


දිවයින
ඉරිද සංග්‍රහය

ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 12

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ



ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

අතහැරීම 12

ඉදිරිපත් කිරීම
**ඉන්ද්‍රජිත් සුබසිංහ**

**දිවයින ඉරිදා සංග්‍රහයේ**
**ලිපි මාලාවක් ඇසුරිනි**

© ඉන්ද්‍රජිත් සුබසිංහ

පළමුවන මුද්‍රණය - 2018 සැප්තැම්බර්

**වෙබ් පිටුව:**

**www.maharahathunwedimagaosse.com**
**www.mrwo.lk**

ISBN 978-955-7887-34-0

**පොත ලබාගත හැකි ස්ථාන :**

**දිවයින පුරා පොත් අලෙවිසැල්**

**තැපැල් මගින් ඔබට ආසන්නම තැපැල් කාර්යාලය වෙතට**

මෙතෙක් පළ වී ඇති පොත් පිළිබඳ සම්පූර්ණ විස්තරය සඳහා
පසුපස කවරයේ ඇතුල් පැත්ත බලන්න.

**විමසීම් -**
දුරකථනඃ 011 2755767
011 2755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 4.30 දක්වා)

ඡායාරූප
**වාසල සේනාරත්න**

මුද්‍රණය සහ බෙදාහැරීම
**ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂන්ස් සෙන්ටර්**
444/3B, පිටිපන දකුණ, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත පරිසර හිතකාමී තීන්ත භාවිතයෙන් මුද්‍රිතයි.)

'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ ' ලිපි මාලාව පින්වත් ඔබ වෙනුවෙන් පුදනු ලැබූ උන්වහන්සේ එදා ඒ සටහන් තබනු ලැබුවේ අප්‍රකටව ය. මහා ඝන වනන්තරයේ ඈත කුටියක සිට, සිතත්, පරිසරයත් සහමුලින් ම නිසල මොහොතක, ලොව ම නිදනා රාත්‍රියක, විටෙක රුස්ස ගස් අතරින් පෙරී එන ළහිරු කිරණ හෝ තවත් විටෙක ලන්තෑරුමේ දුප්පත් එළියේ පිහිටෙන් තැබූ ඒ සටහන් දිවයින සිසාරා සදහම් සුවඳ වී හමා ගියේ ය. ඒ සුවඳ හමන්නේ කොයි ඉසව්වෙන් දැයි සැදැහැති දනෝ විමසූහ. ඒ දහම් සුවඳින් හදවත සුවඳවත් කරගත් අයෙක් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඒ දහම් සුවඳ පතුරුවාහළ බුදුපුතුන් දැකීමට ප්‍රාර්ථනා කළහ; සත්‍යක්‍රියා කළහ; තවමත් ගළපාගත නොහැකි දහම් ගැටලුවක් වේ නම් එය ඒ පින්වත් ස්වාමීන් වහන්සේගෙන් ම විමසා ගළපා ගැනීමට උනන්දු වූහ.

කාලයාගේ ඇවෑමෙන් ඒ ප්‍රාර්ථනා ඉටු විය. සටහනකින් ඔබ දුටු උන්වහන්සේව සියැසින් දැක ගැනීමට ඔබට හැකි විය. නැතිනම් ඔබට ඒ සඳහා හේතු තිබුණි. එතෙක් ඇසින් කියවූ දහම් ගැළපුම දෙසවනින් ඇසීම උදෙසා දසදහස් ගණනින් රැස් වූහ. පිරිස කොතරම් උන්වහන්සේ වටා රැස් වුව ද, උන්වහන්සේ උන්වහන්සේගේ ස්වභාවයෙන් ම සිටි සේක. රැස් වන කඳු ගණන් පිරිකර ද, දහස් ගණන් පිරිවර ද ලෝකය වශයෙන් ම, මාරයා වශයෙන් ම දුටු සේක. ප්‍රශංසාවත්, සාධුකාරයත්, ගැරහුමත්, විවේචනයත් ධර්මයට ම ගැළපූහ.

වනයේ රුක්ෂ මණ්ඩලයක රැඳුණු හුදකලාව තමන් වහන්සේගේ විවේකය පිණිසත්, ගම, නගරයේ සැකසුණු ධර්ම මණ්ඩපයක ඉල්ලීම ධර්මකාමී ජනතාවගේ පහසුව පිණිස කැපකිරීමක් ලෙසත් වස්කාලයෙන් වස්කාලය, උන්වහන්සේ ඉකුත් වසර කිහිපය ගෙවා දැමූහ. නමුත් උන්වහන්සේ අප සැම කෙරෙහි අනුකම්පාවෙන් අඛණ්ඩව ම ශ්‍රී සද්ධර්මය අප සැම වෙත දායාද කළ සේක. මේ එවැනි වූ තවත් උතුම් දහම් ගැළපුම් පෙළක එකතුවකි.

# පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නො ගැසූ තැනක් වේ ද? අත්නොවිඳි අත්දැකීමක් වේද් ද? ඒ සා තැන්හි කරක්ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ තවත් කැරකෙමු ද? අප හැමදා ම කැරකුණේ එක ම තැනක් වටා ය; විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ වැනි එක ම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ, යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කල්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත් ද, ඒ කල්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

**ඉන්ද්‍රජිත්**

# පටුන


භවයේ උගුලද අගුලද මෙයමය 1

සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පිරීමේ අවසන් පරමාර්ථය මෙය නොවේද? 5

කසපහර තුන්සියය ඉවසන්න පින්වත! මන්ද.... 8

ආයතන හයක මරණානුස්සතිය නුවණින් දකින්න 11

තුන්කාලයටම ගලපා රූපයේ අනිත්‍යභාවය දකින්න 14

කාලය මවනා වෙනසක යථාර්ථය විනිවිද දකින්න 18

අනිත්‍යය නොදැක අනාගතය රැස්කරන අදක්ෂයෙක් නොවන්න 21

ඕනෑම අකීකරු ලෝක ධර්මයක් ඉදිරියේ නොසැලී සිටින්නට නම්... 24

ඔබ ඇසුණ, දුටුව, දැනුණ තැන නැවතුනු බුදුන්ගේ දරුවෙක්මය 27

සත්ත්වයා භවයට ගාල් කිරීමේ මුල් පියවර - වේදනාව 31

සැපත්, දුකත්, උපේක්ෂාවත් අනිත්‍යයෙන් විනිවිද දකින්න 34

අතීතය සිහිනයක් පමණයි - වත්මනද ඒ වගේමයි 37

ඊළඟ මොහොත මේ මොහොතෙන් වෙනස් වන්නේ කුමක් නිසාද? 40

හඳුනාගැනීම කාලයට අනුව වෙනස්වන හැටි දකින්න 42

ඊයේ අද මෙන් හෙටටත් හඳුනාගන්නේ මායාවක් 46

සිතිවිල්ල සංස්කාරයකට උපත දෙන බව සිතුවාද? 49

'සිතීම' පහසුයි - 'භවය' අපහසුයි 52

සංස්කාරයෝ අනිත්‍යයි, කටුකයි, බියකරුයි, රුදුරුයි 55

අවිද්‍යාවේ අකුසල් නිධිය විපාක දෙන්නේ මෙසේය 59

මගේ මළකඳ තුළිනුත් ඔබ ධර්මයම දකින්නේ නම්..... 62

විඤ්ඤාණයේ අනාගතයට සංස්කාර අස්වද්දාගන්නා රඟ දකින්න 65

උප්පැන්නයෙන් එහා ඔබේ සැබෑ වයස ගැන සිතන්න 68
සංසාරයත් සංස්කාරත් අතර ඇති සංසිද්ධිය කෙසේද යත්.... 71
කබරයෙක් කියාදුන් සංස්කාර පිළිබඳ පාඩම 74
විශේෂයෙන් දැනගත් දේ එලෙසින්ම රැඳුනේද? 76
ඊයේත් අදත් හෙටත් විඤ්ඤාණයේ හිස්බව දකින්න 79
ඔබ සංස්කාර තුරුල්කරගෙන නලවනවා නොවේද? 82
මාරයන් දෙදෙනෙකුගේ දාසයෙක්ද ඔබ? 85
අනුන් තුළ පමණක් නොව, තමා තුළද සිටින මාරයා හඳුනාගන්න 88
'මම මෙහෙම කෙනෙක්' කියන මනෝලෝකයේ සිරකරුවෙක් නොවන්න 91
අනුන් ඔබට කරන කියන දෙය නොව එයින් ඔබ තුළ ඇතිවන දෙය විමසන්න 95
බාහිර ලෝකය ප්‍රශ්නාර්ථයක් ලෙසින් දකිනු වෙනුවට ඔබ නිහඬව ඔබේ ප්‍රශ්නය විසඳාගන්න 98
ඔබ විසින්ම ඔබව රවටාගැනීමේ විපාකය දන්නේද? 101
දැනුම පළිබෝධ සහිතයි - අවබෝධයෙන් පරිහරණය කරන්න 104
පංච උපාදානස්කන්ධය අවබෝධයෙන් දැක, මේ වියවුල් සහිත ලෝකයම සංසිඳවන්න 107
මාරයාගේ ස්වයං වර්ණනාවට හෝ ස්වයං විවේචනයට නොරැවටෙන්න! 111
සංස්කාර යනු පංච උපාදානස්කන්ධ මාරයාගේ තවත් නිෂ්පාදනයක්මය 115
දෑස් හැරගෙනම ඔබ කරන භාවනාව කුමක්ද? 119
ශීලයේ පලුදු බුද්ධානුස්සතියෙන් පිරියම් කර සොඳුරු ආරම්භයක් ගන්න 123
බුද්ධානුස්සතියට පූර්වකෘත්‍යයක් ලෙසින් ඔබ බුදුසමයෙන් එපිට අතීතයට යන්න 127

ඔබ පය තබාගෙන සිටින පොළොව ඔබ උදෙසා බෝධිසත්වයන් දන් දුන් ශරීර මාංශයම නොවේද? 131

බුද්ධත්වයට පෙර අවධිය දක්වාද බුදු ගුණය දකින්න 134

ඒ විශිෂ්ටත්වයන් ඇත්තේ බුදුන්වහන්සේ තුළම පමණි... 137

මේ භයංකාරත්වය බුදුවරයකුම හැර වෙන කව්රුන් ඔබට පහදා දෙන්නද? 140

ඒ අසිරිමත් බුද්ධ ඥානයට මෙසේ වූ හැකියාවන්ද ඇත්තේය 144

දැවෙන සිත් නිවුනු සිතින් දමනය කළ උන්වහන්සේගේ පුරිසධම්ම සාරථී ගුණය... 147

අවසන් බුදු වදනේ පවා විහිදුනේ ඒ මහා කරුණා ගුණයයි... 151

අයාලේ දුවන ඔබේ සිත බුදු ගුණයක් අභියස තැන්පත් කරන්න... 155

ඔබේ නින්ද ද බුදුගුණයක් තුළම සතපවන්න 158

# භවයේ උගුලද අගුලද මෙයමය

**(පංච උපාදානස්කන්ධය තේරුම් ගනිමු)**

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'සත්ත්වයා බැඳුණොත් බැඳෙන්නේ පංච උපාදානස්කන්ධයට. සත්ත්වයා නිදහස් වුණොත් නිදහස් වෙන්නේ පංච උපාදානස්කන්ධයෙන්මය' කියලා. භවයට සත්ත්වයාව බැඳතබන පංච උපාදානස්කන්ධය මාරයා හැටියටත්, භවයෙන් නිදහස් වීම පංච උපාදානස්කන්ධ මාරයාගෙන් නිදහස්වීමයි කියලත් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

පින්වත් ඔබත්, මමත් සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂ ගණනාවක් කල්ප විනාශයන් දස දහස් ගණනක් පසුකරමින් සම්මා සම්බුද්ධ ශාසන ලක්‍ෂ ගණනක් අතපසුකොටගනිමින් පැමිණි මේ දීර්ඝ කටුක භවගමනට ඔබට උපකාරක ධර්මයන් සකස්කොට දුන්නේ පංච උපාදානස්කන්ධය කෙරෙහි ඔබ ඇතිකොටගත් තෘෂ්ණාව යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

පංච උපාදානස්කන්ධය කෙරෙහි සත්ත්වයා ඇතිකොට ගන්නා වූ තෘෂ්ණාවේ ඵලය වශයෙන් සත්ත්වයාට ලැබෙන්නේ මමත්වයේ දැඩිභාවය හෙවත් සක්කාය දිට්ඨියයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මහා සාගරයේ ආශ්චර්යමත් කාරණා කිහිපයක්ම තිබෙනවාය කියලා. මහා සාගරය වෙරළින් පටන් අරගෙන ක්‍රමානුකූලව ගැඹුරින් ගැඹුරට යෑම ඉන් එක් කාරණාවක්. මේ උතුම් ධර්ම රත්නයේ ගමන් කරන පින්වතා මුලින්ම කල්‍යාන මිත්‍ර ආශ්‍රය නමැති වෙරළින්

තමයි සද්ධර්මය කියන මහා සාගරයට බැසගන්නේ. කල්‍යාන මිත්‍ර ආශ්‍රය තුළින් සද්ධර්ම ශ්‍රවණයත්, ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කිරීමත් කියන අර්ථයන් පින්වත් ඔබව ආර්ය අෂ්ටාංගික මාර්ගයට යොමු කරනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගය ඔබ තුළ වැඩීමේ ඵලය හැටියටයි පින්වත් ඔබ තුළින් කාය, චිත්ත, ධම්ම, වේදනා කියන සතර සතිපට්ඨාන ධර්මයන් වැඩෙන්නේ. සතර සතිපට්ඨාන ධර්මයන් ඔබ තුළින් වැඩීමේ ඵලය වශයෙන් සති, ධම්ම විජය, වීර්යය, ප්‍රීති, ඵස්සද්ධි, සමාධි, උපේක්‍ෂා කියන සප්ත බොජ්ඣංග ධර්මයන් වැඩෙනවා. සම්මා සම්බුද්ධ ශාසනයේ වෙරළ වන කල්‍යාන මිත්‍ර ආශ්‍රයෙන් පටන්ගෙන සද්ධර්ම ශ්‍රවණය නුවණින් මෙනෙහි කිරීම, ආර්ය අෂ්ටාංගික මාර්ගය, සතර සතිපට්ඨාන ධර්මයන්, සප්ත බොජ්ඣංග ධර්මයන්... මේ සියළුම ධර්මතාවයන් ඔබ තුළ වැඩෙන්නේ රූපය ඇසුරුකොටගෙන පංච උපාදානස්කන්ධයක් වශයෙන්මය. මෙතැනදී පින්වත් ඔබ කල්‍යාන මිත්‍ර ආශ්‍රයෙන් පටන් අරගෙන සප්ත බොජ්ඣංග ධර්මයන් දක්වා ඔබ තුළ වැඩෙන ධර්මතාවයන්ට බැඳුනොත්, එම ධර්මතාවයන් නිත්‍ය වශයෙන් ගත්තොත්, ඔබ ඒ බැඳෙන්නේ පංච උපාදානස්කන්ධයටමය.

මේ කාරණා තුළින් පින්වත් ඔබට වැටහෙනවා කල්‍යාන මිත්‍ර ආශ්‍රය තුළින්, සද්ධර්ම ශ්‍රවණය කිරීම තුළින්, නුවණින් මෙනෙහි කිරීම තුළින්, ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළත්, සතර සතිපට්ඨාන ධර්මයන් තුළත්, සප්ත බොජ්ඣංග ධර්මයන් තුළත් ඔබ මෙම ධර්මතාවයන් නිත්‍ය වශයෙන්, නොවෙනස්වන ස්වභාවයෙන් දකිනා මොහොතක් පාසා පංච උපාදානස්කන්ධ මාරයා ඉහත ධර්මතාවයන් තුළත් බැසගෙන සිටිනාවය කියන කාරණය.

පින්වත් ඔබ අදක්‍ෂ නම්, ඔබ තුළ වැඩෙන ධර්මතාවයන්ට බැඳෙනවා නම්, ආශ්වාදයට යටවෙනවා නම්, පංච උපාදානස්කන්ධ මාරයා බැසගෙන සිටිනවාය කියන කාරණය, සද්ධර්ම ශ්‍රවණය තුළින්, පින්වත් ඔබ තේරුම්ගත යුතුයි. ඔබ අදක්‍ෂ නම් කල්‍යාන මිත්‍ර ආශ්‍රය තුළත් පංච උපාදානස්කන්ධ මාරයා බැසගෙන සිටිනවා.

බුදුරජාණන් වහන්සේ කියන අති උතුම් කල්‍යාන මිත්‍රයා අනිත්‍යභාවයට පත්වුණා. බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ උතුම් ශ්‍රී සද්ධර්මය අනාගතයේ යම් දවසක අතුරුදන් වී යනවා. බුදුරජාණන් වහන්සේ තුළ වැඩුනු ආර්ය අෂ්ටාංගික මාර්ගය, සතර සතිපට්ඨාන ධර්මයන්, සප්ත බොජ්ඣංග ධර්මයන් අනිත්‍යභාවයට පත්වුණා. පින්වත් ඔබ අතීත සම්මා සම්බුද්ධ ශාසන ලක්‍ෂ ගනනක ඉපදිලා මොනතරම් කල්‍යාන මිත්‍ර ආශ්‍රයන් ලබන්නට ඇතිද. බුදුරජාණන් වහන්සේලා, පසේබුදුරජාණන් වහන්සේලා, මහරහතන් වහන්සේලා යන මේ ලෝක ධාතුවේ දුර්ලභම කල්‍යාන මිත්‍ර ආශ්‍රය ඔබ ලබලා තිබෙනවා. සද්ධර්ම ශ්‍රවණය කරලා තිබෙනවා. ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරලා තිබෙනවා. නමුත් මේ සෑම අතීත ධර්මතාවයක්ම අනිත්‍යවූ සංස්කාරයන් පමණක්මයි. මේ සංස්කාරයන් නිත්‍ය වශයෙන් ඔබ ගත්ත නිසාම, ආශ්වාදයක් කරගත්ත නිසාම, එම සංස්කාරයන් වෙනස්වුණා, පිරිහුණා, අනිත්‍ය වී ගියා. සංසාරයේ ඔබ මොනතරම් ආර්ය අෂ්ටාංගික මාර්ගය පුහුණුවෙලා ඇතිද? භාවනා පන්ති ලක්‍ෂ කීයකට සහභාගීවෙලා, සතර සතිපට්ඨාන ධර්මයන් පුහුණු වෙන්නට ඇතිද? අතීතයේ සමථ භාවනාවන් පුහුණුවෙලා, සප්ත බොජ්ඣංග ධර්මයන්වල ආශ්වාදය ජීවිතයට මොනතරම් ලබන්නට ඇතිද?

නමුත් මේ සෑම ධර්මතාවයක්ම වෙනස්වී ගියා. පිරිහී ගියා, අහිමිවී ගියා, අනිත්‍ය දෙය අනිත්‍ය වශයෙන් නොදැක්ක නිසාම, දුක දෙය දුක වශයෙන්, අනාත්ම දෙය අනාත්ම වශයෙන්, අසුබ දෙය අසුබ වශයෙන් නොදැක්ක නිසාම පින්වත් ඔබ කල්‍යාන මිත්‍ර ආශ්‍රයේදීත්, සද්ධර්ම ශ්‍රවණයේදීත්, නුවණින් මෙනෙහි කිරීමේදීත්, ආර්ය අෂ්ටාංගික මාර්ගය, සතර සතිපට්ඨාන ධර්මය, සප්ත බොජ්ඣංග ධර්මයන් වැඩීමේදීත්, එම ධර්මයන් තමා තුළින් මෝදුවෙද්දීත්, පංච උපාදානස්කන්ධ මාරයා පින්වත් ඔබව මේ සෑම ධර්මතාවයක්ම, ආශ්වාදයේ නිත්‍ය වූ සැපයක් බවට පෙන්වා, මෙම ධර්මතාවයන් තුළින්ම මමත්වයේ දැඩිභාවය වර්ධනය

කොට ඔබව නැවත භවයේම කොටස්කරුවෙක් බවට පත්කොට තිබෙනවා. එමනිසා පින්වත් ඔබ දක්ෂවෙන්න ඕනේ කල්‍යාන මිත්‍ර ආශ්‍රය ලබමින්, සද්ධර්ම ශ්‍රවණය කරමින්, ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරමින් මේ ධර්මතාවයන්ගේ අනිත්‍යභාවය දකින්න.

# සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පිරීමේ අවසන් පරමාර්ථය මෙය නොවේද?

**(පංච උපාදානස්කන්ධය තේරුම් ගනිමු)**

කුසිනාරානුවර බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑ මොහොතේ මල්ල රජ දරුවන් මොනතරම් හඬා වැටුණාද. සාරිපුත්ත මහරහතන් වහන්සේ පිරිනිවන් පෑවාය කියලා දැනගත්ත මොහොතේ ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේට පවසනවා 'භාග්‍යවතුන් වහන්ස, සාරිපුත්ත මහරහතන් වහන්සේ නමැති උතුම් කල්‍යාන මිත්‍රයා පිරිනිවන් පෑවාය කියන කාරණය ඇසූ මට දිශාවක් නොපෙනී ගියා. මට මොකුත්ම සිතාගන්න බැරිව ගියා. මාව අප්‍රාණික වෙලා ගියා' කියලා. ඇයි ආනන්ද ස්වාමීන් වහන්සේට ඉහත අපහසුතාවයන් ඇතිවුණේ. ඒ වන විට උන්වහන්සේ කල්‍යාන මිත්‍ර ආශ්‍රය අනිත්‍යයි කියලා ප්‍රත්‍යක්ෂ වුණු තත්ත්වයක සිටියේ නැහැ. ඒ නිසාම දුකට පත්වුණා.

පින්වත් ඔබ, කල්‍යාන මිත්‍ර ආශ්‍රය ඇතිකොට ගනිමින්, කල්‍යාන මිත්‍ර ආශ්‍රයේ අනිත්‍යභාවය දකින්න. සද්ධර්මය ශ්‍රවණය කරමින්, එම ධර්මදානමය පින්කම්වල අනිත්‍යභාවය දකින්න. නුවණින් මෙනෙහි කරමින්, එම මෙනෙහි කරන සිතිවිලිවල අනිත්‍යභාවය දකින්න. ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරමින්, සතර සතිපට්ඨාන ධර්මයන් වඩමින්, සප්ත බොජ්ඣංගයන් මතුකොට ගනිමින්, මේ සෑම ධර්මතාවයකම අනිත්‍යභාවය නුවණින් දකින්න. සතිය තුළ සිටිමින්, සතියේ

අනිත්‍යභාවය දකින්න. ප්‍රීතිය, පස්සද්ධිය තුළ සිටිමින්, ප්‍රීතිය පස්සද්ධියේ අනිත්‍යභාවයම දකින්න. රූපය ඇසුරින් හේතුඵලයක් නිසා සකස්වෙන ධර්මතාවයන්ට බැඳෙන්නේ නැහැ. ඒවා නිත්‍ය, ස්ථිර වශයෙන් දකින්නේ නැහැ. එම ඵලයන් මමත්වයේ දැඩිභාවයෙන් ගන්නේ නැහැ. පංච උපාදානස්කන්ධ මාරයා, මාරයා ලෙසින්ම දකිනවා. පංච උපාදනස්කන්ධ මාරයා තුළින්ම, පංච උපාදානස්කන්ධ මාරයාගෙන් මිදීමේ දිශාව මතුකොට ගන්නවා. කල්‍යාන මිත්‍ර ඇසුරේ පටන්, තමන් තුළ සකස්වෙන සෑම ධර්මයක්ම නිත්‍ය වශයෙන්, සුබ වශයෙන්, ආත්මය වශයෙන් දැකීම පංච උපාදානස්කන්ධ මාරයාව පෝෂණය කිරීමක් වෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, පංච උපාදානස්කන්ධ ධර්මයන්, අවබෝධ නොකිරීමෙන් සත්ත්වයා අවුල් වූ නූල් පන්දුවක් සේ ව්‍යාකුලය කියලා. සැබෑ සැපයෙන් පහවූ නරක ගති ඇති විසිරුණු සිත් ඇතිව සසර භවගමන දික්කොට ගන්නවාය කියලා. පංච උපාදානස්කන්ධ ධර්මතාවයන් කෙරෙහි සත්ත්වයාගේ තෘෂ්ණාව වැඩෙනකොට, තෘෂ්ණාව හේතුවෙන් උපාදානය සකස්වෙනවා. උපාදානය නිසා භවය සකස්වෙනවා. භවය නිසා ජාති, ජරා, ව්‍යාධි, මරණ දුක උරුමවෙනවාය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මහත් රුකක් තිබෙනවා. එහි යටට බසිනා මුදුන් මුලත්, සතර අතට ගමන්ගත් මුල් වේද, ඒ සියළුම මුල් පසේ ඕජාව උඩට ගෙනයනවා. ඒ මහා රුක, ඒ ආහාර ඇතිසේ, ආහාර කෙරෙහි තෘෂ්ණාවෙන් උපාදානයන් ඇතිසේ අතිදීර්ඝ කාලයක් පවතිනවා වගේ, සත්ත්වයා, ඇසට, කනට, නාසයට, දිවට, ශරීරයට, මනසට අරමුණුවන රූපයන් කෙරෙහි ඇතිකොට ගන්නා වූ ඡන්දරාගය නිසාම, භවගමනේ දීර්ඝ කාලයක් ගමන් කරනවාය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

වරක් සාරිපුත්ත මහරහතන් වහන්සේ තම ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලාගෙන් විමසනවා, අන්‍ය තීර්ථකයින් ඔබලාගෙන්

ප්‍රශ්න කළොත්, ඔබලාගේ ශාස්තෘන් වහන්සේ මොනවිදිහේ ධර්මයක්ද දේශනා කරන්නේ කියලා ඔබලා මෙහෙමයි පිළිතුරු දෙන්න ඕනේ කියලා.

'මාගේ ශාස්තෘන් වහන්සේ වන බුදුරජාණන් වහන්සේ ඡන්ද රාගය දුරුකිරීම ගැනයි දේශනා කරන්නේ' කියලා පිළිතුරු දෙන්න

'කුමන ඡන්ද රාගය දුරු කිරීමටද? රූපය කෙරෙහි, වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණය කෙරෙහි ඡන්දරාගය දුරුකිරීම ගැනයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ' කියලා.

'එවිට එම අන්‍ය තීර්ථකයන් ඔබෙන් ඇසුවහොත්, කුමන ආදීනවයන් දැකලද රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ වෙනස් වී යනකොට, විකෘති වී යනකොට දුකට පත්වෙනවා. සත්ත්වයා විඳින ඉහත ආදීනවයන් දැකලයි බුදුරජාණන් වහන්සේ රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ ධර්මතාවයන් කෙරෙහි ඡන්දරාගය දුරුකිරීම දේශනා කරන්නේ' කියලා සාරිපුත්ත මහරහතන් වහන්සේ දේශනා කරනවා.

දැන් පින්වත් ඔබට වැටහෙනවා, ලොව්තුරා බුදුරජාණන් වහන්සේනමක්, සාරා සංඛ්‍ය කල්ප ලක්‍ෂ ගණනාවක් දස පාරමී ධර්මයන් පූර්ණකොට, උතුම් සම්මා සම්බෝධිය සාක්‍ෂාත්කොට ගැනීමේ අවසාන පරමාර්ථය වෙන්නේ ලෝක සත්ත්වයාට පංච උපාදානස්කන්ධය කෙරෙහි ඇති ඡන්දරාගය දුරුකිරීමේ මාර්ගය මතුකොටදීමටය කියන කාරණය.

# කසපහර තුන්සියය ඉවසන්න පින්වත! මන්ද....

**(පංච උපාදානස්කන්ධය තේරුම් ගනිමු)**

පංච උපාදානස්කන්ධය කෙරෙහි ඡන්දරාගය දුරුකිරීමේ මාර්ගය වන, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ පින්වත් ඔබ ගමන් කරලා, මූලිකව ඔබ පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිනවා. පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකින පින්වතා, උතුම් සෝවාන්ඵල අවබෝධය සාක්ෂාත්කොට ගෙන පංච උපාදානස්කන්ධය කෙරෙහි තමන් ඇතිකොටගෙන තිබූ සක්කාය දිට්ඨිය හෙවත් මමත්වයේ දැඩිභාවය නිරෝධයකොට දමනවා. මේ සක්කාය දිට්ඨිය හෙවත් මමත්වයේ දැඩිභාවය කියන වචනයේ අර්ථය සත්ත්වයාට මොනතරම් දුක් දෙනවාද කියන කාරණය මතුකොට පෙන්වන්න බුදුරජාණන් වහන්සේ මෙහෙම උපමාවක් දේශනාකොට තිබෙනවා.

'යම් පුද්ගලයෙක් ඔබට කිවහොත් දිනකට කස පහරවල් තුන්සියය බැගින් අවුරුදු තුන්සියයක් ලබා ගෙවීගිය තැන මම ඔබට උතුම් සෝවාන්ඵල අවබෝධය ලබාදෙනවාය කියලා, ඔබ ඒ තියුණු වූද, කටුක වූද, වේදනාකාරී වූද, අමිහිරි වූද දුක වසර තුන්සියයක් විඳලා උතුම් සෝවාන්ඵල අවබෝධය ලබාගන්නට කැමතිවෙන්න'ය කියලා. ඉහත උපමාවෙන් පින්වත් ඔබට වැටහෙනවා ඇති, සක්කාය දිට්ඨිය කියන අර්ථය පින්වත් ඔබට සංසාරයක් පුරාවට මොනතරම් අමිහිරි දුක් කන්දරාවක් උරුමකොටදී ඇති ද කියන කාරණය.

තවදුරටත් ඔබ සක්කාය දිට්ඨියට බැඳුනොත්, අනාගත භවගමනේදී තව කොතෙක් කටුක දුක් විඳවන්නට සිදුවේද කියන කාරණය පින්වත් ඔබ නුවණින් දකින්න. වසර තුන්සියයක් දිනපතා කසපහර තුන්සියයක් බැගින් පහරකන මනුෂ්‍යයෙකුගේ තියුණු දුක, වේදනාව, අඳෝනාව, මරණය, ඉපැදීම නුවණින් දකිමින් සක්කාය දිට්ඨිය, මමත්වයේ දැඩිභාවය කියන අර්ථය කෙරෙහි කළකිරීම ඇතිකර ගන්න.

වරක් බමුණෙක් බුදුරජාණන් වහන්සේගෙන් විමසනවා, භාග්‍යවතුන් වහන්ස උතුම් සෝවාන් ඵලයට පත්වීමට නම්, කුමක්ද කළ යුතු කියලා. ඒ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, ආර්යකාන්ත ශීලය සහ පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකින පින්වතා, උතුම් සෝවාන් ඵලයට පත්වෙනවාය කියලා. දෙවැනුව, බමුණා විමසනවා 'යම් පින්වතෙක්, උතුම් සෝවාන්ඵල අවබෝධය ලැබුවාට පසුව කුමක්ද කළයුත්තේ?' කියලා. එවිට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'යමෙක් සෝවාන් ඵලයට පත්වුණාට පස්සේ, ඔහු තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව ගැන හෝ ඔහුගේ ආර්යකාන්ත ශීලය ගැන ඔහුට ප්‍රශ්නයක් නැහැ. එම ධර්මයන් පරිපූර්ණයි. ඔහු දැන් කළයුත්තේ තමන් අනිත්‍ය වශයෙන් දැක්කා වූ පංච උපාදානස්කන්ධය නැවත නැවත අනිත්‍ය වශයෙන්ම දකිමින් ජීවත්වීමය' කියලා.

ඔහු පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය නැවත නැවත දකිමින් සිටිනවිට, එම පින්වතා උතුම් සකෘදාගාමී ඵලයට පත්වෙනවා. සකෘදාගාමී ඵලයට පත්වුණ පින්වතාත් නැවත නැවත පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිමින් ජීවත්වෙනකොට ඔහු උතුම් අනාගාමී ඵලයට පත්වෙනවා. අනාගාමී ඵලයට පත්වූ පින්වතා නැවත නැවතත් පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය නුවණින් දකිමින් සිටිනවිට එම පින්වතා උතුම් අර්හත්ඵල අවබෝධයට පත්වෙනවා. උතුම් අරිහත්ඵල අවබෝධය ලැබූ රහතන් වහන්සේ තමන්

අවබෝධකොට ගත්තා වූ පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය විවේකීව නැවත නැවත ආවර්ජනය කරමින් සිටිනවාය කියලා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරන ඉහත ධර්මයෙන් පින්වත් ඔබට වැටහෙනවා සෝවාන් ඵලයට පත්වෙන පින්වතා පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිනවා උතුම් අරිහත්භාවයට පත්වෙන රහතන්වහන්සේ මුලින්ම තමන් අනිත්‍යවශයෙන් දැක්ක පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය උතුම් ඥාන දර්ශන තුළින් අවබෝධකොට ගෙන පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිනවා. උතුම් අරිහත්ඵල අවබෝධයේදී පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය අවබෝධකොට ගෙන සම්මා විමුක්තිය සාක්ෂාත්කොට ගන්නවා. උතුම් සෝවාන් ඵලයේදී පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිනවා. උතුම් අරිහත්ඵල අවබෝධයේදී පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය අවබෝධකොට ගන්නවා.

පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය නොදකින පින්වතා, නිරතුරුවම රූපය මමය කියලා ගන්නවා. වේදනාව, සංඥාව, චේතනාව, විඤ්ඤාණය මමය කියලා ගන්නවා. මගේ ආත්මය කියලා ගන්නවා. නොවෙනස්වන රූපයක්, නොවෙනස්වන වේදනාවක් තිබෙනවාය කියලා ගන්නවා. සැප දුක් විඳිනා ආත්මයක් තිබෙනවාය, එම ආත්මය තුළ මම සිටිනවාය කියලා දකිනවා. මේ සක්කාය දිට්ඨියේ දැක්ම නිසාම, උපදින අයෝනිසෝමනසිකාරය පින්වතුන්ට නැති ආශ්‍රවයන් ඇතිකොට දෙනවා, ඇති ආශ්‍රවයන් වර්ධනයකොට දෙනවාය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

# ආයතන භයක මරණානුස්සතිය නුවණින් දකින්න

**(රූපය)**

පින්වත් ඔබ සමාජය දෙසට මොහොතක් හැරී බලන්න. මනුෂ්‍යයාගේ මමත්වයේ දැඩිභාවය නිසා මමය කියලා ගන්නාවූ දැඩි දෘෂ්ඨිය නිසා මනුෂ්‍යයා නිරතුරුවම මොනතරම් අකුසල් මූලයන් ඇතිකොට ගන්නවාද. පින්කමක් සිදුකළත්, දානයක් පූජාකළත්, සිල් සමාදන් වුණත්, භාවනාවක් කළත් මේ සෑම ක්‍රියාවක්ම මමත්වයේ දැඩිභාවයෙන් ගැනීම නිසාම සමාජය නැවත නැවත අකුසල් මූලයන්ම සකස්කොට ගන්නවා. ශීලය තුළ මම සිටිනාවය කියලා දකිනවා. මා තුළ ශීලය තිබෙනවාය කියලා දකිනවා. මම පිරිසුදුයි, අනුන් අපිරිසුදුයි කියලා දකිනවා. ශීලය නමැති ආත්මය මා සුවපත් කරනවාය කියලා දකිමින් ශීලයේ නාමයෙන්, දානයේ නාමයෙන්, භාවනාවේ නාමයෙන් සක්කාය දිට්ඨිය වර්ධනයකොට ගන්නවා. ශීලයෙන් දානයෙන් ලැබුණා වූ සංස්කාර සහ ශීලයෙන් දානයෙන් ලැබෙන්නාවූ සංස්කාර අනිත්‍ය බව නුවණින් දකින්නේ නැහැ. පෙර ශීලය නිසාම, දානය නිසාම, පින්කම් නිසාම තමන්ට ලැබුණ ආයුෂ, වර්ණය, සැපය, බලය, උගත්කම, හැකියාව, ජනප්‍රියභාවය, දක්ෂභාවය නිසා මේ ධර්මතාවයන් මමත්වයේ දැඩිභාවයෙන් ගැනීම නිසාම පෙර පිනට ඔබට ඔබට ලැබුණු ධර්මතාවයන් ඔබ උපයෝගීකොට ගන්නේ නැවත නැවත ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් වර්ධනය උදෙසාමයි.

දැන් පින්වත් ඔබට හොඳින්ම වැටහෙනවා පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය නොදැකීම සක්කාය දිට්ඨිය සිඳ නොදැමීම, සෝවාන් ඵලයට පත්නොවීම යන අර්ථයන් සත්ත්වයන්ගේ ජීවිතවලට මොනතරම් බියකරු, නපුරු, විෂම ප්‍රතිඵලයන් ඇතිකොට දෙනවාද කියන කාරණය. පින්වත් ඔබ දක්ෂවෙන්න මේ ලැබූ උතුම් මනුෂ්‍ය ජීවිතයේදී අර්ථවත්ව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන්කොට පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැක, උතුම් සෝවාන් ඵල අවබෝධය සාක්ෂාත්කොට ගන්න.

පංච උපාදානස්කන්ධය කියලා කියන්නේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ධර්මතාවයන් පහට. ඉහත කාරණා පහ ඵස්ස, වේදනා, සංඥා, චේතනා, මනසිකාර වශයෙනුත් ගන්න පුළුවන්. පංච උපාදානස්කන්ධය කෙරෙහි ඇතිකොට ගන්නාවූ තෘෂ්ණාවයි සත්ත්වයාට දුක සකස්කොට දෙන්නේ. දුකින් මිදීමේ මාර්ගයට අවතීර්ණව සිටින පින්වත් ඔබ, ඉහත කාරණා පහ වෙන් වෙන් වශයෙන් නුවණින් දකිමින් මෙම ධර්මතාවයන්ගේ යථාර්ථය වන, අනිත්‍යභාවය දකින්න පුහුණු වෙන්න ඕනේ.

වර්තමාන පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකලා පමණක්ම පින්වතුන්ලාට පංච උපාදානස්කන්ධය කෙරෙහි, තෘෂ්ණාවෙන් මිදෙන්න බැහැය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. කල්ප සියක් කෝටි, ප්‍රකෝටි ගණනක් ඈත අතීතයේ සිට, පටිච්ච සමුප්පන්නව පංච උපාදානස්කන්ධය මමත්වයේ දැඩිභාවයෙන් ගැනීම නිසාම, තදංග වශයෙන් පෝෂණය වූ සක්කාය දිට්ඨිය පටිච්ච සමුප්පන්නව ගලාගෙන එන, සංස්කාර පච්චයා විඤ්ඤාණං කියන ධර්මතාවය තුළ මුහුවී තිබෙනවා. එම නිසා පංච උපාදානස්කන්ධය අතීත, වර්තමාන, අනාගත වශයෙන් අනිත්‍ය දකින්න කියලා බුදුහාමුදුරුවෝ දේශනා කරනවා.

''රූපය''

රූපය කෙරෙහි ඇති තෘෂ්ණාව හේතුවෙන් සකස්වෙන උපාදානය රූප උපාදානස්කන්ධයයි. පින්වත් ඔබ මුලින්ම වර්තමාන රූපයේ අනිත්‍යභාවය දකින්න. රහතන් වහන්සේ නමකටත්, ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස කියන ආයතන හය තිබෙනවා. නමුත් රහතන් වහන්සේ රූපය කෙරෙහි තෘෂ්ණාව නිරෝධය කර ඇති නිසා, රහතන් වහන්සේට රූප උපාදානස්කන්ධයක් සකස්වෙන්නේ නැහැ. ඒ නිසා රහතන් වහන්සේ දරාගෙන සිටින්නේ පංචස්කන්ධයක්. මොකද අන් සෑම සත්ත්වයෙක්ම තම පංචස්කන්ධය තෘෂ්ණාවෙන් තෙත් කොට පංච උපාදානස්කන්ධයක් බවට පත්කොට ගන්නවා.

වර්තමාන රූපස්කන්ධයේ අනිත්‍යභාවය දකින පින්වත් ඔබ, මුලින්ම රූපය කියන්නේ කුමක්ද කියලා හඳුනාගන්න ඕනේ. ඇසත්, කනත්, නාසයත්, දිවත්, ශරීරයත්, මනසත් මේවාට අරමුණුවෙන සියළුම බාහිර රූපයනුත් රූපය වශයෙන් හඳුන්වනවා. ඒ සෑම රූපයක්ම සෑදිලා තිබෙන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධර්මතාවයන් හතර වන සතර මහා ධාතුවෙන්. සතර මහා ධාතුවේ ස්වභාවය අනිත්‍යයි. පින්වත් ඔබ දෑස්දෙක පියාගෙන ඇසට, කනට, නාසයට, දිවට ශරීරයට මනසට සිත යොමුකරලා, තද ස්වභාවයෙන්, දියර ස්වභාවයෙන්, උෂ්ණ ස්වභාවයෙන්, වායු ස්වභාවයෙන් සෑදුණු රූපයේ අනිත්‍යභාවය නුවණින් දකින්න. ආයතන හයක් වශයෙන් දෙතිස් කුණපයක් වශයෙන් නිතරතුරුවම මරණයට පත්වෙන මරණානුස්සතියක් වශයෙන් රූපය දකින්න.

වර්තමාන, ඔබේ අධ්‍යාත්මික රූපයේ අනිත්‍යභාවය දකිනවා වගේම, ඔබට අරමුණුවන සෑම බාහිර රූපයක්මත් අනිත්‍ය වශයෙන් දකින්න. ඇසට බාහිර රූපයක් ඵස්සය වන මොහොතේම ඇස ඉපදෙන හැටිත්, රූපය ගැන සිතීමේදී ඇස මැරී මනස උපදින හැටිත් නුවණින් දකින්න. නිරතුරුවම ආයතන හයක මරණානුස්සතිය නුවණින් දකිමින් වර්තමාන රූපස්කන්ධය කෙරෙහි කලකිරීම ඇතිකරගන්න.

# තුන් කාලයටම ගලපා රූපයේ අනිත්‍යභාවය දකින්න

**(රූපය)**

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මහණෙනි, රූපයේ ආශ්වාදයක් තිබෙනවා. වයස අවුරුදු දහඅටක්, දහනමයක් වයසැති තරුණයකුගේ, තරුණියකගේ රූපයේ ඇති ප්‍රභාශ්වරය, තාරුණ්‍යය, ලාලිත්‍යය, රිද්මය, විකසිතභාවය රූපයේ ආශ්වාදයයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පින්වත් ඔබ මතකයෙන් ඔබේ අතීතයට යන්න. පින්වත් ඔබට ඒ තාරුණ්‍යයේ හිමිව තිබූ රූපයේ ආශ්වාදය වෙනස්වී ගිය හැටි නුවණින් දකින්න. ඔබ අත්විඳින රූපයේ කෙටි ආශ්වාදය නිසා, පින්වත් ඔබ දීර්ඝ කාලීන වූ ආදීනවයන් අත්විඳිනවා. තාරුණ්‍යයේ රිද්මයෙන්, ලාලිත්‍යයෙන්, විකසිතභාවයේ තිබූ රූපය, මෝරා, නෙරා, ඉදිමී, හැකිලී, එල්ලී වැටෙන ජරා ව්‍යාධි ලක්ෂණ රූපයේ දීර්ඝකාලීන වූ ආදීනව යයි කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

යුරෝපයේ රැකියාව කරන මහත්මයෙක් භික්ෂුව මුණ ගැහෙන්න වසරකට වරක් එනවා. එම මහත්මයාගේ මෑණියන්ගේ වයස අවුරුදු හැත්තෑපහක් වෙනවා. මේ මහත්මයා ධර්මයට ලැදි වුණත්, තමන්ගේ අම්මා ගැන ප්‍රසාදයකින් කතා කරන්නේ නැහැ. 'ස්වාමීන් වහන්ස, මම මගේ අම්මාගෙන් මොනවද එයාගේ අවශ්‍යතා කියලා ඇහුවහම, කවදාවත් බණ පොතක්, සිල් ඇඳුමක්, වන්දනා ගමනක් යන්න අවශ්‍යයි කියලා කියන්නේ නැහැ. අම්මා නිතරම ඉල්ලන්නේ ශරීරය අලංකාර කරන ඇඳුම්

පැළඳුම්, සුවඳ විලවුන් වැනි දේවල් පමණක්මයි. මම කාමරයකට වෙලා ධර්ම දේශනාවකට ඇහුම්කන් දීගෙන ඉන්නකොට, අම්මා ලස්සනට ඇඳගෙන, සුවඳ විලවුන් තවරාගෙන පියානෝ එක වාදනය කරනවා' කියලා ඒ මහත්මයා කියනවා.

ඒ අම්මා මෝරා, නෙරා, ඉදිමී, හැකිලී, එල්ලීගිය රූපයේ ආදීනවයෙනුත් දකින්නේ ආශ්වාදයකුයි. රූපයේ ආදීනවයත් ආශ්වාදයක් කොටගන්න සමාජයක රූපයේ නිස්සරණය හුදු මායාවක්ම වෙනවා. වර්තමාන රූපස්කන්ධයේ අනිත්‍යභාවය නොදැක කෙසේනම් අතීත රූපස්කන්ධයේ අනිත්‍යභාවය දකින්නද?

පින්වත් ඔබ මොහොතක් විවේකීව දෑස් පියාගෙන අතීත රූපස්කන්ධයේ අනිත්‍යභාවය නුවණින් දකින්න. අතීත රූපයේ ජරා, ව්‍යාධි, මරණ ස්වභාවයන් මතුකොට දකිමින්, අතීත රූපස්කන්ධය කෙරෙහි කළකිරීම ඇතිකොට ගන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ජීවිතයේ මව්කුසේ කළල රූපයෙන් එහාට, පටිච්ච සමුප්පන්නව අතීත රූපයේ අනිත්‍යභාවය දකින්නය කියලා. දීර්ඝ වූ අතීත භවගමනේදී ඔබ සක්විති රජුවෙලා ඉපදුන වේලාවේ, ඔබ ලැබූ දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් බබලන රූපකාය, අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකින්න. ඔබ අතීතයේ සක්‍ර දෙවියන් වෙලා තව්තිසාවේ ඉපදුනු වෙලාවේ, ඔබලා ලැබුණු දිව්‍ය තේජසින්, දිව්‍ය ඕජසින් පිරීගිය සක්‍රදෙව් රූපය වෙනස්වී ගිය හැටි නුවණින් දකින්න. රජවරු සිටුවරු වෙලා, ඔබට ලැබුණු රාජ තේජසින් බබලන රූපයන් වෙනස්වී ගිය හැටි නුවණින් දකින්න. අතීතයේ ඔබ, රූපාවචර අරූපාවචර බ්‍රහ්මතලවල ඉපදිලා, ඔබ ලැබූ බ්‍රහ්ම රූපයන් වෙනස්වී ගිය හැටි නුවණින් දකින්න. අතීතයේ ඔබ මවුකුසේදීම ගබ්සාවී ගිය හැටි, ළදරු කාලයේදීම, ළමා තරුණ වයසේදීම මියගිය, අතීත රූපයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකින්න.

අතීතයේ ඔබ සතර අපායන්ට වැටිලා අලියෙක්, කොටියෙක්, ප්‍රේතයෙක්, ප්‍රේතියක්, මහා සාගරයේ අසුරයෙක්, තිරිසනෙක් වෙලා ඉපදුන වෙලාවේ ඔබ ලැබූ රූපයන් අනිත්‍යවී ගිය හැටි නුවණින් දකින්න. අතීතයේ ඔබ මනුෂ්‍යකුලවල ඉපදිලා, සත්ත්ව කුලවල ඉපදිලා මියගිය අවස්ථාවලදී එකතු වූ මළකඳන් එක ගොඩක් ගැහුවොත්, එම මළකඳන්ගොඩ ගිජ්ජකූට පර්වතයට වඩා උසයි කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. පින්වත් ඔබ ගිජ්ජකූට පර්වතය සිතින් මවාගෙන අතීත රූපයන්ගෙන් ගොඩනැගුණු ඔබේ මළකඳන් ගොඩ නුවණින් දකින්න. පින්වත් ඔබ දෙපා තබාගෙන සිටින මහපොළොවේ පස, අතීතයේ ඔබේ රූපයන් නමැති සතර මහා ධාතුවේ ම අනිත්‍යභාවයෙන් සැදුණු සතරමහා ධාතුවක් බව නුවණින් දකින්න. පින්වත් ඔබ මහපොළාව මත දෙපා තබන සෑම පියවරක් පාසාම, ඔබ දෙපා තබන්නේ ඔබේම අතීත රූපයන්ගේ අනිත්‍යභාවයෙන් ගොඩනැගුණු මළකඳන් ගොඩ මතම බව නුවණින් දකිමින් පියවර තබන්න.

මේ ඔබ දකින්නේ අතීත රූපස්කන්ධයේ අනිත්‍යභාවයයි. පින්වත් ඔබට මේ ජීවිතයේදී ලැබුණු ඔය ඇස්දෙක වගේ ඇස් කෝටි කීයක් සංසාරයේ ඔබ ලබන්න ඇතිද? පින්වත් ඔබට මේ ජීවිතයේදී ලැබුණු කන්දෙක වගේ කන් කෝටි කීයක් සංසාරයේ ඔබට ලැබෙන්නට ඇතිද...

අතීතයේ ඉපදුනා වූ සෑම ඇසක්, කනක්, දිවක්, ශරීරයක්ම වෙනස් වී ගිය හැටි, අභිමිවී ගිය හැටි, පටිච්ච සමුප්පන්නව නැවත ඉපදුන හැටි නුවණින් දකින්න. ඒ ඔබ දකින්නේ අතීත රූපස්කන්ධයේ අනිත්‍යභාවයයි. අතීතයේ කොතැනකවත් වෙනස් නොවූ ජරා, ව්‍යාධි, මරණවලට පත්නොවූ රූපයක් නම් තිබුණේ නැහැ යැයි දකිමින් අතීත රූපස්කන්ධය අනිත්‍යයි වශයෙන් දකින්න.

අතීත රූපස්කන්ධය අනිත්‍යවී ගියානම්, වර්තමාන රූපයත් අනිත්‍යනම්, පින්වත් ඔබ 'මට අනාගතයේදී මෙවැනි රූපයක්

ලැබේවා’ කියලා, මට ලස්සන රූපයක් ලැබේවා, නිරෝගී රූපයක් ලැබේවා. ජරා ව්‍යාධි මරණයන් නැති රූපයක් ලැබේවා බලාපොරොත්තුවක් ඇතිකරගතහොත්, එම බලාපොරොත්තුව නිත්‍යවේද? අනිත්‍යවේද? පින්වත් ඔබ ‘මට අනාගතයේදී මෙවැනි සශ්‍රීක දිව්‍ය ජීවිතයක්, බ්‍රහ්ම ජීවිතයක්, මනුෂ්‍ය ජීවිතයක් ලැබේවා කියලා බලාපොරොත්තුවෙන් සිටිනවා නම්, එම බලාපොරොත්තු නිත්‍යවේද? අනිත්‍යවේද? අතීතයේ සක්විති රජවෙලා, ශක්‍රදෙවියන් වෙලා, තිබුණු රූපයනුත් අනිත්‍ය වී ගියානම්, අනාගතයේ බලාපොරොත්තුවන දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය රූප හුදු මායාවක් පමණක්මයි.

පින්වත් ඔබ විවේකීව සිටිනකොට, නිරතුරුවම අතීත, වර්තමාන, අනාගත වශයෙන් රූපයේ අනිත්‍යභාවය, රූපයට උරුම වූ ජරා, ව්‍යාධි මරණ ලක්ෂණ නුවණින් දකිමින් රූපය කෙරෙහි මමත්වයේ දැඩිභාවය සියුම් කොටගන්න. පින්වත් ඔබට ‘මගේ රූපය’ කියන සංඥාව මතුවන හැම මොහොතකම, රූපය අනිත්‍යයි කියලා දකින්න. අනාගතයේ මම මේ විදිහේ රූපයක් ලබනවා කියලා සිතෙන සෑම මොහොතකම, රූපය අනිත්‍යයි කියලා දකින්න. අනාගතයේ පින්වත් ඔබ දිව්‍ය ජීවිත, බ්‍රහ්ම ජීවිත, මනුෂ්‍ය ජීවිත ලබලා, එම රූපයන් අනිත්‍යවන හැටි, විකෘතිවෙන හැටි, වෙනස්වෙන හැටි නුවණින් දකිමින් අනාගත රූපස්කන්ධය කෙරෙහි තෘෂ්ණාව සියුම්කොට ගන්න.

මේ මොහොතේ ලෝකයේ ජීවත්වෙන සෑම ජනප්‍රිය චරිතයකටම, ඔබේ ජීවිතය ආරෝපනයකොට දකිමින්, කුසලය නැමැති හේතුව නිසා, සකස් වුණු එම ජනප්‍රියභාවය, එම චරිත අනිත්‍යභාවයට පත්වෙන හැටි නුවණින් දකින්න. ලෝකයේ බලවත්ම රාජ්‍යයේ රාජ්‍ය නායකයාත්, දිව්‍ය තලයන්ගේ බලවතා වන ශක්‍ර දෙවියනුත්, බ්‍රහ්මලෝකයේ අධිපති මහා බ්‍රහ්මයාත්, ජරා, ව්‍යාධි, මරණයන්ට පත්වී එම රූපයන් වෙනස් වී යන ආකාරය නුවණින් දකිමින් වර්තමාන, අතීත, අනාගත රූපයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකින්න.

# කාලය මවනා වෙනසක යථාර්ථය විනිවිද දකින්න

(රූපය)

පින්වත් ඔබ ආධ්‍යාත්මික රූපයේ අනිත්‍යභාවය දකිනවා වගේම, බාහිර රූපයන් කෙරෙහිද එම අනිත්‍ය සංඥාව මතුකොට දකිමින් බාහිර රූපයන් කෙරෙහි තෘෂ්ණාව සියුම්කොට ගන්න. පින්වත් ඔබේ ඇසට, කනට, නාසයට, දිවට, ශරීරයට, මනසට අරමුණුවෙන්නා වූ සෑම බාහිර රූපයක්ම අතීත, වර්තමාන, අනාගත වශයෙන් අනිත්‍ය සංඥාවට ලක්කරන්න.

පින්වත් ඔබ සක්විති රජවෙලා, ඉපදුණු වේලාවේ මොන තරම් බාහිර රූපයන් මගේකොට ගෙන ජීවත්වෙන්න ඇතිද? සක්විති රජුට අයිතිවෙන සුරූපි ස්ත්‍රීරත්නය, ඍර්ධිමත් ඇතා, ඍර්ධිමත් අජානීය අශ්වයා, මහපොළොව යට තිබෙන ඕනෑම සම්පතක් දිවැසින් දැකිය හැකි පුරෝහිතයන්, මුළු ලෝකයම දිග්විජය කරන සක්විති රජුට දාව උපත ලබන පුතුන් දහස... මේ සෑම බාහිර රූපයක්ම අනිත්‍ය වී ගියා, අභිමිවී ගියා. පින්වත් ඔබ අතීතයේ ශක්‍ර දෙවියන්ව ඉපැදුණු වේලාවේ ඔබට ලැබුණු සුජම්පතී බිසව, වෛජයන්ති මාලිගාව, දිව්‍ය අප්සරාවන්, දිව්‍ය භෝජන.... මේ සෑම බාහිර රූපයක්ම වෙනස්වී ගියා. අභිමිවී ගියා. ඔබ අතීතයේ මනුෂ්‍ය ජීවිත ලබපු වේලාවේ ඔබට ලැබුණු අම්මලා, තාත්තලා, බිරින්දෑවරු, ස්වාමි පුරුෂයන්, දරුවන්, ඥාතීන්, දේපළ, ඉඩකඩම්, යාන වාහන වෙනස්වී ගියා. අනිත්‍ය වී ගියා.

වරක් පින්වත් මහත්මයෙක් විමසුවා, ඔබ වහන්සේ ගිහි ජීවිතයේදී විවාහ නොවී, පැවිදි වූයේ ඇයිද කියලා. භික්ෂුව ඒ මහත්මයාට ප්‍රකාශ කළේ 'මහත්තයෝ, මේ මනුෂ්‍ය ලෝකයේ ජීවත්වන සෑම පුරුෂයෙක්ම, ස්ත්‍රියක්ම අතීතයේ මට බිරිඳවෙලා, ස්වාමි පුරුෂයා වෙලා තිබෙනවා. මට පෙම්වතෙක්, පෙම්වතියක් වෙලා තිබෙනවා. මට අතීතයේ බිරිඳක්, ස්වාමි පුරුෂයෙක්, පෙම්වතෙක්, පෙම්වතියක් නොවූ කිසිම සත්ත්වයෙක් මේ ලෝක ධාතුවේ නැහැ. ඒ කියන්නේ මේ ලෝකයේ සිටින සෑම සත්ත්වයෙකුටම මම අතීතයේ ආදරය කරලා තිබෙනවා. විවාහ ගිවිසගෙන තිබෙනවා. ඒ නිසා මහත්තයෝ අතීතයේ ආදරය කර තිබෙන අයට නැවත ආදරය කරන්න යන එකේ තේරුමක් නැහැ. ඒ නිසාමයි මම පැවිදි වූයේ' කියලා.

අතීතයේ බිරින්දෑවරු, ස්වාමිපුරුෂයන්, පෙම්වතුන්, පෙම්වතියන් කියන බාහිර රූපයන් නිසා මම හෙළූ කඳුළු මහා සාගරයේ ජලයට වැඩියි. අතීතයේ බිරින්දෑවරු, ස්වාමිපුරුෂයන් අහිමිවීම නිසා, අතහැරයෑම නිසා, සිත්රිදවීම් නිසා, අන්‍ය සැමියන් බිරින්දෑවරු සමග එක්වී දුන් කායික මානසික පීඩාවන් නිසා, මරාදැමීම් නිසා, කාමය වරදවා හැසිරීම් නිසා, විරහ වේදනාවන් නිසා, අතීතයේ බාහිර රූපයන් මගේ කරගැනීම නිසා මම හෙළා ඇති කඳුළුයි මහා සාරගයේ ජලකඳ දකින විට භික්ෂුවට සිහිපත් වෙන්නේ.

අතීත භවයන්හිදී පින්වත් ඔබ ධනය, බලය, තනතුරු, දේපළ නැමැති බාහිර රූපයන් කෙරෙහි තෘෂ්ණාවෙන් ඒවා අයිතිකොට ගැනීමට යෑම නිසා, මොනතරම් රාජ දඬුවම් ලබන්නට ඇතිද. හිසගැසුම් කන්නට ඇතිද. අතපය කපා දැමීම්, උලතැබීම්වලට ලක්වෙන්න ඇතිද? සතර අපායන්ට වැටිලා මොන තරම් දහදුක් විඳින්නට ඇතිද. බාහිර රූපයන් කෙරෙහි පින්වත් ඔබ ඇතිකොටගත් තෘෂ්ණාව පින්වත් ඔබට අතීතයේ කර ඇති විනාශය නුවණින් දකින්න. අපි නිතරම අතීත බාහිර රූපස්කන්ධය ආශ්වාදයක්කොට ගන්නවා. 'මගේ තාත්තා හිටපු

නායකයෙක්. අසවල් රජතුමා අපේ ඥාතියෙක්. අපේ අහවලා සභාපති කෙනෙක්, ලේකම් කෙනෙක්, විදුහල්පති කෙනෙක්. මගේ තාත්තා ලොකු දේපළ හිමි ධනවතෙක්. මගේ තාත්තා උගතෙක්. අතීතයේ මගේ රට පෙරදිග ධාන්‍යාගාරයක්....' මේ සංස්කාරයන් අපට අයිති නැති බව, වෙනස්වූ බව අපි දකින්නේ නැහැ. එම නිසා පින්වත් ඔබ අතීත බාහිර රූපස්කන්ධයේ අනිත්‍යභාවය නිරතුරුවම නුවණින් දකින්න.

අතීතයේ ඔබේ ඇසෙන් බුදුරජාණන් වහන්සේලා කොතෙක් නම් දකින්නට ඇතිද? පසේබුදුරජාණන් වහන්සේලා, මහරහතුන් වහන්සේලාගේ රූපයන් කොතෙක් නම් දකින්නට ඇතිද. ඒ සෑම බාහිර රූපයක්මත්, එම රූපයන් දුටු ඔබේ ආධ්‍යාත්මික රූපයනුත් නිරතුරු වෙනස් වීම නිසා අනිත්‍ය වී ගියා. අතීත රූපස්කන්ධයේ අනිත්‍යභාවය ආධ්‍යාත්මික, බාහිර වශයෙන් අර්ථවත්ව නුවණින් දකින පින්වතා වර්තමාන, අනාගත, රූපය කෙරෙහි තෘෂ්ණාව සියුම්කොට ගන්නවා. භික්‍ෂුව ඉහතින් සඳහන් කළේ, පංච උපාදානස්කන්ධයට අදාළව රූපයේ අතීත, වර්තමාන, අනාගත වශයෙන් අනිත්‍ය සංඥාව මතුකොටගන්නා ආකාරයයි.

(රූපයට අදාල කොටස මෙතනින් නිමවේ.)

# අනිත්‍යය නොදැක අනාගතය රැස්කරන අදක්ෂයෙක් නොවන්න

**(ඵස්සය)**

පංච උපාදානස්කන්ධ ක්‍රියාවලියට අදාළව මීළඟ ධර්මතාවය තමයි ඵස්සය. ඵස්සය කියලා කියන්නේ කාරණා තුනක එකතුවට. එම කාරණා තුන තමයි, ආධ්‍යාත්මික රූපය, බාහිර රූපය සහ විඥ්ඥානය. ඉහත කාරණා තුනේ එකතුවෙනුයි ඵස්සය කියන ධර්මතාවය සකස් වෙන්නේ.

ඵස්සය කියලා කියන්නේ දැක්කා, ඇසුණා, දැනුණා... කියන අර්ථයයි. බුදුරජාණන් වහන්සේ බාහියදාරුචීරියට දේශනා කරනවා 'ඇසෙන් දැක්ක දේ දැක්කාය කියන තැන නවතින්න. කනට ඇසුණ තැන 'ඇසුණා'ය කියන තැන නවතින්න. සිතට දැනුණු දෙය 'දැනුණා'ය කියලා නවතින්න. දකින දෙය, ඇසුණු දෙය, දැනෙන දෙය නිරතුරුවම අනිත්‍යභාවයට පත්වෙනවා නම්, මේ ධර්මතාවයන්ට බැඳෙන්න එපා කියලා බුදුරජාණන් වහන්සේ බාහියට කෙටි කමටහනක් වශයෙන් දේශනා කරන්නේ.

පින්වත් ඔබ, ඇස, කන, නාසය, දිව, ශරීරය යන ඔබේ ආධ්‍යාත්මික රූපයන්ට බාහිර රූපයන් ඵස්සයවන මොහොතේම, එම ඵස්සය අනිත්‍ය වශයෙන් දකින්න. මේ ඵස්සය කියන ධර්මතාවයන් අතීත, වර්තමාන, අනාගත වශයෙන් ඔබ අනිත්‍යය ලෙස දකින්න දක්ෂවෙන්න ඕනේ.

ඔබ වර්තමානයේ ඇසෙන් යම් රූපයක් දැක්කා නම්, එම රූපය නිත්‍යද? අනිත්‍යද?

පින්වත් ඔබ වර්තමානයේ, කනෙන් යම් ශබ්දයක් ඇසුවා නම්, නාසයට යම් ගඳ සුවඳක් දැනුණා නම්, එම දැනීම නිත්‍යද? අනිත්‍යද? වර්තමානයේ පින්වත් ඔබ මේ කුමක්ද කරමින් ඉන්නේ. අනිත්‍යවන, වෙනස්වන, ඵස්සය නිත්‍ය වශයෙන් ගන්න. වර්තමාන ඵස්සය නිත්‍ය වශයෙන් ගැනීම නිසාම, සෑම නිමේශයකදීම වර්තමානය අතීතය වෙත ගලාගෙන යන්නේ, අනාගතයට සංස්කාරයන් රැස්කරදීලා. ඒ අනාගතයත්, යම් දවසක වර්තමානයක් බවට පත්වෙලා, නැවත අනාගතයට සංස්කාරයන් රැස්කොටදී අතීතයට එකතුවෙනවා. වර්තමාන ඵස්සය අනිත්‍ය වශයෙන් නොදන්න පින්වතා නිරතුරුවම අනාගතය රැස්කර ගන්නා අදක්ෂයෙක් වෙනවා. පින්වත් ඔබ වර්තමානයේ ඇසෙන් රූපයක් දැක්කොත්, ඒ ක්ෂණයෙන්ම රූපය අනිත්‍යයි කියලා දකින්න දක්ෂවෙන්න. රූපය ගැන හැඩතල මවන්න යන්න එපා. ඔබ කැමති, අකමැති ශබ්දයක් ඇසෙනකොට, අනිත්‍යයි කියලා දකින්න. පංච උපාදානස්කන්ධ ධර්මයේ ඵස්සය කියන ධර්මතාවය අනිත්‍ය වශයෙන් නොදකින සෑම මොහොතකම පින්වත් ඔබ අනාගත භවයට රැස්කර ගන්නෙක් වෙනවා.

පින්වත් ඔබ වර්තමානයේ දකින දෙය, ඇසෙන දෙය, දැනෙන දෙය, සිතෙන දෙය අනිත්‍ය වශයෙන් දකින මොහොතක් පාසා, ඔබ වර්තමාන ඵස්සයේ අනිත්‍යභාවය දකින පින්වතෙක් වෙනවා. පින්වත් ඔබ දෑස් පියාගෙන ඵස්සයේ අනිත්‍යභාවය දකිමින් ජීවත්වෙන්න. වර්තමාන ඵස්සය කෙරෙහි කලකිරීම් ඇතිකොටගන්න.

භික්ෂුව වරක් පෞද්ගලික බස් රථයකින් දුර බැහැර පළාතකට වැඩම කරනකොට අතරමගදී තවත් පින්වත් ස්වාමීන් වහන්සේ නමක් බස් රථයට ගොඩවී භික්ෂුව අසළින්ම වැඩ සිටියා. උන්වහන්සේත් ආරණ්‍යයකට වඩින ස්වාමීන් වහන්සේ නමක්. බස් රථයේ සිටි තරුණ කොන්දොස්තර මහත්මයා කැසට් රේඩියෝව

ටිකක් ශබ්දයෙනුයි දමා තිබුණේ. ඒ වෙලාවේ වාදනය වෙමින් පැවතියේ වේගරිද්ම සිංදුවක්. භික්ෂුව ගිහි කාලයේ එම සිංදුවට ගොඩාක් ආසයි. මඟුල්ගෙවල්වලදී මම ඒ සිංදුවට ගොඩක් නටලා තිබෙනවා. භික්ෂුව පෞද්ගලික බස් රථයේ මේ වේගරිද්ම සිංදුව ඇසෙනකොට, භික්ෂුවට අතීත පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවයයි සිහිපත් වුණේ. සිංදුවට කන් යොමාගෙන නිහඬව අතීතයේ නැටුම්, ගැයුම්, වැයුම් අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකිමින් සිටියදී එක පාරටම භික්ෂුව අසල වැඩ සිටි අනෙක් ස්වාමීන්වහන්සේ ආසනයෙන් නැගිට කේන්තිගිය ස්වභාවයෙන් කොන්දොස්තර මහත්මයාටත්, රියදුරු මහත්මයාටත් බැණ වැදුනා වහාම කැසට් රේඩියෝව වසාදමන්නයි කියලා. එම ස්වාමීන් වහන්සේගේ ආවේගශීලී ක්‍රියාව දැක භික්ෂුව දැක්ක දෙය, ඇසුණ දෙය, අනිත්‍ය වශයෙන්මයි දකිමින් සිටියේ. මේ මොහොතේත් භික්ෂුවට එම සිද්ධිය අනිත්‍ය වූ ඵස්සයක් පමණක්මයි. එම සිද්ධිය සිද්ධවෙන අවස්ථාවේදී එම ස්වාමීන් වහන්සේ ඒ ආවේගශීලී සිද්ධියට භික්ෂුවවත් හවුල් කරගන්න උත්සාහ කළා. භික්ෂුව උන්වහන්සේට ප්‍රකාශ කළේ 'ස්වාමීන් වහන්ස, අපට ලෝකය හදන්නට බැහැ. අකීකරු ලෝකය දෙස බලලා, ඔබ වහන්සේ හැදෙන්න'ය කියන කාරණයි. අකීකරු ලෝකය දෙස බලලා, ඔබ හැදෙන්නයි කියලා කියන්නේ ඵස්සය අනිත්‍ය වශයෙන් දකින්න කියන කාරණයයි.

පින්වත් ඔබ වර්තමාන ඵස්සය අනිත්‍ය වශයෙන් නොදකින තාත්කල්, ඔබට වර්තමාන අකීකරු ලෝකයෙන් ගැලවීමක් නම් ලැබෙන්නේ නැහැ.

# ඕනෑම අකීකරු ලෝක ධර්මයක් ඉදිරියේ නොසැලී සිටින්නට නම්...

**(ඵස්සය)**

ආධ්‍යාත්මික රූපයත් මාරයාම වූ කල, මීට උපකාරක ධර්මයන් සකස්කොටදෙන විඤ්ඤාණයත් මාරයා ම වූ කළ, මෙහි ඵලය වෙන, ඵස්සය කියන ධර්මතාවයත් මාරයාටම අයිති ධර්මතාවයක් බවට පත්වෙනවා. ඵස්සය පින්වත් ඔබ නිත්‍ය වශයෙන් ගන්නා මොහොතක් පාසා, පින්වත් ඔබ මාරයා, එසේත් නැතිනම් සංස්කාර ජීවිතයට එකතුකොටගත් භවගාමී පුද්ගලයෙක් වෙනවා. මෙය සටහන් තබන භික්ෂුව කවදාකවත් අකීකරු ලෝකය හදන්න යන්නේ නැහැ. අකීකරු ලෝකය තුළ භික්ෂුව කීකරුව ජීවත්වෙන්නේ අකීකරු ලෝකයෙන් ඇසෙන, දකින, දැනෙන, වර්තමාන ඵස්සය අනිත්‍ය වශයෙන් දැකීම නිසාමයි. පින්වත් ඔබටත්, අකීකරු ලෝකය වටිනා කමටහනක් බවට පත්වෙන්නේ වර්තමාන ඵස්සය අනිත්‍ය වශයෙන් දැකීම තුළින්මයි. වර්තමාන ඵස්සයේ අනිත්‍යභාවය දකින පින්වතා, ඕනෑම අකීකරු ලෝක ධර්මයක් ඉදිරියේ නොසැලී සිටින ශක්තිමත්භාවය ලබනවා.

සමහර දෙමව්පියන්, ගුරුවරුන් අපට කියනවා 'මේ දරුවාව මට පෙන්නන්න බැහැ' කියලා 'අහවල් මනුෂ්‍යයා මට පෙන්නන්න බැහැ' කියලා. ඇයි මෙහෙම වෙන්නේ? වර්තමාන ඵස්සය මගේ කොට ගන්නවා. ඵස්සය තුළ මම සිටිනවාය කියලා ගන්නවා. ඵස්සය මගේ ආත්මය කොට

ගන්නවා. උවමනාවෙන්ම මාරධර්මයන්ට ආහාර, පෝෂණය ලබාදෙනවා. වර්තමාන ඵස්සයේ අනිත්‍යභාවය දකින පින්වත් ඔබ අතීත ඵස්සයේද අනිත්‍යභාවය දකින්න. පින්වත් ඔබ ඔබේ ඇස්දෙකෙන් මුලින් දැක්කේ කුමක්ද? ඔබේ අම්මාගේ රූපයයි. ඒ දැක්ක අම්මා, තාත්තා, සහෝදරයා, සහෝදරිය, ආච්චී, සීයා, තොටිල්ල, සේල්ලම් බඩු, ළදරු පාසල, පාසල, විශ්වවිද්‍යාලය.... මේ සෑම ඵස්සයක්ම අනිත්‍ය වී ගියා. වෙනස් වී ගියා. විකෘති වී ගියා. අතීතයේ ඔබ දැක්ක ඔබේ මහගෙදර, මහ ඉඩම අනිත්‍ය වී ගියා. වෙනස් වී ගියා. අහිමි වී ගියා.

පින්වත් ඔබට කනෙන් මුලින්ම ඇසුණා වූ ශබ්දය ඔබට මතකද? ඔබ මවුකුසෙන් එළියට එන වේලාවේ, ශල්‍යාගාරයේදී ඔබ නැගූ ඔබේම කෑගැසීමේ හඬයි ඔබ මුළින්ම ඇසුවේ. දෙවැනිව ඔබේ අම්මාගේ දරු නැලවිලි, තාත්තාගේ සුරතල් බස්, අතීතයේ ඔබට ඇසුණා වූ සෑම ශබ්දයක්ම අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකින්න. ඊයේ දවසේ මොනතරම් රූපයන්, මොන තරම් ශබ්දයන් ඔබට දැනෙන්නට ඇතිද? පරිසරයෙන්, ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන් මේ ඇසුණු සෑම මිහිරි වූද ශබ්දයන් අනිත්‍ය වූ හැටි නුවණින් දකින්න. පින්වත් ඔබේ දිවට දැනුණ මුල්ම රසය මව්කිරිවල රසයයි. පින්වත් ඔබ මුලින්ම ඉඳුල්කට ගාපු දවසේ දැනුණු ආහාරයේ රසය අනිත්‍ය වූ හැටි නුවණින් දකින්න. ඔබේ නාසයට දැනුණ අම්මාගේ සුවඳ, අම්මාගේ ශරීරයේ උණුසුමේ පහස, සිනිඳු ඇතිරිලිවල පහස අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකින්න. ඊයේ දවසේ ඔබ ඇසූ සෑම ශබ්දයකම, සෑම දැනීමකම, සෑම සිතිවිල්ලකම අනිත්‍යභාවය නුවණින් දකින්න. මේ ඔබ දකින්නේ අතීත ඵස්සයේ අනිත්‍යභාවයයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ජීවිතයෙනුත් ඈතට අතීත ජීවිතවල ඵස්සයේ අනිත්‍යභාවය දකින්න කියලා. පටිච්ච සමුප්පන්නව ඉපදුන ඔබේ ඇසෙන්, ඔබ අතීතයේ කොපමණ නම්, බුදුරජාණන් වහන්සේලා දකින්න ඇතිද? පසේබුදුරජාණන් වහන්සේලා, මහරහතන් වහන්සේලා දකින්නට

ඇතිද ඒ උතුමන්ගෙන් කොපමණ නම් සද්ධර්මය අසන්නට ඇතිද. උන්වහන්සේලා නිසා මොනතරම් නම් ධර්මයේ ආශ්වාදයන් දැනෙන්නට ඇතිද. ඔබ ඒ අතීතයේ දැක්ක, ඇසුණ, දැනුණ සෑම ඵස්සයක්ම අනිත්‍ය වී ගියා. පිරිනිවී ගියා. අහිමි වී ගියා. අතීතයේ පින්වත් ඔබ සක්විති රජුවෙලා ඉපදුණු වෙලාවේ, ශක්‍ර දෙවියන් වෙලා ඉපදුණු වේලාවේ මොනතරම් අතිසුන්දර, සුඛෝපභෝගී, රූමත්, මිහිරි රූපයන්, ශබ්දයන්, ස්පර්ශයන් දකින්නට ඇසෙන්නට දැනෙන්නට ඇතිද. නමුත් ඒ අතීත සෑම ඵස්සයක්ම අනිත්‍ය වී ගියා. වෙනස් වී ගියා. විකෘති වී ගියා. දෑස් පියාගෙන, පින්වත් ඔබ දිව්‍ය තලවල ඉපදුණු වෙලාවේ ඔබ ලැබූ අසිරිමත් දිව්‍ය රූපයන්, දිව්‍ය භෝජන, දිව්‍ය නැටුම්, ගැයුම්, වැයුම් වෙනස් වී ගිය හැටි, අහිමි වී ගිය හැටි නුවණින් දකින්න. ඔබ සතර අපායන්නට වැටුණු වෙලාවේ සතර අපායන්හී ඔබ දැක්ක, ඔබට ඇසුණ, දැනුණ, ඔබේ සහෝදර සහෝදරියන්, ප්‍රෙත ප්‍රේතියන්ගේ, තිරිසන් සතුන්ගේ, අසුරයින්ගේ, නිරිසතුන්ගේ, අපුල රූපයන්, බියකරු ශබ්දයන්, අමිහිරි ස්පර්ශයන් අනිත්‍ය වී ගිය අතීත ඵස්සයේ යථා ස්වභාවය නුවණින් දකින්න.

දැන් පින්වත් ඔබට හොඳින්ම වැටහෙනවා ඇති ඔබ පටිච්ච සමුප්පන්නව පැමිණි අතීත භවයන්හීදී ඔබට ඇසුණාවූ, ඔබට දැනුණා වූ ඔබ දැක්කා වූ සෑම ඵස්සයක්ම අනිත්‍යයි කියලා.

# ඔබ ඇසුණ, දුටුව, දැනුණ තැන නැවතුනු බුදුන්ගේ දරුවෙක්මය

**(ඵස්සය)**

අතීතයේ, වර්තමානයේ, ඔබ දැක්කා වූ, ඇසුණා වූ, දැනුණා වූ සෑම ඵස්සයක්ම අනිත්‍ය නම්, අනිත්‍ය වී ගියා නම්, පින්වත් ඔබ ඔබේ ඇසෙන්, ඔබේ කනෙන්, ඔබේ දිවෙන්, නාසයෙන්, ශරීරයෙන්, මනසින් 'මට අනාගතයේදී මෙවැනි දේ දකින්නට ලැබේවා, අසන්නට ලැබේවා, මට අනාගතයේ මෙවැනි මටසිළුටු දැනීම් ලැබේවා' කියලා ඔබ යම් බලාපොරොත්තුවක් ඇතිකර ගතහොත්, එම බලාපොරොත්තුව නිත්‍යවේද, අනිත්‍යවෙයිද? අතීතයේ, වර්තමානයේ ඔබ දැක්කා වූ, ඇසුණා වූ, දැනුණා වූ සෑම ධර්මතාවයක්ම වෙනස් වී ගියා නම්, විකෘති වී ගියා නම්, ජරා ව්‍යාධි මරණ බවට පත් වී ගියානම්, අනාගතයේ ඔබ දකින්නට, අසන්නට, දැනෙන්නට බලාපොරොත්තුවන සෑම ඵස්සයක්ම අනිත්‍යයි, අනිත්‍යයි, අනිත්‍යයි.... වශයෙන් දකිමින් අතීත, වර්තමාන, අනාගත ඵස්සය කෙරෙහි අවබෝධයෙන් යුතුවම කලකිරීම ඇතිකොටගන්න. ඵස්සය කියන ධර්මතාවය නිත්‍යභාවයෙන් ගැනීම නිසාම, ඵස්සය මගේ කොට ගැනීම නිසාම, සංසාරය පුරාවට ඔබ වින්දා වූ දුක් කන්දරාව නුවණින් දකින්න.

ඵස්සයේ අනිත්‍යභාවය පුහුණු නොකිරීම නිසාම, අතීතයේ ඔබ මියගිය සෑම ජීවිතයකදීම, කුසලය නිසා හෝ අකුසලය නිසා, ඔබට අරමුණුවන චුති සිතට ඔබ බැඳී යනවා. කුසලය

නිසා ඔබට ඵස්සය වන දිව්‍ය රූප, දිව්‍ය ආලෝක, දිව්‍ය මල් ගොමුවලට බැඳී යනවා. දිව්‍ය ශබ්ද, දිව්‍ය තූර්යවාදන හඬට, දිව්‍ය පිරිත්, පිරිත් සජ්ඣායනයට, අවසාන චුති සිතේදී බැඳී යනවා. දැක්ක දෙය, ඇසුණු දෙය, දැනුණු දෙය, අනිත්‍ය වූ ඵස්සයක්ය කියලා දකින්න දක්ෂ නැහැ. මැරෙන වෙලාවේ අවසාන චුති සිතට, ඔබේ ගේදොර, ඉඩකඩම්, බිරිඳ, දරුවන්, මුණුපුරන් දැක්කොත්, ඔබ එම රූපයන්ට බැඳී නිවසේම, ඉඩමේ ම ප්‍රේත ජීවිතයක් ලබනවා.

ඔබේ චුති සිතට අරමුණු වූ රූපය දැක්කාය කියන තැන නවතින්න ඔබ දක්ෂවුණේ නැහැ. ඇයි අතීතයේ මෙහෙම වුණේ. ඵස්සයේ අනිත්‍යභාවය පුහුණු නොවීම නිසාමයි. ඵස්සය සකස්වීමට හේතුවන, රූපයේ අනිත්‍යභාවය නොවැඩුව නිසාමයි. පින්වත් ඔබට මේ ලැබුනාවූ ජීවිතයේදී අකුසල් අවම කොටගෙන, කුසලය ශක්තිමත්කොට ගන්නත්, කුසලයන් අකුසලයන් තුළින් සකස්වෙන අවසාන චුති සිත, අනිත්‍ය වශයෙන් දකින්නත්, වර්තමානයේ දකින, ඇසෙන, දැනෙන, සෑම ඵස්සයක්ම අනිත්‍ය වශයෙන් දකින්න පුහුණු වෙන්න. අතීත, වර්තමාන ඵස්සය අනිත්‍ය නම්, අනාගත ඵස්සයන් කෙරෙහි කළකිරීම ඇතිකොට ගන්න.

පංච උපාදානස්කන්ධ ධර්මයේ තීරණාත්මක ධර්මතාවය තමයි ඵස්සය. ඵස්සය කියන ධර්මතාවය සකස් වෙන්නේ මාර බලවේග තුනක එකතුවෙන්. ආධ්‍යාත්මික රූපය කියන්නේ මාරයා. බාහිර රූපය කියන්නෙත් මාරයා. විඥානය කියන්නෙත් මාරයා. මේ තියුණු මාර බලවේග තුන එකතුවයි, ඵස්සය කියන ධර්මතාවය සකස්කොට දෙන්නේ. ඵස්සය කියන ධර්මතාවය සකස්වීමේදී විඥානයේ ක්‍රියාකාරීත්වය අප්‍රකටව බලවත් වෙනවා. මේ අප්‍රකට ක්‍රියාකාරීත්වය නිසයි බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණය මැජික්කරුවෙක් වශයෙන් දේශනා කරන්නේ. ඵස්සය අනිත්‍ය වශයෙන් දැකීමෙන් භව නිරෝධය දෙසටත්, ඵස්සය නිත්‍යභාවයෙන් ගැනීමෙන් භවයටත් සත්ත්වයා බැඳ

තබන නිසා, සත්ත්වයා භවයට ගාල්කිරීම උදෙසාම මාර බලවේග තුනක්ම, ඵස්සය ඉදිරියේ ශක්තිමත්ව සිටිනවා. පින්වත් ඔබ ඵස්සය නැමැති මේ මාර බලවේග තුනවන ආධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඥානයත් යන ධර්මතාවයන් තුනෙන් සකස්වෙන දැක්කා, ඇසුණා, දැනුණා, සිතුණා කියන ධර්මතාවයන් විවේකී මනසකින් යුතුව නිවැරදිව හඳුනාගෙන ඵස්සය අනිත්‍ය වශයෙන් දැකීමට පුහුණුවීම පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් දැකීමටත්, ඒ දැකීම තුළින්ම උතුම් අධිගමයන් සාක්ෂාත්කොට ගැනීමටත් එකම මාර්ගය වෙනවා.

පින්වත් ඔබ ඵස්සය නැමති ධර්මතාවයේ අනිත්‍යභාවය ශක්තිමත්ව දැකීමට නම්, රූපයේ අනිත්‍යභාවය දැකීම පුහුණු කරන්නටම වෙනවා. රූපයේ අනිත්‍යභාවය දකින්නේ නැතිව, ඵස්සයේ අනිත්‍යභාවය දකින්නට අපහසු වෙනවා. රූපයේ අනිත්‍යභාවය පින්වත් ඔබ මුලින්ම දකින්න. පින්වත් ඔබ රූපය කෙරෙහි අවබෝධයෙන් කලකිරෙනකොට විඥානයේ ක්‍රියාකාරීත්වයට ඔබ අභියෝග කළා වෙනවා. මේ හේතුඵල ධර්මයයි, පින්වත් ඔබට ඵස්සයේ අනිත්‍යභාවය දැකීම සහතිකකොට දෙන්නේ.

බුදුරජාණන් වහන්සේ දේශනාකර ඇති, ස්වක්ඛාත ඥානය කියන්නේ මේ සෑම ධර්මතාවයක්ම අනුපිළිවෙලට, එක පියවරක් වැඩෙනකොට අනිත් පියවර වැඩෙන ආකාරය, එක පියවරක් නිරෝධය වන විට අනිත් පියවර නිරෝධය වන ආකාරය හේතුඵල ධර්මතාවයන්ට යටත්වයි ධර්මය දේශනාකොට තිබෙන්නේ. එම නිසා පින්වත් ඔබ රූපයේ අනිත්‍යභාවය පුහුණු කිරීමෙන් ලබන ඵලයන් තුළින්මයි ඵස්සයේ අනිත්‍යභාවය දකින්න ශක්තිය සකස්කොට දෙන්නේ.

පින්වත් ඔබ පටාචාරාව පිස්සියක් සේ නිරුවතින් බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි අවස්ථාවේදී, මේ දර්ශනය දැක දායක පිරිස කලබලකාරීවෙද්දී 'දැක්කාය' කියන තැන නැවතී සිට බුදුරජාණන් වහන්සේව සිහිපත්කොට ගන්න. අන්‍ය ශාස්තෘවරු

බුදුරජාණන් වහන්සේට අභූත චෝදනා එල්ලකොට චරිත ඝාතනයක් සිදුකරද්දී මේ සෑම අභූත චෝදනාවක් ඉදිරියේම 'ඇසුණා' කියනතැන නතරවී සිටි බුදුරජාණන් වහන්සේව සිහිපත්කොට ගන්න. දේවදත්ත හිමි, ගල්පරයක් පෙරලා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරය තුවාල කිරීමේදී දැනුණු ඒ කටුක වූ වේදනාව ඉදිරියේ දැනුණාය කියන තැන නැවතී සිටි බුදුරජාණන් වහන්සේ සිහිපත්කොට ගන්න.

රූපය කෙරෙහි තෘෂ්ණාව නිරෝධය කළ තැන, විඥානයේ ක්‍රියාකාරීත්වය අහිමිවෙලා යනවා. ඒ නිසාම එවැනි උතුමන්ට දැක්කා, ඇසුණා, දැනුණා යන ධර්මතාවයන් හුදු අනිත්‍ය වූ ඵස්සයක් පමණක්ම වෙනවා.

(ඵස්සයට අදාළ කොටස මෙතැනින් නිමවේ)

# සත්ත්වයා භවයට ගාල් කිරීමේ මුල් පියවර - වේදනාව

**(වේදනාව)**

ආධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඥ්ඥාණයත් මුසුවීමෙන් 'ඵස්සය' (ස්පර්ශය) කියන ධර්මතාවය සකස් වුණා. ඵස්සය හේතුවෙන් සකස්වෙන ඵලය තමයි වේදනාව.

'ඵස්ස පච්චයා වේදනා. ඵස්ස නිරෝධා වේදනා නිරෝධා'

ඵස්සය තෘෂ්ණාවෙන් තෙත්කිරීම නිසා සකස්වෙන ඵලය තමයි, වේදනාව. නැතිනම් විඳීම කියන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සැප වේදනාව, දුක් වේදනාව, උපේක්ෂා සහගත වේදනාව කියලා තුන් ආකාරයක වේදනාවක්. සැප, දුක්, උපේක්ෂා කියන විඳීම් තුනම නිරෝධය කරන්නේ රහතන් වහන්සේයි. රහතන් වහන්සේ දැක්ක දෙය, ඇසුණ දෙය, දැනුණ දෙය තෘෂ්ණාවෙන් තෙත් නොකරන නිසා, විඳීම නිරෝධය වෙලා යනවා. සමහර පින්වතුන්ලා කියනවා රහතන් වහන්සේට විඳීම තිබෙනවාය කියලා. මේ කාරණය නිවැරදිව තේරුම්ගන්න නම්, වේදනාව කියන වචනයේ සැබෑම අර්ථය තේරුම්ගන්නට ඕනේ. වේදනාව කියන අර්ථයට අදාළ ඇලීම, ගැටීම, උපේක්ෂාව කියන කාරණා තුන තුළම තෘෂ්ණාව බැසගෙන තිබෙනවා. රහතන් වහන්සේ කියන්නේ තෘෂ්ණාව නිරෝධය කළ උත්තමයෙක්. එම නිසා රහතන් වහන්සේ කියන අර්ථය තුළ වේදනාව කියන අර්ථය ප්‍රතික්ෂේප වෙනවා. ඉහත මතය දරන පින්වතුන්ලා ඵස්සයත්, වේදනාවත් කියන අර්ථ දෙක පටලවා ගෙනයි සිටින්නේ.

රහතන් වහන්සේ ටොෆියක් වළඳනවා යැයි සිතමු. රහතන් වහන්සේට එම ටොෆියේ රසය දැනෙනවා. ඒ වගේම රහතන් වහන්සේට උෂ්ණය සීතලය දැනෙනවා. අනුන් තමන්ට චෝදනාවක් කළත් රහතන් වහන්සේට එය ඇසෙනවා. රහතන් වහන්සේ බාහිර රූප දකිනවා. මෙතැනදී සිද්ධවෙන්නේ ඵස්සය. ඵස්සය කියන ධර්මතාවය රහතන් වහන්සේ තුළ සිද්ධවෙනවා. නමුත් රහතන් වහන්සේ දැක්ක දෙය, ඇසුණ දෙය, දැනුණ දෙය තෘෂ්ණාවෙන් තෙත් කරන්නේ නැහැ. මොකද උන්වහන්සේ රූපය කෙරෙහි විඤ්ඤාණය කෙරෙහි, තෘෂ්ණාව උතුම් ඥාන දර්ශන තුළින් ක්ෂය කරලයි සිටින්නේ. රහතන් වහන්සේ පැණි රසයක් වළඳනකොට උන්වහන්සේට පැණි රසයක් දැනෙනවා. නමුත් එම පැණි රස කෙරෙහි උන්වහන්සේ ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් සකස් කොටගන්නේ නැහැ. ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් සකස් නොවෙනවා කියන්නේ වේදනාවේ නිරෝධයයි. දැනුණා, ඇසුණා, දැක්කා කියන්නේ ඵස්සයයි. දැනුණ දෙය, ඇසුණ දෙය, දැක්ක දෙය තෘෂ්ණාවෙන් තෙත් කිරීමයි වේදනාව කියන්නේ.

රහතන් වහන්සේ තුළ ඵස්සය කියන ධර්මතාවය නිරතුරුවම සිද්ධවෙනවා. රහතන් වහන්සේ අවබෝධ ඥානයෙන්ම ඵස්සයේ අනිත්‍යභාවය දකින නිසා, වේදනාව රහතන් වහන්සේ තුළ නිරෝධය වූ ධර්මතාවයක් වෙනවා. ආධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත් කියන තියුණු මාර ධර්ම තුනක් විසින් සත්ත්වයා භවයට ගාල් කිරීමේ ක්‍රියාන්විතයේ මුල් පියවරයි වේදනාව කියන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, වේදනාව තුළත් විඤ්ඤාණය බැසගෙන තිබෙනවාය කියලා. විඤ්ඤාණය නමැති අප්‍රකට මැජික්කරුවා පටිච්ච සමුප්පන්නව පැමිණි අතීත භවගමනේ කැමති, අකමැති උපේක්ෂා සහගත ධර්මතාවයන්, දැනීම් මතුකොට දෙමින් වේදනවා තුළ ක්‍රියාත්මකව සිටිනවා.

පෙර ජීවිතයේ ප්‍රභූ, මහේශාඛ්‍ය ජීවිතයක් ගතකරපු මහත්මියක් සිටිනවා. ඇය මේ ජීවිතයේ ඉපදිලා තිබුණේ ප්‍රභූ,

මහේශාඛ්‍ය පවුලක නොවෙයි. නාගරික මධ්‍යම පන්තික පවුලක. නමුත් මේ මහත්මියගේ හැසිරීමෙන්, ඇඳුමෙන් පැළඳුමෙන්, ඇවතුම් පැවතුම්වලින් නිරතුරුව පෙර ජීවිතයේ ප්‍රභූ මහේශාඛ්‍ය ගති ලක්ෂණ ප්‍රකට වෙනවා. සත්ත්වයාගේ වේදනාව තුළ පටිච්ච සමුප්පන්නව ගලාගෙන පැමිණෙන විඤ්ඤාණය බැසගෙන තිබෙනවා.

එක පින්වත් දරුවෙක් සිටිනවා, පුංචි කාලයේදීම එම දරුවා ගාථා කියනවා. අම්මාගේ දුඹුරුපාට සාරිය පෙරවාගෙන 'මම සාදු' 'මම සාදු' කියලා කියනවා. එම දරුවාගේ කැමැත්ත පන්සල් යන්නමයි. පටිච්ච සමුප්පන්නව ගලාගෙන එන විඤ්ඤාණය, දැනීම් මේ ජීවිතයේ විඳීම තුළ බැසගෙන තිබෙනවා.

එක පින්වත් දැරියක් සිටිනවා, ඇය ළමා කාලයේදීම තම දෙමාපියන්ට කියන්නේ 'මම හමුදාවට බැඳෙනවා ' කියලා. ඇය ළමා කාලයේදී බෝනික්කෙකුට වඩා, සෙල්ලම් පිස්තෝලයක් තුවක්කුවක් සමග සෙල්ලම් කරන්න කැමති. ළමා ඇයගේ ප්‍රියතම සෙල්ලම 'හොරා-පොලිස්' සෙල්ලමයි. ඇය පෙර ජීවිතයේදී කොටි යුද්ධය දරුණුව පැවති කාලයේ රට, ජාතිය, ආගම දැඩිලෙස උපාදානය කරගෙන සිට මියගිය සිංහල බෞද්ධ කාන්තාවක්. පටිච්ච සමුප්පන්නව ගලාගෙන පැමිණෙන විඤ්ඤාණය ඇයගේ වර්තමාන වේදනාව තුළ බැසගෙන සිටිනවා.

දැන් පින්වත් ඔබට තේරෙනවා ඇති, පටිච්ච සමුප්පන්නව ගලාගෙන එන විඤ්ඤාණය කියන ධර්මතාවය, සත්ත්වයාගේ විඳීම තුළ ක්‍රියාත්මකවන ආකාරය.

# සැපත්, දුකත්, උපේක්ෂාවත් අනිත්‍යයෙන් විනිවිද දකින්න

**(වේදනාව)**

මෙය සටහන් තබන භික්ෂුවගේ වසර 44 වන ගිහි ජීවිතය පුරාවට භික්ෂුව වැඩියෙන්ම අත්වින්දේ දුක් වේදනාවන්. මේ හැම දුක් වේදනාවක් තුළම, පටිච්ච සමුප්පන්නව ගලාගෙන පැමිණෙන, සංස්කාර පච්චයා විඤ්ඤාණ කියන ධර්මතාවය, මුසුවී තිබෙන බව පසුකාලීනව මට වැටහුණා. අතීත භවයන්හිදී පටිච්ච සමුප්පන්නව කරගත් අකුසල් විපාකයන්, දුක් වේදනාවන් හැටියට ජීවිතය ඉදිරියට පැමිණෙනකොට, දුක් වේදනාවට හේතුව ධර්මානුකූලව හඳුනාගෙන තිබුණු නිසාම, මා ඉදිරියට පැමිණි හැම දුක් වේදනාවක්ම, මම උපේක්ෂාව කියන තැනට ගන්න දක්ෂ වුණා. නමුත් ජීවිතයේ අත්වින්ද සැප වේදනාවන් නම් උපේක්ෂාව කියන තැනට ගන්න මම අපොහොසත් වුණා. එම නිසාම සැප වේදනාවන් තුළට නැවත නැවත කිඳාබසිමින්, එම සැම වේදනාවන්ද අසීමිතව අත්විඳීම තුළින්, දුක් වේදනාවන් බවට පත්කොටගත්තා. අන්න ඒ දුක් වේදනාවන් තමයි, දෙවැනුව උපේක්ෂාව කියන තැනට ගත්තේ. දැන් පින්වත් ඔබට වැටහෙනවා ඇති ගිහි ජීවිතයේදී මම සැම දුක්වේදනාවක්ම අකුසල් විපාකයක් වශයෙන් හඳුනාගෙන, සෑම දුක්වේදනාවක්ම ඉදිරියේ මම උපේක්ෂාව කියන තැනට පැමිණියා.

නමුත් මා අත්විඳි සැප වේදනාවන්, ඒවා කෙරෙහි ඇති තෘෂ්ණාව නිසාම, ධර්මානුකූලව දකින්න ශක්තිය තිබුණේ

නැහැ. සැප වේදනාවන් කෙරෙහි මා බැඳීගියා. මෙම තත්ත්වය මා ජයග්‍රහණය කළේ, සැම සැප වේදනාවක්ම නැවත නැවත අත්විඳීම තුළින්, ඇතිවෙන නීරසභාවය මතුකොටගෙන, සැප වේදනාවද දුක් වේදනාවක් බවට පත්කොටගෙන, එම දුක් වේදනාව අවසානයේ උපේක්ෂා විඳීමක් බවට පත්කොට ගත්තා. යම් පින්වතෙක් සැප වේදනාවත්, දුක් වේදනාවත් මුල් වටයේදීම අනිත්‍ය වශයෙන් දැකීමට යනවා නම්, එය ටිකක් අසීරු කාරණයක් වෙන්න පුළුවන්. එම නිසා පින්වත් ඔබ සෑම සැප වේදනාවක්ම, දුක් වේදනාවක්ම තම තමන්ගේ දක්ෂභාවයත්, උපක්‍රමශීලීභාවයත් උපයෝගිකොටගෙන, මුල්වටයේදී උපේක්ෂා විඳීම් බවට පත්කොට ගන්න. එය ඔබට පහසුවක් වෙනවා වේදනාවේ අනිත්‍යභාවය දැකීමට. ඒ වගේමයි පින්වත් ඔබ යම් සැප වේදනාවක්, දුක් වේදනාවක් අත්විඳීමේදී, එම විඳීම ධර්ම මනසිකාරයක් තුළ සිටිමින් අත්විඳීමට දක්ෂ නම්, එතැනදී පින්වත් ඔබට ශක්තිය ලැබෙනවා, එම සැප දුක් වේදනාවන්, උපේක්ෂා විඳීමක් බවට පත්කොටගන්න.

එක පින්වත් යුවලක් දිනක් කුටියට පැමිණ, භික්ෂුවට දානයක් පූජාකොට කුටියෙන් පිටත්වෙනකොට එම පින්වතිය ප්‍රකාශ කරනවා 'දැන් නම් මළත් කමක් නැහැ' ය කියලා. බලන්න දානය නැමැති සැප වේදනාවට බැඳී ගියා. මහා සංසරත්නයට දන් පූජා කරලා, වේදනාව නමැති මාරයාට බැඳිලා නිවසට යනවා. වරක් භික්ෂුව මුණගැහෙන්න පින්වතෙක් ඇවිල්ලා, එයට ඉඩ ප්‍රස්ථාව නොලැබීම නිසා එම පින්වතා භික්ෂුවට දෝෂාරෝපණය කරමින් ගිහින් තිබෙනවා. බලන්න මහා සංසරත්නය මුණගැහෙන්න ඇවිල්ලා, දුක් වේදනාව නමැති මාරයාට බැඳිලා නිවසට යනවා. දිනක් භික්ෂුව මුණගැහෙන්න පින්වතෙක් ඇවිල්ලා, එම පින්වතාට භික්ෂුව මගහැරීම නිසා, මම හෙට උදේට කොහොමහරි ඇවිල්ලා භික්ෂුව මුණගැහෙනවා කියලා ගිහින් තිබෙනවා. බලන්න මහා සංසරත්නය මුණගැහෙන්න ඇවිල්ලා, එම පින්වතා උපේක්ෂා වේදනාව කියන මාරයාට බැඳිලා ගෙදරට යනවා. මෙතැනදී උපේක්ෂා වේදනාව කියන්නේ තෘෂ්ණාවේ මදභාවය වුණත්,

උපේක්ෂාව තුළත් මාරයා බැසගෙන සිටිනවාය කියන කාරණය, පින්වත් ඔබ හොඳින් තේරුම්ගත යුතුයි. ඉහතින් සඳහන් කළ තෙවැනි මහත්මයා, ස්වාමීන් වහන්සේ හමුවීම මගහැරුණාය කියලා නොගැටී, නොඇලී 'හෙට උදේම ඇවිත් හමුවෙනවා'ය කියලා උපේක්ෂා සිතින් ගෙදර ගියා. නමුත් බලාපොරොත්තු සහගතව, හෙට උදෙත් ස්වාමීන් වහන්සේව මුණගැහෙන්න ඇවිත් ස්වාමීන් වහන්සේ මුණනොගැසුනොත්, අන්න උපේක්ෂා සහගත මාර සිත, ඔබව නැවතත් ගැටීමක්, එසේත් නැතිනම් දුක්වේදනාවකට යොමුකරනවා.

ඇයි පින්වත් ඔබට මෙහෙම වෙන්නේ? ඇලීමත්, ගැටීමත්, උපේක්ෂාවත් කියන සෑම විඳීමක්ම අනිත්‍ය වශයෙන් දැකීමට ඇති අදක්ෂභාවය නිසාමයි.

වරක් භික්ෂුව ස්වාමීන් වහන්සේ නමක් මුණගැහෙන්න ගිය අවස්ථාවක උන්වහන්සේ මෙහෙම ප්‍රකාශ කළා. 'ඔබ වහන්සේ දැන් ජනප්‍රියයි නේද? '

එයට භික්ෂුව හිනාවෙන් ප්‍රතිචාර දැක්වුවා.

'ඒ වුණාට ඔබ වහන්සේව හුඟක් අය විවේචනය කරනවා නේද? '

එම ප්‍රකාශයටත් භික්ෂුව මුවගට සිනාවක් නගාගත්තා.

'ඒ වුණාට ඔබවහන්සේ කටයුතු හොඳින් කරගෙන යන්න'

එම ප්‍රකාශයටත් භික්ෂුව සිහින්ව සිනාසුනා.

ඔබට සිතෙන්නට පුළුවන්, ඇයි භික්ෂුව බොහොම සෙමින්, ඉහත අදහස්වලට මුවගට නගාගත් සිනහවකින්ම පමණක් ප්‍රතිචාර දැක්වුවේ කියලා. භික්ෂුව දන්නවා මේ කතා කරන්නේ ඇලීම, ගැටීම, උපේක්ෂාව කියන තෘෂ්ණාවේ ඵලයක්ය කියලා. පින්වත් ඔබ මුහුණදෙන සෑම සැප, දුක්, උපේක්ෂා විඳීමක් ඉදිරියේම, අනිත්‍යයි කියන දැක්ම ඇතිකර ගැනීමට ඔබ දක්ෂනම්, එය වේදනාවේ අනිත්‍යභාවය පුහුණුකිරීමට හොඳ රුකුලක් වෙනවා.

# අතීතය සිහිනයක් පමණයි - වත්මනද ඒ වගේමයි

(වේදනාව)

වේදනාවේ අනිත්‍යභාවය පුහුණුවෙනකොට අතීත, වර්තමාන, අනාගත, වශයෙන් වේදනාවේ අනිත්‍යභාවය දකින්න පුහුණු වෙන්න ඕනේ. මුලින් වර්තමාන වේදනාවේ අනිත්‍යභාවය නුවණින් දකින්න. දැක්ක දෙය, ඇසුණ දෙය, දැනුණ දෙය තෘෂ්ණාවෙන් තෙත්කිරීම නිසා, වර්තමානයේ ඔබ තුළ සකස්වෙන සෑම සැප, දුක්, උපේක්ෂා සහගත විඳීමක්ම නිත්‍යද? අනිත්‍යද?

වර්තමානයේ සකස්වෙන සෑම විඳීමක්ම අනාගතයට සංස්කාරයන් රැස්කොටදීලා අනිත්‍යවෙලා යනවා. වර්තමානයට සිත යොමුකරලා, සකස්වෙන සෑම විඳීමකම අනිත්‍යභාවය නුවණින් දකිමින් අතීත වේදනාවන්ගේ අනිත්‍යභාවය නුවණින් මතුකොටගෙන දකින්න.

පින්වත් ඔබ ඔබේ අම්මාගේ මව්කුසේ ගර්භාෂ කුටියේ සිරවී සිටියදී, එම කලල රූපයට දැනුණ විඳීම් නිත්‍යද අනිත්‍යද? ඔබ ලෝකයට බිහිවෙන වේලාවේ ඔබට දනුණ දුක් වේදනාව නිත්‍යද අනිත්‍යද? වෙනස්වෙලා ගියා. අනිත්‍ය වී ගියා.

ඔබ මෙලොවට බිහි වූ මොහොතේ පටන් අම්මා, තාත්තා, ඥාතීන්, සහෝදරයන් නිසා සකස් වූ සෑම දුක්, සැප, උපේක්ෂා විඳීමක්ම අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකින්න. ඔබ පුංචි කාලයේදී අම්මා ඔබව නලවනකොට, අම්මාගෙන් කිරි උරා බොනකොට,

අම්මාගෙන් උණුසුම ලබනකොට, තොටිල්ලේ නැලෙවෙනකොට. සෙල්ලම් බඩු සමග සෙල්ලම් කරනකොට, ළදරු පාසලට යනකොට.... ඇතිවූ සෑම සැප වේදනාවක්ම අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකින්න. පාසල් ජීවිතය මොහොතක් සිහිපත්කොට ගන්න. ඔබ හාපුරා කියලා පාසලේ පළමු වසරට ඇතුළත් වූ දවස...මේ සෑම සැප වේදනාවක්ම සිහිනයක් පමණක්මයි. වෙනස් වී ගියා. අහිමි වී ගියා. අනිත්‍ය වී ගියා. ඔබේ උසස් අධ්‍යාපනය, මුල්ම රැකියාව, ව්‍යාපාරය, තාරුණ්‍යය, ආදරය, විවාහය, කුළුඳුල් දරු උපත... මේ සෑම සැප වේදනාවක්ම අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකින්න.

පින්වත් ඔබට අතීතයේ අම්මා, තාත්තා ගහනකොට, බණිනකොට, සැරකරනකොට, අසත්පුරුෂ මිතුරන් මුණගැසෙන කොට, අකමැති දේවල් සිදුවෙනකොට, අතීතයේ මොනතරම් දුක් වේදනාවන් අත්වෙන්නට ඇතිද? මේ සෑම දුක් වේදනාවක්ම අනිත්‍ය වී ගියා. වෙනස්වී ගියා. අතීතයේ පින්වත් ඔබ සැප, දුක් වේදනාවන්ට බැඳෙන්නේ නැතිව, සැප, දුක දෙකම උපේක්ෂාවෙන් දරාගෙන මොනතරම් ජීවත්වෙලා තිබෙනවාද. ඇලීම් ගැටීම් ඉදිරියේ මොනතරම් ඔබ උපේක්ෂාවෙන් යුතුව ක්‍රියාකොට තිබෙනවාද. ඒ සෑම අතීත උපේක්ෂා සහගත විඳීමක්ම අනිත්‍ය ව ගියා. අතීතයේ ඔබ අත්වින්දා වූ සෑම දුක්වේදනාවක්ම උපේක්ෂා සහගත විඳීමක්ම අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකින්න.

පින්වත් ඔබේ ඊයේ දවසට සිත යොමුකොට, දවස පුරා ඔබ තුළ සකස් වූ සෑම සැප වේදනාවක්ම, දුක් වේදනාවක්ම, උපේක්ෂා සහගත වේදනාවක්ම අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකිමින් වේදනාව අනිත්‍යයි.. අනිත්‍යයි.. අනිත්‍යයි වශයෙන් අර්ථවත්ව දකින්න. පුහුණු වෙන්න.

පින්වත් ඔබ වේදනාවේ අනිත්‍යභාවය පෙර භවයන්ට නුවණින් යොමුකරන්න. අතීත භවයන්හිදී ඔබ පැවිදි උපසම්පදාව ලබලා, දස දහස් ගණන් පින්වතුන් වටකොටගෙන ධර්ම දේශනා, පින්කම් පවත්වපු වේලාවේ, අතීතයේ ඔබ බුදුරජාණන් වහන්සේලා,

පසේ බුදුරජාණන් වහන්සේලා, මහරහතන් වහන්සේලා මුණ ගැහුණු වේලාවෙ ඇතිවූ සැප වේදනාවන් මනසින් මවාගන්න. අතීතයේ ඔබ සක්විති රජු වෙලා, මුළු ලෝකයම දිග්විජය කරනකොට, දිව්‍ය අප්සරාවක් බඳු ස්ත්‍රී රත්නය ඇසුරුකරද්දී, ඍර්ධිමත් අජානීය අසුපිට, ඇතුපිට ගමන්කරද්දී පින්වත් ඔබ මොනතරම් සැප වේදනාවන් ලබන්නට ඇතිද. අතීතයේ ඔබ ශක්‍ර දෙවියන් වෙලා, ලැබූ අසිරිමත් දිව්‍ය විදීම් දිව්‍ය අප්සාරවන්, දිව්‍ය නැටුම්, ගැයුම්, වැයුම්, දිව්‍ය භෝජන... මොනතරම් දිව්‍ය සැප වේදනාවන් ලබන්නට ඇතිද.

අම්මා, තාත්තා, ඥාතීන්, දරුවන්, සත්පුරුෂ ආශ්‍රයන් නිසා අතීත භවයන්හිදී මොනතරම් සැප වේදනාවන් ලබන්නට ඇතිද. මේ සෑම සැප වේදනාවක්ම වෙනස්වී ගිය හැටි, විකෘති වී ගිය හැටි, අනිත්‍යට ගිය හැටි නුවණින් දකින්න.

සංසාරයේ ඔබ ලැබූ සෑම සැප වේදනාවක්ම අනිත්‍ය වූ තැනදී, අසත්පුරුෂ ආශ්‍රයන් ලැබුණ තැනදී, අබුද්ධෝත්පාද කාලයන් මුණගැසුන අවස්ථාවන්හිදී, කල්ප විනාශයන්ට හසුවී ඉරවල් හතක උණුසුමට පිච්චි, පිච්චී මියගිය අවස්ථාවන්හිදී, සතර අපායන්ට වැටී ප්‍රේත ලෝකවල සෙම් සොටු කමින්, අකුසල් නිසාම ප්‍රේත ශරීර රිදුම් දෙමින් මොනතරම් කටුක දුක් වේදනාවන් විඳින්නට ඇතිද. තිරිසන් කුලවල ඉපදිලා, වෙනත් සතුනට ගොදුරුවීමෙන්, මිනිසුන් අමු අමුවේ අපිව මරාගෙන කෑමෙන් මොතරම් කටුක දුක් වේදනා සංසාරයේ විඳින්ට ඇතිද? නිරයන්ට වැටී පටිච්ච සමුප්පන්නව ඔබත් මමත් ගින්දර, ලෝධිය සමග වින්දාවූ සෑම දුක් වේදනාවක්ම වෙනස් වී ගියා. අතීත භවයන්හිදී කැමති දෙය සිද්ධ නොවෙනකොට, අකැමති දෙය සිද්ධ වෙනකොට, එම කැමැත්ත, අකමැත්ත කොච්චර නම් උපේක්ෂාවෙන් දරාගත්තා වූ අවස්ථා ඇතිද. ඒ සෑම අතීත උපේක්ෂා විඳීමක්ම අනිත්‍ය වී ගියා. පින්වත් ඔබට දැන් වැටහෙනවා. අතීතයේ, වර්තමානයේ ඔබ වින්දා වූ සෑම සැප, දුක්, උපේක්ෂා විඳීමක්ම අනිත්‍ය වී ගිය ධර්මතාවයන්ය කියලා.

# ඊළඟ මොහොත මේ මොහොතෙන් වෙනස් වන්නේ කුමක් නිසාද?

(වේදනාව)

අතීතයේ, වර්තමානයේ ඔබ වින්දාවූ සෑම සැප, දුක්, උපේක්ෂා වේදනාවක්ම අනිත්‍ය වී ගියානම්, අභිමි වී ගියානම්, අනාගතයේ රට, ජාතිය, ආගම නිසා අම්මා, තාත්තා, දරුවන් නිසා රැකියාව, ව්‍යපාරය නිසා මට මෙවැනි සැප වේදනාවක් ලැබෙනවා කියල බලාපොරොත්තු වෙනවා නම් එම අනාගත සැප වේදනාව නිත්‍ය වෙයිද? අනිත්‍ය වෙයිද? අනාගතයේ මම දෙවියෙක් වෙලා බ්‍රහ්මයෙක් වෙලා, සශ්‍රීක මනුෂ්‍යයෙක් වෙලා මෙවැනි සැප වේදනාවන් ලබනවාය කියල බලාපොරොත්තු වෙනවානම් එම සැප වේදනාවන් නිත්‍ය වෙයිද? අනිත්‍ය වෙයිද? අතීත වර්තමාන වේදනා ස්කන්ධය අනිත්‍ය වී ගියානම් අනාගතයේ ඔබ බලාපොරොත්තු වන විඳීම් අනිත්‍යවන ධර්මතාවයක්මයි. අතීතයේ, වර්තමානයේ සකස්වූ සෑම දුක් වේදනාවක්ම, උපේක්ෂා වේදනාවක්ම අනිත්‍ය වී ගියානම්, අනාගතයේ සකස්වෙන සෑම දුක් වේදනාවක්ම උපේක්ෂා වේදනාවක්ම අනිත්‍යයයි අනිත්‍යයයි වශයෙන් නුවණින් මෙනෙහි කරන්න.

අතීතයේ ශක්‍ර ජීවිතයේ සැප වේදනාවත් අනිත්‍ය වී ගියා නම්, මේ ජීවිතයේ සැප වේදනාද අනිත්‍යයි දකිමින්, සැප වේදනාවට නොඇලී ඉන්න. අතීතයේ සතර අපායෙන් විඳි, දුක් වේදනාවන් අනිත්‍ය වී ගියා නම් මේ ජීවිතයේ ඔබ විඳිනා දුක් වේදනාද අනිත්‍යයයි. එම නිසා දුක් වේදනාවන්ටත් ගැටෙන්න

එපා. සැප වේදනාවට නොඇලෙන තැන දුක් වේදනාවට නොගැටෙන තැන ඔබ ඉන්නේ උපේක්‍ෂා වේදනාව තුළයි. ඒ උපේක්‍ෂා වේදනාව ඔබ අනිත්‍යයි කියල අවබෝධ කරගන්නේ උතුම් අර්හත් ඵල අවබෝධය ලබන අවස්ථාවෙදියි.

ධර්ම මාර්ගයේ ගමන් කරන පින්වතුන්ලා කමටහනක් ඔස්සේ සිත තැන්පත් වෙනකොට එම සැප වේදනාවට බැඳී යනවා. සිත විසිරී යනකොට සිත විසිරීයාමේ දුක් වේදනාවට ගැටෙනවා. පින්වත් ඔබ නොවිසිරෙන, විසිරෙන සිතුවිලි ඉදිරියේ අනිත්‍යයේ අර්ථය මතුකරගනිමින් උපේක්‍ෂාව තුළටම පැමිණෙන්න දක්‍ෂවෙන්න ඕන. උපේක්‍ෂාව කියන අර්ථය තුළදියි ධර්මය ඔබ තුළ වැඩෙන්නේ. ධර්ම මාර්ගයේ අවසන් අදියරේදියි පින්වත් ඔබ උපේක්‍ෂාවේ අනිත්‍යභාවය දකින්නේ. එතෙක් උපේක්‍ෂාව ඔබව මාර්ගයේ ඉදිරියටම රැගෙන යාමට උපකාරක ධර්මයක්ම වෙනවා.

දැන් පින්වත් ඔබට වැටහෙනවා ඇති පංච උපාදානස්කන්ධයට අදාල වේදනාව කියන ධර්මතාවය, විඤ්ඤාණය බැසගෙන සිටින වේදනාව කියන ධර්මතාවය අනිත්‍ය වශයෙන් දැකීමට නම් පිටකොන්දේ වේදනාවට, දණහිසේ වේදනාවට වේදනාවයි වේදනාවයි සිත සිතා සිටීමෙන් පමණක් මේ වේදනාවට ඇති තෘෂ්ණාවේ ප්‍රශ්නය විසඳීමට නොහැකිබව. මාරයා මෙවැනි සීනිබෝල කමටහන් තුළ ඔබව සිරගතකර යථාර්ථය වසන්කිරීමට උත්සාහ කරන පංච උපාදානස්කන්ධ ලෝකයක් තුළ පින්වත් ඔබ අතීත, වර්තමාන, අනාගත වශයෙන් සැප, දුක්, උපේක්‍ෂා විඳීම්වල අනිත්‍යභාවය අර්ථවත්ව නුවණින් මතුකර ගනිමින් ඔබේ විවේකීභාවය වේදනාවේ අනිත්‍යභාවය දැකීම උදෙසා යොමුකරගන්න දක්‍ෂ වෙන්න.

(වේදනාවට අදාළ කොටස මෙතැනින් නිමාවේ.)

# හඳුනාගැනීම කාලයට අනුව වෙනස්වන හැටි දකින්න

(සංඥාව)

පින්වත් ඔබ පංච උපාදානස්කන්ද ධර්මයන්ට අදාළව ඇසෙන් රූපයක් දකිනවා. කනෙන් ශබ්දයක් අහනවා, නාසයට ගඳ සුවඳත් දැනෙනවා, දැක්ක දෙයට, ඇසුණ දෙයට, ඔබ ඇලෙනවා ගැටෙනවා උපේක්ෂා සහගත වෙනවා. ඇලුණ ගැටුණ උපේක්ෂා සහගත වුණ දෙයට ඔබ මොකද කරන්නේ. ඔබ හඳුනාගන්නවා. හඳුනා ගන්නවා කියල කියන්නේ සංඥාවට. වේදනාව නිසා සකස් වූ ඵලයයි සංඥාව හෙවත් හඳුනාගැනීම. 'වේදනා නිරෝධා සංඥා නිරෝධෝ'

පින්වත් ඔබ දැන් බොහෝම සියුම්ව ඔබ තුළ සිදුවන පංච උපාදානස්කන්ධ ක්‍රියාවලියට අදාළ මුල් සිදුවීම් පෙළ නුවණින් දකින්න. මුලින්ම ඔබ ඇසෙන් රූපයක් දකිනවා. දැක්ක රූපයට ඔබ ඇලෙනවා, ගැටෙනවා. නැතිනම් උපේක්ෂා සහගත වෙනවා. තෙවැනිව ඔබ එම රූපය හඳුනාගන්නවා. මේ මගේ තාත්තා, අම්මා, නංගී, මල්ලී කියල හඳුනාගන්නවා.

මනුෂ්‍යයෝ සියයක් සිටින තැන ඔබේ අම්මා සිටියොත් ඒ ක්‍ෂණයෙන්ම 'මේ මගේ අම්මා' කියල හඳුනාගන්නවා. මේ සුදුපාට, රතුපාට, නිල්පාට වශයෙන් හඳුනාගන්නවා. මොහු ජපන් ජාතිකයෙක්, මොහු ඇමරිකානු ජාතිකයෙක් වශයෙන් හඳුනා ගන්නවා. දැන් පින්වත් ඔබ නුවණින් මෙනෙහිකර බලන්න ඔබ වර්තමානයේ යම් රූපයක් ඇසෙන්, කනෙන්, නාසයෙන්,

දිවෙන්, මනසින් හඳුනාගත්තා නම් ඒ සෑම හඳුනා ගැනීමක්ම අනිත්‍යයයි නේද? මේ මොහොතේ මනුෂ්‍යයෙක් වශයෙන් හඳුනාගත් රූපයක් ඊළඟ මොහොතක දෙවියෙක්, ප්‍රේතයෙක්, තිරිසන් සතෙක් වෙන්න පුළුවන්. මේ මොහොතේ නිල් පැහැයට තිබෙන ආකාසය ඊළඟ මොහොතේ කලු පැහැගැන්වෙන්න පුළුවන්. මේ මොහොතේ ජපන් ජාතිකයෙක් ලෙස හඳුනාගත් රූපය, ඊළඟ මොහොතේ මියගොස් අප්‍රිකාණු ජාතිකයෙක් වෙන්න පුළුවන්. වර්තමානයේ පින්වත් ඔබ තුළ සකස්වෙන්නා වූ සෑම සංඥාවක්ම, හඳුනා ගැනීමක්ම වෙනස්වෙලා යනවා. අනිත්‍යවෙලා යනවා. විකෘතිවෙලා යනවා.

බුදුරජාණන් වහන්සේ, දේශනා කරනවා සංඥාව තුළත්, විඤ්ඤාණය බැසගෙන සිටිනවාය කියලා. එක පින්වත් දරුවෙක් සිටිනවා, එම දරුවා කුඩා ළමා කාලයේදීම කිසිම මස් මාංශ වර්ගයක් ගෙදරට ගෙනෙන්නට දෙන්නේ නැහැ. මේ දරුවාට මස් මාංශ හරිම පිළිකුල්. නමුත් කවුරුවත්ම ඒ දරුවට මස් මංශවල ගුණ අගුණ කියා දීලත් නැහැ. මස් මංශවලට අදාළ කිසිම දේශනයකට, පාඩමකට මේ දරුවා සවන් දීලත් නැහැ. දෙමාපියනුත් නිර්මාංශ පින්වතුන් නොවේ. නමුත් මේ දරුවා පෙර ජීවිතයේදී දැඩි නිර්මාංශ දෘෂ්ඨියක් ගත්ත පින්වතෙක්. දරුවාගේ වර්තමාන හඳුනාගැනීම් තුළ, පටිච්ච සමුප්පන්නව සකස්වෙන විඤ්ඤාණය බැසගෙන තිබෙනවා.

එක පින්වත් මහත්මයෙක් සිටිනවා, එම මහත්මයා ටිකක් විරූපී මහත්මයෙක්. ගොඩක් ප්‍රශ්න අතර සිරගත වූ මහත්මයෙක්. ඒ මහත්මයා ගින්දර සමග, ගිනි රස්නය සමග මුහුන් කරන රැකියාවක් තමයි තමන්ගේ ආදායම් මාර්ගය හැටියට සොයාගත්තේ. එක්කෝ පාන් බේකරියක, තේ කර්මාන්ත ශාලාවක දර උඳුන නැතිනම් යකඩ උණුකරන රැකියවාක්, කම්මල් රැකියාවක්. ගින්දරත් සමග කෙරෙන හඳුනා ගැනීම්වලට මොහු හරිම කැමැත්තක් දක්වනවා. මොහු පෙර ජීවිතයක දීර්ඝ කාලයක් ගිනි නිරයක සිට මනුෂ්‍ය ජීවිතයක් ලැබුව පින්වතෙක්.

පටිච්ච සමුප්පන්නව සකස්වෙන විඤ්ඤාණය, සංඥාව හඳුනා ගැනීම් තුළ බැසගෙන තිබෙනවා.

එක පින්වත් පිරිමි දරුවෙක් සිටිනවා. එම සිඟිති දරුවා, තමන් පිරිමින් යැයි හඳුනාගත් අයගේ අතට පමණයි යන්නේ. අම්මා ළඟ නැලවෙන්න, අම්මා ළඟ නිදාගන්න මේ දරුවා කැමති නැහැ. තාත්තාගේත් පිරිමි පක්ෂයේ ඥාතීන්ගේත් අතට තමයි මේ දරුවා වැඩිපුර යන්නේ. පිරිමි පක්ෂයේ හඳුනාගැනීම් වලටයි වඩාත් කැමති. මේ දරුවා පෙර ජීවිතයේ කාමයන්ට අදාළ ශිල්පද හොඳින් ආරක්ෂා කරගත් භික්ෂුවක්. පටිච්ච සමුප්පන්නව සකස්වෙන විඤ්ඤාණයේ 'රූප ගුණ' වර්තමාන සංඥාව, හඳුනාගැනීම තුළ බැසගෙන සිටිනවා.

පින්වත් ඔබ වර්තමාන සංඥාවන්ගේ අනිත්‍යභාවය දකිමින් අනිත්‍ය සංඥාවට, එසේත් නැතිනම් හඳුනා ගැනීම්වලට සිත යොමු කරන්න. ඔබ මවුකුසේ සිටිම මොනතරම් ඇසින්, කනින්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින් හඳුනාගැනීම් ඇතිකොටගන්න ඇතිද. ඔබ මව්කුසේ සිටියදී ඔබ පෝෂණය වුණු ගර්භාෂය 'මේ මගේ නිත්‍ය වූ නිවහන, ස්ථානය' වශයෙන් හඳුනාගත්තා මතකද? මේ අම්මාගේ කටහඬ, මේ තාත්තාගේ කටහඬ, මේ අම්මාගේ උණුසුම, මේ තාත්තාගේ උණුසුම කියා ඔබ හඳුනාගත්තා මතකද? මේ මව්කිරි, මේ පිටිකිරි කියා ඔබ හඳුනාගත්තා මතකද? මේ බෝනික්කෙක්, මේ හාවෙක් කියා හඳුනාගත්තා මතකද? මේ එකේ පංතියේ ගුරුතුමිය, මේ දෙකේ පන්තියේ ගුරුතුමිය වශයෙන් හඳුනාගත්තා ඔබට මතකද? මේ සාමාන්‍ය පෙළ විභාගය, මේ උසස් පෙළ විභාගය කියලා හඳුනාගත්තා මතකද.

මේ හැම අතීත හඳුනාගැනීමක්ම, සංඥාවක්ම වෙනස් වී ගිය හැටි නුවණින් දකින්න. සෑම අතීත හඳුනා ගැනීමක්ම අනිත්‍ය වී ගියා. විකෘති වී ගියා. අහිමි වී ගියා. පුංචි කාලයේ, ළමා කාලයේ ඔබ හඳුනාගත්තේ ඔබේ එකම ආරක්ෂකයා අම්මා තාත්තාය කියලා. ඔබ විවාහ වුණාට පස්සේ ඒ අතීත හඳුනා

ගැනීම වෙනස්වෙලා, ඔබේ ආරක්ෂකයා බවට පත්වූයේ බිරිඳ හෝ ස්වාමිපුරුෂයායි. ඔබ වයසට යනකොට එසේත් නැතිනම් කල්‍යාන මිත්‍ර ආශ්‍රය ලබනකොට ආයෙමත් මේ හඳුනාගැනීම වෙනස් වෙනවා. මගේ ආරක්ෂකයා වශයෙන් හඳුනාගත් අම්මා, තාත්තා, බිරිඳ, ස්වාමිපුරුෂයා මගේ සැබෑ ආරක්ෂකයා නොව, උතුම් සද්ධර්මයයි මගේ ආරක්ෂකයා කියලා හඳුනාගන්නවා. සෑම අතීත හඳුනාගැනීමක්ම මොහොතින් මොහොත වෙනස් වෙනවා.

ඊයේ රතු පැහැතියි කියලා හඳුනාගත් ඇඳුම, ලබන වසරේ අවපැහැගැන්විලා යනවා. ඊයේ සත්පුරුෂයෙක් කියලා හඳුනාගත් පුද්ගලයා හෙට දවසේ අසත්පුරුෂයෙක් වශයෙන් හඳුනා ගන්නවා. මෙයා නායකයෙක්ය කියලා හඳුනාගත් පුද්ගලයා ටික දවසකින් 'සිරකරුවෙක්ය' කියලා හඳුනාගන්නවා. රට, ජාතිය, ආගම, සුදු, කළු, හොඳ, නරක මේ සෑම අතීත හඳුනාගැනීමක්ම වෙනස් වී ගියා නම්, අනිත්‍ය වී ගියා නම්, නුවණින් දකිමින් අතීත හඳුනා ගැනීම්වල අනිත්‍යභාවය මතුකොටගෙන නුවණින් විමසා බලන්න.

# ඊයේ අද මෙන් හෙටටත් හඳුනගන්නේ මායාවක්

**(සංඥාව)**

පින්වත් ඔබ පෙර භවයන්හි හඳුනාගැනීම්වලට සිත යොමුකරන්න. අතීත භවගමනේදී පින්වත් ඔබ පටිච්චසමුප්පන්නව ඇසෙන්, කනෙන්, නාසයෙන්, දිවෙන්, ශරීරයෙන්, මනසින් මොනතරම් හඳුනාගැනීම් ඇතිකර ගන්නට ඇතිද? මේ බුදුරජාණන් වහන්සේ නමක්, මේ පසේබුදුරජාණන් වහන්සේ නමක්, මේ රහතන් වහන්සේ නමක්, මේ රහත් භික්ෂුණීන් වහන්සේ නමක් යැයි හඳුනාගත් අතීත සංඥාවන් සියල්ලක්ම වෙනස් වී ගියා. මේ සක්විති රජකෙනෙක්, මේ තුසිතය, මේ යාමය, මේ ශිල්වතෙක්, මේ දුශිල්වතෙක්, මේ ප්‍රේතයෙක්, තිරිසනෙක්, අසුරයෙක්, යමපල්ලෙක් යැයි ඔබ අතීත භවයන්හිදී ඇතිකරගත් සෑම සංඥාවක්ම අනිත්‍ය වී ගියා. අතීතයේ ඔබ අම්මා, තාත්තා, ආච්චී, සීයා වශයෙන් හඳුනාගත් ලක්ෂ ගණනක් ඥාතීන් මියගිය පසු කුමන හඳුනාගැනීමකින් හඳුන්වන්නද? අතීත සංඥාවන්, වර්තමාන සංඥාවන්, හඳුනාගැනීම් අනිත්‍යබව පින්වත් ඔබට දැන් වැටහෙනවා. අතීත වර්තමාන හඳුනාගැනීම් අනිත්‍යනම්, ඔබ අනාගතයේදී යම් සංඥාවක් හඳුනාගැනීමක් කිරීමට බලාපොරොත්තුව සිටිනවා නම් එම හඳුනාගැනීම නිත්‍යවෙයිද? අනිත්‍ය වෙයිද?

පින්වත් ඔබ මොහොතක් දෑස් පියාගෙන තමා තුළින් දකින්න, ඔබ මොනතරම් හඳුනාගැනීම් අනාගතය තුළ ඇතිකොටගෙන

තිබෙනවාද. අධ්‍යාපනය, රැකියාව, විවාහය, දරුවන්, මුණුපුරන්, රට, ජාතිය, ආගම, සුගතිය, දුගතිය, අධිගමයන්.... මේ ඔබ ඇතිකොටගෙන තිබෙන සෑම අනාගත හඳුනා ගැනීමක්ම අනිත්‍ය වන බව නුවණින් දකින්න. අතීතයේ ඔබ හඳුනාගත් බුදුරජාණන් වහන්සේලාත් අනිත්‍ය වී ගියා නම්, අතීතයේ ඔබ හඳුනාගත් සක්විති රජවරුනුත් අනිත්‍යවී ගියා නම්, කුමන අනාගත හඳුනා ගැනීමක් කෙරෙහි බලාපොරොත්තු ඇතිකොට ගන්නද? අතීත වර්තමාන අනාගත සංඥාවන් අනිත්‍යයි, අනිත්‍යයි, අනිත්‍යයි වශයෙන් නුවණින් දකිමින් ජීවත්වෙන්න.

පින්වත් ඔබ අනාගතයේදී මට මෙවන් ලේලි කෙනෙක්, බෑනා කෙනෙක්, මුණුපුරෙක්, මිණිපිරියක් හඳුනා ගැනීමේ බලාපොරොත්තුවක් තිබේ නම්, අතීතයේ ඔබ ලද සුජම්පතී දේවිය වැනි ලේලිවරුනුත්, ශක්‍රයා වැනි බෑනාවරුනුත් අනිත්‍ය වී ගියවිට, අතීත සංඥාවන් වෙනස් වී ගිය හැටි නුවණින් දකින්න. තමන්ට අයිති නැති, අනිත්‍යභාවයට පත්වෙන හඳුනාගැනීම් කෙරෙහි ඇතිකොටගත් තෘෂ්ණාව නිසා සංසාරයක් පුරාවට ඔබ වින්දා වූ දුක් කන්දරාව නුවණින් දකිමින් අනාගත සංඥාවන් කෙරෙහි කළකිරීම ඇතිකොට ගන්න. ඇලීම්, ගැටීම්, උපේක්ෂා කියන මාරයා නිරතුරුව සංඥාව, හඳුනාගැනීම් ඔබේ කොට දෙනවා. මාරයා සංඥාව ඔබේ කරදීමෙන් උත්සාහගන්නේ, සංඥාව හේතුවෙන් සකස්වෙන සංස්කාර මාරයා ශක්තිමත් කිරීමටයි. පටිච්ච සමුප්පන්නව ක්‍රියාත්මකවන විඤ්ඤාණය නමැති මාරයා පංච උපාදානස්කන්ධයේ සෑම ධර්මතාවයක් තුළටම බැසගනිමින් එකිනෙකට උපකාරක ධර්මයන් සකස්කොට දෙමින් සත්ත්වයාගේ භවගමන දීර්ඝ කරන ආකාරය පින්වත් ඔබට ඉහත කාරණයෙන් පැහැදිළි කරගන්න පුළුවන්.

භික්ෂුව වැඩ සිටින කුටිය ආශ්‍රිත ප්‍රදේශයක තරුණ මවක් හිටියා. එම තරුණ මව තම කුළුඳුල් දරු ප්‍රසූතිය බලාපොරොත්තුවෙන් සිටියේ. මේ මව, පියා කුසේ සිටින දරුවා කියන රූපය නිසා, එම රූපය කෙරෙහි ඇලීම නිසා රූපය සැප වේදනාවක් කරගත්ත

නිසා කුළුඳුල් දරුවා ගැන ගොඩාක් හඳුනාගැනීම් ඇතිකර ගත්තා. දරුවා පිරිමි දරුවෙක්, දරුවා නීරෝගී දරුවෙක් කියන වර්තමාන හඳුනාගැනීම් තුළමයි ජීවත්වුණේ. දරුවා නිසා අනාගත හඳුනා ගැනීම් ගොන්නක් සකස්කොට ගන්නවා. දරුවා සුරතල් කරනවා, දරුවා ළමා පාසලට යනවා, දරුවා උසස් අධ්‍යාපනය ලබනවා.... මේ සෑම අනාගත හඳුනාගැනීමක්ම සිතේ දරාගෙන සංස්කාරයන් රැස්කොටගනිමින් සිටියදී දරු ප්‍රසූතියේදී මේ සිඟිති දරුවාත්, මවත් මියයනවා. සියළු හඳුනාගැනීම් කෙරෙහි ඇතිකොට ගත්තා වූ තෘෂ්ණාව නිරතුරුවම සත්ත්වයා දුකට පත්කරනවා. අනිත්‍ය දෙය, නිත්‍ය වශයෙන් දකින තැනදී දුක සීරුවෙන් සිටිනවා. මාර ධර්මයක්ම වන කුසල් සංස්කාරයෝ දුක වසා පෙන්වීමට මාරයාට හොඳ සහයෝගයක් ලබාදෙනවා.

මේ සටහන් තබන භික්ෂුවට අකුසල් සංස්කාර දකිනකොට ඇතිවන බිය වගේම බියක්, අනිත්‍ය සංඥාවෙන් තොරව රැස්කොටගන්නා කුසල් සංස්කාර කෙරෙහිත් ඇතිවෙනවා. අකුසලය දුකම උරුමකොට දෙනවිට, කුසලය සැප පෙන්වා සත්ත්වයා අනාගතයේදී දුකට ඇද දමනවා. මාරයා කුසලයත් අකුසලයත් දෙකම එකම කාසියේ දෙපැත්ත කොට සත්ත්වයාට 'සිරස-අගය' ක්‍රීඩාව (කාසියක් උඩදමා එහි පෙරලෙන පැත්ත 'සිරස'ද නැතිනම් 'අගය'ද යන්න) පෙන්වනවා. මේ ක්‍රීඩාවේදී දෙපැත්තෙන් කවුරු දිනුවත් ඔහු භවයේ කොටස්කරුවෙක්ම වෙනවා.

පින්වත් ඔබ මුලින්ම සද්ධර්මයේ ශ්‍රවණය ඔස්සේ මාරයාව හඳුනාගෙන, හඳුනාගැනීම තුළත් මාරයා බැසගෙන සිටිනවාය කියන කාරණයා තේරුම්ගෙන අතීත, වර්තමාන වශයෙන් ඇසේත්, කනේත්, නාසයේත්, දිවේත්, මනසේත් ඔබ තුළ ඇතිවන්නා වූ සෑම හඳුනා ගැනීමකම අනිත්‍යභාවය නුවණින් දකිමින් අනාගත හඳුනාගැනීම් කෙරෙහිත් කළකිරීම් ඇතිකොට ගන්න.

(සංඥාවට අදාළ කොටස මෙතැනින් නිමාවේ.)

# සිතිවිල්ල සංස්කාරයකට උපත දෙන බව සිතුවාද?

**(සංස්කාර)**

පංච උපාදානස්කන්ධ ක්‍රියාවලියට අදාලව පින්වත් ඔබ ඇසෙන් රූපයක් දකිනවා, කනෙන් ශබ්දයක් අසනවා, දිවට රසයක් දැනෙනවා, දැක්ක දෙයට, ඇසුණ දෙයට, දැනුණ දෙයට ඔබ ඇලෙනවා, ගැටෙනවා, උපේක්ෂා සහගත වෙනවා. ඇලුණ ගැටුණ උපේක්ෂා සහගත වූ දෙය ඔබ හඳුනා ගන්නවා. හඳුනා ගන්නාවූ දෙය ගැන ඔබ සිතනවා. සිතනවා කියල කියන්නේ සංස්කාර සකස්වෙනවා. සංඥාව හේතුවෙන් සංස්කාර සකස්වෙනවා. 'සංඥා නිරෝධා සංස්කාර නිරොධෝ' සංඥාව නිසා සකස්වෙන ඵලයයි, සංස්කාර කියලා පංච උපාදානස්කන්ධ ධර්මයේදී අර්ථවත් වෙන්නේ. සත්ත්වයා දෙයාකාරයක සංස්කාරයන් නිරතුරුවම රැස්කරනවා. ඒවා කුසල් සහ අකුසල් සංස්කාරයි.

දැන් පින්වත් ඔබ මේ ක්‍රියාවලිය හොඳින් නුවණින් දකින්න. ඔබ ඇසෙන් රූපයක් දකිනවා. කනෙන් ශබ්දයක් අසනවා. දැක්ක දෙයට ඇසුණ දෙයට ඔබ ඇලෙනවා ගැටෙනවා උපේක්ෂා සහගත වෙනවා. ඇලුණ, ගැටුණ, උපේක්ෂා සහගත වෙච්ච දෙය ඔබ හඳුනාගන්නවා. හඳුනා ගත්තාවූ දෙය ගැන ඔබ සිතනවා. ඔබ සිතනකොට කුමක්ද වෙන්නේ. කුසල්, අකුසල් සංස්කාරයන් රැස්වෙනවා. පින්වත් ඔබ සිතන සිතුවිල්ලක් පාසා කුසල් හෝ අකුසල් සංස්කාරයන් රැස්කරගන්නවා. ඒ කියන්නේ ඔබ සිතන සෑම සිතුවිල්ලක් පාසාම අනාගතයේ සුගතියට හෝ දුගතියට අදාල සංස්කාරයන් රැස්කර ගන්නවා.

පින්වත් ඔබ ඇසෙන් රූපයක් දැකලා එම රූපයට ඇලෙනවා. එම රූපය හඳුනා ගන්නවා. දැන් ඔබ හඳුනාගත් රූපය ගැන සිතනවා. තරුණයි, ලස්සනයි.... අන්න දැක්කාවූ රූපය නිසා ලෝභ සිතක් අකුසල් සංස්කාරයක් ඇතිවුණා. ඔබ තවත් රූපයක් දකිනවා. දැක්ක රූපය ගැන සිතනවා. 'එයා මාත් සමග සිනාසුනේ නැහැ, හරි ආඩම්බරයි. මමත් එයාව ගණන් ගන්නේ නැහැ'. අන්න දැක්කාවූ රූපය නිසා ද්වේශ සිතක් අකුසල් සංස්කාරයක් ඇතිවුණා. ඔබ තවත් රූපයක් දකිනවා. දැක්කාවූ රූපය ගැන සිතනවා. එයාට මම උපකාරයක් කරනවා. එයාට යහපතක්ම වේවා. අන්න දැක්කාවූ රූපය නිසා අලෝභ, අද්වේශ සිතක් කුසල් සංස්කාරයන් ඇතිවුණා. ඉහත ආකාරය ඔබ නුවණින් දකින්න. ඔබ සිතන සෑම සිතුවිල්ලක් පාසාම අනාගතයේ විපාකයට අදාලව කුසල් හෝ අකුසල් සංස්කාරයන් රැස්කරදෙනවා. හඳුනා ගැනීම නිත්‍ය වශයෙන් ගන්නා මොහොතක් පාසා ඔබ හඳුනා ගන්නාවු දෙය ගැන සිතනවා. සිතන මොහොතක් පාසා විතර්ක ඇතිවෙනවා. විතර්ක ඇතිවෙන මොහොතක් පාසා සංස්කාර සකස්වෙනවා.

භික්ෂුව වැඩසිටින කුටියට පැමිණි තරුණ ස්වාමීන් වහන්සේ නමක් බොහෝම කනස්සල්ලෙන් තමන්ගේ ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ස්වාමීන් වහන්ස මම මේ දවස්වල වැඩසිටින කුටියේ සිට පිණ්ඩපාත වඩින්නට තිබෙන්නේ නිතරම වාහන, ජනතාව ගැවසෙන පාරකින්. එම නිසා වාහන, ජනතාව දකිනවිට මගේ සිත නිරතුරුවම විසිරෙනවා. මේ විසිරෙන සිත මට හරිම පලිබෝධකයක්. මේ ප්‍රශ්නයට විසඳුමක් කියන්න කියලයි එම ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළේ.

භික්ෂුව උන්වහන්සේට මතක් කළේ 'ඔබ වහන්සේ කුටියෙන් එළියට වඩිනවිට බිම බලාගෙන සියළු සතත්වයෝ සුවපත් වේවා කියන සංඥාවෙන් වඩින්න. කුමන හෝ සිතුවිල්ලක් පහළ වුණොත් එම සිතුවිල්ල ගැන සිතන්න යන්න එපා. මෛත්‍රී සංඥාව සිතට ගන්න. 'මෙන්න මනුෂ්‍යයෙක්. මෙන්න වාහනයක්'

කියල හඳුනාගන්න මොහොතේම ඒ හඳුනා ගැනීම ගැන සිතන්න එපා. මෛත්‍රී සංඥාව නැතිනම් අනිත්‍ය සංඥාව සිතට ගන්න. ඔබ හඳුනාගත්තාවූ දෙය ගැන සිතන්න ගියොත් සිත විසිරෙනවා. ඒ කියන්නේ ගැටෙන සිතුවිලි නිසා අකුසලයන්නට අදාල සංස්කාර රැස්වෙනවා. හැකිතාක් සිතීම අඩුකරන්න. සිතීම අඩුකරන ප්‍රමාණයට සංස්කාර රැස්වෙන ප්‍රමාණය අඩුවෙනවා. යමක් දැක්කාද 'දැක්කා'ය කියන තැන නවතිනවා. එවිට හඳුනා ගැනීමත්, සංස්කාරත් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ.

දැන් ඒ තරුණ ස්වාමීන් වහන්සේ තමන් වඩින පාරේ වාහන තිබුණාද ජනතාව ගැවසුනාද ඒවා ගැන සිතන්න යන්නේ නැහැ. ඒ නිසාම විතර්ක සකස්වෙන්නේ නැහැ. මෛත්‍රී සංඥාවෙන්ම තම පිණ්ඩපාත චාරිකාව අවසන් කර කුටියට වඩිනවා. පින්වත් ඔබ ඔබේ ජීවිතයේ ආපස්සට සිත යොමුකරල බලන්න අපි ජීවිතයේ වැඩියෙන්ම කරන්නෙ මොකක්ද? දැක්කාවූ, ඇසුණාවූ, දැනුණාවූ දෙයට ඇලිල ගැටිල ඇලුණ ගැටුණ දෙය හඳුනාගෙන හඳුනාගත්ත දෙය ගැන සිතනවා. මේ සිතීමේ පුරුද්ද නිසා මොනතරම් සංස්කාරයන් අපි සකස්කර ගන්නවාද?

# 'සිතීම' පහසුයි - 'භවය' අපහසුයි

**(සංස්කාර)**

එක මහත්මයෙක්, තමන්ගේ ඉඩමේ වැටමායිමකට මුළු ජීවිතයම නඩු කියලා, වැට මායිමේ අයිතිය ගැනම හිතලා, ඒ ගැන සිතමින් සිටියදීම මියයනවා. පටිච්ච සමුප්පන්නව ඒ මහත්මයා එම ඉඩමේ ප්‍රේතයෙක් වශයෙන් උපත ලබනවා. ඒ වැටමායිම ළඟ සිටිමින් තවමත් මායිමේ අයිතිය ගැන සිතනවා. නිමාවක් නැති සිතීම, නිමාවක් නැති භවය පෝෂණය කොටදෙනවා. ලෝකයේ කටුකම, බියකරුම, ගැඹුරුම, දීර්ඝම, අම්හිරිම දෙය මොකක්ද කියලා ඇසුවහොත්, භික්ෂුව එයට දෙන පිළිතුර 'භවය' කියලයි.

ලෝකයේ සරළම, පහසුම, ඉක්මන්ම දෙය කුමක්ද කියලා ඇසුවොත්, අපිට කරන්න පුළුවන් පහසුම කාරණය 'සිතීම' කියන කාරණයයි. සිතීම කියන ලෝකයේ සරලම කාරණය, ලෝකයේ ගැඹුරුම, දීර්ඝම 'භවය'ට ඔබව ඇද දමනවා. ඇලීම්, ගැටීම් වැඩිවෙන ප්‍රමාණයට හඳුනාගැනීම් වැඩිවෙනවා. හඳුනාගැනීම් වැඩිවෙන ප්‍රමාණයට සිතීම, සංස්කාර වැඩිවෙනවා. මනුෂ්‍යයෝ සිතලා සිතලා, සිතාගන්න බැරිවෙනකොට, මත්වතුර බීලා හිතනවා. මත්වතුර බීලත් හිතාගන්න බැරිවෙනකොට, සියදිවි නසාගන්න සිතනවා. සියදිවි නසාගැනීමට උපක්‍රම භාවිතාකොට, මරණ වේදනාව දැනෙද්දී, 'අනේ මම ජීවත්වෙන්න ඕනේ' කියලා සිතනවා. ඇලීම්, ගැටීම් හඳුනාගැනම්වල ස්වභාවය නිසා, සත්ත්වයාගේ සිතීම, සත්ත්වයාටම ප්‍රහේලිකාවක් වෙනවා.

භික්ෂුවට මතකයි, භික්ෂුවගේ භික්ෂු ජීවිතය මුල්කාලයේ, නිවීමේ මෙහෙයුමේ මුල් අවස්ථාවල, භික්ෂුවගේ සිත විසිරෙද්දී, එම විසිරීම නැවත නැවත සිදුවන අවස්ථාවල, මගේ සිතට මම අවවාද කළා, සිත දමනය නොවුණොත් මම මැරෙනවාය කියලා. මම මරණය පෙන්වමින්, විසිරෙන්නාවූ මාර සිතට අවවාද කළා. මෙතැනදි 'මම' කියලා කියන්නේ ප්‍රඥාවටයි. ඒසේත් නැතිනම් බල ධර්මයක්මයි. භික්ෂුව තුළ වැඩෙන බල ධර්මයන් විසිනුයි මෙතැනදි මාරයාට මරණය පෙන්වමින් අවවාද කරන්නේ. මේ මොහොතේ භික්ෂුවට ජීවිතය ගැන ගැටීමක් නැහැ. නිවන ගැන ඇලීමක්ද නැහැ. නිදහස්වීමක්, නිවීයෑමක්.... එහෙත් එය බලාපොරොත්තුවක් නෙවෙයි. බලාපොරොත්තු හිස්කළ ජීවිතයක නිදහස්වීමක්, නිවීයෑමක්. ප්‍රඥාව විසින් පංච උපාදානස්කන්ධයට අවවාද කරනවා. සප්ත බොජ්ඣංග ධර්මයන්ගේ සති, ධම්මවිජය, වීර්යය කියන ධර්මතාවයන් අයෝමය බලයක් වී, මෙතෙක්කල් සුරතල් කළ පංච උපාදානස්කන්ධ මාරයාට, මරණයෙන් අභියෝග කරමිනුයි, අවසානයේදී කල්ප සියක් කෝටි ගණනක්, පටිච්ච සමුප්පන්නව අයාලේ දිව්ව සිත ප්‍රඥාවේ ග්‍රහණයට ගත්තේ.

වර්තමාන සමාජයේ පින්වතුන්ලා, උතුම් අධිගමයන්, සරල ව්‍යායාමයක ප්‍රතිඵලයක් වශයෙන් දකිමින්, අඩු වීර්යයකින් වැඩි ප්‍රතිඵල ලබාගන්න බලාපොරොත්තුවෙන බවක් පෙනෙන්නට තිබෙනවා. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනාවක්, අයාලේ දුවපු සිතක්, මග නොමග වසා පෙන්වූ සිතක්, කුසලය, අකුසලය, පටලවා පෙන්වූ සිතක්, පටිච්ච සමුප්පන්නව මැරෙන උපදින සිතක්, සංස්කාර හේතුවෙන් සකස්වෙන විඥානය නමැති ධර්මතාවයේ තියුණුභාවය, පින්වත් ඔබත් නුවණින් දකින්න දක්ෂ වෙන්න.

බුදුරජාණන් වහන්සේල ලක්ෂ ගණනක් අතීතයේ මුණ ගැසිලත්, අධිගමයන් සාක්ෂාත්කොට ගැනීම වැලැක් වූ සිතක් භික්ෂුව දමනය කළේ 'එක්කෝ මරණය, එක්කෝ නිවීම' කියන අවසාන සිතිවිල්ලෙන් මාරයට අභියෝග කිරීමෙන් පමණක්මයි.

මරණයෙනුත් නීවීමෙනුත් එහා භික්ෂුවට සිතක් සකස්වුණේ නැහැ. ඒ කියන්නේ සිත නැවතුණා. සංස්ඛාර නිරෝධා- විඥාන නිරෝධා - උපාදාන නිරෝධා - භව නිරෝධා ලෝකයේ ගැඹුරුම පටිච්ච සමුප්පාද ධර්මය බොහෝම සුන්දර ධර්මයක්.

ඇසෙන් රූපයන් දැකලා, එම රූපයට ඇලිලා, ගැටිලා, උපෙක්ෂාසහගත වෙලා, ඇලුණු ගැටුණු රූපය හඳුනාගෙන, හඳුනාගත් රූපය ගැන සිතනකොට තමයි සංස්කාරයන් රැස්වෙන්නේ. පින්වත් ඔබ අතීත, අනාගත, වර්තමාන වශයෙන් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකින්න. වර්තමානයේ ඔබ යම් භික්ෂු රූපයක් දැකලා, සද්ධර්මයන් ශ්‍රවණය කරලා, ධර්මය තුළ සංසිඳීමක් දැනිලා, රැස්කරන්නා වූ සෑම කුසල් සංස්කාරයක්ම නිත්‍යද, අනිත්‍යද? මේ සෑම කුසල් අකුසල් සංස්කාරයක්ම, යම් දවසක විපාක සකස්කොටදීලා, අනිත්‍යවෙලා යනවා. පින්වත් ඔබ, දෑස් පියාගෙන, වර්තමානයේ ඔබ සිදුකරන සෑම කුසල් ක්‍රියාවක්ම, අකුසල් ක්‍රියාවක්ම, විපාකදී අනිත්‍යවන ධර්මතාවයන් බව නුවණින් දකින්න.

# සංස්කාරයෝ අනිත්‍යයි, කටුකයි, බියකරුයි, රුදුරුයි

**(සංස්කාර)**

අතීත සංස්කාරයන් විපාකදී අවසන්වන වර්තමානයේදී, පින්වත් ඔබ අනාගතයට, අනිත්‍ය වූ සංස්කාරයන් රැස්කොට ගන්නවා. අතීත සංස්කාරයන් වර්තමානයේද විපාක දෙනකොට, අනාගතයට සංස්කාරයන් එකතුකොට ගන්නවා. රූපය කෙරෙහි ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන්, හඳුනාගැනීම්. හොඳින් උපකාර කරනවා, අනාගත ලෝකය තීන්දු කරන සංස්කාරයන් රැස්කොටදෙන්නට. වර්තමානයේ ඔබේ ඇසට, කනට, නාසයට... ඵස්සය වන සෑම රූපයක්ම අතීත සංස්කාරක ඵලයක්මයි. සුගතිය, දුගතිය, මහේශාඛ්‍යභාවය, අලේපේශාඛ්‍යභාවය, උගත්භාවය, නූගත්භාවය, අයුෂ, වර්ණය, සැපය, බලය.... සමාජයේ පවතින මේ හැම ධර්මතාවයක්ම විවිධත්වයක්ම, අනිත්‍යවන සංස්කාරයන්ගේ ඵලයක්මයි. වර්තමානයේ මනුෂ්‍යයා අත්විඳි සෑම සැප වේදනාවක්ම, දුක් වේදනාවක්ම, අතීත සංස්කාරයන්ගේ ඵලයක්මයි. පින්වත් ඔබ වර්තමාන සමාජයේ දකින මේ විවිධත්වය, සංස්කාරයන්ගේම අනිත්‍යභාවය වශයෙන් දකිමින්, සංස්කාරයෝ අනිත්‍යයි... අනිත්‍යයි... අනිත්‍යයි වශයෙන් මෙනෙහි කරන්න.

පින්වත් ඔබ අතීතයේ ඔබ රැස්කොටගත්තා වූ, විපාක දුන්නා වූ, සංස්කරයන්ගේ අනිත්‍යභාවය නුවණින් දකිමින්, ඔබට පින්වන්ත අම්මා කෙනෙකු, තාත්තා කෙනෙකු ලැබුණේ, ඔබට

හොඳ අධ්‍යාපනයක්, රැකියාවක්, ව්‍යාපාරයක්, බිරිඳ, දරුවන්, සමාජ තත්ත්වයක් ලැබුණේ අතීත කුසල් සංස්කාරයන් නිසාමයි. ඒ සංස්කාර අනිත්‍යවෙලා යනවා.

මෙය සටහන් තබන භික්ෂුවගේ අතීත කුසල් සංස්කාරයන් නිසාම ලැබුණු අම්මා, තාත්තා අද ලෝකයේ නැහැ. වෙනස්ව ගියා, අනිත්‍ය වී ගියා. භික්ෂුවට අතීත කුසල් සංස්කාර නිසාම ලැබුණු ගිහි ජීවිතය වෙනස් වී ගියා. මේ පැවිදි ජීවිතයත් කවදාහරි සංස්කාරයන්ට අදාළව අනිත්‍යවී යනවා. ඔබ අතීතයේ අම්මා, තාත්තාට කීකරුව ජීවත්වෙලා, වැඩිහිටියන්ට ගරුකරලා, මව්පිය උපස්ථානය කරලා, පන්සල් ගිහිල්ලා, පින්කම් කරලා, දඹදිව වන්දනාවේ ගිහිල්ලා, දන්දීලා, සිල්සමාදන් වෙලා, යම් කුසල සංස්කාරයන් අතීතයේ රැස්කොටගත්තා නම් එම සෑම කුසල් සංස්කාරයක්ම අනාගතයේ විපාකදී අනිත්‍යවෙලා යනවා. පින්වත් ඔබ අතීතයේ සිදු කළා වූ සෑම අකුසල් ක්‍රියාවක් තුළින්ම රැස් වූ අකුසල් සංස්කාරයන්ද අනාගතයේ විපාක සකස්කොටදීලා අනිත්‍ය වී යනවා.

පින්වත් ඔබ දෑස් පියාගෙන, අතීතය පුරාවට ඔබ සිදුකළ සෑම කුසල්, අකුසල් සංස්කාරයක්ම සිහිපත්කොට සංස්කාරයෝ අනිත්‍යයි, අනිත්‍යයි.. වශයෙන් නුවණින් මෙනෙහි කරගන්න.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන් කියන්නේ, අතීත පාරමී භවගමනේ කුසල් සංස්කාරන්ගේ ඵලයක්මයි. ඒ කුසල් සංස්කාරයන් අනිත්‍යයට ගියා. සීවලී මහරහතන් වහන්සේ ප්‍රත්‍යලාභීන් අතර අගතැන ලැබුවේ අතීත කුසල් සංස්කරයන්ගේ ඵලයන් නිසා. යශෝදරාව, රාහුල, සිදුහත් කුමරුන්ගේ බිසව, පුතනුවන් වුණේ අතීත කුසල් සංස්කාරයන්ගේ ඵලයන් නිසා. නමුත් මේ සෑම කුසල් සංස්කාරයක් ම අනිත්‍ය වී ගියා. අතීතයේ පින්වත් ඔබ සක්විති රජකෙනෙක් වුනේ, දිව්‍යතලවලට අධිපති ශක්‍ර දෙවියන් වුණේ, කුසල් සංස්කාරයන් නිසා. මේ සෑම අතීත කුසල් සංස්කාරයක්ම අනත්‍ය

වී ගියා. අතීතයේ ඔබට බුදුරජාණන් වහන්සේ මුණ ගැසුණේ, ඍෂිවරුන් හැටියට ඍර්ධියෙන් ගමන් කරන්නට හැකියාව ලැබුණේ, සශ්‍රීක දිව්‍යතලවල, බ්‍රහ්මතලවල ඔබ උපත ලැබුවේ ඔබේ කුසල් සංස්කාරයන් නිසා. මේ සෑම කුසල් සංස්කාරයක්ම අනිත්‍ය වී ගියා. අතීතයේ ඔබ සතර අපායන්ට වැටුණේ, සෙම්, සොටු, පුන්නක්කු තණකොළ කෑවේ. ගින්දර, ලෝදිය බිව්වේ, අකුසල් සංස්කාරයන් නිසා. මේ සෑම සංස්කාරයක්ම අනිත්‍ය වී ගියා. පින්වත් ඔබ පටිච්ච සමුප්පන්නව පැමිණි භව ගමනේදී ඔබ අත්විඳි සෑම සැප වේදනාවක්ම, සෑම දුක් වේදනාවක්ම අතීත කුසල් අකුසල් සංස්කාරයකම ඵලයක් සෑම සැප දුක් සංස්කාරයක්ම අනිත්‍ය වුණා.

දැන් පින්වත් ඔබට වැටහෙනවා, සෑම අතීත වර්තමාන, සංස්කාරයක්ම අනිත්‍යභාවයට පත්වෙනවාය කියලා. අතීත සංස්කාරත්, වර්තමාන සංස්කාරත්, විපාකදී අවසන් වෙනවා නම්, ඔබ අනාගතයේදී මේ උතුම් සම්මා සම්බුද්ධ ශාසනය උපයෝගී කොටගෙන, රැස්කිරීමට බලාපොරොත්තුවන කුසල් සංස්කාරයන් නිත්‍ය වෙයිද, අනිත්‍ය වෙයිද? පින්වත් ඔබ 'මම අනාගතයේ මේ විදිහේ පින්කම් කරනවා. මේ විදිහට දන්දෙනවා, ශීල ව්‍යාපාර පවත්වනවා, ධර්මදාන පින්කම් කරනවා, අටමහා කුසල් කරනවා, මේ විදිහට පන්සල්, ආරණ්‍ය හදනවා කියලා යම් කුසල් ධර්මයන් කෙරෙහි අනාගත බලාපොරොත්තු තිබේනම්, එම කුසල් සංස්කාරයන්, අනිත්‍යභාවයට පත්වෙන කුසල් සංස්කාරයන්මයි. මම අනාගතයේ කුසල් දහම් වඩමින්, දෙවියන්, බ්‍රහ්මයන් වෙනවා යැයි බලාපොරොත්තුවක් ඔබට තිබේ නම්, එම දිව්‍ය බ්‍රහ්ම, ජීවිතත් අනිත්‍ය වී යන කුසල් සංස්කාරයන්මයි.

ආනන්තරීය පාපකර්මය සිදුකොට ගැනීම නිසාම අවීචි මහා නිරයේ දුක්විඳින දේවදත්ත නිරිසතා, අනාගතයේ යම් දවසක පසේබුදුරජාණන් වහන්සේ නමක්ව පිරිනිවන් පාන්නේ ද සංස්කාරයන්ගේ අනිත්‍යභාවය නිසාමයි. අනාගතයේ බුද්ධෝත්පාද කාලයක්, අබුද්ධෝත්පාද කාලයක් පහළවන්නේ,

සත්ත්වයා කල්ප විනාශයන්ට මැදිවී, ඉරවල් හතක උෂ්ණත්වයෙන් අවුරුදු දස දහස් ගණන් පිච්චි පිච්චී මැරෙමින් ඉපදෙන්නේ සංස්කාරයෙන්ගේ අනිත්‍යභාවය නිසාමයි. පින්වත් ඔබේ ඇලීම, ගැටීම් හේතුවෙන් සකස්වෙන හඳුනාගැනීම්, අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම සංස්කාරයන් රැස්වීම වේගවත් වෙනවා.

වෙනස්වෙන, විකෘතිවෙන අනිත්‍යවෙන සංස්කාරයෝ දුකටමයි හේතුවෙන්නේ කියලා නුවණින් දකිමින් ජීවත්වෙන්න. මනුෂ්‍යයා වැඩිපුරම කරන අකුසල් විපාක නොදී, විපාක දීමට අවස්ථාවක් නොලැබී, සත්ත්වයාගේ එකතුවෙන අකුසල් කල්ප විනාශයන්හිදී, කිසිදු භේදයකින් තොරව, සත්ත්වයා පුච්ච පුච්චා විපාක දෙනවා. සංස්කාරයෝ අනිත්‍යයි, කටුකයි, බියකරුයි, රුදුරුයි.

# අවිද්‍යාවේ අකුසල් නිධිය විපාක දෙන්නේ මෙසේය

**(සංස්කාර)**

අවිද්‍යා නිරෝධෝ සංස්කාර නිරෝධෝ... සංස්කාර නිරෝධයෙන් භවයෙන් නිවීගිය ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා, මහ රහතුන් වහන්සේලා ආදී උතුමන්, ගිනි ගොඩක දර අභවර වීමෙන් ගිනිගොඩ යම්සේ නිවීයන්නේද, සංස්කාර නිරෝධයෙන් එම උතුමන්ගේ විඥ්ඥාණය තමා තුළින්ම නිවීගිය හැටි නුවණින් දකිමින්, සංස්කාර නිරෝධය කෙරෙහි ඡන්දය ඇතිකර ගන්න. අකුසල් සංස්කාරයන්ගෙන් මිදී කුසල් සංස්කාරයන් රැස්කරගනිමින්, කුසල් අකුසල් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකිමින් ජීවත්වෙන්න. විවේකීව සිටින සෑම මොහොතකම අතීතයේ කුසල් සංස්කාර නිසා වින්දාවූ සැපයන් අතීතයේ අකුසල් සංස්කාරයන් නිසා වින්දාවූ දුක් නුවණින් දකිමින් සංස්කාරයන් අනිත්‍යයයි අනිත්‍යයයි... වශයෙන් මෙනෙහි කරමින්, අනිත්‍යවන සංස්කාරයන් කෙරෙහි කලකිරීම ඇතිකර ගන්න. මනුෂ්‍යයාගේ අකුසල් සංස්කාරයන්ගේ බලවත්භාවය නිසාම අනාගතයේ උදාවෙන, අති දීර්ඝ අබුද්ධෝත්පාද කාලයන් නුවණින් දකිමින්, සංස්කාරයෝ අනිත්‍ය වශයෙන් දකිමින් ජීවත් වෙන්න. අතීතයේ ඔබ සක්විති රජකෙනෙක්ව ඉපදුන වෙලාවේ ඔබේ ඒ රාජතේජසින් යුත් රූපයත්, මළකඳක් වු හැටි නුවණින් දකිමින් සංස්කාරයෝ අනිත්‍යයි... අනිත්‍යයි... වශයෙන් මෙනෙහි කරන්න.

පින්වත් ඔබ එදිනෙදා සිදුකරන සෑම ක්‍රියාවකදීම අනාගතයේ විපාක දීමට සංස්කාරයන් රැස්කර ගනිමිනුයි සිටින්නේ. ඔබ එළවළු ගන්න වෙළඳ පොළට යනවා. ඔබ වම්බටු තෝරා ගන්නේ නැහැ. තලන බටුයි තෝරා ගන්නේ. මෙතනදී මගේ නිරෝගීභාවය කියන ලෝභ සිත ඇතිවුණා. ඔබ රූපලාවන්‍යයට කැමති පින්වතෙක් නම් ඔබ බතල තෝරා ගන්නේ නැහැ, කැරට් තමයි තෝරාගන්නේ. මෙතනදී රූපයේ නිත්‍යභාවය පිළිබඳව ලෝභ සිතක් ඇතිවුණා. ඔබ මාළුගන්න මාළු කඩයට යනවා. මාළු කඩේ කෙලවල්ලා මාළු, තලපත් මාළු තිබෙනවා. ඔබට එකපාරටම සිතක් ඇතිවෙනවා කෙලවල්ලා උෟෂ්ණයි කියලා. ඔබ තලපත් මාළු මිලදී ගන්නවා. මෙතනදී ඔබේ රූපයේ නිරෝගීභාවය පිළිබඳව ලෝභ සිතක් ඇතිවුණා. ඔබ රැවුල කපනවා කණ්ණාඩියෙන් නැවත නැවත බලමින්. රූපයේ ලස්සන පිළිබඳව ලෝභ සිතක් ඔබ තුළ ඇතිවුණා. ඔබ පුටුවක වාඩිවෙලා බොහෝම විවේකීව කකුල් දෙක සොලව සොලවා සිටිනවා. ඔබ රූපය ඇසුරුකරගෙන සැප වේදනාවක් ගැන ලෝභ සිතක් සකස්කර ගන්නවා. ඔබ උදේම රාජකාරියට යාමට ඇඳුමක් අඳිනවා කියල සිතන්න. මොනතරම් රූපය කෙරෙහි ලෝභ සිත් ඇතිවෙනවාද. ඔබ ගෙදර අතුපතුගාල පිරිසිදු කරනකොට, ඇඳුම් සෝදන, මදිනකොට... මේ සෑම ක්‍රියාවකදීම රූපය කෙරෙහි ලෝභ සිත් ඇතිවෙනවා.

පින්වත් ඔබ කල්පනාකොට බලන්න, එදිනෙදා ජීවිතයේ සෑම ක්‍රියාවකදීම මොනතරම් අකුසල් කන්දරාවක් ඔබ ඇතිකර ගන්නවාද කියලා. අකුසල් ධර්මයන්ගේ මුල්ම කාරණය තමයි ලෝභ සිත. තෘෂ්ණාව ලෝභ සිතට බාධා ඇතිවෙනකොට ද්වේශය සකස්වෙනවා. ලෝභයත්, ද්වේශයත් සකස් කර ගන්නේ මෝහය නිසාමයි. මේ සකස්වෙන සෑම ලෝභ සිතුවිල්ලක්ම අනාගත ලෝකය අස්වද්දන සංස්කාර බවට පත්වෙනවා. පින්වත් ඔබ නිරතුරුව සකස්වෙන සංස්කාරයන් ගැන තියුණු අවධානයකින් සිටින්න. කඩයට ගිහිල්ල එළවළුවක් ගන්නවිට අනාගතයේ විපාකයට සංස්කාරයන් රැස්වෙනවා නම් නිරතුරුවම ඔබ අනතුරක් තුළයි ජීවත්වෙන්නේ. පින්වත් ඔබට ප්‍රශ්නයක්

මතුවෙන්න පුළුවන්, සත්ත්වයා අයෝනිසෝමනසිකාරයෙන් කරන සෑම ක්‍රියාවකදීම අකුසල් රැස්කර ගන්නවා නම් මෙතරම් අකුසල් අනාගතයේ විපාකදෙන්නේ කොහොමද කියලා. ලෝභ සිත වැඩිවෙන්න වැඩිවෙන්න, මමත්වයේ දැඩිභාවය වැඩිවෙනවා. මමත්වයේ දැඩිභාවය වැඩිවෙනවිට ද්වේශය දැඩිවෙනවා. පංච උපාදානස්කන්ධය කෙරෙහි සක්කාය දිට්ඨිය නිසාම තව තව ද්වේශය වැඩිවෙනවා. මේ අකුසල් විපාකයට පැමිණෙන නිසාමයි, සත්ත්වයා සතර අපායන්ට වැටුණාම ඒවායේ කල්ප ගණන් ප්‍රමාදභාවයට පත්වෙන්නේ. ධර්මය කෙරෙහි ඇති නොදැනුවත්භාවය නිසාම සත්ත්වයා සෑම සිතුවිල්ලක් තුළින්ම රැස්කරගන්නා අකුසලමූලයන්, පටිච්ච සමුප්පන්නව කල්ප ගණන් එකතු වී, කල්ප විනාශයන් සිදුවන අවස්ථාවේදී එක ඉරක, ඉරවල් දෙකක, ඉරවල් හතක උෂ්ණත්වයෙන් ගිනියම් වූ ලෝකය තුළ සියළු සත්ත්වයෝම යක්ෂයින්, ප්‍රේතයින්, භූත සත්ත්වයින් කෘමීන් හැටියට පරිසර උෂ්ණත්වයෙන් මැරී මැරී උපදිනවා. මේ ලෙස ගිනිගනිමින් මැරෙනවා. නැවත උපදිනවා. එදාට සත්වයාගේ ඉපදීමත් මියයාමත් අතර පරතරය එක සිතුවිල්ලක කාලයට සමානවෙනවා.

සත්ත්වයාගේ අකුසල් සංස්කාරයන්ගේ තිව්‍රභාවයට අදාළව විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වයද වේගවත් වෙනවා. පින්වත් ඔබ වර්තමානයේ නොදැනුවත්භාවය නිසා සෑම සිතුවිල්ලකදීම අකුසල් සිදුකරගන්නවා වගේම කල්ප විනාශකයදී පරිසර උෂ්ණත්වයේ රුදුරුභාවය නිසාම, ගිනියම්භාවය නිසාම පිච්චීමේ වියරුවෙන් මැරෙනවා. ඒ ක්ෂණයේදීම උපදිනවා. එක සිතුවිල්ලක් සකස්වෙද්දීම නැවත පිච්චී මැරෙනවා. නැවත උපදිනවා. වර්තමානයේ මනුෂ්‍යයෙකුගේ ආයුෂ අවුරුදු අසූඅටක් පමණ වෙනවා. නමුත් කල්ප විනාශයකදී සත්ත්වයාගේ ආයුෂය තප්පරයක් වගේ කෙටි කාලයක්. මේ මොහොතේ ඔබ සෑම තප්පරයකදීම ලෝභ, ද්වේශ, මෝහ සිත් ඇතිකරගන්නවා වගේම ඒවාට විපාක වශයෙන් සෑම තප්පරයකදීම ඔබ ඉපදෙමින් මියයනවා. තිරිසත්ත්වයා නිරයට වැටුණු අවස්ථාවන්හිදී ඉහත ක්‍රියාවලියට සමාන සිදුවීම් සිද්ධ වෙනවා.

# මගේ මළකඳ තුළිනුත් ඔබ ධර්මයම දකින්නේ නම්.....

**(සංස්කාර)**

පින්වත් ඔබ, දෑස් පියාගෙන අතීතයේ නිතිපතා රැස් කළා වූ අකුසල් කඳු නිසා කල්ප විනාශයන්ට මැදිවී, ඔබත් මමත් පිච්චි, පිච්චී මියගිය තැන නුවණින් දකින්න. එදාට සත්ත්වයාගේ ආයුෂය වන්නේ එක සිතිවිල්ලක් සකස්වෙන කාලයයි. සංස්කාරයන් පින්වත් ඔබට කරන මේ තියුණු විනාශය නුවණින් දකිමින් සංස්කාරයෝ අනිත්‍යයි.. අනිත්‍යයි වශයෙන් මෙනෙහි කරන්න. සත්ත්වයාගේ අවිද්‍යාව නිසාම, අනිත්‍ය වූ සංස්කාර විසින් ලෝකය පාලනය කරනවා. සංස්කාර විසින් යම් දවසක අවීචි මහා නිරයට ඇද දමන සත්ත්වයාව, සංස්කාර විසින්ම යම් දවසක පසේ බුදුරජාණන් වහන්සේ නමක් බවට පත් කරනවා (දේවදත්ත චරිතය උදාහරණයකට ගන්න) සංස්කාරයන්ගේ වියරුභාවය දකිමින් පින්වත් ඔබ නිවැරදි වෙන්න. ආදර්ශමත් වෙන්න.

ඔබට වැරදුනොත්, ඔබේ පූර්වාදර්ශයන් ඔස්සේ තව ගොඩාක් දෙනා වරද්දවා ගන්නවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ගිහි පින්වතුන්ලා සතුටින් විනෝදයෙන් ජීවත්වෙනවා දකින්න මම අකමැති නැහැ. ඒත් මේ ලෝභ, ද්වේෂ, මෝහ සංස්කාරයන් විසින් සත්ත්වයා බලවත් වූ අනතුරුවලට ඇද දමනවා. එම නිසා පින්වත් ඔබ ජීවිතයේ සෑම ක්‍රියාවකදීම සිතුවිල්ලෙන් සිතිවිල්ලට, ක්‍රියාවෙන් ක්‍රියාවට සතිය

පිහිටුවා ගන්න. එළවළුවක්, මාළුවක්, ඖෂධයක් තෝරාගැනීමේදී නීරෝගීභාවය පිළිබඳ සකස්වන ලෝභ සිතක් ඇතිවුණොත්, ඒ මොහොතේම රෝගීභාවයත්, නීරෝගීභාවයත් අනිත්‍යක්ම බව සිතන්න. ඇඳුමක් පැළඳුමක් පරිහරණය කරනකොට, ගේදොර පරිහරණය කරනකොට, ශරීරය ලස්සන කරනකොට, රූපය ගැන ලෝභ සිතිවිල්ලක් ඇතිවන මොහොතේදී, ලස්සනත් අවලස්සනත් අනිත්‍ය බව නුවණින් දකින්න. මේ ඔබ සංස්කාරයන්ගේ අනිත්‍යභාවයයි නුවණින් දකින්නේ.

පින්වත් ඔබ දක්ෂ නම්, සුපිරි වෙළඳසැලකට ගිහිල්ල, ගමේ කඩේට ගිහිල්ල එළවළුවක් මිළදී ගන්නකොටත් සංස්කාරයන්ගේ අනිත්‍යභාවය ජීවිතයට එකතුකොටගන්න පුළුවන්.

පින්වත් ඔබ කැමති දේ මිලදී ගන්න. කැමති දෙය ලස්සනට අඳින්න පළඳින්න. ඒවා කෙරෙහි නිත්‍යභාවයක් දකින්න එපා. රූපයේ නිරෝගීභාවය, පිරිසිදුභාවය කෙරෙහි තෘෂ්ණාව ඇතිකොට ගන්න එපා. පින්වත් ඔබ දානමය, ශීලමය, ධර්ම දේශනාමය, පින්කමක් සිදුකිරීමේදීද දක්ෂවෙන්න, ඔබ රැස්කොටගත් සංස්කාරයන් ගැන සතුටුවෙනවා වගේම, එම සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින්න. භික්ෂුවට මේ මොහොතේ යම් පින්වතෙක් පිරිකරක් පූජා කළොත්, මේ මොහොතේම එය සිතෙන් අයින්කරනවා. සංඝයා උදෙසා පූජා කරන දෙය සංඝයාට අයිති දෙයක් බව දැකලා. භික්ෂුව එසේ කරන්නේ අකුසලයෙන් බැහැර වී කුසලයේ පරිපූර්ණ වීමට නොවේ. මේ වියරු සංස්කාරයන්ගේ අනිත්‍යභාවය පිළිබඳව පින්වත් ඔබට ආදර්ශක් දෙන්නයි. පින්වතුන්ලා ශ්‍රද්ධාවෙන් පිරිකර පූජාකොට සුගතියට යද්දී, පිරිකර හිමිකරගත් පින්වතුන් දුගතියට ගිය අවස්ථා ගොඩාක් තිබෙනවා. පින්වත් ඔබ සංස්කාරයන් කෙරෙහි වැට බැඳීමට නම්, රූපය කෙරෙහි තෘෂ්ණාව සියුම්කොට ගන්නට වෙනවා.

ගිහි ජීවිතයේදී භික්ෂුව පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියන වචනයවත් එතරම් අසලා තිබුනේ නැහැ. නමුත් එහි

අර්ථය එදා ජීවිතය තුළ තිබුණ බව භික්ෂුව වර්තමානයේ දන්නවා. ගිහි ජීවිතයේදී මට ලැබුණු අවස්ථා හුඟාක්, අනුන්ගේ සතුට උදෙසා මම අහිමිකොටගෙන තිබෙනවා. වර්තමානයේ ඒ ක්‍රියාවන් දෙස අතීතාවර්ජනයක යෙදෙන විට, එදා මා තුළ රූපයේ අනිත්‍යභාවය, සංස්කාරයන්ගේ අනිත්‍යභාවය පිළිබඳ දැනීම අතීත පුහුණුවක් නිසාම සැඟවී තිබුණ බව හොඳටම ප්‍රකට වෙනවා. මේවා ගැන කොපමණ සටහන් තැබුවත්, මේ තබන සටහන් ද අතීත සංස්කාරයන්ගේ ඵලයක්මයි. මේ සටහන් කියවීම තුළින් ඔබ රැස්කොට ගන්නා වූ සංස්කාරයනුත් අනිත්‍යභාවයට පත්වෙන සංස්කාරයන්මයි.

මේ සටහන් ලිවීමට හේතු වූ අතීත කුසල් සංස්කාරයන්ද, යම් මොහොතක අනිත්‍යවෙලා යනවා. එදාට පින්වත් ඔබ මෙම සටහන් තැබූ භික්ෂුවගේ මළකඳ ළඟට ඇවිල්ලා සියළු සංස්කාරයෝ අනිත්‍යයි කියලා, භික්ෂුවගේ මළකඳ තුළිනුත් ධර්මය දකින්න දක්ෂනම් මේ ලිපිපෙළ පරිශීලනය කිරීම තුළිනුත් ඔබ රැස්කළා වූ සංස්කාරයන් සැබෑ ලෙස ඔබේ අවබෝධඥානය තුළ තැන්පත්කොට ගත්තා වෙනවා. එසේ නොවී ඔබ භික්ෂුවගේ මළකඳ දැකලා කනගාටු වුවහොත්, වැළපුණහොත් ඔබ මළකඳක් තුළින් මළකඳක්ම, අධර්මයක්ම දැක්ක අවාසනාවන්තයෙක්ම වෙනවා.

# විඥ්ඥාණයේ අනාගතයට සංස්කාර අස්වද්දාගන්නා රඟ දකින්න

**(සංස්කාර)**

පින්වත් ඔබ වර්තමානයේ සිටම 'මහ රහතුන් වැඩි මග ඔස්සේ' කියලා මතකයට එනකොටම, 'සංස්කාරයෝ අනිත්‍යයි' කියලා දකිමින් පුහුණු වෙන්න. ඔබට මේ සටහන් තබන භික්ෂුව සිහිපත් වුණොත්, ඒ මොහොතේම, භික්ෂුවගේ රූපය මළ කඳක් කොට දකින්න. ඒ මළකඳ මහපොළොවට පස්වෙනවා නුවණින් දකින්න. ඔබ දෙපා තබාගෙන සිටින මහ පොළොවේ පස, නුවණින් දකිමින් සියළු සංස්කාරයෝ අනිත්‍යයි... අනිත්‍යයි.. වශයෙන් නුවණින් මෙනෙහි කරන්න.

අතීතයේ වැඩසිටි රහතන් වහන්සේලා, රහත් උත්තමාවියන් වහන්සේලා ලක්ෂ ගණනකගේ දේහයන් අනිත්‍යභාවයට පත්වී සකස්වුණ පස නැමැති සතර මහා ධාතුව මතයි පින්වත් ඔබ මේ මොහොතේ දෙපා තබාගෙන සිටින්නේ. නික්ලේශී උතුමන්ගේ අතීත තෘෂ්ණාවෙන් හැදුණ සතර මහා ධාතුව නමැති රූපය, සතර මහා ධාතුවටම එකතුකොට දීලා උන්වහන්සේලා නිවී යන්නේ, සංස්කාරයන්ගේ නිරෝධය නිසාමයි. රහතන් වහන්සේලා සර්පයෙක් හැව අරින්නා සේ රූපය කෙරෙහි තෘෂ්ණාව අතහැර, රූපය සතරමහා ධාතුවටම මුසුකොට නිවී යද්දී අපි තවමත් රූපය මගේ කොටගෙන සංස්කාරයන් රැස්කොට ගන්නවා. පොහොසත් පින්වතාත් සංස්කාර රැස්කරනවා. දුප්පත් පින්වතාත් සංස්කාර රැස්කරනවා. හඬන පින්වතාත් සංස්කාර රැස්කරනවා. සිනහවෙන

පින්වතාත් සංස්කාර රැස්කරනවා. සිල්වත් පින්වතාත්, දුසිල්වත් පින්වතාත් සංස්කාර රැස්කරනවා. ලෝකය තේරුම්ගන්න බැරි අවුලක්ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ඉහත අවුල නිසාමයි. මේ සෑම අවුලක්ම තම අවබෝධඥානයෙන්, 'සියළු සංස්කාරයෝ අනිත්‍යයි' කියන එකම අර්ථයම අරගෙන පංච උපාදානස්කන්ධය නිශේධකොට දමන්නේ 'රහතන් වහන්සේ' කියන අර්ථයයි.

සංස්කාරයන් ගැන මේ සටහන ලියන වෙලාවේ සංස්කාරයන්ගේ වියරු, කටුක යථා ස්වභාවය ලෝකයට තම උතුම් සම්මා සම්බුද්ධ ඥානයෙන් අවබෝධකොට දේශනාකොට වදාල ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සම්බුදු අසිරියෙන් බබලන රූපකාය භික්ෂුවට මැවිලා පෙනෙනවා. බුදුරජාණන් වහන්සේ, පටිච්චසමුප්පන්නව පිරිනිවීගොස්, දැනට වසර දෙදහස් හයසියයක් ගත වී තිබුණත්, මෙය සටහන් තබන භික්ෂුව තවමත් බුදුරජාණන් වහන්සේගේ සිවුරු කොන අල්ලාගෙන බුදුරජාණන් වහන්සේ පසුපසින් වඩින භික්ෂුවක්මයි. බුදුරජාණන් වහන්සේ ඈත්වුණේ නැහැ. ඈත්වෙලා නැහැ. බුදුරජාණන් වහන්සේගේ සිවුරුකොන අල්ලාගෙන පසුපසින් වඩිනකොට දැනෙන සම්බුදු සිසිලස භික්ෂුවට තවමත් හැඟෙනවා. බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, ඥාණයන්, මහා කරුණා ගුණයන් භික්ෂුවට තවමත් දැනෙනවා. පෙනෙනවා. අපි ධර්ම විනයෙන් ඈත්වෙන්න, ඈත්වෙන්න බුදුරජාණන් වහන්සේ අපෙන් ඈතට යනවා. ධර්ම විනයෙන් ඈත් වූ භික්ෂුවකට බුදුරජාණන් වහන්සේ පිරිනිවීගොස් අවුරුදු දෙදහස් පන්සියයක්ම වෙනවා. ධර්ම විනය තුළ අවංකවම ජීවත්වෙන භික්ෂුවට බුදුරජාණන් වහන්සේගේ උපත, බුද්ධත්වය, පිරිනිවීම කියන තෙමගුල සමරන්න අවශ්‍ය නැහැ. මොකද උන්වහන්සේ තවමත් බුදුරජාණන් වහන්සේගේ සිවුරුකොන අල්ලාගෙන බුදුරජාණන් වහන්සේගේ පසුපසින් වඩින බුද්ධ ශ්‍රාවකයෙක්මයි. නමුත් මේ සෑම සංස්කාරයක්ම මොහොතින් මොහොත අනිත්‍යභාවයට පත්වෙනවා.

පංච උපාදානස්කන්ධ ධර්මයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සංස්කාර තුළත් විඥානය බැසගෙන තිබෙනවාය කියලා. දුප්පත් පින්වතෙක් සිටිනවා, ඔහුට තිබෙන එකම දේපළ තමයි පොල් අතු සෙවිල්ලූ කුඩා පැල්පත. සඳ තිබෙන රාත්‍රියක පොල්අතු අතරින් සඳඑළිය පෙනෙනවා. ඒ තරමටම දිරාගිය පැල්පතක්. නමුත් මේ දිරාගිය පැල්පත, මේ දුප්පත් පින්වතා, රාජ මන්දිරයක් වගේ තෘෂ්ණාවෙන් මගේ කොටගෙනයි ජීවත්වෙන්නේ. අතීත අකුසල් සංස්කාර හේතුවෙන් ලැබුණු දුගී පැල්පත කියන අල්ලා ගැනීම තුළ විඤ්ඤාණය බැසගෙන තිබෙනවා.

තවත් පින්වත් මහත්මයෙක් සිටිනවා, ඔහු මහා ධනවතෙක්. ඔහුට සුඛෝපභෝගී මහා මන්දිරයක් තිබෙනවා. ඔහු තමන්ට, පෙර කුසල් සංස්කාර නිසාම ලැබුණු මහා මන්දිරයේ තෘෂ්ණාවෙන් මගේ කොටගෙන ජීවත්වෙන්නේ. අතීත කුසල් සංස්කාර හේතුවෙන් ලැබුණ මහා මන්දිරය කියන අල්ලා ගැනීම තුළ විඥානය බැසගෙන තිබෙනවා. සංස්කාර ධර්මයන් තුළ, විඥානය නමැති මැජික්කරුවා බැසගෙන සිටින නිසාම සත්ත්වයා සංස්කාර හේතුවෙන් සකස්වෙන වියරු කටුක යථා ස්වභාවය මතුකොට ගන්නේ නැහැ. සංස්කාර වෙනස්වෙනවාය කියන දැක්ම මතුකොටගන්නේ නැහැ. මොකද අතීත සංස්කාර හේතුවෙන් සකස්වෙන විඥානය වර්තමාන සංස්කාරයන් තුළ බැසගෙන විඤ්ඤාණයේම පැවැත්මට අදාළ සංස්කාරයන් නැවත නැවත පෝෂණයකොට ගන්නවා. පටිච්ච සමුප්පාද ධර්මයේදී සංස්කාර හේතුවෙන් විඤ්ඤාණය සකස් වුණත්, පංච උපාදානස්කන්ධ ධර්මයේදී සංස්කාරයන් තුළ විඤ්ඤාණය බැසගෙන, විඤ්ඤාණයේ අනාගත පැවැත්මට අදාළ සංස්කාරයන් නැවත අස්වද්දාගන්නවා. විඤ්ඤාණය නමැති මැජික්කරුවාගේ සියුම් කපටි ක්‍රියාකාරකම් පින්වතුන්ලා බොහෝම සියුම්ව මතුකොට දක්වගන්න දක්ෂවෙන්න ඕනේ.

# උප්පැන්නයෙන් එහා ඔබේ සැබෑ වයස ගැන සිතන්න

**(සංස්කාර)**

භික්ෂුව දිනක් කුටියක වැඩසිටිනකොට පින්වත් මහත්මයෙක් කුටියේ කැපකරු මහත්මයා හරහා දැනුම් දුන්නා, හෙට උදේට පිණ්ඩපාත දානය බෙදන්න කුටියේ පිණ්ඩපාත මඩුවට එනවාය කියලා. භික්ෂුව උදෑසන පිණ්ඩපාත මඩුවට වැඩම කරලා විනාඩි කිහිපයකට පසුව, ලොකු බෑගයක් අරගෙන එම පින්වතුන් පැමිණියා. ගමේ පිණ්ඩපාතය බෙදන්න පැමිණි දායක පින්වතුන් දැන් බලාගෙන සිටිනවා. මේ මහත්වරුන් තම බෑගයෙන් රූපවාහිනී කැමරාවකුත්, කැමරා රඳවනයකුත් එළියට අරගෙන භික්ෂුව ඉදිරියේ කැමරාව ස්ථානගත කළා. ඒ මොහොතේ භික්ෂුව, මනුෂ්‍යයාගේ සංස්කාර තුළ බැසගෙන විඤ්ඤාණය නමැති මැජික්කරුවා කරන මැජික් සන්දර්ශනය නුවණින් දකිමිනුයි හිටියේ. කැමරාව සූදානම් කරලා තමයි එම මහත්වරු පාත්තරයට දානය බෙදුවේ. දානය පූජාකරනකොට භික්ෂුවට තේරුණා දානයට වඩා මුල්තැනදීලා තිබුණේ කැමරාකරණයටය කියලා.

දවස් කිහිපයකට පස්සේ භික්ෂුවට ආරංචි වුණා, එදා බෙදුව පිණ්ඩපාත දානයේ දර්ශන අන්තර්ජාලයේ පළවී තිබුණාය කියලා. පින්වත් ඔබ නුවණින් දකින්න. ඔබ වර්තමානයේ රැස්කරන කුසල් සංස්කාරයන් තුළ විඤ්ඤාණය බැසගෙන, එම කුසල් සංස්කාරයන් නැවත මමත්වයේ දැඩිභාවයෙන් තෙත්කරනවා.

සංස්කාර අනිත්‍යභාවයට පත්වීයන වේගයෙන්ම, විඤ්ඤාණය නමැති මැජික්කරුවා නැවත නැවත සංස්කාර පෝෂණය කොට දෙනවා. රූපය කෙරෙහි ඔබ ඇතිකරගන්නා වූ තෘෂ්ණාව, විඤ්ඤාණයේ පෝෂණයට තිබෙන හොඳම උපකාර ධර්මය වෙනවා.

භික්ෂුව තම භික්ෂු ජීවිතයේ අටවෙනි වස්කාලයයි මේ ලියන මොහොතවන විට ගත කරන්නේ. විශාල ජල යෝජනා ක්‍රමයක් ආශ්‍රිත කොලනි ගම්මානයක් වශයෙන් හඳුන්වන ගම්මානයක කුඩා කුටියකයි, භික්ෂුව වස්ශීලය සමාදන්ව වැඩසිටින්නේ. ගමේ පින්වතුන් කෙසෙල් වගාව, වී ගොවිතැන සහ රටකජු වගාව තමයි ජීවිකාව හැටියට කරන්නේ. අද උදෑසන භික්ෂුවට පිණ්ඩපාතයට, තම්බපු රටකජු පාර්සලයක් පාත්‍රයට පූජාකළා. භික්ෂුව කොලෙස්ටරෝල් ගැන නොසිතාම එය වැළඳුවා. ආහාරයක් වළඳන වෙලාවට, ශරීරයට සම්බන්ධ ලෙඩක් මතක් වෙනවා නම්, එයත් අතීත අකුසල් විපාකයක්මයි. ලෙඩ ගැන මතක්වෙනකොට භික්ෂුවට භික්ෂුවගේ වයස මතක්වුණා. භික්ෂුව ඉපදුණේ 1962 දෙසැම්බර් මස 21 වැනි සිකුරාදා රාත්‍රී 10.07ට. ලග්නය සිංහ. නවාංශකය මේෂ. භික්ෂුවට උපන් දිනයට අදාළ ඉහත දත්තයන් තවමත් මතකයේ තිබෙන්නේ, ගිහි කාලයේදී මනාලියන්ට හඳහන් පිටපත් ලියලයි. භික්ෂුවට උපන් වෙලාව, නැකත, දවස තවමත් මතකයේ තිබෙන්න තරම් ගිහිකාලයේ මනාලියන්ට හඳහන් පිටපත් ලියලත්, විවාහයක් සිදුනොවුණේ අතීත අකුසල් සංස්කාරයන්ගේ ඵලයක් නිසාමයි. නමුත් භික්ෂුව දක්ෂවුණා එම අකුසල් සංස්කාරය කුසල් සංස්කාරයක් බවට පත්කරගන්න. එය සැබැවින්ම භික්ෂුවගේ යම් අකුසල් සංස්කාරයක ඵලයක් වගේම මෙය කියවන ඔබගේ කුසල් සංස්කාරයන්ගේ ඵලයක්.

භික්ෂුව මොහොතක් දෑස් පියාගෙන අතීතය මෙනෙහි කරනකොට, භික්ෂුවට මැවිලා පෙනෙනවා, පටිච්ච සමුප්පන්නව සංස්කාර පච්චයා විඤ්ඤාණ හේතුවෙන් සකස්වුණ අවුරුදු

කෝටි ප්‍රකෝටි ගණනක් වයසැති මහත් සේ මුහුකුරා ගිය ගොරහැඩි මනුෂ්‍යයෙක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක් සතර අපාසත්ත්වයෙක්ගේ එකතුවක්. සම්මුති ලෝකය තුළ බැසගෙන මේ සටහන තබන මොහොතවන විට භික්ෂුවගේ වයස අවුරුදු 54ක් වුණාට, සංසාරයේ අවිද්‍යාව නිසා සකස්වුණු හේතුඵල ධර්මයන්ට, අවුරුදු කෝටි ගණනක අතීතයක් තිබෙනවා. ඉහත ගොරහැඩි වයසක ලෝකයේ, ඔබව තරුණකරලා, නැවුම් කරලා දෙන්නේ සංස්කාර සහ සංස්කාරයන් හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වයයි.

පින්වත් ඔබ ඉහත කරුණු ආත්ම සංඥාවෙන් ගන්න එපා. 'පටිච්ච සමුප්පන්න' කියන වචනය භික්ෂුව නිතර යොදන්නේ පින්වත් ඔබ එම අනතුරින් වලක්වාගන්නයි.

# සංසාරයත් සංස්කාරත් අතර ඇති සංසිද්ධිය කෙසේද යත්....

**(සංස්කාර)**

පංච උපාදානස්කන්ධයට අදාළව, සංස්කාරයන්ගේ අනිත්‍යභාවය ගැන, මෙම සටහන අවසන් කිරීමට සූදානම්වන මොහොතේ, භික්ෂුවගේ භික්ෂු ජීවිතයේ මුල් මාස කිහිපය තුළ විපාකයට පැමිණි, කුසල් සංස්කාරයක් ගැන මෙහි සටහන් තබනවා. භික්ෂුවට මතක්වෙනවා මීට වසර අටකට පෙරාතුව, භික්ෂුව සාමණේරකෙනෙක් වශයෙන් ආරණ්‍යයක වැඩසිටියදී අහම්බෙන් වගේ සිදුවූ හමුවීමක්. ඒ හමුවීම තමයි මෙම ලිපිපෙළ ඉදිරිපත් කරන ඉන්ද්‍රජිත් සුබසිංහ මහත්මයාගේ හමුවීම. කළුතර වසන්ත සර් නමැති පින්වත් ඉංග්‍රීසි ගුරු මහත්මයෙක්ගේ (සංස්කාරක සටහන - මෙම ලිපිය පළවන මොහොත වන විට හෙතෙම පැවිදි බිමට පත්ව සිටියි) ශිෂ්‍යයන් වශයෙන් ආරණ්‍යයේ පිළිසකර කිරීමේ කටයුත්තකට පැමිණ සිටියදීයි, ඉන්ද්‍රජිත් සුබසිංහ මහත්මයාව, මුල්වරට භික්ෂුවට මුණගැසුණේ. යම් හෙයකින් මීට වසර අටකට පෙරාතුව, භික්ෂුවට ඉන්ද්‍රජිත් සුබසිංහ මහත්මයා මුණනොගැසුණා නම්, භික්ෂුව කැලයේම පිපිලා, කැලයේම පරවෙලා යනවා. කැලයේ බඹරු කැලයේ මලෙන් රොන් අරගෙන, සතුටු වී යනවා පමණක්මයි, කරන්නේ. කැලයේ බඹරු කවදාවත් මලෙන් අහන්නේ නැහැ, මේ මල හටගත්තේ කොහොමද කියලා. මේ මල පිපුණේ කොහොමද කියලා. මේ මල සුවඳ හමන්නේ ඇයි කියලා. මේ මල පරවෙලා යන්නේ ඇයි කියලා. කැලේ බඹරුන්ට කැලේ මල්වලින් ඉහත

ප්‍රශ්න අහන්න තේරුමක් නැහැ. කැලේ බඹරු මල්වලින් රොන් අරගෙන සතුටුවෙනවා පමණක්මයි කරන්නේ.

මෙතැනදී කැලයේ බඹරු යැයි භික්ෂුව සටහන් කළේ, කුටි ආශ්‍රිතව ඇත ගම්මානවල ජීවත්වෙන අහිංසක ජනතාව. කැලේ බඹරු රොන් අරගෙන පමණක් සතුටුවෙනවාය කියලා සටහන් කළේ, එම කුටි ආශ්‍රිත ජනතාව පිණ්ඩපාතය බෙදලා සතුටුවෙනවා පමණක්මයි. කවදාවත් භික්ෂුවගෙන් අහන්නේ නැහැ අපි ඉපදුනේ කොහොමද? කියලා. අවිද්‍යාව කියන්නේ කුමක්ද කියලා. මනුෂ්‍යයාට සැප දුක් ලැබෙන්නේ කොහොමද කියලා. අපි මැරුණට පස්සේ මොනවද වෙන්නේ කියලා. එම ගම්මානවල අහිංසක පින්වතුන් දානයේ සතුට පමණයි ලබන්නේ.

මීට වසර අටකට පෙරාතුව කැලයේ පිපිලා කැලයේම පරවෙලා යන්නට තිබුණු මලක් 'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ' නමින් ලෝකයටම පූජාකොට ගත්තේ ඉන්ද්‍රජිත් සුබසිංහ මහත්මයා. එසේ නොවන්න මේ මල කැලයේම පරවෙලා යන්නට තිබුණා. එහෙත් භික්ෂුව කැලයේ පිපී කැලයේම පරවීයන මලක් නොවන්නට තිබූ නිසාමයි ඉන්ද්‍රජිත් සුබසිංහ මහත්මයත්, 'දිවයින' පුවත්පත් ආයතනයත්, ඊට උපකාර ධර්මයන් සකස් කොටදුන් ගෞරවනීය ස්වාමීන් වහන්සේලාත්, ගිහි පින්වතුනුත්, පින්වතියනුත්, කිසිම ආයාසයකින් තොරවම අතීතයේ භික්ෂුවට මුණගැසුනේ.

සංස්කාරයන් ලෝකය මුණගස්වනවා. ලෝකය පාලනය කරනවා. ලෝකය ගොඩනගනවා. ලෝකය වෙනස් කරනවා. ලෝකය විනාශ කරනවා. නමුත් මේ හැම සංස්කාරයක්ම අනිත්‍ය වී යනවා. වෙනස් වී යනවා. විකෘති වී යනවා. අහිමි වී යනවා.

පංච උපාදානස්කන්ධයට අදාළ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය ගැන සටහන අවසන් කරන මොහොතේ, භික්ෂුව දෑස් පියාගෙන ආවර්ජනය කරනවා, වර්තමානයේ 'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ' ලිපි පෙළෙන් හමුවූ අපි සියළුදෙනාම,

වර්තමානයේ එකට ඉඳගෙන මේ සටහන් කියනවා වගේම, මේ සටහන් ගැන සාකච්ඡා කරනවා වගේම, සද්ධර්මය ශ්‍රවණය කරනවා වගේම, අතීතයේ ඔබත් මමත් ජීවමාන බුදුරජාණන් වහන්සේලා ඉදිරියේ සන්සුන්ව වාඩිවී, සද්ධර්ම ශ්‍රවණය කරන්නට ඇති. එකම සම්මා සම්බුද්ධ ශාසනයේ, එකට පැවිදි උපසම්පදාව ලබලා ඉන්නට ඇති. එක අම්මා කෙනෙක්ගේ දරුවෝ වෙලා ඉපදිලා ඉන්නට ඇති. එක තිරිසන් අම්මගේ තනබුරුල්ලෙන් එකට කිරිඋරාබොන්න ඇති. එකම ප්‍රේත පවුලේ සාමාජිකයන්ව සිටින්නට ඇති. එකම යුදබිමේ එකට මියයන්න ඇති. එකම දංගෙඩියේ පෙළට හිස්ගැසුම්කන්න ඇති. එකම ලොහොකුඹු නිරයේ එකට පැහෙන්නට ඇති. එකම සක්විති රජුන්ට දාව පුතුන් ලෙස ඉපදෙන්න ඇති. එකම ශක්‍රයාට දාව පුතුන් ලෙස ඉපදෙන්න ඇති. එකම මාරයාගේ පරිවාර සේනාව වී සිටින්නට ඇති. වර්තමානයේ අපි එකට එකතුවී 'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ' ලිපි පෙළ කියනවා. සංසාරයක් පුරාවට සංස්කාරයන් අනිත්‍යභාවය, විකෘතිභාවය, වෙනස්වන ස්වභාවය නුවණින් දකිමින් වර්තමානයේ 'මහ රහතුන් වැඩිමග ඔස්සේ' සටහන්පෙළ පරිශීලනය කිරීමෙන් රැස්වෙන කුසල් සංස්කාරයන්ට බැඳෙන්න එපා. සංස්කාරයෝ විෂමයි, කටුකයි, දුකයි, සැපයි වශයෙන් සංස්කාරයන් කෙරෙහි කළකිරීම ඇතිකර ගන්න.

තව ටික දිනකින් මේ ලිපිපෙළත් අවසන් වෙලා යාවී. එදාට පින්වත් ඔබලාට 'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ' කියන නාමයත් මතකයෙන් ගිලිහිලා යාවී. සියළු සංස්කාරයෝ අනිත්‍යභාවයට පත්වෙමින් ලෝකය ගලාගෙන යාවී. 'මහ රහතුන් වැඩිමඟ ඔස්සේ' ලිපි පෙළ ප්‍රයෝජනයට ගනිමින්, ගලාගෙන යන ලෝකය උපරිම ආත්මභාව හතකට සීමාකොටගැනීමට දක්ෂ පින්වතා, පින්වතිය 'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ' ගමන් මාර්ගයට අවතීර්ණ වූ දක්ෂයන් අතර සැබෑම දක්ෂයන් වේවි.

# කබරයෙක් කියාදුන් සංස්කාර පිළිබඳ පාඩම

**(සංස්කාර)**

භික්ෂුව වැඩසිටින කුටිය ප්‍රදේශයේ විසිදෙනෙක්ගෙන් පමණ සමන්විත වඳුරු රංචුවක් ජීවත්වෙනවා. මේ වඳුරු රංචුවෙන් ගම්මානයේ ගොවි ජනතාවට ගොඩක් හිරිහැර වෙනවා. පසුගිය සතියේ දවසක එක් වැඩුණු වඳුරෙක් මුළු දවසම කුටිය ඉදිරිපිට ගසේ රෝගීව සිටියා. ගමේ කෙනෙක් තියුණු පිහියකින් පසුපස ප්‍රදේශයට පහරදීලා. අඟලක පමණ කැපුමක් නිසා වඳුරාගේ පසුපස කකුල පණ නැහැ. සවස් වෙනවිට වඳුරා ගහෙන් බැහැල බොහොම අමාරුවෙන් කුටිය පසුපස ප්‍රදේශයට යනවා භික්ෂුව දැක්කා. ඊට දිනදෙකකට පසුව එම රෝගී වඳුරා භික්ෂුවගේ කුඩා කුස්සිය අසල මියගොස් තිබුණා. දවල් කාලයේ බල්ලන්ගෙන් හා රාත්‍රී කාලයේ නරියන්ගෙන් වන මරණ බිය නිසාම, තමන් අනතුරකට පත් වී ඇතැයි දැනගැනීම නිසාම, ආරක්ෂාවට වඳුරා භික්ෂුවගේ කුස්සිය අසලම රැඳී මියගිහින්.

භික්ෂුව ඒ වඳුරු මළකුණ කැළයට ගිහින් දැම්මා. වඳුරු මළකුණේ කුණු ගඳට වහවැටිල මළකුණ ගිල දමන්න, කුණු මස් අනුභව කරලාම පෘෂ්ටිමත් වෙච්ච ලොකු කබරයින් දෙදෙනෙක් ඇවිත් සිටියා. මොහොතකින් කබරයින් දෙදෙනා මළකුණට ගැටී, එක කබරයෙක් පිටුපස අනෙක් කබරයා ලුහුබැන්දා. මරබියෙන් වේගයෙන් භික්ෂුවගේ කුටිය දෙසට දිවගෙන පැමිණි කබරයා, කුටිය ඉදිරිපිට තිබෙන විශාල ගසේ මීටර් 10ක් පමණ

උස අත්තකට බඩගෑවා. මරණ බිය නිසාම පුදුම වේගයක්, පුදුම ජවයක් එම කබරයාට ඒ වෙලාවේ තිබුණේ.

මේ කබරයා ගසට නැග්ග වෙලාවේ සිටම භික්ෂුවට කුටියේ වැඩසිටින්න බැහැ. ඒ තරමට කුණු ගඳ. ගස් උඩ සිටින කබරයා, කුණුමස් ගොඩවල් උඩ ලැගලා කබරයන්ගේ ශරීරයෙන් මහා මළකුණු ගඳක් වහනය වෙනවා. එම කබරයින්ගේ ශරීරයත් තෙත බරිතයි. සම හරිම පිළිකුල් සහගතයි. කබරයාගේ ශරීරයෙන් වහනය වෙන්නේ හරිම අප්‍රසන්න, පිළිකුල් දුගඳක්. නමුත් මේ කබරයා තම ශරීරයෙන් හමන මළකුණු දුගඳ පුදුමාකාර සැපවේදනාවක් කරගෙනයි ජීවත්වෙන්නේ. පින්වත් ඔබ මිල අධික ඉස්තරම් සුවඳ විලවුන් වර්ගයන් ඇඟ තවරා ගෙන එම සුවඳින් යම්සේද තෘප්තිමත් වෙන්නේ, මේ කබරයෝ තම ශරීරයෙන් වහනයවන මළකුණු ගඳින් ඒ තරමටම තෘප්තිමත් වෙනවා.

පින්වත් ඔබ නුවණින් දකින්න, කබරායාට මෙතරම් කුණු ගඳක් සැප වේදනාවක් කොට දකින්න කබරයා අතීතයේ මොනතරම් බලවත් අකුසල් සංස්කාරයක් සිදුකොට ගෙන ඇතිද කියලා.

පින්වත් ඔබ මහා සංඝ රත්නයට, ධර්මරත්නයට, බොරුවෙන්, චෝදනාවෙන්, විවේචනය කිරීමෙන් දුර්ගන්ධයම සැප වේදනාවක් බවට පත්වෙන, කබරකුලයේ උපතකට අවශ්‍ය අකුසල් සංස්කාරයන් සකස්වෙන්න පුළුවන්. පටිච්ච සමුප්පන්නව මේ කබරයෝත් අනාගත භවයක ඉස්තරම්ම මිල අධික සුවඳ විලවුන් පාවිච්චි කරන, වත්කම් අධික මනුෂ්‍යයෙක් වෙන්නත් පුළුවන්. සංස්කාරයෝ කටුකයි, වියරුයි, විෂමයි, අම්හිරියි, මිහිරියි, දුගඳයි, සුගන්ධයි, සැපයි..... සංස්කාරයෝ මිරිඟුවක්මයි.

(පංච උපාදානස්කන්ධයට අදාළ 'සංස්කාර'
කොටස මෙතැනින් නිමවේ)

# විශේෂයෙන් දැනගත් දේ එලෙසින්ම රැඳුනේද?

(විඤ්ඤාණය)

පින්වත් ඔබ පංච උපාදානස්කන්ධ ධර්මයට අදාළව ඇසෙන් රූපයක් දකිනවා, කනෙන් ශබ්දයක් අසනවා, මනසින් සිතුවිල්ලක් සිතනවා. දැක්කදෙයට, ඇසුණ දෙයට, දැනුණ දෙයට ඔබ ඇලෙනවා, ගැටෙනවා, උපේක්ෂා සහගත වෙනවා. ඇලුණ, ගැටුණ, උපේක්ෂාසහගත වෙච්ච දෙය ඔබ හඳුනා ගන්නවා. හඳුනාගත් දෙය ගැන ඔබ සිතනවා. සිතනදෙය ගැන ඔබ මොකක්ද කරන්නේ විශේෂවූ දැනීමක් ඇතිකර ගන්නවා. මෙතනදි විශේෂවූ දැනීම කියන්නේ විඤ්ඤාණයයි.

සංස්කාර පච්චයා විඤ්ඤාණ... සංස්කාර නිරෝධෝ විඤ්ඤාණ නිරෝධා.... සංස්කාර ඇසුරෙන් සකස්වෙන ඵලයයි විඤ්ඤාණය කියන්නේ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා විඤ්ඤාණය රූප, වේදනා, සංඥා, සංස්කාර ධර්මයන් තුළ බැසගෙන සිටිනවාය කියල. විඤ්ඤාණය කියන ධර්මතාවයන් අතීත, වර්තමාන, අනාගත වශයෙන්, අනිත්‍ය දකින්න පින්වත් ඔබ දක්ෂවෙන්න ඕන.

පින්වත් ඔබ මගුල් ගෙදරක යනවා. කෙනෙක් ඔබෙන් අහනවා 'කොහොමද මගුල් ගෙදර' කියලා. ඔබ කියනව 'හරිම ෂෝක්' කියල. කෙනෙක් ඔබට රසවත් ආහාරවේලක් ලබා දීලා, ඔහු අහනව 'කොහොමද ආහාරවේල' කියලා. ඔබ කියනවා 'හරිම රසවත්' කියලා. කෙනෙක් ඔබට රසවත් බීමක් පිළිගන්වල,

ඔබෙන් අහනවා 'කොහොමද බීම වීදුරුව' කියල. ඔබ කියනවා හරිම ඉස්තරම් කියලා. කෙනෙක් ඔබට කසාය වීදුරුවක් බොන්න දීල, ඔහු ඔබෙන් අහනවා 'බෙහෙත කොහොමද?' කියලා. ඔබ කියනවා 'හරිම තිත්තයි' කියල. ඔබ අලුතින් වාහනයක් මිලදී ගන්නවා. කෙනෙක් ඔබෙන් අහනවා 'කොහොමද වාහනය' කියලා. ඔබ කියනවා 'වෙඩි වගේ' ය කියල. අලුත විවාහවුණ කෙනෙක්ගෙන් ඔබ අහනවා 'කොහොමද මනමාලි' කියල. එවිට ඔහු කියනව 'ඇය මගෙ අම්මා වගේ ගුණවත්' ය කියලා. පින්වත් ඔබ වර්තමානයේ යම් රූපයක් ඇසුරු කරලා, එම රූපයට ඇලිල, ගැටිල, උපේක්ෂා සහගත වෙලා, ඇලුණ ගැටුණ දෙය හඳුනාගෙන, හඳුනාගත් දෙය ගැන සිතලා, සිතපු දෙය ගැන විශේෂ දැනීමක් ඇතිකොට ගන්නවා නම්, ඒ සෑම විශේෂ දැකීමක්ම විඤ්ඤාණයක්ම නිත්‍යද? අනිත්‍යයද?

වෙනස්වෙලා යනවා. අනිත්‍යවෙලා යනවා.

ඔබම හොඳයි කියල විශේෂ දැකීමක් ඇතිකරගත් ඔබේ බිරිඳ, ස්වාමි පුරුෂයා ඔබව පසුකාලයක දික්කසාද කර දමනවා. මේ මොහොතේ ඔබේ දිවට දැනෙන තිත්ත රසය, පැණි රසය මොහොතකින් වෙනස් වී යනවා. අද සුළඟ හරිම සනීපයි. අව්ව හරිම උෂ්ණයි. මීදුම හරිම ශීතලයි... ඔබ ඇතිකොට ගත්තාවූ සෑම විශේෂ දැකීමක්ම අනිත්‍යවෙලා යනවා. පින්වත් ඔබ වර්තමානයේ අනිත්‍යවූ සෑම විශේෂ දැකීමකම විඤ්ඤාණයේ අනිත්‍යභාවය නුවණින් දකින්න. පින්වත් ඔබ බොහෝම සිහිනුවණින් දකින්න, ඔබ කරන සෑම ක්‍රියාවකදීම ඔබ විශේෂ දැනීමක් ඇතිකර ගන්නවා. හොඳයි නරකයි, පහසුයි අපහසුයි, තිත්තයි පැණිරසයි, සනීපයි අසනීපයි, කැතයි ලස්සනයි, ගුණයි අගුණයි, සත්පුරුෂයි අසත්පුරුෂයි.... මේ සෑම විශේෂ වූ දැකීමක්ම නිරතුරුව වෙනස් වී යනවා, අනිත්‍ය වී යන හැටි නුවණින් දකින්න. එය වර්තමාන විඤ්ඤාණය අනිත්‍යබව නුවණින් දැකීමයි.

දෙවනුව ඔබ අතීත විඤ්ඤාණයේ අනිත්‍යභාවය නුවණින් දකින්න. පින්වත් ඔබ අතීතයේ අම්මාගේ ගර්භාෂ කුටියේ

වැඩෙනවිට, මව් උණුසුම ලබනවිට, මව්කිරි බොනවිට, තොටිල්ලේ නැලවෙනවිට, සෙල්ලම්බඩු සමග සෙල්ලම් කරනවිට, අධ්‍යාපනය ලබන විට, සමාජ ඇසුර ලබනවිට, ආදරය කරනවිට, ඇතිකරගත් විශේෂ දැනීම නුවණින් දකින්න. මට හොඳටෝම උණ, මට සෙම් ගෙඩි, මට පිළිකාවක්, මට දරුවෙක් ලැබෙන්නට යනවා, දරුවා නම් පුතෙක්මයි.... මේ සෑම විශේෂ දැනීමක්ම අනිත්‍ය වී ගියා. අතීතයේ ඔබ යම් පුද්ගල වර්ග හඳුනාගෙන එම හඳුනාගත් චරිත ගැන හිතලා විශේෂවූ දැනීම් ඇතිකොට ගත්තා නේද? ඔහු ශීල්වතෙක්, ඔහු ගුණවතෙක්, ඔහු බේබද්දෙක්, ඔහු සමාජ සේවකයෙක්, ඔහු ජනතාවගේම නායකයෙක්, ඔහු පිරිසිදු චරිතයක්ය කියලා. අතීතයේ ඔබ ඇතිකරගත් මෙවැනි සෑම අතීත දැනීමක්ම වෙනස් වී ගිය හැටි නුවණින් දකින්න.

අතීතයේ භික්ෂුවගේ තරුණ ගිහිකාලයේ එක් අලුත් අවුරුදු සමයක මම මත්වතුර පානය කරල සිටිනවා දැක්ක මගේ වැඩිහිටි ඥාතිවරයෙක්. මට කිව්ව 'පුතේ උඹ කවදහරි බේබද්දෙක් වෙනවා' කියල. ඒ විශේෂවු දැනීම, එම වැඩිහිටි පින්වතාගේ විඤ්ඤාණය වෙනස් වී ගියා. අනිත්‍ය වී ගියා. අංගුලිමාල ඇඟිලි මාලයක් කරවටා දමාගෙන මිනී මරනකොට ජනතාව ඇතිකරගත් 'මිනීමරුවෙක්' ය කියන විශේෂ දැනීම අංගුලිමාල තරුණයා බුදුරජාණන් වහන්සේ සරණ යද්දී වෙනස් වී ගියා. අනිත්‍ය වී ගියා. පටාචාරාව අඩ නිරුවතින් බුදුරජාණන් වහන්සේ අභියසට පැමිණෙනවිට, ජනතාව ඇතිකරගත් පටාචාරා පිස්සියක් කියන විශේෂ දැනීම, පටාචාරාව බුදුරජාණන් වහන්සේ සරණ පිහිටි පසු වෙනස් වී ගියා. අනිත්‍ය වී ගියා.

# ඊයේත් අදත් හෙටත් විඤ්ඤාණයේ හිස් බව දකින්න

(විඤ්ඤාණය)

අතීතයේ ඔබ පටිච්ච සමුප්පන්නව සක්විති රජවෙලා සිටියදී රාජ භෝජන නිසා, රාජ්‍ය සම්පත්, රාජ්‍ය බලය නිසා, දිව්‍යාංගනාවන්, ස්ත්‍රීරත්නය නිසා ලෝකයම දිග්විජය කරන පුතුන් දහසක් නිසා, සෘර්ධියෙන් යන අජානේය අශ්වයා නිසා, මොනතරම් විශේෂ වූ දැනීම් ඇතිකොට ගන්න ඇතිද.

සශ්‍රික දිව්‍යතලවල ඉපදෙන වෙලාවේ, සශ්‍රික දිව්‍යසැප නිසා, දිව්‍ය භෝජන, දිව්‍ය අප්සරාවන්, දිව්‍ය විමාන නිසා මොනතරම් විශේෂවූ දැනීම් ඇතිකොට ගන්න ඇතිද.

පින්වත් ඔබ සතර අපායන්ට වැටුණු වෙලාවේ මොනතරම් විශේෂ වූ දැනීම් ඇතිකොට ගන්නට ඇතිද. පිච්චෙනවා, දැවෙනවා, ගිනි ගන්නවා, බඩගිනියි, පිපාසයෙන් දිව ගිලෙනවා.... මේ සෑම විශේෂ වූ දැනීමක්ම අනිත්‍ය වී ගිය හැටි නුවණින් දකිමින්, අතීත විඤ්ඤාණයේ අනිත්‍යභාවය ජීවිතයට පුහුණුකොට ගන්න.

අතීතයේ පින්වත් ඔබ පටිච්ච සමුප්පන්නව දිව්‍ය තල, බ්‍රහ්ම තලවල, මනුෂ්‍ය ලෝකයේත්, සතර අපායන්හී උපත ලද මොහොතේ සැපත් දුකත් නිසා, හඳුනාගැනීම නිසා, කුසල් අකුසල් සංස්කාර නිසා, ඇතිවුණාවූ සෑම විඤ්ඤාණයක්ම අනිත්‍ය වී ගියා. වෙනස් වී ගියා. විකෘති වී ගියා.

දැන් ඔබට වැටහෙනවා අතීත, වර්තමාන විඥානය අනිත්‍යයි කියලා. පින්වත් ඔබ මේ සටහන කියවලා, ඔබ තුළ විශේෂ දැනීමක් ඇතිවේවි, මේ සටහන ධර්මානුකූලව අර්ථවත් කියලා. තව පින්වතෙක් තුළ විශේෂ දැනීමක් ඇතිවෙන්න පුළුවන්, මේ සටහන හිස් දෙයක්ය කියලා. මනුෂ්‍යයා තුළ සකස්වෙන, සෑම විඤ්ඤාණයක්ම වෙනස්වෙලා යනවා.

භික්ෂුව මුණගැසුන එක්තරා වයෝවෘර්ධ ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුව හඳුනාගෙන, භික්ෂුවට ප්‍රසංශා කළා, ඔබ හරිම විනයගරුක භික්ෂුවක් කියලා. ඊට දින කිහිපයකට පස්සේ උන්වහන්සේ භික්ෂුවට චෝදනා කරනවා 'පත්තරකාරයෝ, පත්තර විකුණාගන්න මෝඩයින්ව උස්සලා තියනවා' කියලා. මෙම ප්‍රකාශය කළ භික්ෂුව මේ වනවිට අපවත්වෙලා. ඒ නිසයි භික්ෂුව ඉහත සටහන කළේ.

විශේෂ වූ දැනීම් නිරතුරුව වෙනස්වෙලා යනවා. ඊයේ ප්‍රසංශා කරපු පින්වතා, හෙට දවසේ ඒ ප්‍රසංශා ලැබූ තැනැත්තාටම 'මෝඩයා' කියා කියනවා. සංස්කාර හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණය, සංස්කාර අනිත්‍යභාවයට පත්වන වේගයෙන්ම වෙනස් වී යනවා. අතීත විඤ්ඤාණයත්, වර්තමාන විඤ්ඤාණයත් අනිත්‍ය නම්, වෙනස්වෙලා යනවා නම්, විකෘති වෙලා යනවා නම් ඔබ බලාපොරොත්තු තබාගෙන සිටින අනාගත විඤ්ඤාණය නිත්‍ය වෙයිද? අනිත්‍ය වෙයිද? පින්වත් ඔබේ හදවතට තට්ටුකොට අසන්න.

කොච්චර නම් අනාගත විශේෂ වූ දැනීම් ඔබ තුළ තෙරපාගෙන තිබෙනවාද. 'මම මෛත්‍රී බුදුරජාණන් වහන්සේ දැකලාමයි නිවන් අවබෝධ කොටගන්නේ. මම දිව්‍ය තලයකට බ්‍රහ්ම තලයකට ගිහිල්ලමයි නිවන් අවබෝධ කරගන්නේ.

මේ සෑම අනාගත විඤ්ඤාණයක්ම අනිත්‍ය වී යනවා.

අවුරුදු තිහක පමණ තරුණයෙක් භික්ෂුවට ඇවිත් කියනවා 'ස්වාමීන් වහන්ස මම ළඟදීම විවාහ වෙනවා. පිරිමි දරුවෙක් හදනවා. ඒ දරුවව ශාසනයට පූජා කරනවා. අපි දෙන්නා අවුරුදු පනහේදී පැවිදි වෙනවාය කියලා. අනිත්‍ය වූ විඤ්ඤාණය මනුෂ්‍යයාට අනාගතය පෙන්වා, ලස්සනට මුලා කරනවා.

පින්වත් ඔබ හොඳින් නුවණින් දකින්න, ඔබ රට, ජාතිය, ආගම නිසා ඔබේ පවුල, ඥාතීන් නිසා, ව්‍යාපාර, රැකියා, දේපොළ, ඔබේ අධ්‍යාපනය නිසා. ඔබේ දරුමුණුබුරන් නිසා, පින්කම්, කුසල් ධර්මයන් නිසා ඔබ අනාගතය ගැන මොනතරම් දැනීම් ඇතිකොටගෙන ජීවත්වෙනවාද.

පින්වත් දුටුගැමුණු රජතුමා අතීතයේ මේ රට එක්සේසත් කරලා 'මම මේ ධර්ම ද්වීපය එක්සේසත් කළාය, සම්මා සම්බුද්ධ ශාසනය ආරක්ෂා කළාය කියලා ඇතිකොටගත්තා වූ විශේෂ දැනීම නිරතුරුව වෙනස් වී ගියා. අනාගත විඤ්ඤාණයේ අනිත්‍යභාවය නුවණින් දකිමින් ජීවත්වෙන්න. අතීත විඤ්ඤාණය, වර්තමාන විඤ්ඤාණය අනිත්‍ය වී ගියා නම්, අනාගත විඤ්ඤාණය අනිත්‍යයයි.. අනිත්‍යයයි... වශයෙන් නුවණින් දකිමින් ජීවත් වෙන්න.

# ඔබ සංස්කාර තුරුල්කරගෙන නලවනවා නොවේද?

(විඤ්ඤාණය)

අතීත දීර්ඝ භව ගමනේ පටිච්ච සමුප්පන්නව 'උපාදාන පච්ඡයා භවෝ' කියන ධර්මතාවය තුළ සකස් වුණා වූ සෑම චුති චිත්තයක්ම, සෑම ප්‍රතිසන්ධි චිත්තයක්ම අනිත්‍ය වී ගියා. වෙනස්වී ගියා. විකෘති වී ගියා. පින්වත් ඔබ දෑස් පියාගෙන අතීතයේ සත්ත්වයෙක් ලෙස ඔබ තුළ සකස් වූ සෑම චුති චිත්තයක්ම, සෑම ප්‍රතිසන්ධි චිත්තයක්ම වෙනස් වී ගිය හැටි නුවණින් දකින්න. සංස්කාරයන් අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම සංස්කාර හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණය වෙනස් වී යනවා. පටිච්ච සමුප්පන්නව භවය සකස්කොට දෙන විඤ්ඤාණය නැමැති මැජික්කරුවාගේ අනිත්‍යභාවය, වෙනස්වන ස්වභාවය නුවණින් දකිමින් අතීත, වර්තමාන, අනාගත විඤ්ඤාණය කෙරෙහි කලකිරීම ඇතිකොට ගන්න.

පින්වත් ඔබ පටිච්ච සමුප්පන්නව හේතුඵල ධර්මයන්ට අනුව භවයෙන් භවය සකස්කොට දෙන විඤ්ඤාණයේ සියුම්, උපක්‍රමශීලී ක්‍රියාකාරීත්වය නුවණින් දකින්න. විඤ්ඤාණයේ සියුම් උපක්‍රමශීලී ක්‍රියාකාරීත්වය නුවණින් නොදකින නිසාම විඤ්ඤාණය හේතුවෙන් සකස්වෙන නාමරූපයන්ට පුද්ගලයා බැඳී යනවා.

භික්ෂුව මුණගැසීමට පැමිණි පින්වතුන් කණ්ඩායමක සිටි වයස අවුරුදු තුනක පමණ දැරියක් වැඩිහිටියන්ගේ පෙළඹවීමකින් තොරව භික්ෂුවට පසඟ පිහිටුවලා වන්දනා කළා. ඒ වෙලාවේ භික්ෂුව ප්‍රකාශ කළා මේ දරුවා නම් පෙර ජීවිතයේ හොඳ, වයසක උපාසක අම්මා කෙනෙක් වගේය කියලා. භික්ෂුව මෙම කාරණය කියනකොටම එම දැරියගේ පින්වත් අම්මා ගැටුණු ස්වභාවයක් ප්‍රකාශ වුණා, 'මගේ දරුවා වයසක උපාසකම්මා කෙනෙක් නොවේ' ය කියලා. විඤ්ඤාණය මගේ කොට ගත් තැනදී විඤ්ඤාණය හේතුවෙන් සකස්වෙන නාම රූප ධර්මයන් මගේ කොට තෘෂ්ණාවෙන් ගන්නවා. නාම රූප ධර්මයන් ආත්මය කර ගන්නවා. එවිට ආත්මය තුළ මම සිටිනවාය කියලා ගන්නවා. නාම රූප ධර්මයන් මගේ කොටගැනීමේදී සළායතන මගේ කොට ගන්නවා. ආධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත් එකම අවයවයක් කර දකිනවා. අම්මාත් දරුවාත් එකම ආත්මයක කොටසක් බව අයෝනිසෝ මනසිකාරයෙන් දකිනවා. දරුවාගේ ජීවිතය අම්මාගේ ජීවිතයකොට දකිනවා. පටිච්ච සමුප්පාද ධර්මය තුළ ජීවිතය විසිරුවා දකින්න දක්ෂ නැහැ.

පින්වත් ඔබේ හෘද සාක්ෂියෙන් ප්‍රශ්න කරන්න. ඔබ මේ මගේ කොටගෙන සුරතල් කරන දරුවා කවුද කියලා. කවුද මේ දරුවා...? තණ්හා පච්ඡයා උපදානං, උපාදාන පච්චයා භවෝ, භව පච්චයා ජාති... මෙන්න හමුවෙනවා දරුවා කවුද කියලා. දරුවා කියන්නේ තෘෂ්ණාවේ, ලෝභකමේ, මසුරුකමේ, කෑදරකමේ ඵලයක්. මෙය සටහන් තබන භික්ෂුවට නම් ලෝභකම, තෘෂ්ණාව එපාම එපා. එහෙත් පින්වත් ඔබ තුරුල්කරගෙන නලවනවා....

තෘෂ්ණාව හේතුවෙන් උපන් බබාලා නිසා අම්මලා, තාත්තලා තව තව තෘෂ්ණාව වැඩිකොට ගන්නේ, පටිච්ච සමුප්පාද ධර්මය තුළ ජීවිතය විසුරුවා දකින්න අපි තුළ ඇති අදක්ෂභාවය නිසාමයි. මෙය සටහන් තබන භික්ෂුවට තමන්ගේ මියගිය දෙමාපියන් සිහිපත්වෙනකොට, එම ජීවිත පටිච්ච සමුප්පාද ධර්මයේ අර්ථයන් පමණක්මයි. අපේ අම්මලා, තාත්තලා, දරුවා නමැති

බාහිර රූපයන් නිසා මොනතරම් අනාගත දැනීම් ඇතිකරගෙන, සිහින මාලිගාවල ජීවත් වෙනවාද. මගේ දරුවා අනාගතයේ වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවෙක්, ශ්‍රී ලංකා කණ්ඩායමේ ක්‍රීඩකයෙක්..... දෙමාපියන් මෙසේ ඇතිකොටගන්නා අනාගත දැනීම්, එසේත් නැතිනම් විඤ්ඤාණයන් අනිත්‍ය වී යනකොට, වෙනස් වී යනකොට, දුකම ජීවිතයකොට ගන්නවා. හදිසි අනතුරකින් පාසල් දරුවෙක් මියගිය අවස්ථාවකදී, එම දරුවාගේ දේහය බදාගෙන මවක් වැලපෙනවා, පුතේ උඹ මගේ අනාගත සිහින මාලිගා සේරම බිඳ දැම්මාය කියලා. අම්මා ඇතිකොටගත් අනාගත විඤ්ඤාණයන් ගැන ඇයගේ වර්තමාන විඤ්ඤාණය කතා කරනවා.

දැන් පින්වත් ඔබට හොඳින්ම වැටහෙනවා ඇති, විඤ්ඤාණය කියන ධර්මතාවයේ අර්ථය කුමක්ද කියලා. ඉහතින් භික්ෂුව සටහන් කරන ලද පංච උපාදානස්කන්ධ ධර්මයේ සරලම අර්ථය වෙන්නේ, ඔබ ඇසෙන් රූපයන් දකිනවා, කනෙන් ශබ්දයන් අසනවා, දිවෙන් රසයන් දැනගන්නවා- 'ඵස්සය' ඔබ දැක්ක දෙයට, ඇසුණ දෙයට, දැනුණ දෙයට, ඇලෙනවා, ගැටෙනවා, උපේක්ෂා සහගත වෙනවා - 'වේදනාව' ඇලුණ, ගැටුණ, උපේක්ෂා සහගත වෙච්ච දෙය ඔබ හඳුනා ගන්නවා- 'සංඥාව' හඳුගන්නා දෙය ගැන ඔබ සිතනවා - 'සංස්කාර' සිතන දෙය ඔබ දැන ගන්නවා. එසේත් නැතිනම් විශේෂ වූ දැනීමක් ඇතිකොට ගන්නවා - 'විඤ්ඤාණය'.

හේතුඵල ධර්මයන් නිසා හටගෙන නිරතුරුව වෙනස්වන, අනිත්‍යභාවයට පත්වෙන ධර්මතාවයන් පහක් සත්ත්වයා නිත්‍යභාවයෙන් ගැනීම නිසාම දුක කියන කාරණය සකස්කොට ගන්නවා.

# මාරයන් දෙදෙනෙකුගේ දාසයෙක්ද ඔබ?

(විඤ්ඤාණය)

පින්වත් ඔබ සමාජය තුළ ජීවත්වෙනකොට ඔබේ ඥාතිවරයා, ඔබේ අසල්වැසියා, ඔබේ මිතුරා, මිතුරියගේ හැසිරීම් නිරතුරුවම වෙනස්වෙනවා. සමහර පින්වතුන් භික්ෂුවට ඇවිත් කියනවා 'මගේ දරුවා හරිම කීකරුව හිටියේ. දැන් වෙනස්වෙලා. මගේ ස්වාමිපුරුෂයා මට හරිම ආදරෙන් හිටියේ. දැන් ඔහු වෙනස් වෙලා' කියලා. වයෝවෘර්ධ අම්මලා තාත්තලා ඇවිත් කියනවා 'මගේ පුතා, දුව මට වෙනස්කම් කරනවා'ය කියලා. ඇයි මේ වෙනස්වීම සිද්ධවෙන්නේ? ඔබ නිරතුරුවම ගනුදෙනු කරන්නේ තවත් පංච උපාදානස්කන්ධයක් සමගයි. පින්වත් ඔබ, ඔබේ බිරිඳ සමග කථා කරනවා කියන්නේ පංච උපාදානස්කන්ධයක්, තවත් පංච උපාදානස්කන්ධයක් සමග කථා කරනවා කියන කාරණයයි.

අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත් අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම වේදනාව අනිත්‍යභාවයට පත්වෙනවා. වේදනාව අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම, සංඥාව, සංස්ඛාර, විඤ්ඤාණය අනිත්‍යභාවයට පත්වෙනවා. විඤ්ඤාණය අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම, විඤ්ඤාණය හේතුවෙන් සකස්වෙන නාම රූප ධර්මයන් අනිත්‍යභාවයට පත්වෙනවා. නාම රූප ධර්මයන් අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම, සළායතන අනිත්‍යභාවයට පත්වෙනවා. සළායතන අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම නැවත නැවතත් පංච

උපාදානස්කන්ධ ධර්මයන් සකස්කොටගෙන සත්ත්වයා ජාති, ජරා, ව්‍යාධි, මරණවල හිමිකරුවෙක් වෙනවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා කැඩෙන, බිඳෙන, විසිරෙන අර්ථය ලෝකයයි කියලා. කුමක්ද නිරතුරුවම කැඩෙන්නේ බිඳෙන්නේ විසිරෙමින් පවතින්නේ? ඒ පංච උපාදානස්කන්ධයයි. පංච උපාදානස්කන්ධය යනු ලෝකයයි. ලෝකය යනු පංච උපාදානස්කන්ධයයි. අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත් මුසුවුණ තැනදී සකස්වෙන ඵස්සය පින්වත් ඔබ, තෘෂ්ණාවෙන් තෙත්කරපු තැනදි පංච උපාදානස්කන්ධ ලෝකය උපදිනවා. ඉපදුනා වූ ලෝකයේ අනාගතය තීරණය කරන්නේ සංස්කාර විසින්. සංස්කාර විසින් තීරණය කරන අනාගතය විඤ්ඤාණය විසින් ක්‍රියාත්මකභාවයට පත්කොට දෙනවා. මේ ක්‍රියාන්විතයයි ඔබ සම්මුති ලෝකය හැටියට දකින්නේ.

පින්වත් ඔබ රූපයක් ඵස්සය වන සෑම මොහොතකදීම, එම ඵස්සය තෘෂ්ණාවෙන් තෙත්කරන සෑම මොහොතකදීම, අනාගත භවයකට අදාළ සංස්කාරයන් ඔබ තුළින් රැස්වෙනවා. සංස්කාරයන්ගේ තීරණයන්ට අදාළව විඤ්ඤාණය ක්‍රියාත්මකභාවයට පත්වී පින්වත් ඔබව පටිච්ච සමුප්පන්නව, පරක් තෙරක් නොපෙනෙන මහා සාගරය බඳු, භවයේ දීර්ඝ සංචාරකයෙක් බවට පත්කරනවා. පින්වත් ඔබ යම් දවසක උතුම් චතුරාර්ය සත්‍ය අවබෝධය ලැබුව කල්හී, ඵස්සයේ අනිත්‍යභාවය අවබෝධ ඥානයෙන්ම දකිනවා. ඵස්සය තෘෂ්ණාවෙන් තෙත් කිරීමක් නැහැ. වේදනාවේ නිරෝධය නිසාම සංඥාව සංස්කාර විඤ්ඤාණය නිරෝධයි. ඔබට කැඩෙන, බිඳෙන, විසිරෙන ලෝකය අතහැරෙනවා. ලෝකයෙන් නිවී යනවා. කැඩෙන බිඳෙන විසිරෙන පංච උපාදානස්කන්ධ ලෝකයක් නොකැඩෙන නොවිසිරෙන නොවෙනස්වන අර්ථයෙන් අල්ලාගැනීම නිසාම, වීර්යයෙන් ගැලවීයාහැකි ලෝකයක්, හිස්කළ හැකි ලෝකයක්,

නිරෝධය කළ හැකි ලෝකයක්, සම්මුති ලෝකයක්කොට ඔබ අල්ලා ගන්නවා.

සද්ධර්මයේ හිරු විකසිතව තිබියදීත්, අවිද්‍යාවේ අන්ධකාරයෙන් සත්ත්වයා අඳුරේම අතපතගානවා. අඳුරේ බලවත්භාවය නිසාම කැඩෙනදෙය, නොකැඩෙනදෙය ලෙස දකිනවා. වෙනස්වන දෙය නොවෙනස්වන දෙයක් ලෙස දකිමින් තර්ක විතර්ක, හරි වැරදි, වාද විවාද, දෘෂ්ඨී මතවාද තුළින් කැඩෙන බිඳෙන විසිරෙන පංච උපාදානස්කන්ධ ලෝකය තව තවත් පුළුල්කොට ගන්නවා. පින්වත් ඔබ ඉදිරියට පැමිණෙන කුමන චරිතයක් වුවද තෘෂ්ණාවෙන් හටගත්, වෙනස්වන පංච උපාදානස්කන්ධයක් බවම සිතන්න. ඔබ ඉදිරියට පැමිණෙන පංච උපාදානස්කන්ධය ඔබට චෝදනාවක් කරත්, ඔබට ප්‍රසංශා කළත්, ඔබ 'අනිත්‍යයි' කියලාම දකින්න. එවිට ඔබට පුළුවන්, තෘෂ්ණාවෙන් තෙත්වූ අනුන්ගේ පංච උපාදානස්කන්ධයක් නිසාම ඔබට විදර්ශනාත්මක කුසලයක් ජීවිතයට එකතුකොට ගන්න. එම නිසා, පින්වත් ඔබ අනුනගේ දුර්වල ක්‍රියාකාරකම් ඉදිරියේ අනුන් සමග තර්ක විතර්ක කරන්න යන්න එපා. අනුනගේ පංච උපාදානස්කන්ධ මාරයා තුළින් ඔබේ පංච උපාදානස්කන්ධ මාරයා අවදිකොට ගන්න ඔබ දක්ෂ වෙන්න. තමන් යනු පංච උපාදානස්කන්ධයක් බවත් අනුන් යනු ද පංච උපාදානස්කන්ධයක් අවබෝධ නොවීම නිසාම තමන් සහ අනුන් තුළින් දුක උපදවන මාරයින් දෙදෙනෙක් මගේකොට ගෙනයි ඔබ ජීවත්වෙන්නේ. මෙතෙක් උතුම් සද්ධර්මය තුළින් ඔබ හඳුනානොගත් ඒ මාරයින් දෙදෙනා නිසා තර්ක විතර්ක, දෘෂ්ඨී මතවාද ඇතිකොට ගනිමින් ලෝකය තව තව පුළුල්කොට ගන්නවා.

# අනුන් තුළ පමණක් නොව, තමා තුළද සිටින මාරයා හඳුනාගන්න

(විශද්ශදාණය)

සමහර පින්වතුන්ලා භික්ෂුව මුණ ගැහෙන්න ඇවිල්ල ධර්මකාරණා සම්බන්ධයෙන් කථා කරනවා. එම ධර්ම කාරණයන්ට එම පින්වතුන් සූත්‍රගත අර්ථය නොවෙයි දෙන්නේ, තම තමන්ගේ දෘෂ්ඨි මතවාදයි ප්‍රකාශ කරන්නේ. භික්ෂුව දැන් එවැනි පින්වතුන්ලාට කරුණු දක්වන්න යන්නේ නැහැ. සිනාවෙලා රටතොටේ විස්තර අහල සතුටු සිතින්ම පිටත් කර හරිනවා. එම පින්වතුන්ලාට නැති අකුසල් රැස්කරදෙන්නේ නැහැ. භික්ෂුව කරුණු දැක්වුවාය කියලා එම පින්වතුන් නිවැරැදි කරන්න බැහැ. දෘෂ්ඨි මතවාද කාන්තාරවල බැසගෙනයි එම පින්වතුන් සිටින්නේ. මෙවැනි විනාශයන් මනුෂ්‍යයින් සිදුකර ගන්නේ, තෘෂ්ණාවෙන් උපන් පංච උපාදානස්කන්ධ මාරයා තමන් තුළින් ක්‍රියාත්මකවන බවක් නොදන්නා නිසාමයි. 'මම'ම ඔසවා තබමින් 'මම' නිවැරැදිකරුවා කරමින් 'මම'ම දන්නා බව සිතමින් තමන් තුළ ජීවත්වෙන පංච උපාදානස්කන්ධ මාරයාට තව තව තෘෂ්ණාවේ ආහාර දෙමින් පෝෂණය කරනවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තම අතීත දසපාරමී කුසල් ශක්තියෙන් අති ගැඹුරු ලෝක ධර්මයන්, තම උතුම් සම්මා සම්බුද්ධ ඥාණයෙන් සරල කොට, කාරණා හතරකින් අපිට දේශනාකර තිබෙනවා. එම කාරණා හතර තමයි දුක, දුක ඇතිවීමට හේතුව, දුක නැතිකිරීම, දුක නැතිකිරීමේ මාර්ගය කියන චතුරාර්ය සත්‍ය

ධර්මය. බලන්න, දුකින් පිරුණු පංච උපාදානස්කන්ධ ලෝකය නිරෝධය කරන්න එකම එක මාර්ගයයි බුදුරජාණන් වහන්සේ දේශනාකරල තිබෙන්නේ. ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. මේ තරම් සරල අර්ථයකට මේ ගැඹුරු ලෝකධර්මයන් බුදුරජාණන් වහන්සේ පෙන්වාදීලත්, මනුෂ්‍යයා තෘෂ්ණාවේ බලවත්භාවය නිසාම මොනතරම් පඹගාල්වල පැටලිලා සිටිනවාද? තර්ක, විතර්ක, දෘෂ්ඨි, මතවාද සමාජයට බෝකරනවාද? පංච උපාදානස්කන්ධ මාරයා ධර්මයේ නාමයෙන් පින්වත් ඔබට මොන දෘෂ්ඨි මතවාද, තර්ක, විතර්ක ඉදිරිපත් කළද, පින්වත් ඔබ තෙරුවන්ගේ නාමයෙන් නොබියව කියන්න 'ආර්ය අෂ්ටාංගික මාර්ගය බොහෝම නිරවුල්ව තිබෙනවා. මගේ දුක මට නිවාගන්න අවශ්‍ය ආර්ය අෂ්ටාංගික මාර්ගය පමණක්මය' කියලා.

තෘෂ්ණාවෙන් පිරී ඉතිරී ගිය පංච උපාදානස්කන්ධ මාරයාට බොහෝම නිහතමානීව පිළිතුරු දෙමින් අනතුරුවලින් මිදී, සද්ධර්මයේ ශක්තිය ජීවිතයට එකතුකර ගන්න. අනුන්ගේ දෘෂ්ඨි කාන්තාරවල ඔබ අතරමං වෙන්න යන්න එපා.

පසුගිය දවසක එක් විදේශගත පින්වතියක් තමන් හොඳින් ඇසුරු කරන පින්වතෙකුට ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථයන් දැක්වෙන ධර්ම පුස්තකයක් තෑගිකොට තිබෙනවා. ඒ අවස්ථාවේදී එම පින්වත් මහත්මයා එම ආර්ය අෂ්ටාංගික මාර්ගය පොත ප්‍රතික්ෂේපකර තම හිතවතියට කියනවලු, අපි ''පියෝ බුඩිස්ට්'' ඒ කියන්නේ පිරිසිදු බෞද්ධයෝ. 'අපිට ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩක් නැහැ'ය කියල. පංච උපාදානස්කන්ධ මාරයා කතා කරනවිට ඔබ, සමාවෙන්න කියලම ඉවත්ව යන්න ඕනේ. සමාජ ඇසුරේදී ඔබ උපක්‍රමශීලී වෙන්න දක්ෂවෙන්න ඕනේ. එම උපක්‍රමශීලීභාවය ඔබ තුළ ඇලීම් හා ගැටීම් අඩුකොට ගැනීමට හේතුවෙනවා. යම් පින්වතෙක් ධර්මයෙන් බාහිර දෘෂ්ඨි මතවාද ඉදිරිපත් කරනවා නම්, කථාකරනවා නම්, කරුණාකර බුදුරජාණන් වහන්සේ දේශනාකර ඇති මගහැරයාමෙන් දුරුකළ

යුතු ආශ්‍රවයන් ඔස්සේ උපක්‍රමශීලීව එම අකුසල් මගහැර යන්න දක්ෂවෙන්න ඕනේ.

භික්ෂුව දන්න එක මහත්මයෙක් සිටිනවා, ඔහු නිතිපතා පන්සිල් සුරකින, දන් පැන් පූජා කරන, සද්ධර්මය ශ්‍රවණය කරන මහත්මයෙක්. මේ මහත්තයාගේ එක දුර්වලතාවයක් තියෙනවා, මොහු නිරතුරුව උතුම් සම්බුද්ධ දේශනාවන්ට පටහැනි දෘෂ්ඨී මතවාද ප්‍රකාශකරන අය සමග ගැටෙන්නට යනවා. ඔහු හඳුනා ගන්නේ නැහැ, තමා තුළත් අනුන් තුළත් ක්‍රියාත්මක වන්නේ මාරයාට අයිති පංච උපාදානස්කන්ධයයි කියලා. මොහු අනුන් තුළ මාරයා දැක්කත් තමන් තුළ මාරයා දකින්නේ නැහැ. පංච උපාදානස්කන්ධය කෙරෙහි ඇති මමත්වයේ දැඩිභාවයයි ඔබව මෙවැනි අනතුරුවලට යොමුකරන්නේ.

# 'මම මෙහෙම කෙනෙක්' කියන මනෝ ලෝකයේ සිරකරුවෙක් නොවන්න

(විඤ්ඤාණය)

තමන් තුළ ඇතිවන පංච උපාදානස්කන්ධ මාරයා සහ බාහිර පංච උපාදානස්කන්ධ මාරයන් ගැන විමසීමේදී, එයටම අදාළ ධර්මයන් තමයි බුදුරජාණන් වහන්සේ සබ්බාසව සූත්‍රයට අදාළව දේශනා කරන දර්ශනයෙන් ප්‍රහානය කළයුතු ආශ්‍රවයන් ප්‍රහානය කිරීම සඳහා, ඉන්ද්‍රිය සංවරය, වීර්යය, ප්‍රත්‍යවේක්ෂාව, මගහැරයාම, දුරුකිරීම කියන මූලික කාරණා කිහිපය පින්වත් ඔබට හුඟාක් උපකාර වෙනවා. ඉහත කාරණා කිහිපය කැටි කරලා තමයි, බුදුරජාණන් වහන්සේ, ස්වාමීන්වහන්සේලාට දේශනා කරන්නේ ආරණ්‍ය, රුක්ඛමූල, වනසෙනසුන්, විවේකීභාවය, හුදෙකලාභාවය ජීවිතයට එකතුකොට ගන්නය කියලා.

මෙතැනදි සිද්ධවෙන්නේ තමන් තුළ සකස්වෙන පංච උපාදානස්කන්ධ මාරයාව, බාහිර පංච උපාදානස්කන්ධ මාරයන්ගෙන් හුදෙකලාකොට තැබීමයි. මේ හුදෙකලාභාවය හේතුවෙන් විතක්ක අඩුවී, මුල් වටයේදී, මාරයාට පක්ෂව සිත සමාධිමත්කොට ගන්නවා. දෙවැනි වටයේදී මාරධර්මයන්ම උපයෝගීකොටගෙන, මාරධර්මයන්ට අභියෝග කරනවා. ශීලයෙන්, ආර්ය ශීලයට, සමාධියෙන් ආර්ය සමාධියට, ප්‍රඥාවෙන් ආර්ය ප්‍රඥාවට මාර්ගය යොමුකොට ගන්නවා.

නමුත් හුදෙකලාබව සොයා යෑමට නොහැකි, කාර්යබහුල ගිහි පින්වතුන්ලාට, තමන් තුළත්, අනුන් තුළත් ක්‍රියාත්මකවන්නේ පංච උපාදානස්කන්ධ මාරයාය කියන කාරණය තේරුම්ගෙන සමාජ ඇසුරේදී මතුවෙන දෘෂ්ඨී, විතර්ක, මගහැරයෑමට, දුරුකිරීමට ඔබ දක්‍ෂ නම්, එම මාරධර්මයන්ගෙන් හිස්වෙන පින්වතුන්ගේ සිත, ගිහිගෙදර සිටියදීම, විවේකාගාරයක්, හුදෙකලාවක් බවට පත්කොට ගැනීමට, ගිහි පින්වතුන්ලාට හැකිවෙනවා. හුගක් ගිහි පින්වතුන්ලා, අනුන්ගේ තර්ක, විතර්ක, දෘෂ්ඨී, මතවාදවලට උවමනාවෙන්ම පැටලී, තමන්ගේ සිතේ, හුදෙකලාව විනාශකොට දමා ගන්නවා. පංච උපාදානස්කන්ධ ධර්මයේ අනිත්‍යභාවය පුහුණුකිරීම, එවැනි පින්වතුන්ලාට වටිනා ඔසුවක් වෙනවා.

භික්‍ෂුව කුටියේ වැඩසිටිනකොට පැමිණි සාමණේර ස්වාමීන් වහන්සේ නමක් ප්‍රකාශ කළා, තමන් අහවල් ආරණ්‍යයේ වැඩසිටියා, එම ආරණ්‍යයේ විවේකය හුදෙකලාව මදි, එම නිසා තමන් දැන් වැඩ සිටින්නේ අහවල් කැළයේ, ගමේ සිට කිලෝමීටර හතරක් පමණ ඈත ගල්කුටියක. දිනකට කිලෝමීටර 8ක් පමණ ඇවිදින්න ඕනේ පිණ්ඩපාතයට. හරිම දුෂ්කරයි. පිණ්ඩපාතයට ගමට වැඩියහම ගමේ ළිඳකින් තමයි පැන්පහසු වෙන්නේ. සමහර දවස්වලට පිණ්ඩපාතයට වඩින්නේ නැහැ. නිරාහාරව සිටිනවා. නිතරම මාර්ගයේ අලින් මුණගැහෙනවා.... උන්වහන්සේ බොහොම කැමැත්තෙන් තමන්ගේ තොරතුරු ප්‍රකාශ කළා. එම සාමණේර ස්වාමීන් වහන්සේගේ කථාබහෙන් භික්‍ෂුවට තේරුම්ගියේ උන්වහන්සේගේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ දුර්වල ස්වභාවයක්. භික්‍ෂුව එම ස්වාමීන් වහන්සේට අවවාද කළා. ඔබ වහන්සේට පුළුවන් ඉක්මනට, වැඩිහිටි ස්වාමීන් වහන්සේලා කිහිපනමක් වැඩසිටින ආරණ්‍යයක ආරණ්‍යගත වෙන්නය කියලා. වැඩිහිටි ගුරුවරයෙකුගේ ඇසුර ලබන්නටය කියලා. අවම වශයෙන් මාස තුනක්වත් එම කටයුතු කරගෙන කැලයට යන්න අවශ්‍යම නම්, ගම්මානයට උපරිම කිලෝමීටර් එකක් පමණ කිට්ටුව තිබෙන කුටියක් තෝරාගන්නය කියලා. භික්‍ෂුව මෙහෙම ප්‍රකාශ කරනකොට එම සාමණේර ස්වාමීන්

වහන්සේ කියනවා 'ඔබවහන්සේ මගේ වීර්යය, දුර්වලකරනවා නේද' කියලා. එම තරුණ ස්වාමීන් වහන්සේ නොසතුටු සිතින් භික්ෂුව වන්දනාකොට පෙරලා වැඩියා.

මාස දෙකකට විතර පස්සේ භික්ෂුවට ආරංචි වෙනවා, මානසික රෝගී තත්ත්වයක් හේතුවෙන් උන්වහන්සේ රෝහල්ගත වෙලාය කියලා. විඤ්ඤාණය නැමැති මැජික්කරුවා, රූපයන් කෙරෙහි ඇලීම්, ගැටීම්, හඳුනාගැනීම්, සිතීම් හේතුවෙන් ඇතිකොට ගන්නා 'මම මෙහෙම කෙනෙක්' කියන දැනීම, අපව මානසික රෝගී භාවයන්ට, උඩඟුභාවයන්ට පත්කරනවා. ඉන්ද්‍රිය ධර්මයන් දුර්වල ගිහි පින්වතුන්ලා ලබාදෙන 'ඔබවහන්සේ මෙහෙම කෙනෙක්' කියන දැනීම, උන්වහන්සේලාට 'මම මෙහෙම කෙනෙක් ' කියන දෘෂ්ඨිය පෝෂණය කොටගැනීමට හොඳ පිටිවහලක් වෙනවා. මේ අදහස් පංච උපාදානස්කන්ධ මාරයින්ය කියලා හඳුනා ගන්නේ නැහැ.

තවත් අවස්ථාවක සාමණේර ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුව මුණගැසීමට පැමිණියා. උන්වහන්සේ ගොඩක් කථාකරන ස්වාමීන් වහන්සේ නමක්. උන්වහන්සේ තමන් කරන භාවනා ගැන දීර්ඝ විස්තරයක් කළා. තමන්ගේ අවබෝධයන් පිළිබඳවත් ඉඟි කිහිපයක් ප්‍රකාශ කළා. අවසානයේ උන්වහන්සේ කියනවා 'මට දැන් කරන්න දෙයක් නැහැ' කියලා. මට දැන් කරන්න දෙයක් නැහැ කියන කාරණයෙන් උන්වහන්සේ අදහස්කළේ, බොහොම ගැඹුරු අවබෝධයක් පිළිබඳ ඉඟියක්. භික්ෂුවට තේරුම්ගියා මේ කථාකරන්නේ විඤ්ඤාණය නමැති මැජික්කරුවාමයි කියලා. භික්ෂුව එම සාමණේර ස්වාමීන් වහන්සේගෙන් ඇහුවා, ඔබවහන්සේගේ වයස කීයද කියලා. උන්වහන්සේගේ වයස අවුරුදු 30ක් පමණ වෙනවා. ඒ වෙලාවේ භික්ෂුව උන්වහන්සේගෙන් විමසුවා 'ඇයි ඔබවහන්සේ උපසම්පදා වෙන්නේ නැත්තේ?' කියලා. එවිට උන්වහන්සේ ප්‍රකාශ කරනවා, මගේ ශීලයේ යම් දුර්වලතාවයන් තිබෙනවා. ඒවා නිවැරදි කරගත් විගස මම උපසම්පදා වෙනවාය කියලා. බලන්න තවමත් ශීලයෙන්

පරිපූර්ණභාවයටත් පත්වෙන්නේ නැතිව, තමන් ලැබූ උතුම් අවබෝධයක් ගැන ඉඟිකරනවා. උපසම්පදා ශීලයට බිය නම්, කුමන මාර්ගඵල අවබෝධයක් ලබාගන්නද? රූපය කෙරෙහි ඇලීම්, ගැටීම්, හඳුනාගැනීම්, සිතීම් නිසාම සකස්වෙන විශේෂ දැනීම් 'මම මෙහෙම කෙනෙක්' කියන මනෝලෝකවල අපිව සිරකරුවන් කරනවා. තමා තුළින් ක්‍රියාත්මකවන 'දැනීම්' විඤ්ඤාණය කියන මැජික්කරුවාගේ ප්‍රයෝගයක් බව හඳුනා ගන්නේ නැහැ.

# අනුන් ඔබට කරන කියන දෙය නොව එයින් ඔබ තුළ ඇතිවන දෙය විමසන්න

(විශුද්ධඥාණය)

තමා තුළත් අනුන් තුළත් ක්‍රියාත්මක වන්නේ පංච උපාදානසකන්ධ මාරයා කියන අර්ථය නොදන්නා නිසාම සමාජයෙන් ලැබෙන ප්‍රතිචාර ඉදිරියේ අපි මෝහනයට පත්වෙන්න පුළුවන්. එම නිසාමයි බුදුරජාණන් වහන්සේ විනය කාරණාවන් පනවන්නේ පැවිදිභාවයට පත්වී වසර පහක් අනිවාර්යෙන්ම ගුරුවරයා ඇසුරෙයි වැඩසිටිය යුතුය කියලා. එම ගුරුවරයා වස් දහයක් සම්පූර්ණ ගුරුවරයෙක් විය යුතුයි කියලා.

මෙය සටහන් තබන භික්ෂුව ගුරුවරයාගේ අවසරයෙන් ගුරු ඇසුරෙන් බැහැර වුයේ පැවිදිවී මාස දෙකහමාරකින්. ගුරු ඇසුරෙන් බැහැරවෙන මොහොතේ මගේ පැවිදි ගුරුවරයා මට බොහෝම ගාම්භීර ප්‍රකාශයක් කළා. ඔබ කොහේ ජීවත්වුණත් කමක් නැහැ, ධර්ම විනය දෙක ආරක්ෂා කරගෙන ජීවත්වෙන්න කියලා. මගේ සාමණේර ජීවිතය තුළ මා ඇසූ මුල්ම ධර්මාවවාදය මගේ දෙසවන් තුළ තවමත් දෝංකාරය දෙනවා. වසරක සාමණේර ජීවිතය පුරාවට භික්ෂුවගේ සාමණේර ජීවිතය පසුපස බලවත් අතීත අකුසල් සංස්කාර ගොඩක් ලුහුබැඳගෙන පැමිණියා. භික්ෂුව පැවිදිවූයේ හතලිස් හතර වැනි වියේදී. වයසට ගිහින් කෙනෙක් පැවිදි වුණාම එම වයසක පැවිදි ජීවිතයට අඩු ලංසුවකුයි ලැබෙන්නේ. ඒ නිසාම සාමණේර අවධියේ ඇසුරු කළ සමාජය තුළින් නොසලකාහැරීම්, සැකකිරීම්, පරීක්ෂා කිරීම් නිතරම

සිදුවුණා. දිනක් එක් ආරණ්‍යයක දානශාලාවට භික්ෂුව වඩිනවිට එහි වැඩසිටි ටිකක් කටකාර වැඩිහිටි ස්වාමීන් වහන්සේ නමක් කියනවා 'ඔන්න සාමණේර දණ්ඩා එනවා' කියල. එදා මාව 'සාමණේර දණ්ඩා' කියල හඳුන්වපු අවස්ථා තිබුණත් මම කලබල වුණේ නැහැ. කව්ද එහෙම කිව්වේ? ඇයි එහෙම කියන්නේ කියලා අහන්න ගියේ නැහැ. සාමණේර දණ්ඩා කියන වචනය ඇසෙද්දි මගේ සිතේ ඇතිවුණ සිතිවිලි ගැනයි මම පරීක්ෂාකාරී වුණේ. අනුන්ගේ පංච උපාදානස්කන්ධ ක්‍රියාවලියක් ඉදිරියේ මගේ පංච උපාදානස්කන්ධයට මම ඇවිලෙන්න ඉඩදුන්නේ නැහැ. අනුන්ගෙන් එල්ල වන පීඩාවන් ඉදිරියේ මගේ සිතේ සකස්වෙන සිතිවිලිවල අනිත්‍යභාවයයි මට එදා වැදගත් වුණේ. යමෙක් මට 'සාමණේර දණ්ඩා' කියල කිව්වා නම් එය මගේ අකුසල් විපාකයක්ය කියලා. එය කාගේවත් වරදක් නොවේ. මම අතීතයේ ගෞරවණීය සාමණේර ස්වාමීන් වහන්සේ නමකට 'සාමණේර දණ්ඩා' කියල අවඥාවට ලක්කරලා තිබෙනවා. එහි විපාකයයි මට එදා ලැබුනේ. එදා සංස්කාරයන්ට අදාලව ජීවිතය දකින්න තිබු දක්ෂභාවය නිසාම විඤ්ඤාණය නැමති මැජික්කරුවාට වේවැල පෙන්වාගෙනයි භික්ෂුව සිටියේ.

මගේ සාමණේර ජීවිතයේදී මගේ පසුපසින් පැමිණි අකුසල් සංස්කාර නැමති මාරයා නිසා ශරීරය පිරිසිදු කරගන්න සබන් කැබැල්ලක්, හිස රැවුල කපාගන්න රේසර් එකක් නැතුව හිටපු අවස්ථා තිබෙනවා. කවදාකවත් පෞද්ගලික වාහනයක් නවත්වලා ගොඩවෙන්න කියල නැහැ. මේවා මගේ අතීත අකුසල් විපාකයන්. කාගේවත් වැරදි නොවේ. දිනක් භික්ෂුව ඈත කුටියක වැඩ සිටිනකොට පපුවේ මහන්සියක් හැදුණා. එම රෝගී තත්ත්වය උත්සන්න වෙලා රජයේ රෝහලකින් බෙහෙත් ගත්තා. දොස්තර මහත්මයා සිරප් එකක් ලියල දුන්නා ෆාමසියෙන් ගන්න කියලා. එම සිරප් එකේ එදා වටිනාකම රුපියල් 120යි. එම ඖෂධය ගන්න මට එදා ක්‍රමයක් තිබුනේ හෝ අරන් දෙන්න කෙනෙක් හිටියේ නැහැ. ගිහි පින්වතුන් මගහැර සිටි නිසාම කියන්න කෙනෙක්, අහන්න කෙනෙක් හිටියේ නැහැ. කවුරුවත්ම මාව

ගනන්ගත්තෙත් නැහැ. භික්ෂුවගේ එම භික්ෂු ජීවිතයේ මුල් අවධිය යාචක ජීවිතයක, හිඟන ජීවිතයක හැබෑම රුවගුණ ගැබ්වෙලා තිබුණා.

භික්ෂුව නැවතත් සටහන් කරනවා මේවා මේ ආකාරයට පෙළ ගැසුනේ භික්ෂුවගේ අතීත අකුසල් සංස්කාරයන් නිසාමයි. අතීත අකුසල් සංස්කාර නැමැති මාරයා, භික්ෂුව තුළින් මුල් අවධියේ දැඩි ආකාරයෙන් ක්‍රියාත්මක වූයේ භික්ෂුව, භික්ෂු ජීවිතය තුළ අතරමංකොට දැමීමටයි. භික්ෂුවගේ භික්ෂු ජීවිතය මරාදැමීමටය. භික්ෂුව එදා මේ මාර අවධානයෙන් ගැලවුණේ අනුනගේ පංච උපාදානස්කන්ධ මාරයින් නිසා මාගේ පංචඋපාදානස්කන්ධ මාරයා අවුලවා නොගැනීමෙන්ය.

භික්ෂුවට මතකයි, භික්ෂුව වැඩසිටිය එක් ආරණ්‍යයක නායක ස්වාමීන්වහන්සේ නමක් ප්‍රකාශ කරලා තිබෙනවා 'මේ හාමුදුරුවෝ කථා කරන්නේ නැහැ. බණක් භාවනාවක් ඉගෙනගන්න බවක් පෙනෙන්නේ නැහැ. සිවුරු හැරලා යන්නද කොහෙද කල්පනා කරන්නේ ' කියලා. ඉහත ප්‍රකාශය තුළ පින්වත් ඔබට හොඳින්ම වැටහෙනවා, අනුන්ගේ පංච උපාදානස්කන්ධ මාරයාව මුලා කරමින් භික්ෂුව ක්‍රියාත්මක වූ ආකාරය. භික්ෂුවගේ පටිච්ච සමුප්පන්නව සකස්වුණු අතීත අකුසල් සංස්කාර නමැති මාරයා, භික්ෂුවගේ ජීවිතයට පීඩාවක් එල්ල කරනකොට, භික්ෂුව ක්‍රියාත්මක කළේ අනුන් කියන දෙය, අනුන් කරන දෙය ගැන සිතීම නොව, අනුන් නිසා මගේ සිතේ ඇතිවන සිතිවිලි ගැන පරීක්ෂාකාරීවීමයි. එම සිතිවිලි අනිත්‍ය වශයෙන් දැකීමයි.

තවත් පින්වත් ස්වාමීන්වහන්සේ නමක් භික්ෂුවට 'සාමණේර දණ්ඩා' කියලා කියද්දිත්, මං පරීක්ෂාකොට බැලුවේ මගේ සිතේ ස්වභාවයයි. අතීත අකුසල් නමැති සංස්කාර මාරයා තියුණු ආකාරයට භික්ෂුවගේ ජීවිතය තුළින් ක්‍රියාත්මක වෙනකොට, ඒ සෑම එස්සයක්ම අනිත්‍ය වශයෙන් දකිමින් සංස්කාර හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය භික්ෂුව එදා අඩපනකොට දැමුවා.

# බාහිර ලෝකය ප්‍රශ්නාර්ථයක් ලෙසින් දකිනු වෙනුවට ඔබ නිහඬව ඔබේ ප්‍රශ්නය විසඳාගන්න

**(විඤ්ඤාණය)**

පංචඋපාදානස්කන්ධ ධර්මයන්ට අදාළව විඤ්ඤානය ගැන සටහන් තබන මොහොතේ පින්වත් ඔබ දක්ෂවෙන්න අනුනගේ පංච උපාදානස්කන්ධයන් ගැන නොසිතා, නොසොයා තම පංච උපාදානස්කන්ධයේ ක්‍රියාකාරීත්වය ගැන දකින්න. අනුන් හරි දේ කළත්, අනුන් වැරදි දේ කළත් පින්වත් ඔබට ඇති ඵලයක් නැහැ. අනුන් අවංක වුවත්, අනුන් වංක වුවත් ඔබට ඇති ඵලයක් නැහැ. ඔබට අර්ථයක් තිබෙන්නේ අනුන් නිසා සකස්වෙන ඔබේ සිතිවිලිවල අනිත්‍යභාවය දැකීමයි. බාහිර ලෝකයට, ලෝකයේ ස්වභාවයෙන් ඉන්නට හැරලා, බාහිර ලෝකය නිසා ඔබ තුළ සකස්වෙන සිතිවිලිවල අනිත්‍යභාවය පමණක් දකින්න ඔබ දක්ෂවෙන්න. බාහිර ලෝකය ප්‍රශ්නාර්ථයක් ලෙසින් දකිනු වෙනුවට ඔබ නිහඬව ඔබේ ප්‍රශ්නය විසඳාගැනීමට දක්ෂවෙන්න.

පින්වත් ඔබ ලෝකයාට විවෘත වෙන්න ගියොත්, ලෝකයේ ප්‍රශ්න ඔබේ ප්‍රශ්නයක් බවට පත්කොටගෙන, ඔබද ඇවිලෙන පංච උපාදානස්කන්ධයක් වේවි. රූපයක් කෙරෙහි ඇලීම, ගැටීම, උපේක්ෂාවීම, හඳුනාගැනීම, හඳුනාගත් දේ ගැන සිතීම හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණය කථාකරන හඬ පින්වත් ඔබට සමාජයෙන් නිතරම ඇසෙනවා.

මට ඕනෑම ලෙඩක් සුවපත් කරන්න පුළුවන්, මට කරන්න බැරි වැඩක් නැහැ, මට වැස්ස නවත්වන්න පුළුවන්, මට ආණ්ඩු පෙරළන්න පිහිටුවන්න පුළුවන්, මම කිව්වොත් එයා ඕනෑම දෙයක් කරනවා, මම තමයි එයාව ඔය තැනට ගෙනාවේ.... ආදී දැනීම් හේතුවෙන් සකස්වෙන මෙවැනි වචන සමාජයෙන් ඇසෙනකොට, තමාගේ හැකියාවන් පිළිබඳව සීමාවන් ඉක්මවා ගිය පුරසාරම් කියනකොට, මේ ඔබ දකින්නේ විඤ්ඤාණය නමැති මැජිකරුවාගේ සක්කාය දිට්ඨිය පෝෂණය කිරීමේ ක්‍රියාවලිය බව පින්වත් ඔබ නුවණින් තේරුම්ගත යුතුව තිබෙනවා. ජීවිතය තුළින් ධර්මය මතුකොටගත් තැනදී ජීවිතය කියන්නේ ධර්මයක්මයි. ජීවිතය පිරිහෙන්නේ නැහැ. ජීවිතය තුළින් අධර්මය මතුකොටග න්න තැනදී ජීවිතය කියන්නේ අධර්මයක්මයි. ඔබ නැවත නැවත පිරිහීමට පත්වෙනවා.

ආර්ය අෂ්ටාංගික මාර්ගය ඔස්සේ සතර සතිපට්ඨාන ධර්මයන් මෝදුකොටගනිමින් පංච උපාදානස්කධයේ අනිත්‍යභාවය දකින පින්වතා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, අචල ශ්‍රද්ධාවක් බවටත්, ශීලය ආර්ය ශීලයක් බවටත් පත්කොටගෙන, උතුම් සෝවාන් ඵල අවබෝධය ලබා අනාගත භවගමන ආත්මභව හතකට සීමාකොට ගන්නවා. ගිහි පින්වතුන්ලා මේ ඉලක්කය සපුරාගතහොත් ඔබට අනාගතයේ විඳින්න සිදුවන දුකගැන බුදුරජාණන් වහන්සේ මෙහෙම උපමාවක් දේශනා කරනවා. මහ පොළොවෙන් පස්මිටක් අතට ගෙන බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා සෝවාන් ඵලයට පත්වූ පින්වතා අතීතයේ වින්දාවූ දුක් මහ පොළොවේ පස්වලට සමාන බවත්, ඔහුට අනාගතයේ විඳින්නට ඇත්තේ අතේ තිබෙන පස් ප්‍රමාණයට සමාන දුකක්ය කියලා.

ඉහත උපමාවෙන්, සෝවාන් ඵලය කියන සැබෑම අර්ථය මොන තරම් ගැඹුරු, මොන තරම් තීරණාත්මක, මොනතරම් දුකින් මිදුනාවූ අර්ථයක්ද කියන කාරණය පින්වත් ඔබ නුවණින් තේරුම්ගත යුතුවෙනවා. වර්තමාන සමාජය මේ තරම් අර්ථවත්වූ සෝවාන් ඵල අවබෝධය සතියක වැඩසටහනකින් ලබාදෙන

තරමට සැහැල්ලුවට ගෙන තිබෙනවා. භාවනා කිරීම නිසා, ශිල්පද සමාදන් වීම නිසා, දන්දීම පින්කම් සිදුකිරීම නිසා තමන් තුළ ඇතිවන සැහැල්ලුව, ප්‍රීතිය, පස්සද්ධිය පංච නීවරණ යටපත්වූ ස්වභාවය සෝවාන් ඵලය ලෙස වරදවා වටහාගත් පින්වතුන්ලා සමාජයේ සිටිනවා. මෙවැනි ස්වයං රැවටීම හේතුවෙන්, මේ ලැබුනාවූ උතුම් අවස්ථාව එම පින්වතුන්ලා අහිමිකොට ගන්නවා. සෝවාන් ඵල අවබෝධය මගේ කොට ගන්නවා. සෝවාන් ඵල අවබෝධය තුළ මම සිටිනවාය කියලා දකිනවා. මා තුළ නොවෙනස්වන අවබෝධයක් තිබෙනවාය කියලා දකිනවා. සෝවාන් ඵල අවබෝධය මගේ ආත්මයකොට දකිනවා. ඒ ආත්මය තුළ සෝවාන් ඵල අවබෝධය තිබෙනවාය කියලා දකිනවා. පංච උපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාව හිස් කරනවා වෙනුවට, තව තවත් මමත්වයේ දැඩිභාවයට පොහොර දමා ගන්නවා.

මම තුළ නොවෙනස්වෙන සෝවාන්ඵල අවබෝධයක් තිබෙනවාය කියන දෘෂ්ටියෙන් සෝවාන්ඵල අවබෝධයට අදාළව තමන් අනුමාන කරන හැසිරීම්, කථාකිරීම්, ඇවතුම් පැවතුම් පැවැත්වීම වැනි චර්යාවන්ගෙන් තම දෘෂ්ටිය තව තවත් ශක්තිමත්කොට ගන්නවා. පංච උපාදානස්කන්ධ ධර්මයට අදාළව රූපය, වේදනාව, සංඥාව, චේතනා, විඤ්ඤාණය මාරයා හැටියට දකින්නේ නැහැ. රූපයේ බැසගෙන, විඳීම ජීවිතයකොට ගන්නවා. අතීත සංසාරයේ සම්මා සම්බුද්ධ ශාසනවල පින්වත් ඔබ සෝවාන්ඵල අවබෝධය නොලබා වංචාකාරී ධර්මයන් නිසා, වැරදි මගපෙන්වීම නිසා තමන් සෝවාන්ඵල අවබෝධය ලැබුවාය කියලා රැවටී උතුම් සෝවාන්ඵල අවබෝධය අහිමි කොටගත් අවස්ථා ලක්ෂවාරයකට වැඩිබව ඔබ හොඳින් නුවණින් තේරුම්ගත යුතුවෙනවා.

# ඔබ විසින්ම ඔබව රවටාගැනීමේ විපාකය දන්නේද?

**(විඥ්ඥාණය)**

අතීතයේ පින්වත් ඔබ, ධර්ම මාර්ගය වඩමින් තව එක සිතිවිල්ලක් අනිත්‍යභාවයෙන් දැකීම තුළ උතුම් සෝවාන් ඵල අවබෝධය ලැබීමට හැකියාව තිබියදී, එම සිතිවිල්ල මගේකොට ගැනීම නිසා, ඔබ අතීතයේ උතුම් සෝවාන් ඵලය අහිමිකොටගෙන තිබෙනවා. පින්වත් ඔබ විවේකීව සිටින විට ඉහත කාරණය නුවණින් මෙනෙහි කරන්න. එවිට පින්වත් ඔබට මේ ජීවිතයේදී එවැනි වංචාකාරී ධර්මයන්ට හසුනොවී ඒ අතීතයේ ඇතිකොටගත්තා වූ විශේෂ දැනීම්, විඥ්ඥාණයන් අනිත්‍ය වශයෙන් දකින්න. දිගින් දිගටම එම වංචාවන්ට හසුවූ, අතීතය නුවණින් මතුකොටගෙන ඒ සකස්වුණා වූ දැනීම්, අනිත්‍ය වශයෙන් දකින්න. එවිට මේ ජීවිතයේදී එවැනි වංචාකාරී ධර්මයන්ට රැවටීමේ අවස්ථාවන් ඔබට මගහැරී යනවා.

උතුම් සෝවාන් ඵලයට පත්වූ පින්වතා, පින්වතිය ලෝකෝත්තර සම්මා සතියෙන් පරිපූර්ණ කෙනෙක් වෙනවා. ඔහු සිත මාරයා වශයෙන් හඳුනාගත් කෙනෙක්. අනිත්‍ය දේ අනිත්‍ය වශයෙන්, දුක් දෙය දුක් වශයෙන්, අසුබ දෙය අසුබ වශයෙන්, අනාත්ම දෙය අනාත්ම වශයෙන් හඳුනාගත් කෙනෙක්. ඔහුගේ සිත කිව්වොත් ඔහු සෝවාන් ඵලයට පත්වුණාය කියලා, ඔහු දන්නවා ඒ සිතත් මාරයාට අයත් පංච උපාදානස්කන්ධයක්ය කියලා. ඔහු තමන් සෝවාන් ඵලයට පත්වුණාය කියන සිතට බැඳී

යන්නේ නැහැ. ඔහු මම තුළ සෝවාන් ඵලය තියෙනවාය කියලා දකින්නේ නැහැ. ඔහුට මම කියන ධර්මයත්, සෝවාන් ඵලය කියන ධර්මයත් අනිත්‍ය වශයෙන් දැක්කා වූ පටිච්ච සමුප්පාද ක්‍රියාවලිය තුළ විසුරුවා දැක්කා වූ ධර්මයක් පමණක්මයි. අවංකව, අර්ථයෙන්ම සෝවාන් ඵලයට පත්වූ පින්වතා, තමා සෝවාන් ඵලයට පත්වුණාය කියන සිත අනිත්‍ය වශයෙන් දකිමින් තමා තුළින් තමා දකිනවා. තමා තුළින් තමා දකින්නේ, තමා තමාටම අවංක වෙමින්. මෙම ධර්මතාව සෝවාන් ඵලයට පත්වූ පින්වතාගේ සුවිශේෂී වූ ධර්මතාවයක් වර්තමාන සමාජයේ හුගදෙනෙක් තමා තුළින් තමා දකින්නේ, තමා තමාට වංක වෙමින්, තමා තමාවම රවටා ගැනීම තුළිනුයි. නමුත් සෝවාන් ඵල අවබෝධය ලැබූ පින්වතා, තමා තුළින් තමන්ව දකින්නේ, තමා තමාටම අවංක වෙමින්. නැවන නැවතත් තමන් තුළින් තමාව දකිනවා.

පින්වත් ඔබ තවමත් සෝවාන් ඵලයට පත්ව නොමැති පින්වතෙක් නම්, පින්වත් ඔබ ගෙවාගෙන පැමිණි අති දීර්ඝ භව ගමනේදී ඔබ තුළ තවමත් ලෝකෝත්තර සම්මා සතිය කියන ධර්මතාවය සකස්වෙලා නැහැ. ඔබ තුළ ලෝකෝත්තර සම්මා සතිය සකස්වුණා නම්, ඔබ මේ වනවිට උතුම් සෝවාන් ඵල අවබෝධයට පත්වී සිටින්නට ඕනෑ. එය ධර්මතාවයක්. ලෝකෝත්තර සම්මා සතිය සකස්වී උතුම් සෝවාන් ඵලයට පත්වූ පින්වතා නුවණින් දකිනවා, තමන් සංසාරයේ, සෝවාන් ඵලය ලැබුවාය කියලා රැවටුණු අවස්ථා ලක්ෂ ගාණකට වැඩිය කියලා.

සිත නමැති පංච උපාදානස්කන්ධ මාරයා අතීතයේ තමා රැවටූ හැටි, නුවණින් දකිමින් ලෝකෝත්තර සම්මා සතිය තුළින් පංච උපාදානස්කන්ධ මාරයා හඳුනාගත් ඔහු තමා තුළ සකස්වෙන මාර සිතිවිල්ලකට රැවටෙන්නේ නැහැ. බැඳෙන්නේ නැහැ. මම සෝවාන් ඵලයට පත්වුණාය කියන සිතත් ඔහුට අනිත්‍ය වූ පංච උපාදානස්කන්ධයක් පමණයි. ඔහු තමා

තුළින් තමාව ස්වයං පරීක්ෂණයකට ලක්කොට බලනවා. තමා තමාට අවංකවෙමින්, තමා තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවට පැමිණ තිබෙනවාද කියලා. තමා තුළ ශීලය ආර්ය ශීලයක් හැටියට වැඩෙනවාද කියලා. ලොව්තුරා බුදුරජාණන් වහනසේ, ධර්මරත්නය, සංඝරත්නය කියන උතුම් ධර්මතාවයන්ද අනිත්‍ය වී යන ධර්මතාවයක් බව තමන් දකිනවාද කියලා. කුසල් අකුසල් සංස්කාරයන් විපාක දී අනිත්‍යභාවයට පත්වෙන ධර්මතාවයක් වශයෙන් තමා තුළින් තමා දකිනවාද කියලා. රූප, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ ධර්මතාවයන් නිරතුරුවම අනිත්‍යභාවයට පත්වෙන ධර්මතාවයන් හැටියට තමා තුළින් දකිනවාද කියලා. ජීවිත පටිච්ච සමුප්පාද ක්‍රියාවලිය තුළ විසුරුවා දකින්න සෝවාන් ඵලය ලැබූ පින්වතා දක්ෂ වෙනවා.

# දැනුම පළිබෝධ සහිතයි - අවබෝධයෙන් පරිහරණය කරන්න

(විශ්ලේෂණය)

තමා තුළින් තමා දකිමින්, තමා තමාට අවංක වෙමින් නැවත නැවත අදාළ ධර්මයන් ස්වයං පරීක්ෂණයකට ලක්කරමින් ඔහු විශ්වාසයකට පැමිණෙනවා, ඔහු තුළින් සතර අපාය කෙරෙහි බිය දුරු වුණාය කියලා. උතුම් සෝවාන් ඵලයට පත්වූ පින්වතාට, තමා තුළ සකස්වෙන, තමන් සතර අපායෙන් මිදුනාය කියන සිතත්, අනිත්‍ය වූ පංච උපාදානස්කන්ධයක් පමණක්මයි. ඔහු තමන් සෝවාන් ඵලයට පත්වුණාය කියන සිතටත් බැඳෙන්නේ නැහැ.

පින්වත් ඔබ මේ සටහන කියවා නුවණින් තේරුම්ගෙන මොහොතක් දෑස් පියාගෙන, අතීත භව ගමනේදී බුදුරජාණන් වහන්සේලාගේ ශ්‍රී මුඛයෙන් පංච උපාදානස්කන්ධ ධර්මයන්ට අදාළ දහම් ශ්‍රවණය කළ හැටි, අතීතයේ ලක්ෂ ගණනක් වූ මහ රහතන් වහන්සේලාගෙන්, මහා සංඝරත්නයේ ධර්ම දේශනා තුළින් පංච උපාදානස්කන්ධ ධර්මයන්ට අදාළ ධර්මයන් ශ්‍රවණය කළ හැටි නුවණින් දකින්න. පින්වත් ඔබ, දිව්‍ය තල, බ්‍රහ්ම තලවල ඉපිද අනාගාමී බ්‍රහ්මයන්ගෙන් පංච උපාදානස්කන්ධ ධර්මයන්ට අදාළ ධර්මයන් ශ්‍රවණය කළ හැටි නුවණින් දකිමින් ඒ අතීත පංච උපාදානස්කන්ධ ධර්මයන් අනිත්‍යවී ගිය හැටි නුවණින් දකින්න. එසේ දකිමින් මේ මොහොතේ පින්වත් ඔබ මේ 'දිවයින' ඉරිදා සංග්‍රහයේ පළවන පංච උපාදානස්කන්ධ ධර්මයන් ගැන සටහන්

වෙන මෙම සටහනද කියවා ඔබ තුළ සකස්වූ අතීත, වර්තමාන පංච උපාදානස්කන්ධ ධර්මයන් ද අනිත්‍ය බව නුවණින් දකින්න දක්ෂ වෙන්න.

සියළු සංස්කාරයෝ අනිත්‍යභාවයට පත්වෙනවා. සියළු සංස්කාරයෝ අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන් සංස්කාර හේතුවෙන් සකස්වෙන විඥානයද අනිත්‍ය භාවයට පත්වෙනවා. විඥානය අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම විඥානය හේතුවෙන් සකස්වෙන නාම රූප ධර්මයන් අනිත්‍යභාවයට පත්වෙනවා. නාම රූප ධර්මයන් අනිත්‍යභාවයට පත්වෙන වේගයෙන්ම සත්ත්වයා පටිච්ච සමුප්පන්නව භවයේ ඈතින් ඈතට ගසාගෙන යනවා. අනිත්‍ය වූ පංච උපාදානස්කන්ධය නිත්‍ය වශයෙන් ගනිමින් දුක කැමැත්තෙන්ම උරුමකොට ගන්නවා. දුකෙන් මිදීමේ එකම මාර්ගය වන උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය පින්වත් ඔබට මේ භව ගින්දර නිවා දැමීම පිණිස සිසිල් දියපොදක් වෙනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගය පින්වත් ඔබට පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකීමේ උපකාරක ධර්මයක් සකස්කොටදෙන තීරක බලවේගය වෙනවා.

සෝවාන් ඵලය ගැන කථාකරනකොට දැනුම සහ අවබෝධය අතර වෙනස දැනගැනීම අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ළිඳක් තිබෙනවා, එම ළිඳේ පිරිසිඳු ජලය තිබෙනවා, මනුෂ්‍යයෙක් ජලය පානයකොට පිපාසය සංසිඳුවාගැනීමේ බලාපොරොත්තුවෙන් ළිඳ ළඟට එනවා. නමුත් ළිඳ ළඟ බාල්දියක් නැහැ, වතුර පානයකොට පිපාසය සංසිඳුවා ගන්නට. තවත් එවැනි ළිඳක් තිබෙනවා, එහිද පිරිසිඳු ජලය තිබෙනවා. මනුෂ්‍යයෙක් ජලය පානයකොට පිපාසය සංසිඳුවා ගැනීමට ළිඳ ළඟට එනවා. ඔහු ළිඳ ළඟ තිබෙන බාල්දියෙන් වතුර ඇදගෙන පිපාසය සංසිඳුවා ගන්නවා. දැනුම හරියට පිරිසිඳු ජලය තිබුණත් එම ජලය පරිහරණයට ගැනීමට නොහැකි බාල්දියක් නැති ළිඳ වගේය කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා.

වර්තමාන සමාජයේ දැනුම නිසාම, දැනුම නිසා සකස්කොට ගත් වෘත්තීය මමත්වයේ දැඩිභාවය නිසාම පින්වතුන් බලවත් ආකාරයට පංච උපාදානස්කන්ධයට බැඳී යනවා. දැනුම තුළ මම දකිනවා. මම තුළ 'දැනුම' දකිනවා. දැනුම මගේ ආත්මය කොට දකිනවා. මේ සියල්ල සංස්කාරයන්ගේ ඵලයක් හැටියට දකින්නේ නැහැ. සංස්කාරයන් හේතුවෙන් සකස්වෙන විඤ්ඤාණයේ ක්‍රියාත්මකභාවය වශයෙන් දකින්නේ නැහැ. හේතුව නොදකින නිසාම ඵලය දුකක් බවට පත්කොටගන්නවා. කුමන ක්ෂේත්‍රයක වුවද, ඔබ ලබා තිබෙන දැනුම යනු අතීත කුසල් සංස්කාරයන්ගේ ඵලයකි. අතීත කුසල් සංස්කාරයන්ගේ ඵලයක් හේතුවෙන් ඔබට ලැබුණු දැනුම නිසා ඔබ මමත්වයේ දැඩිභාවය ඇතිකොට ගත්තොත් දැනුම හේතුවෙන්ම සකස්කොට ගන්නා අකුසල් සංස්කාර හේතුවෙන් ඔබ අනාගත භවයේ නූගතෙක් බවට පත්වෙනවා. පින්වත් ඔබ නුවණින් දකින්න දක්ෂවෙන්න ඕනේ, වර්තමාන සමාජයේ යම් නූගත් පින්වතුන් ජීවත්වෙනවා නම් එම නූගත්භාවයට අවශ්‍ය සාධක සකස්කොට දුන්නේ එම පින්වතා අතීතයේ දැනුම නිසා ඇතිකොටගත් අකුසල් සංස්කාරයන් නිසාම කියන කාරණය. 'සංස්කාර පච්චයා විඤ්ඤාණං' කියන ධර්මතාවය තට්ටු මාරු ක්‍රමයට සත්ත්වයා උගත්භාවයෙන් නූගත්භාවයට, සුගතියෙන් දුගතියට පත්කිරීමේ ක්‍රියාන්විතයේ පෙරගමන්කරු වෙනවා.

# පංච උපාදානස්කන්ධය අවබෝධයෙන් දැක, මේ වියවුල් සහිත ලෝකයම සංසිඳවන්න

(විශ්ලේෂණය)

පංච උපාදානස්කන්ධ ධර්මයන් කෙරෙහි ඇති නොදැනුවත්භාවය නිසාම, බුදුරජාණන් වහන්සේ කාරණා පහකට ගොනුකොට පෙන්වූ ලෝක ධර්මයන්ගේ ක්‍රියාකාරීත්වය, අපි ඇසට පෙනෙන, කනට ඇසෙන, මනසට දැනෙන සංකීර්ණ වූ සම්මුති ලෝකය බවට පත්කොටගෙන පංච උපාදානස්කන්ධ ලෝකය තුළ සිටිමින් පංච උපාදානස්කන්ධ ධර්මයන් ගැන සොයනවා. එය හරියට ඇල්වතුර බොමින්, ඇල්වතුර කියන්නේ මොනවද කියලා සොයනවා වගේ වැඩක්. ඒ නිසාම පින්වතුන්ලා ප්‍රකාශ කරනවා, ධර්මය හරිම ගැඹුරුයි, සංකීර්ණයි කියලා. අසූහාරදහසක් ධර්මස්කන්ධය, සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්.... මේවා කෙසේ පුහුණු කරන්නද කියලා. ධර්මය කෙරෙහි උකටලීභාවයට පත්වෙනවා. උතුම් ධර්ම මාර්ගය කෙරෙහි එම උකටලීභාවය ඇතිකොට දෙන්නේ කල්‍යාන මිත්‍රභාවයේ ඇති දුර්වලතාවය නිසාමයි.

පින්වත් ඔබ දෑස් පියාගෙන මේ සියලුම දෙවියන්, බ්‍රහ්මයන්, මනුෂ්‍යයන්, සතර අපායේ සත්ත්වයන් යනු අතීත සංස්කාරයන්ගේ ඵලයක්, මේ සමග අත්විදින සැප, දුක්, උපේක්ෂාවන් යනු අතීත සංස්කාරයන්ගේ ඵලයක්, මේ හැම සංස්කාරයක්ම අනිත්‍යභාවයට පත්වෙනවා, වෙනස්වෙනවාය

කියලා දකින මොහොතේම පින්වත් ඔබ තුළ, බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාල අසූහාරදහසක් ධර්මස්කන්ධය ඔබතුළ වැඩුනා වෙනවා. ඔබේ ජීවිතයට එකතුවුණා වෙනවා. සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්ගෙන් බල ධර්මයන් හැර ඉතිරි සියළුම ධර්මයන් ඔබ තුළ වැඩුනා වෙනවා.

පින්වත් ඔබ නුවණින් කල්පනාකොට බලන්න, එක විනාඩියක් තුළ ඔබ සිතන ධර්මානුකූල මනසිකාරයක අසූහාරදහසක් වූ ධර්මස්කන්ධයම මතුවෙලා තිබෙනවා. සමාජයේ ඇති දෘෂ්ඨි මතවාද, තර්ක විතර්ක, හොඳ නරක, සැප දුක්.... මේ සා අවුල් ජාලාවක වෙලී ගිය ලෝකයක් පංච උපාදානස්කන්ධ ධර්මය තුළින් දැකලා, හේතුඵල ධර්මයන් නිසා සකස් වූ සංස්කාරයන් අනිත්‍යයි කියලා දකින එකම අර්ථයෙන්, මේ මුලු අවුල් වියවුල් ලෝකයම නිරෝධය කිරීමේ මාර්ගය බුදුරජාණන් වහන්සේ දේශනාකොට තිබෙනවා. නමුත් පින්වත් ඔබට මේ අවුල් වූ ලෝකය තවම නිරවුල්කොට ගැනීමට නොහැකිවී ඇත්තේ, පින්වත් ඔබ තුළ ක්‍රියාත්මක වන්නේත්, අනුන් තුළ ක්‍රියාත්මක වන්නේත් පංච උපාදානස්කන්ධ මාරයා කියන කාරණය තේරුම් නොගැනීමය.

එමනිසා පින්වත් ඔබ, අනුන් මාරයා ලෙස දකිමින් තමන් දෙවියෙක් හැටියට නොදකිමින්, දෙපාර්ශ්වය තුළින්ම ක්‍රියාත්මකවෙන්නේ පංච උපාදානස්කන්ධ මාරයා බවම තේරුම් බේරුම්කොට ගන්න. එසේ නොවනතාක් කල් ධර්මයේ නාමයෙනුත්, භාවනාවේ නාමයෙනුත් පින්කම්වල නාමයෙනුත් පින්වත් ඔබ තව තවත් සංස්කාරයන්ම රැස්කොටගනිමින් විඤ්ඤාණය පෝෂණයකොට ගනිමින්, නැවත නැවත ලෝකය සකස්කොට ගැනීම ඒකාන්තයෙන්ම සිදුවනු ඇත. පින්වත් ඔබ පංච උපාදානස්කන්ධය නිත්‍ය වශයෙන් ගන්න මොහොතක් පාසා ලෝකය තුළ සංචාරකයකු බවටත්, පින්වත් ඔබ පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් ගන්නා මොහොතක් පාසා ලෝකයෙන් නිවීම දෙසටත් ගමන් කරනු ඇත. පංච

උපාදානස්කන්ධ ධර්මයට අදාළ මේ සටහන අවසන් කරන මොහොතේ භික්ෂුවට ගෞතම බෝධිසත්වයාණන්වහන්සේ ජය ශ්‍රී මහා බෝධි මූලයේදී 'මගේ ලේ, මස්, සම්, නහර වියලේවා. මා උතුම් සම්මා සම්බෝධිය අවබෝධයෙන් තොරව නොනැගිටිමි' යි යනුවෙන් අධිෂ්ඨානයක් ඇතිකරගත් මොහොත මතකයට නැගෙනවා. මෙතැනදී බෝධිසත්වයන් ජීවිතය මරණයට දැමීමයි සිද්ධ කරන්නේ. ජීවිතය මරණයට දැම්මා යනු රූප, වේදනා, සංඥා, සංස්කාර, විඥ්ඥාණය කෙරෙහි ඇති තෘෂ්ණාව අතහැරීමයි. ඒ කියන්නේ පංච උපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාව අතහැරීමයි.

බුදුරජාණන් වහන්සේගේ ඉහත ආදර්ශය ඔස්සේ භික්ෂුව, භික්ෂු ජීවිතය තුළ අත්දැකීමක් කෙටියෙන් මෙහි සටහන් තබනවා.

'සංස්කාර මාරයා ඔබේ ජීවිතය උදුරාගැනීමට පෙරාතුව පින්වත් ඔබ ඔබේ ජීවිතය කෙරෙහි ඇති තෘෂ්ණාව අතහරින්න. පින්වත් ඔබ නිවීමේ අවබෝධය ලබා මාරයාව හිස් අතින් ගෙදර යවන්න'

ඉහතින් භික්ෂුව සටහන් කළේ පංච උපාදානස්කන්ධ ධර්මයෙන් කවදාහරි ඔබ ලබන අර්ථවත්ම ජීවමාන අත්දැකීමයි. චෝදනා කරන ලෝකයට, විවේචන කරන ලෝකයට, අඩුපාඩු සොයන ලෝකයට, විකෘතීන් කරන ලෝකයට නිදහසේ තව තව වැජඹෙන්නට ඉඩ හැර පින්වත් ඔබ ලෝකයට හොරෙන් ලෝකයෙන් නිවී යන උතුම් වූ කල්‍යාන මිත්‍ර ධර්මය යනු, පංච උපාදානස්කන්ධ ධර්මය අනිත්‍යවශයෙන් දැකීමේ සහ අවබෝධකොට ගැනීමේ ධර්මතාවයයි.

වස් සමය ගෙවී යන්න තව සති දෙකක් තිබෙනවා. අද උදෑසන භික්ෂුව පිණ්ඩපාතයට ගමට වැඩමකොට පිණ්ඩපාතය කරමින් සිටියදී කුඩා දරු සිඟිත්තෙක් වඩාගත්ත කාන්තාවක් ඇතුළු කාන්තාවන් දෙදෙනෙක් නිවසක් ඉදිරිපිටදී පිණ්ඩපාතය බෙදුවා. පිණ්ඩපාතය බෙදලා කුඩා දරුවා වඩාගත් තරුණ අම්මා

ප්‍රකාශ කළා 'ස්වාමීන් වහන්ස අද මගේ දරුවාගේ පළවෙනි උපන් දිනයයි' කියලා. භික්ෂුව එම පුතනුවන්ට නිදුක් නීරෝගී සුවපත්භාවය, දීර්ඝායුෂ ලැබේවා කියලා පින් අනුමෝදන්කොට ඉවතට වැඩම කරනකොට එම අම්මා තම සිඟිති පුතු සිප ගනිමින් සතුටින් කියනවා 'ස්වාමීන් වහන්සේ පුතාට දීර්ඝායුෂ ලැබේවා කියලා කිව්වා' ය කියලා. අම්මාගේත් දරුවාගේත් සෙනෙහස භික්ෂුවට ඇසුණ මොහොතේ භික්ෂුව තුළ ඇතිවුණ සිතිවිල්ල පහත සටහන් තබමින් පංච උපාදානස්කන්ධ ධර්මය ගැන සටහන මෙලෙස අවසන් කරනවා.

තෘෂ්ණාවෙන් උපන් බබා...

තෘෂ්ණාවේ මව් කිරි අම්මාට පොවන බබා...

සංස්කාරයන්ට කණවැල අල්ලන බබා..

අනාගත පංච උපාදානස්කන්ධ ලෝකයේ අපි දෙදෙනාම දුක් නැමති දුක රජ කිරුළ දරමු බබා....

සෑම අම්මා තාත්තා කෙනෙක්ම පින්වත් ඔබේ දරුවන්ටත් මේ අදහස ගලපා බලන්න දක්ෂ වෙන්න!

# මාරයාගේ ස්වයං වර්ණනාවට හෝ ස්වයං විවේචනයට නොරැවටෙන්න!

**(පංච උපාදානස්කන්ධය සම්බන්ධයෙන් වූ විග්‍රහය ඉකුත් ලිපියෙන් අවසන් වන අතර මෙතැන් පටන් කොටස් කිහිපයකින් යුක්තව පළ කෙරෙනුයේ එයට අදාළව භික්ෂුව වෙත යොමුවූ පැනයකට ගොනු කළ පිළිතුරකි)**

පින්වත් මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා 'ස්වාමීන් වහන්ස, මාරපාක්ෂික ධර්මයන් අප තුළින් ක්‍රියාත්මක වෙන්නේ පංච උපාදානස්කන්ධයට අදාළව ඇතිකරගන්නා ලෝභ, ද්වේශ, මෝහ ධර්මයන් නිසාමද?' කියලා.

මාරපාර්ශ්වික ධර්මයන් අප තුළින් ක්‍රියාත්මක වන්නේ අනිවාර්යෙන්ම පංච උපාදානස්කන්ධයට අදාළව ඇතිකොට ගන්නා තෘෂ්ණාව නිසාමය. සක්කාය දිට්ඨියෙන් පෝෂණය වුණු පංච උපාදානස්කන්ධය නිරතුරුවම තමා තුළින් සිල්පද බිඳිමින්, අකුසල මූලයන් තව තව තීව්‍ර කරමින්, සුදුසු අවස්ථාවන්හිදී ද්විත්ව චරිතයක් ලෙසින් පෙනී සිටිනවා. මෙහිදී ලෝභ, ද්වේශ, මෝහ ධර්මයන්ගෙන් ඔද්දල්වුණු විඤ්ඤාණය නමැති මැජික්කරුවා, අපූරු වේශයන්ගෙන්, අපූරු රංගනයන්ගෙන්, අපූරු ගුණාත්මකභාවයක් මවාපාමින් නිසරු දෙය සරු වශයෙන් පෙන්වනවා. මෙතැනදී විඤ්ඤාණය නමැති මැජික්කරුවාගේ මැජික් සන්දර්ශනයේ අපූර්වත්වය වර්ණනා කෙරෙන්නේද, තවත් විඤ්ඤාණය නමැති මැජික්කරුවෙක් නිසාත්, මෙම ක්‍රියාන්විතය තුළ දෙපාර්ශ්වයටම සිද්ධවෙන්නේ, මාරයා

විසින් මාරයාවම වර්ණනා කිරීම සහ විවේචනය කිරීමයි. විවේචනයත්, වර්ණනාවත් තුළ මාරයාමයි ශක්තිමත් වෙන්නේ. සමාජය තුළ සද්ධර්මයේ අර්ථයන් ගුණාත්මකව වර්ධනයක් සිද්ධවෙන සෑම කාලවකවානුවකදීම, එම සද්ධර්මයේ වර්ධනය නැවත දුර්වලකොට දැමීමට, මනුෂ්‍යයා තුළ අකුසල් මූලයන් වර්ධනයකරවීමට, මාරධර්මයන්ගේ චර්යා රටාවන්, මාරයා විසින්ම උපක්‍රමශීලීව වෙනස් කොට ගන්නවා.

පින්වත් ඔබ මාරයාව නිරතුරුවම හඳුනාගන්නේ අධර්මයේ වේශයෙන්. එසේත් නැතිනම් අකුසල් මූලයන්ගේ වේශයෙන්. ඉහත සුපුරුදු හඳුනාගැනීම නිසාම, සද්ධර්මයේ අර්ථයන් ගුණාත්මකව වර්ධනය වනවිට, පින්වත් ඔබ දක්ෂයි ඔබ තුළ සකස්වෙන ශිල්පද බිඳීම් අවමකොටගෙන, අකුසල මූලයන් සියුම්කොටගෙන, මාර පාක්ෂික ධර්මයන්ගෙන් මිදෙන දිශාවට පියවර ඉදිරියට තබන්න. මාරපාක්ෂික බලය කම්පාකරවන මේ තැන, මාරපාක්ෂික ධර්මයන්ට බොහෝම අභියෝගාත්මක තැනක්. ඉවසුම් නොදෙන තැනක්. මෙවැනි අභියෝග හමුවේ මාරයා නිරතුරුවම තම සුපුරුදු උපක්‍රම, ක්‍රමවේදයන්, උපක්‍රමශීලීව වෙනස්කොට ගන්නවා. දැන් අලුත් ජවනිකාවෙදි මාරයා ඔබ ඉදිරියට එන්නේ අධර්මයේ වේශයෙන් නොවේ. ධර්මයේ වේශයෙන්. අල්ලාගැනීමේ වේශයෙන් නොවේ. අතහැරීමේ වේශයෙන්. ද්වේශයේ වේශයෙන් නොවේ. කරුණාවේ වේශයෙන්. පංච උපාදානස්කන්ධ ලෝකයාට මේ මාරපාක්ෂික හැසිරීම ආශ්චර්යයක් වුවද, සැබැවින්ම මෙතැන ඇත්තේ විඤ්ඤාණය නමැති මැජික්කරුවාගේ පුහු රඟපෑමක් පමණක්මය. එකම කාසියේ දෙපැත්ත උඩදමා කෙරෙන හුදු ක්‍රීඩාවක් පමණක්මය.

වර්තමාන සමාජය තුළ ශිල්පද බිඳීම් ශීඝ්‍රයෙන් වැඩිවන නිසාම, සක්කාය දිට්ඨියේ තීව්‍රභාවය නිසාම, වර්තමාන සමාජය, මාරයාගේ මේ කුරිරු උපක්‍රමයේ කරවටක් ගිලී ඇති බව පෙනෙන්නට තිබෙනවා. පංච උපාදානස්කන්ධ මාරයා වර්තමාන සමාජය මතට එලා තිබෙන මේ මාර දැල තුළින්, මාරයාගේ

අනාගත ඉලක්කය වන්නේ මේ ධර්මද්වීපය තුළ සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථයන්ට බලවත් අනතුරක් කිරීම විය යුතුමය. පින්වත් ඔබ මාරයාගේ මේ සටකපට අනතුර නුවණින් හඳුනා නොගන්නේ, විඤ්ඤාණය නමැති මැජික්කරුවා නිරතුරුවම ඉදිරිපත් කරන ආශ්වාදයේ රංගනයන් නිසාමය. ලෝභ, ද්වේෂ, මෝහයන්ගෙන් ඔද්දල්වුණු, පංච උපාදානස්කන්ධ මාරයාගේ මේ උපක්‍රමශීලි 'නරනාටක' මැජික් සංදර්ශන හමුවේ, පින්වත් ඔබ අලෝභ, අද්වේශ, අමෝහ කුසල් ධර්මයන්ගෙන් සමාජයට පූර්වාදර්ශයක් ලබාදීමට දක්ෂවෙන්න.

පින්වත් ඔබ භික්ෂුවගෙන් විමසුවොත් කුමන හේතුවෙක් නිසා මෙවැනි අනතුරක් සමාජය තුළ ක්‍රියාත්මක වන්නේද? කියලා, ඊට මූලිකම හේතුව, සියළුම පාර්ශ්වයන්ගේ සම්මාදිට්ඨියේ අර්ථය දුර්වල වීමයි. සම්මා දිට්ඨියේ අර්ථයන් සමාජයෙන් දුර්වල වන විට, ඊට ආදේශකයක් ලෙස සමාජය තුළින් මතුව එන්නේ මිත්‍යා දෘෂ්ඨියේ, මිථ්‍යා සංකප්පයන්ගේ අර්ථයන්ය. සම්මා දිට්ඨිය කියන අර්ථය මේ ලෝක ධාතුවේ තිබෙන, තමනුත් රකින, අනුනුත් රැකෙන, මෙලොව පරලොව සැපයට ලැබෙන ශ්‍රේෂ්ඨම අර්ථයයි. මේ උතුම් සම්මා දිට්ඨියේ අර්ථය ජීවිතයෙන් ගිලිහුණු තැනදී, බුදුරජාණන් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ උත්තමයකුගේ ඉගැන්වීම් ජීවිතයට එකතුකොට ගන්නේ නැහැ. තෙරුවන් සරණ හැර මට වෙන සරණක් පිහිටක් නැතිය කියලා හිතන්න දක්ෂ නැහැ. තමන්ට ධනය, බලය, කීර්තිය ලබාදෙන ධර්මතාවයන් තමයි එකම සරණකොට, එකම පිහිටකොට ගන්නේ. මේ හේතුව නිසා සමහර පින්වතුන් තමන් සිංහල බෞද්ධයෙක් කියලා ප්‍රසිද්ධියේ කියන්න බයයි. එවැනි පින්වතුන් 'මම ලාංකිකයෙක්' වැනි සම්මාදිට්ඨියට ප්‍රතිවිරුද්ධ වචන තමයි භාවිතා කරන්නේ.

සිංහල බෞද්ධයා කියන්නේ, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන්නා කියන අර්ථයම විය යුතුයි. පින්වත් ඔබ බෞද්ධයෙක්ය කියලා ප්‍රසිද්ධියේ කියන්න බිය නම්, ඒ ඔබ බියවන්නේ 'මම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන

පුද්ගලයෙක්. මම තෙරුවන් සරණ පිහිටි පුද්ගලයෙක්. මම සම්මාදිට්ඨියට පත් පුද්ගලයෙක් 'ය කියන අර්ථයටයි. මාරපාර්ශ්වික ධර්මයන් නවීන මතවාද, සංකල්පයන් ඉදිරිපත්කොට, සිංහල බෞද්ධකම දුර්වල කරන්නේ, දුර්වලවන ආකාරයට සමාජයට වැරදි පූර්වාදර්ශයන් ලබාදෙන්නේ, සමාජයෙන් උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය දුර්වලකොට දැමීමටය. පින්වත් ඔබ තෙරුවන් කෙරහි ශ්‍රද්ධාව ඇතිකොටගත්තා නම්, එය සක්විති රජකම ලබනවාට වඩා ශ්‍රේෂ්ඨ දෙයක්ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, ඒ කියන්නේ උතුම් සම්මා දිට්ඨිය, සක්විති රජකමටත් වඩා ශ්‍රේෂ්ඨ බව බුදුරජාණන් වහන්සේ දේශනාකොට තිබියදී, වර්තමාන සමාජයේ සෑම පාර්ශ්වයක්ම මාරපාක්ෂික ධර්මයන්ට යටත්වීම නිසාම, අන්තිම සුළු සැපයක් උදෙසා, අන්තිම සුළු බලයක් උදෙසා උතුම් සම්මා දිට්ඨියේ අර්ථයන් ජීවිතයෙන් අහිමිකොට ගන්නවාද?

# සංස්කාර යනු පංච උපාදානස්කන්ධ මාරයාගේ තවත් නිෂ්පාදනයක්මය

උතුම් සම්මා දිට්ඨියට පත්වූ පින්වතා, තමන් බියට පත්නොවනවා වගේම අනුන්ව බියට පත්නොකරන පින්වතෙක්. ඔහු තුළ ඇති කර්මය, කර්මඵල විශ්වාසය නිසා සියළු ජාතිකයන්, සියළු ආගමිකයන්, රකින පෝෂණය කරන පින්වතෙක්. තමන් මැරෙනවාය, මැරිලා පටිච්ච සමුප්පන්නව උපදිනවාය කියල හිතන්න දක්ෂ පුද්ගලයෙක්. ඔහු හැම ආගමකටම, හැම ජාතියකටම අයත්ම සෑම පින්වතෙක්ම සංසාරයේ තමන්ට අම්මා, තාත්තා වෙලා තිබෙනවාය, අතීත භවයන්හිදී ඥාතීත්වයකින් බැඳුණ කෙනෙක්ය, කියන විශ්වාසය තිබෙන පින්වතෙක්. ඒ නිසාම සමාජයට ඔහු හොඳ ආරක්ෂකයෙක් වෙනවා.

සම්මා දිට්ඨියට පත් වූ පුද්ගලයා, මේ මොහොතේ තමන් සිංහල බෞද්ධයෙක් වුණත්, අතීත භවයන්හිදී, මමද අන්‍ය ජාතිකයන්, අන්‍ය ආගමිකයින් හැටියට සිටියාය කියලා හිතන්න දක්ෂ පුද්ගලයෙක් වෙනවා. ඔහු දන්නවා, තමන්ද මේ ජීවිතයේදී සම්මා දිට්ඨියෙන් දුර්වලවුණොත් නැවත තමන්ද, අන්‍ය ජාතික මව්කුසක උපත ලබනවාය කියන කාරණය. මේ නිසාම ඔහු සෑම ජාතිකයෙකුටම මනුෂ්‍යත්වයෙන්, ඥාතීත්වයෙන් සලකන කෙනෙක් වෙනවා. ඔහු එසේ කරන්නේ තමන්ගේ සම්මා දිට්ඨියේ අර්ථයන් තව තවත් පෝෂණය කොට ගනිමින්.

සම්මා දිට්ඨියට පත්වූ පින්වතා, සමාජයේ පවතින සම්මා දිට්ඨිය මිථ්‍යා දෘෂ්ඨිය, දුප්පත් පොහොසත් බව, උගත් නූගත් බව,

කුලවත් කුලහීන බව උපතින්වත්, සමාජය නිසාවත් සිදුවූ දේවල් නොව, අතීත සංස්කාරයන්ගේම ඵලයක් බව දකිමින්, ඒවාට නොඇලෙන, ඒවාට නොගැටෙන කුසල් පක්ෂයම වර්ණනා කරන, සමාජයට දානයෙන් ශීලයෙන් පූර්වාදර්ශයන් ලබාදෙන පුද්ගලයෙක් වෙනවා. ඔහු ජනතාව තුළ භේදයක් ඇතිවෙන, අකුසල් උපදවන ක්‍රියාවන් තම සම්මා දිට්ඨියේ දැක්ම තුළින්ම මගහරවාගැනීමට දක්ෂකෙනෙක් වෙනවා.

පින්වත් ඔබ නුවණින් විමසා බලන්නකෝ, සම්මා දිට්ඨිය වැනි මෙච්චර මනුෂ්‍යත්වයෙන් පිරුණු, සමාජ ආරක්ෂකයෙක් ජීවමානව තිබියදී සමාජය මොනතරම් මිත්‍යා දෘෂ්ඨි, මිත්‍යා සංකප්ප පසුපස්සේ ගමන් කරනවාද. ඒවා ක්‍රියාත්මක කිරීමට ගොස් ප්‍රශ්න ඇතිකොට ගන්නවාද කියලා. මේවායේ අවසාන ඵලය වෙන්නේ සිංහල බෞද්ධකම දුර්වල වීමය. සිංහල බෞද්ධකම දුර්වල වීමෙන් සිදුවන්නේ ආර්ය ආෂ්ටාංගික මාර්ගය දුර්වල වීමයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය දුර්වල වීමෙන් සිදුවන්නේ මාරයා අත්පොළසන්දෙන සම්මා සම්බුද්ධ ශාසනයේ අර්ථයන් දුර්වල වීමයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එකම ආරක්ෂකයා වන්නේ, සම්මා දිට්ඨියට පත් බෞද්ධ ජනතාව බව හොඳින් තේරුම් ගන්න. එම නිසා පින්වත් ඔබ ජීවිතය ඉදිරියට පැමිණෙන මොනම අභියෝගයකදීවත්, මොනයම් ජයග්‍රහණයකදීවත්, 'මම සිංහල බෞද්ධයෙක්'ය කියලා කියන්න බය වෙන්න එපා.

සම්මා දිට්ඨියට පත් පින්වතුන්ට පමණක්මයි සමාජයට යහපත් ආරක්ෂකයෙක් බවට පත්වීමට අවස්ථාව ලැබෙන්නේ. එසේ නොවන තැනදී සමාජය එක ප්‍රශ්නයක් විසඳාගන්නේ, අනාගතයේදී තවත් බරපතළ ප්‍රශ්න ඇතිවෙන ආකාරයෙන්මයි. මේ මොහොතේ ඔබ ජීවත්වන සමාජය තුළ සිදුවන්නේ ඔබ කැමති කරන දෙයක් නම් එයත් හේතුඵල ධර්මයක්මයි. ඔබ ජීවත්වන සමාජය තුළ සිදුවන්නේ ඔබ අකමැති කරන දෙයක් නම් එයත් හේතුඵල ධර්මයක්මයි. මනුෂ්‍යයාගේ කැමැත්ත අකමැත්ත

කියන්නේ සංස්කාරයන්ගේ ඵලයක්මයි. සංස්කාර කියන්නේ පංච උපාදානස්කන්ධ මාරයාගේ තවත් නිෂ්පාදනයක්මය. එම නිසා මාරයාට අයිති කැමැත්තට පින්වත් ඔබ ඇලෙන්නේ නැතිව, මාරයාටම අයිති අකමැත්තට ඔබ ගැටෙන්නෙත් නැතිව කැමැත්ත අකමැත්ත දෙකම ඉදිරියේ ධර්මයේ අර්ථයන්ම, සංසාර බියක්ම, අකුසලය වර්ධනය වන ලෝකයක පංචනීවරණවලින් විසිරුණු මනෝභාවයන්ගේ බියකරුබවම දකිමින් පින්වත් ඔබ සම්මා දිට්ඨියේ අර්ථයෙන් සමාජයට පූර්වාදර්ශයන් ලබාදෙන සමාජය ආරක්ෂකයෙක් බවට පත්වෙන්න.

පින්වත් ඔබ ඉදිරියට පැමිණෙන ඕනෑම පුද්ගලයෙක්ගේ විශ්වාසය එකම මිනුම් දණ්ඩ සම්මා දිට්ඨියේ අර්ථයන් බවම හිතට ගන්න. එහෙත් පංච උපාදානස්කන්ධ මාරයා කෙරෙහි විශ්වාසය නොතබන්න. පින්වත් ඔබගේ මේ ව්‍යායාමය හුදු නිස්සාර, නිත්‍ය සැපයක් ගැන බලාපොරොත්තුව නොව, නැසෙන ලෝක ධර්මයන් හමුවේ තමන් තව තවත් සද්ධර්මයෙන් ශක්තිමත් වීමටත්, අනුනට කල්‍යාන මිත්‍රභාවයෙන් සද්ධර්මය එක දිනක් හෝ ආරක්ෂාකොට දීමත් පමණක්ම බව කල්පනාකොට ගන්න. වෙනස්වන ලෝකයක්මයි මේ. තත්පරයෙන් තත්පරය වෙනස්වන ලෝකයක් මේ. අධිවේගයෙන් වෙනස්වන පංච උපාදානස්කන්ධ ලෝකයක් මේ. තෘෂ්ණාවේ වේගවත්භාවයට සරිලන ආකාරයට සිතුවිල ක්‍රමවේදයන් වෙනස් වෙනවා. අකුසල් වේගවත්වන සමාජයක පින්වත් ඔබ ඇතිකොටගන්න සෑම බලාපොරොත්තුවක් අභියසම සියළු සංස්කාරයෝ අනිත්‍ය බවම සිතන්න දක්ෂවෙන්න. අකුසලය පොදුවේ කාටවත්ම වැඩි වේලාවක් සතුටුවෙන්න අවස්ථාව දෙන්නේ නැහැ. විනෝදවෙන්න දෙන්නේ නැහැ. විඤ්ඤාණය නමැති මැජික්කරුවා තෘෂ්ණාවේ වේගවත්භාවය නිසා වර්තමානයේ දැඩිව සක්‍රියවයි සිටින්නේ. විඤ්ඤාණය නමැති මැජික්කරුවා මනුෂ්‍යයාව සුදු රෙදිකඩකින් වසා, තම මැජික් යෂ්ඨිය උපයෝගීකොටගෙන අනාගත ලෝකයට ප්‍රේතයන්, නිරිසතුන්, තිරිසන් සතුන්, අසුරයින්, මිථ්‍යා දෘෂ්ඨික

මනුෂ්‍යයින් නිර්මාණය කරවයි. මැජික් සංදර්ශනයේ දෝංකාරයයි සමාජය තුළ වර්තමානයේ දකින්නට ලැබෙන්නේ. මෙවන් සංදර්ශන භූමි තුළ පින්වත් ඔබ කැමැත්තට හෝ අකමැත්තට ඇලෙන්නේ ගැටෙන්නේ නැතිව සම්මා දිට්ඨියේ අර්ථයන් තමන් තුළිනුත්, අනුන් තුළිනුත් ශක්තිමත් කිරීම දෙසටම ගමන් කිරීමට දක්ෂ වෙන්න. සෑම අභියෝගයක් හමුවේම පලායෑමෙන් තොරව, අකුසලයේ කටුක යථාර්ථය පිළිබඳව අර්ථයන්ම, විදර්ශනාමය දැක්මක්ම ජීවිතයට එකතුකොටගන්න.

'මෙයා හොඳයි. මෙයා නරකයි' කියා ඔබ හඳුන්වන සියළු පාර්ශ්වයන් මාරයාගේ කාසියේ දෙපැත්ත බවම නුවණින් දකිමින් සම්මා දිට්ඨියේ අර්ථයන්ම මුල්තැන දෙමින් පින්වත් ඔබ, ධර්මය සුරැකීමට උත්සාහ කරන්නා ධර්මය තුළින් සුරක්ෂිත වෙනවාය කියන ස්වභාවයට ජීවිතය අතහරින්න.

# දෑස් හැරගෙනම ඔබ කරන භාවනාව කුමක්ද?

**(මෙතැන් පටන් ඉදිරියට පළවෙන ලිපි කිහිපය බුද්ධානුස්සති, භාවනාව පිළිබඳ විග්‍රහයකි)**

**(බුද්ධානුස්සතිය)**

පින්වතුන් නිතරම අසන ප්‍රශ්නයක් තමයි, භාවනාවක් හැටියට අපි මුලින්ම කුමක්ද තෝරාගත යුත්තේ කියලා. භාවනාවක් කියන්නේ වඩනවා කියන කාරණයයි. පින්වත් ඔබ තුළ කුමක් ද වැඩෙන්නේ, එය භාවනාවක් වෙනවා. ඔබ සිතන්න ඔබ මුළු දවසම ද්වේෂය වඩනවා කියලා. එවිට මුළු දවසම ඔබ 'ද්වේෂ භාවනාව' වැඩුවා වෙනවා. ඔබ සිතන්න මුළු දවසම ව්‍යාපාරය නිසා, පවුල් සම්බන්ධතාවයන් නිසා ලෝභය වඩවනවාය කියලා. එවිට ඔබ මුළු දවසම 'ලෝභ භාවනාව' වැඩුවා වෙනවා. පින්වත් ඔබ මුළු දවසම සංස්කාරයන්ට ඇලී ගැලී ජීවත්වෙනවා ය, කියලා සිතන්න. එවිට ඔබ මුළු දවසම 'මෝහ භාවනාව' වැඩුවා වෙනවා. දැන් පින්වත් ඔබට පුළුවන් ඔබේ ජීවිතයට සිත යොමුකරලා දිනපතා ඔබ තුළින් වැඩෙන්නේ අකුසලයට අදාළ භාවනාවක් ද එසේත් නැතිනම් අලෝභ, අද්වේෂ, අමෝහයන්ට අදාළ කුසලය වැඩෙන භාවනාවක් ද කියලා දැනගන්න.

පින්වත් ඔබ දවස පුරාම මුදල් පසුපස, බලය පසුපස, සැපය පසුපස හඹාගෙන යන කෙනෙක් නම්, ඔබ තුළ වැඩෙන්නේ 'ලෝභ භාවනාවයි' ඔබ බලාපොරොත්තුවෙන මුදල්, බලය,

සැපය පිළිබඳ ඉලක්කයන් වැරදී යන විට ඔබ තුළ වැඩෙන්නේ ලෝභ සහ ද්වේෂ භාවනාවයි. ගිලිහී ගිය බලාපොරොත්තු නිසා, ඔබ ගැටෙමින් ජීවත්වන විට ඔබ තුළ වැඩෙන්නේ ලෝභ, ද්වේෂ, මෝහ භාවනාවයි. භාවනාවන් තුනක්ම පින්වත් ඔබ තුළ එකවිටම වැඩෙනවා. දැන් පින්වත් ඔබ තමා කෙරෙහි අනුකම්පාවෙන් ස්වයං අධ්‍යයනයක යෙදෙන්න. ඔබේ ජීවිතය පිළිබඳව. ඔබ දිනකට කොතෙක් වේලාවක් ලෝභ, ද්වේෂ, මෝහ භාවනාවන් වඩනවාද? එම හේතූන් නිසාම ඔබට හොරා දිනකට ඔබ තුළින් කොතෙක් අකුසල් සිදුවෙනවා ද කියලා.

එක පින්වත් මහත්මයෙක් ඉන්නවා. එම මහත්මයා උදේම නිවසින් එළියට බහිනකොට තම දයාබර බිරිඳට කියනවා අද රාත්‍රියට මම නිවසට එන්නේ රුපියල් 75,000 ක් හම්බකරගෙන කියලා. අනිවාර්යයෙන් ම මෙම මහත්මයා රාත්‍රියට එම මුදල අරගෙනයි නිවසට එන්නේ. මේ හැත්තෑපන්දහසේ ඉලක්කය සපුරාගැනීම උදෙසා, එම පින්වත් මහත්මයා දෑස් ඇරගෙන පැය දහයක් එකදිගටම ලෝභ, ද්වේෂ, මෝහ භාවනාව නොවරදාම, වීර්යයෙන් යුතුව සිදුකරනවා. මෙහෙම වීර්යයෙන් 'භාවනා කරන' පින්වතුන් අපට ඇවිල්ලා කියනවා 'හාමුදුරුවනේ, අපිට භාවනාවක් වැඩෙන්නේ නැහැ. සිත විසිරෙනවා' ය කියලා. බලන්න කොච්චර බොරු කියනව ද කියලා. ලෝභ, ද්වේෂ, මෝහ භාවනාවන් ඇස් ඇරගෙනත් පැය දහයක් එක දිගට කරන්න පුළුවන්. අලෝභ, අද්වේෂ, අමෝහ භාවනාවක් දෑස් පියාගෙන විනාඩි දහයක් කරන්න බැහැ සිත විසිරෙනවා.

ඉහත කාරණය තුළ පින්වත් ඔබට හොඳ ප්‍රවේශයක් තිබෙනවා. පංචකාමයන් උදෙසා ඔබේ ඇති කෑදරභාවය නුවණින් මතුකොට ගන්න. දැන් පින්වත් ඔබට තේරෙනවා, ඔබ දවසේ පැය විසිහතර පුරාවටම භාවනාවක් කරමිනුයි සිටින්නේ. එය අකුසලයට, දුකට අදාළ භාවනාවක්වමයි.

එක පින්වතෙක් සිටිනවා, ඔහු පින්කම් කරන්න හරිම කැමතියි. වියදම් කරමින්, විචිත්‍ර පින්කම් කරනවා. ඔහු පිනට හරිම ලෝභයි. මේ පින්කම් තුළ නිරතුරුවම සිත වැඩෙනවා, සුගතියේ උපතකට අදාළව සංස්කාර වැඩෙනවා. නමුත් මොහු තුළ ඇති පින කෙරෙහි ලෝභ ස්වභාවය නිසා, ද්වේෂයත් මෝහයත් කියන අකුසල් මූලයන් දෙකම ඔහු තුළ භාවනාවක් හැටියට වැඩෙනවා. සැපයට අදාළව පින කියන භාවනාව වඩන මොහොතේම, ඔහු දුකට අදාළ අකුසලයට අදාළ, ද්වේෂයත් මෝහයත් යන භාවනා දෙකම වඩන කෙනෙක් බවට පත්වෙනවා. ලෝභ සිතක් ඉදිරියට බාධාවක් පැමිණෙන මොහොතේම ඊළඟට ඔබට මුණගැසෙන්නේ ද්වේෂ සහගත සිතක්මය. පින කෙරෙහි ලෝභ සිත් ඇති පින්වතුන් ධර්මය ගලපාගැනීමට ඇති අදක්ෂභාවය නිසාම නිරතුරුවම ද්වේෂ මෝහ භාවනාවන් ජීවිතවලට එකතුකොට ගන්නා ආකාරය වර්තමාන සමාජය තුළ හොඳින් විද්‍යමාන වෙනවා.

පසුගිය කාලයේ එක්තරා පින්වත් මහත්මයෙක් භික්ෂුව දේශනා කළ එක් නිවැරදි ධර්ම කාරණයක් අරගෙන භික්ෂුවට චෝදනා කළා. දවසක් මේ පින්වත් මහත්මයා මුණගැසුණු මොහොතක බොහොම කාරුණිකව විමසුවා 'ඇයි මහත්තයෝ මේ නිවැරදි ධර්ම කාරණාවකට වෙනත් අර්ථකථනයක් දී භික්ෂුව විවේචනය කරන්නේ?' කියලා. ඒ වෙලාවේ මේ ජීවිතයේදීම උතුම් සෝවාන් ඵලය සාක්ෂාත් කරගැනීමට බලාපොරොත්තුව ධර්ම මාර්ගය වඩන එම පින්වත් මහත්මයා භික්ෂුවට කියනවා 'ඔබ වහන්සේ දේශනා කළ ධර්ම කාරණය, සූත්‍රගත නිවැරදි ධර්ම කාරණයක්ය කියලා මම හොඳින් දන්නවා. එහෙම දැනගෙනත් මම ඔබ වහන්සේව ප්‍රසිද්ධියේ විවේචනය කළේ, ඔබවහන්සේ ගැටෙනවා ද කියා බලන්නයි' කියලා. 'අපේ කණ්ඩායමක් සිටිනවා. එම කණ්ඩායම කරන්නේ ස්වාමීන් වහන්සේලාව චෙක් කරන එක' ය කියලා. බලන්නකෝ, සෝවාන් ඵලය අපේක්ෂාවෙන් කොයිතරම් මේ පින්වතුන්ලා ලෝභ ද්වේෂ මෝහ භාවනාව වඩනවා ද

කියලා. මෙවැනි පින්වතුන්ලාට කිසිදු ගුරු උපදේශයකින් තොරව, දෑස් විවර කරගෙනම අධි වීර්යයකින් යුතුව ලෝභ, ද්වේෂ, මෝහ භාවනාවන් වැඩීමට විසිහතර පැයේම ආශිර්වාද කරන්නේ අකුසලයට අධිපති වසවර්ති මාරයා කියන ඔවුන්ගේ ශාස්තෘවරයාය.

# ශීලයේ පලුදු බුද්ධානුස්සතියෙන් පිරියම් කර සොඳුරු ආරම්භයක් ගන්න

**(බුද්ධානුස්සතිය)**

පින්වත් ඔබ මොහොතක් දෑස් දෙක පියාගෙන නුවණින් මෙනෙහි කරන්න. අද දවසේ ඔබ කොපමණ වේලාවක් ලෝභ, ද්වේෂ, මෝහ ධර්මයන් වඩන්නට ඇති ද කියලා. ඔබ වෙනුවෙන්, ඔබගේ පවුල වෙනුවෙන්, රැකියාව ව්‍යාපාරය වෙනුවෙන්, රට ජාතිය ආගම වෙනුවෙන්, කැමති අකමැති දේ වෙනුවෙන් ලෝභ ද්වේෂ මෝහ ධර්මයන් කොතෙක් වඩන්නට ඇතිද?

දවස පුරාවට ඔබ වැඩූ කුසල්, පින් තරාදියේ එක පැත්තකටත්, අකුසල් සිත් තරාදියේ අනෙක් පැත්තටත් දමා අලෝභ, අද්වේෂ, අමෝහ සිතකින් එම තරාදිය දෙස බලන්න දක්ෂ වෙන්න. මොකද අපි තරාදිය දෙස බලන්න පුරුදුවෙලා තියෙන්නේ ලෝභ, ද්වේෂ, මෝහ සිතුවිලි පෝෂණය කරමින්මයි.

ඉසිගල් පර්වතයේ වැඩසිටි ගෝධික ස්වාමීන්වහන්සේ තම අතින්ම ගෙල සිඳගෙන අපවත්වෙනවා. ගෝධික ස්වාමීන් වහන්සේ සියදිවි නසාගන්නේ පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකිමින්. රූපය කෙරෙහි කලකිරීම අවබෝධයෙන්ම ඇති කර ගෙන එස්සයේ අනිත්‍යභාවය දකිමින්. සියදිවි නසාගන්නා මොහොතේම උතුම් රහත් ඵලයට පත්වී පිරිනිවී යනවා. ගෝධික ස්වාමීන්වහන්සේ අපවත්වූ බව දැනගත් ලෝභ, ද්වේෂ, මෝහයන්ගෙන් ඔද්දල් වුණු වසවර්ති මාරයා ගෝධික ස්වාමීන් වහන්සේගේ දේහය අසල කැරකෙමින් ගෝධික

හිමියන්ගේ විඤ්ඤාණය කොහේ නැවත පිහිටියා ද කියලා සොයන්න ගත්තා. ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ මාරයාට කියනවා 'මාරය, පංච උපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාව අවබෝධයෙන්ම අතහැරිය ගෝධික හිමි තමා තුළින්ම නිවීගියා'ය කියලා. ලෝභ, ද්වේෂ, මෝහ මාර පාර්ශ්වික ධර්මයන් බලවත් වූ තැන පිරිනිවීගිය රහතන් වහන්සේ නිසාත් අකුසල්ම රැස්කර ගන්නවා.

ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් ධර්මයන්ගෙන් සත්ත්වයාට සිදුවන භයංකාර විනාශයෙන් පින්වත් ඔබව මුදවලා දෙන්නේ සම්මා දිට්ඨියේ උතුම් අර්ථය විසින්මයි. සම්මා දිට්ඨියේ අර්ථය පින්වත් ඔබ තුළින් ශක්තිමත්කොට ගැනීමට නම් භාවනාවක් හැටියට මුලින්ම පුහුණු විය යුත්තේ බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය කියන භාවනාවන්ය. මේ උතුම් ධර්ම මාර්ගයට ඔබ අවතීර්ණ වෙන්නේ කල්‍යාන මිත්‍ර ආශ්‍රය තුළින්මය. ධර්ම මාර්ගයේ ශක්තිය උදෙසා ඔබට සිටින ශක්තිමත්ම කල්‍යාන මිත්‍රයා වන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේය. පිරිනිවී ගිය මේ උතුම් ශාස්තෘන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඔබ ඇතිකොට ගන්නේ උතුම් සද්ධර්ම ශ්‍රවණය තුළින්මය. මේ උතුම් සද්ධර්ම ශ්‍රවණය කිරීමට ජීවමානව උපකාරක ධර්මයන් සකස් කොට දෙන්නේ උතුම් සංඝරත්නයයි. තෙරුවන් කෙරෙහි ඔබ ඇතිකොට ගන්නා විශ්වාසයයි. ධර්ම මාර්ගය වන ආර්ය අෂ්ටාංගික මාර්ගයට ඔබව යොමුකර ගන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මුල්ම මාර්ග අංගය වන සම්මා දිට්ඨියේ මූලිකම ලක්ෂණය වෙන්නේ තෙරුවන් කෙරෙහි ඇතිකොට ගන්නා ශ්‍රද්ධාවයි. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළින් පෝෂණය වෙන සම්මා දිට්ඨියේ ශක්තිමත්භාවයයි මුළු ආර්ය අෂ්ටාංගික මාර්ගයම වැඩීම කෙරෙහි උපකාරක ධර්මයන් සකස් කොට දෙන්නේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයයි පින්වත් ඔබ තුළ සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන්ම මෝදුකොට දෙන්නේ.

තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් තොරව කරන භාවනාවන් තුළින් මිච්ඡා සතියක්, මිච්ඡා සමාධියක් මිස සම්මා සතියක්, සම්මා සමාධියක් සකස්වීමක් සිදුවන්නේ නැහැ. ධර්ම මාර්ගයේ ආරම්භය වන සම්මා දිට්ඨිය පෝෂණයකොට ගැනීමට නම් පින්වත් ඔබ බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය භාවනාවක් හැටියට පුහුණුවීම අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. මෙතැනදී පින්වත් ඔබ වැඩි බර දිය යුත්තේ බුද්ධානුස්සතියටයි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඔබ තුළ මෝදුවන ප්‍රමාණයට, ධර්මරත්නය කෙරෙහිත්, සංඝරත්නය කෙරෙහිත් ඔබ තුළ විශ්වාසය මෝදුවෙනවා.

බුද්ධානුස්සතිය වැඩීමට බලාපොරොත්තු වන පින්වතා සෑම උදෑසනකම තෙරුවන් සරණ පිහිටලා, සිල්පද පහ සමාදන් වී එම පංචශීලය ආරක්ෂාකොට ගැනීමට උත්සාහ ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. ශීලයේ යම් දුර්වලතාවයක් තිබුණත් පින්වත් ඔබ බියවිය යුතු නැහැ. බිඳෙන සිල්පද නිවැරදි කර ගැනීමට ඇති උවමනාවයි වැදගත් වෙන්නේ. යම් පින්වතෙක් ශීලයෙන් දුර්වල වෙන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ දුර්වලතාවයක් නිසාමයි. එම නිසා බුද්ධානුස්සතිය ඔබ තුළ වැඩෙන ප්‍රමාණයට ඔබ ශීලය තුළ ශක්තිමත් වීමට උත්සාහ ගැනීම අනිවාර්යය සිද්ධියක් වෙනවා. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඔබ තුළින් මෝදු වෙනකොට, ඔබ තුළ කර්මය කර්මඵල විශ්වාසය, ශීලයේ ආනිසංශ පිළිබඳ විශ්වාසය, ඕපපාතික සත්ත්වයන්ගේ උපත පිළිබඳ විශ්වාසයත් නිසා පින්වත් ඔබ ශීලය තුළ ශක්තිමත් වෙනවා. බුදුරජාණන් වහන්සේගේ අයෝමය මහා කරුණා ගුණය ශීලයෙන් දුර්වල පින්වතුනට වුවද මේ උතුම් ධර්ම මාර්ගයට අවතීර්ණ වීම පිණිස හොඳින් ඉඩකඩ සලසා දෙනවා. මනුෂ්‍ය ඝාතන 999ක් සිදුකළ අංගුලිමාලට, නිර්වස්ත්‍රව බුදුරජාණන් වහන්සේ ඉදිරියට පැමිණි පටාචාරාවට, බීමතින් පසු වූ සන්තිස්ස ඇමැතිවරයාට බුදුරජාණන් වහන්සේ දැක්වූ මහා කරුණාව, කාමයන්ගේ තුච්ඡභාවය ගිහි ජීවිතය පුරාවට අත්විඳි උත්පලවන්නාවට වගේම අම්බපාලියට බුදුරජාණන් වහන්සේ

දැක්වූ මහා කරුණාව, ශීලයෙන් යම් දුර්වලතාවයක් තිබෙන ගිහි පින්වතුන්ලාටත්, බුද්ධානුස්සතිය තුළ ශක්තිමත් වීමට හොඳ කමටහනක් වෙනවා.

ශීලයෙන් යම් දුර්වලතාවයක් තිබුණාය කියලා පින්වත් ඔබ බුදුරජාණන් වහන්සේගේ සරණ තුළට යන්න බියවෙන්න එපා. බුදුරජාණන් වහන්සේ හොඳින්ම දන්නවා ඔබේ ශීලයේ යම් දුර්වලතාවයක් තියෙන්නේ ඔබේ වරදක් නිසා නොව ඔබ තුළ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ ඇති දුර්වලතාවයක් නිසාය කියලා. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය වර්තමානයේ වුවද ඕනෑම මොහොතක සූදානම්, ශීලයේ යම් දුර්වලතාවයක් තිබුණ ද ඔබට ශ්‍රද්ධාවේ අර්ථය තුළින් වැරැද්ද නිවැරදිකොට දෙන්න. එම නිසා ඔබ බුද්ධානුස්සති භාවනාව ඔබේ ජීවිතයේ ආරම්භක භාවනා කමටහන කර ගන්න.

# බුද්ධානුස්සතියට පූර්වකෘත්‍යයක් ලෙසින් ඔබ බුදුසමයෙන් එපිට අතීතයට යන්න

(බුද්ධානුස්සතිය)

බුද්ධානුස්සතිය තුළ පින්වත් ඔබ ශක්තිමත් වන තරමට ඔබ තුළ බිය කියන කාරණය තුනී වී යනවා. ඔබ නිරතුරුවම බියක් සමඟ ජීවත්වන කෙනෙක් නම්, ඊට මූලිකම හේතුව බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසයේ දුර්වලභාවයයි. බුදුරජාණන් වහන්සේ වන් උතුම් සරණක් ඔබ අවබෝධයෙන් සරණ කරගත් තැනදී, සොරබිය, රෝග බිය, මරණ බිය, අමනුෂ්‍ය බිය, ග්‍රහ බිය ඔබෙන් නිශේධ වී යනවා. නිවීමේ මාර්ගයේ ගමන් කරන පින්වත් ඔබට ජීවිතයේ යම් තීරණාත්මක අවස්ථාවන් එළඹෙනවා, බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල විශ්වාසයෙන්, පංච උපාදානස්කන්ධය කෙරෙහි තෘෂ්ණාව අතහැරලා, ජීවිතය මරණයට දමන්න සිද්ධවෙන. ඒ උතුම් අතහැරීමේ තීරණයට ඔබ එන්නේ, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති කොටගත් අචල විශ්වාසය නිසාමයි. එම අවස්ථාව බුද්ධානුස්සතියේ ශ්‍රේෂ්ඨම ඵලයයි.

පින්වතුන් බුද්ධානුස්සතිය භාවනාවක් වශයෙන් වැඩීමට පෙරාතුව, පූර්වකෘත්‍යයක් හැටියට, පින්වත් ඔබ පසුකරගෙන පැමිණි අතීත භව ගමනේ, කල්ප ගණන් අති දීර්ඝ වූ

අබුද්ධෝත්පාද කාලයන් නුවණින් සිහිපත් කළ යුතු වෙනවා. අබුද්ධෝත්පාද කාලයක දහම වෙන්නේ, මාර දහමයි. මාර දහමේ අර්ථය වෙන්නේ සත්ත්වයා පංච නීවරණවලට කොටුකොට තැබීමයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය අතුරුදන්ව ගිය ලොවක, ධර්මය අධර්මය වූ ලොවක, ගස් ගල් වඳින මිනිසුන්, නිර්වස්ත්‍රව විමුක්තිය සොයන මිනිසුන්, ගෝ වෘත, බලු වෘත රකිමින් විමුක්තිය සෙවූ මිනිසුන්, අශුචි කෑමෙන්, නිර්මාංශ වීමෙන්, ශීතල වතුරේ ගිලෙමින්, ගවයන්, එළුවන්, බැටළුවන් දහස් ගණන් මරා දමමින් සත්ත්ව යාග තුළින් විමුක්තිය පිරිසිදුභාවය සෙවූ මිනිසුන්... මිථ්‍යා දෘෂ්ටියේ අබුද්ධෝත්පාද කාලයක සැබෑම රුව මොහොතක් නුවණින් දකින්න.

පින්වත් ඔබත්, මෙවැනි දීර්ඝ අබුද්ධෝත්පාද කාලවල ඉපදී, මෙම මිථ්‍යා දෘෂ්ඨික ක්‍රමවේදයන් නිසා කල්ප ගණන් අපායන්ට වැටී, දුක්විඳි හැටි නුවණින් දකින්න. පින්වත් ඔබ බුදුරජාණන් වහන්සේ පහළවීමට පෙරාතුව දඹදිව දෘෂ්ඨීන් හැටදෙකකින් පෝෂණය වූ සමාජ වාතාවරණය නුවණින් දකින්න. එම මිත්‍යා දෘෂ්ඨීන්ගෙන් එක දෘෂ්ඨියක් වන්නේ ඊශ්වරයා, බ්‍රහ්මයා සියල්ලේම කර්තෘය, සියල්ලේම නිර්මාතෘය, ලොව සකස් කරන්නාය, උපන් සියල්ලන්ගේ ම පියාය, මේ උත්තමයා විසින් අපිව මවන ලදී. සිත කියා හෝ විඤ්ඤාණය කියා හෝ මනස කියා හෝ යමක් තිබේ නම් ඒවා නිත්‍යය, නොපෙරෙලෙන සුළුය, ආත්මය මරණින් පසු නිත්‍යය.... මෙවන් මිත්‍යා දෘෂ්ඨීන් හැටදෙකක් විසින් එදා දඹදිව ජනතාව අකුසලයට යොමු කොට තිබිණි. එදා ගෝ වෘත, බලු වෘත රකිමින් විමුක්තිය සෙවූ මනුෂ්‍යයෝ වර්තමානයේ හරකුන්, බල්ලන් වී තිරිසන් ලෝකය අත්විඳින අයුරු නුවණින් දකින්න. එදා සත්ත්ව යාග සඳහා සතුන්ගේ බෙලි කැපූ බමුණන් වර්තමානයේ හරක්, එළුවන්, කුකුලන්, බැටළුවන් වෙලා මිනිසුන් විසින් බෙලි කපාගෙන මරාගෙන කන හැටි නුවණින් දකින්න.

එදා අසූචි කමින් විමුක්තිය සෙවූ මනුෂ්‍යයෝ වර්තමානයේ උග්‍රරන් වෙලා අසුචි බුදින හැටි නුවණින් දකිමින් පින්වත් ඔබ බුද්ධානුස්සති භාවනාවට අවතීර්ණ වෙන්න.

මෙය සටහන් තබන භික්ෂුවට බුදුරජාණන් වහන්සේව සිහිපත්වන මොහොතේම, භික්ෂුවකට සිත පිහිටන්නේ දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයේදී මඩ වගුරක දිගාවෙලා, දීපංකර බුදුරජාණන් වහන්සේට තම සිරුර පාවඩයක් බවට පත්කොට පූජා කළ බෝධිසත්ත්වයන්වය. කල්ප ලක්ෂ කීයකට ඈත අතීතයක්ද..... ඒ මඩ වගුරේ දිගාවෙලා සිටිය බෝධිසත්ත්වයන්ගේ සිතේ හටගත් සිතිවිලි භික්ෂුවට මේ මොහොතේ මැවී පෙනෙනවා. 'මම තනිවම නිවන් අවබෝධ කරගන්නේ නැහැ. සියක් කෝටියක් සත්ත්වයන්ට නිවන් මාර්ගය සකස් කොට දෙනවාය කියන සිතිවිල්ලේ සිට, මතු සම්මා සම්බුද්ධත්වය පිළිබඳව ඡන්දය ඇතිවූ ඒ සිතිවිල්ල මොන තරම් පරාර්ථකාමිද. කරුණාබරිතද.

දීපංකර බුදුරජාණන් වහන්සේ අපේ බෝධිසත්ත්වයන්ට 'ඔබ අසවල් කාලයේ ගෞතම නමින් සම්මා සම්බුද්ධත්වයට පත්වෙනවා'ය කියන නියත විවරණය ලබාදුන් මොහොතේ, අප බෝධිසත්ත්වයන් තුළ, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබලන සම්මා සම්බුද්ධ ඥානයෙන් පෝෂිත ගෞතම බුදුරජාණන් වහන්සේ හැටියට සිතේ ඇතිවූ මනෝමය චිත්‍රය ඉලක්ක වූයේ, දුකෙන් පෙළෙන ලෝක සත්ත්වයාව දුකෙන් මුදවාලීම උදෙසාමය. මේ ඝෝර, කටුක, භයානක සංසාරයේ දුකෙන් පෙළෙන සත්ත්වයාට සැනසිල්ල ඉලක්කකොට සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනාවක් දස පාරමී ධර්මයන් පිරීමට ඇතිකොටගත් අධිෂ්ඨානය මොනතරම් වීර්යවන්ත, මෛත්‍රීසහගත අධිෂ්ඨානයක්ද? මහා සාගරයේ ජලයට වඩා රුධිරය දන් දෙමින්, මහ පොළොවේ පසට වඩා ශරීරයේ මාංශ දන් දෙමින්, සක්විති රජ පදවි, රාජ

රාජ මහාමාත්‍ය පදවි දන් දෙමින්, බිසෝවරු, දරුවන්, වස්තු සම්පත් දන් දෙමින් දිවි පරදුවට සිල්පද රකිමින් අතපය කපා දමද්දීත් මෛත්‍රිය වඩමින්, කෘතගුණ, කෘතවේදීභාවය දිවි දෙවැනි කොට රකිමින්, උතුම් සම්මා සම්බුද්ධත්වය උදෙසා ගමන් කළ යුතු දීර්ඝ භව ගමනට අධිෂ්ඨානශීලීව, වීර්යවන්තව සතුටු සිතින් පියමැන්න බෝධි සත්ත්වයන්ගේ කරුණා බරිත පරිත්‍යාගශීලී සිතිවිලි මොහොතක් මෙනෙහි කරන්න.

# ඔබ පය තබාගෙන සිටින පොළොව ඔබ උදෙසා බෝධිසත්වයන් දන් දුන් ශරීර මාංශයම නොවේද?

(බුද්ධානුස්සතිය)

පින්වත් ඔබ දෑස් පියාගෙන මහා සාගරයට සිත යොමුකරලා, මහා සාගරයේ ජල කඳ, බුදුරජාණන් වහන්සේ ඔබ වෙනුවෙන්, ඔබ මේ මොහොතේ ලබන ධර්මයේ සැනසීම වෙනුවෙන් අතීතයේ හෙළූ රුධිරය බව දකින්න. පින්වත් ඔබ මේ මොහොතේ 'මගේ කරගෙන' බැඳී සිටින ඔය කුමන රූපයක්වත් ඔබ වෙනුවෙන් මේ ජීවිතයේදී අවම වශයෙන් කඳුළු බාල්දියක් හෙළා තිබෙනවාද?

කඳුළු සාගරයත්, කඳුළු බාල්දියත් සංසන්දනාත්මකව දකිමින් පින්වත් ඔබේ සැබෑ සැපය උදෙසා, දුකෙන් මිදීම උදෙසා ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ අයෝමය කැපවීම, ආරක්ෂාව නුවණින් දකින්න. පින්වත් ඔබ දෙපා තබාගෙන සිටින මහ පොළොවේ පස, බුදුරජාණන් වහන්සේ ඔබ වෙනුවෙන්, ඔබ මේ මොහොතේ ලබන ධර්මයේ සැනසීම වෙනුවෙන් අතීතයේ දන් දුන් ශරීර මාංශ බව නුවණින් දකින්න. බුදුරජාණන් වහන්සේ දෙපා තබාගෙන වැඩසිට පිරිනිවී ගිය මේ මහපොළොව මත, යම් දවසක ඔබේ ශරීරය මළකුණක් කොට තබා, නැවත උපතකට නොයනවාය කියන අධිෂ්ඨානය ඔබ ඇතිකොට ගන්න.

බෝධි සත්ත්වයන් දන් දුන් සක්විති රජ පදවි, තනතුරු, කීර්ති ප්‍රසංශා නුවණින් දකිමින් බෝධි සත්ත්වයන්ගේ අරමුණ කෙරෙහි

කැපවීම, වීර්යය නුවණින් දකින්න. තනතුරු උදෙසා බලය උදෙසා ජීවිතයක් පාවා දෙන සමාජයක, පින්වත් ඔබේ සැබෑම මාර්ගෝපදේශකයා, මගපෙන්වන්නා, බුදුරජාණන් වහන්සේ යැයි නුවණින් දකින්න. සද්ධන්ත කුලයේ ඇතකුව ඉපිද, තම පෞරුෂත්වයෙන් යුත් දළ යුගල අපරාධකාරී මනුෂ්‍යයෙක් අතින් කපා දමද්දිත්, එම මරණීය වේදනාව, සිහි නුවණින්, මෛත්‍රියෙන් යුක්තව ඉවසමින් ඒ අසත්පුරුෂ මනුෂ්‍යයාටත් මෙත් වැඩූ තිරිසන්භාවය තුළත් අයෝමය බෝධිසත්ත්ව ගුණය ප්‍රකට කළ ඒ ගුණය සිහියට නගාගන්න. පින්වත් ඔබේ භවදුක නිවීම උදෙසා මෙවන් කැපකිරීමක් කළ තවත් උත්තම පුරුෂයෙක්, තවත් බුදුරජාණන් වහන්සේ නමක්ම හැර මේ ලෝක ධාතුව තුළ නොමැති බව නුවණින් දකින්න.

සිදුහත් කුමරුන් ලෙස මහාමායා දේවියගේ මවුකුස පිළිසිඳගත් මොහොතේ පටන් සිදුවූ ආශ්චර්යමත් සිදුවීම් සියල්ලම බුදුරජාණන් වහන්සේ නමකගේ උතුම් පාරමී කුසල් ශක්තියේ ඵලයන්මය. බෝධිසත්ත්වයන් වහන්සේ නමක් මවුකුස පිළිසිඳ ගැනීම සිදුවන්නේද, බෝධිසත්ත්ව මෑණියන් දැනුවත්ව මය. දස මසක් කුසේ වැඩෙන දරුවා, මවුකුසේ වැඩෙන්නේ ද බාහිරට දර්ශනය වන ආකාරයටය. බෝධි සත්ත්ව දරුවා මවුකුස පිළිසිඳගත් මොහොතේ පටන් බෝධිසත්ත්ව මෑණියන්ට තම ස්වාමිපුරුෂයා නිසාවත් රාග සිතක් හටගන්නේ නැත. දස මසක් ගිය තැන බෝසත් දරුවා, බෝසත් මව සිටගෙන සිටින ඉරියව්වෙන්මයි ලෝකයට බිහිකරන්නේ. ලෝකයට, බිහිවන බෝසත් දරුවා දෙවියන් විසිනුයි, දෝතට පිළිගන්නේ. මවුකුසින් බිහිවන දරුවා රුධිරය, සැරව තැවරීමකින් තොරව දඹරනින් සෑදූ ළදරුවෙක් සේ පිරිසිදුභාවයෙන් යුක්ත වෙනවා. දෙවියන් දෝතට පිළිගත් දරුවා නැහැවීම සඳහා ස්වාභාවිකවම සිසිල් දිය වැස්සකුත්, උණුදිය වැස්සකුත් ඇතිවෙනවා. බෝසත් දරුවා උපන් මොහොතේම සත් පියවරක් ඉදිරියට තබා උතුරු දෙසට මුහුණලා 'මම ලොවට අග්‍ර වෙමි, මම ලොවට දෙටු වෙමි, මම

ලොවට ශ්‍රේෂ්ඨ වෙමි, මේ මගේ අවසාන උපතයි' යනුවෙන් සිංහ නාදයක් කරනවා. මේ සියලු ධර්මතාවන් උතුම් පාරමී ශක්තියෙන් ක්‍රියාත්මක වන උතුම් බුදුගුණයන්මය.

ඉහත ධර්මතාවන් නුවණින් මෙනෙහි කරමින්, බුදුරජාණන් වහන්සේ නමක් සතු උතුම් පුණ්‍ය ශක්තියේ බල මහිමයෙන් එම පුණ්‍ය ශක්තිය නිසා ස්වාභාවික ලෝක ධර්මයන් ආශ්චර්යවත් අයුරින් වෙනස් වෙන ආකාරයත්, පූජනීයත්වයට පත්වෙන ආකාරයත් නුවණින් දකින්න. දරුගැබක්, දසමසක් කුසේ දරාගෙන සිටිය කාලය තුළ කිසිදු ක්ලාන්ත වීමක්, කායික මානසික වේදනාවකින් තොරව දරු ප්‍රසූතිය සිදුකොට සත්වන දින කලුරිය කරන බෝසත් මෑණියන්, සශ්‍රීක දිව්‍ය තලයක උපත ලැබීමද, උතුම් බුදුගුණයක මහිමයක්මය.

ස්වාභාවික ලෝක ධර්මය කම්පා කරවීමට, වෙනස් කරවීමට සමත් මෙවැනි උත්තමයෙක් බුදුරජාණන් වහන්සේ නමක්ම හැර මේ ලෝක ධාතුව තුළ නොමැති බවද නුවණින් දකින්න.

# බුද්ධත්වයට පෙර අවධිය දක්වාද බුදු ගුණය දකින්න

**(බුද්ධානුස්සතිය)**

සිදුහත් කුමාරයා හැටියට අතීත පාරමී ශක්තියෙන් උරුම වූ ශාක්‍ය වංශයේ උපත, සක්විති රජ පදවියේ උරුමය, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් පරිපූර්ණ වූ රූපකාය බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'මහණෙනි, සිදුහත් කුමරු අවධියේ මම නිදුක්මි. අතිශයින්ම මම නිදුක්මි. සත්‍යයෙන්ම මම නිදුක්මි. මාගේ පිය නිවස්නෙහි පොකුණු ඇත. එකක නිලුපුල් මල් පිපෙයි, එකක හෙල පියුම් පිපෙයි, එකෙක රත් පියුම් පිපෙයි. ඒ සියල්ලම මා උදෙසාය. මම නිරතුරුවම පියුම් සුවඳ සඳුන් දරමි. මාගේ හිස වෙළුම් ද සියුම්ය. මාගේ පොරෝන ද සියුම්ය. උතුරු සළුද සියුම්ය. මහණෙනි මට දිවා රාත්‍රි දෙකේදී ශීතල උෂ්ණය පිනි දූහුවිලිවලින් ආරක්ෂා වීම සඳහා මගේ සේවිකාවෝ මට සේසත් දරනු ලැබේ. මහණෙනි මට රම්‍ය, සුරම්‍ය, සුබ නමින් තුන් පහායෙකි. එකක් හේමන්තයටය. එකක් ගිම්හානයටය. එකක් වර්ෂා ඍතුවටය. මහණෙනි, මම වැසි කාලය පැමිණි කළ වැසි කලට නිසි පහයෙහි පිරිමින් නැති තරුණ රූමත් ස්ත්‍රීන් පමණක් ඇති, නැටුමෙන් ගැයුමෙන්, වැයුමෙන් පිනවනු ලබන්නේ, යට පහයට නොබසී. මගේ පිය නිවස්නෙහි දැසි දස්සන්ට ද මස් සහිත ඇල් සහලේ බත් දෙනු ලැබේ' යැයි බුදුරජාණන් වහන්සේ තම කුමාර ජීවිතයේ විඳි සැප සම්පත් ගැන සඳහන් කරනවා.

දීපංකර බුදුරජාණන් වහන්සේගේ පාද මූලයේදීම 'ගෞතම බුදුරජාණන් වහන්සේ දවස, සිද්ධාර්ථ කුමාරයාගේ බිරිඳ මම වෙමි' යි ප්‍රාර්ථනා කොට, එම උපාදානය ඔස්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනක් ඈත පටන් පාරමී ධර්මයන් පුරාගෙන පැමිණි පංචකල්‍යාණියක් වූ යශෝධරාව, එම අතීත පාරමී ශක්තියේම ඵලයක් වූ රාහුල පුතණුවන්... මේ සෑම ආශ්චර්යවත් ධර්මයක්ම උතුම් බුදු ගුණයක්මය. මෙවන් අසිරිමත් සැපයක් අලුයම බැහැර කරන කෙළ පිඬක් සේ ඉවත දැමීමට, අතහැරීමට බෝධි සත්ත්වයන් තුළ සකස් වූ ඒ පූජනීය සිතිවිල්ල පින්වත් ඔබ මොහොතක් නුවණින් මෙනෙහි කරන්න.

ඒ උතුම් සිතිවිල්ල ද බුදුගුණයක්මය.

චතුරාර්ය සත්‍ය ධර්මයක් නොදන්නා ලොවක, අත්තකිලමථානු යෝගය නමැති වැරදි අන්තයක යමින්, සය අවුරුද්දක් පුරා ශරීරයට දුන්නා වූ අප්‍රමාණ දුක් පීඩාවන් නුවණින් දකින්න. 'ආනන්ද, එදා මට උදරය කියලා, පිට කොන්ද කියලා දෙකක් තිබුණේ නැහැ. උදරය අතගෑවහම, පිටකොන්දයි අතගෑවෙන්නේ. පිටකොන්ද අතගෑවහම උදරයයි අතගෑවෙන්නේ. ආනන්ද මම සොහොනේ මිනීඇට එකතුකොට කොට්ටයක් කොට සයනය කරනවා. එකල මා වෙතට ගොපළු දරුවන් පැමිණ මගේ සිරුරට කෙළ ගහනවා. මුත්‍රා කරනවා. පස් ද විසුරුවනවා. මගේ කන් සිදුරුවලට ඉරටු ගහනවා. නමුත් මම ඔවුන් කෙරෙහි පව්ටු සිතක් ඉපදෙව්වේ නැහැ. උපේක්ෂාවෙන්මයි ගතකළේ. මම මළ හෝ මුත්‍රා හෝ පහ කරන්න හිඳගනිද්දී එහිම ඇදගෙන වැටෙනවා. ඒ අල්ප ආහාර නිසා. මම ශරීරය පිරිමදිනකොට මුල් දිරූ රෝමයෝ ගැලවී අතට එනවා. ඒ තරමටම මම ශරීරයට දුක් දුන්නා ආනන්ද, කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පින්වත් ඔබ වැහැරී, කේඩෑරිව ගිය ඇටසැකිල්ලක් බඳුවූ බෝධිසත්වයන්ගේ රූපකාය මොහොතක් සිහියට නගන්න. පින්වත් ඔබට භව ගමනේ ආයුෂය, වර්ණය, සැපය, බලය ලබාදීම උදෙසා, කුසලයේ ශක්තිය මතුකොට දැක්වීම උදෙසා තම ආයුෂය, වර්ණය, සැපය, බලය

ඇටසැකිල්ලක් වන තරමටම පරිත්‍යාග කළ ඒ උතුම් සත්පුරුෂ ජීවිතය දෙස නුවණින් බලන්න.

මෙවන් දරුණු මරණීය, ශාරීරික පීඩාවක් බෝධිසත්වයන්ට නොමැරී අත්විඳින්න ශක්තිය ලැබුණේ, අතීත පාරමී ශක්තියේ බලවත්භාවය නිසාමය. මෙයත් උතුම් බුදුගුණයක්මය. වැරදි අන්තයක් වූ අත්තකිලමථානු යෝගය අතහැරලා මධ්‍යම ප්‍රතිපදාවේ අර්ථයට පැමිණෙන කොට උන්වහන්සේ තුළ ඇතිවූ සිතිවිල්ල ද උතුම් බුදුගුණයක්මය. සුජාතාවගේ කිරිපිඬු දානය වළඳා හිස් පාත්‍රය ගංගා නම් ගඟේ පාකොට, තමා සම්මා සම්බුද්ධත්වයට පත්වන්නේ නම් මේ පාත්‍රය උඩුගම්බලා යේවා' කියා කළ අධිෂ්ඨානයෙන් එම පාත්‍රය උඩුගම් බලා යන්නේද අතීත පාරමී ශක්තියෙන් උපන් බුදුගුණයක් නිසාමය. 'මාගේ ලේ, මස්, සම්, නහර වියැළේවා, උතුම් සම්මා සම්බුද්ධත්වය අවබෝධයෙන් තොරව නොනැඟිටිමි' යි ජය ශ්‍රී මහා බෝධි මූලයේදී යම් චිත්තයක්, අධිෂ්ඨානයක් ඇතිකොට ගත්තා නම් ඒ උතුම් සිතිවිල්ල ද බුදුගුණයක ඵලයක්මය.

# ඒ විශිෂ්ටත්වයන් ඇත්තේ බුදුන්වහන්සේ තුළම පමණි...

(බුද්ධානුස්සතිය)

ජය ශ්‍රීමහා බෝධි මූලයේදී, වසවර්ති මාරයාගේ අයෝමය අසද් බලය පරාජය කොට දමලා, තණ්හා, රතී, රඟා මාර දූතියන්ගේ උන්මාදනීය, ප්‍රේමනීය, රාගනීය දර්ශනයන්, රංගනයන් පරාජය කොට දමලා, නපුරු වේශයන්ගෙන් පැමිණි මාර සේනාවන්ගේ අසද් බලය පරාජය කොට දමලා, පුබ්බේ නිවාසානුස්සති ඥානය, චුතූපපාත ඥානය තුළින් සත්ත්වයා මැරෙන ඉපදෙන අතීත අනාගත භව ගමන උතුම් ඥාන දර්ශන තුළින් අත්දැකලා, සම්මා විමුක්තියත්, උතුම් සම්මා සම්බුද්ධ ඥානයන් අවබෝධ කොට ගෙන පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය අවබෝධයෙන් අත්දුටු, ඒ අනිත්‍යභාවයට පත්වූ සිතිවිල්ල, පින්වත් ඔබ මොහොතක් මෙනෙහි කරන්න. ඒ උතුම් සිතිවිල්ලත් අතීත පාරමී ශක්තියෙන් උපන් බුදුගුණයක්මය.

මිථ්‍යා දෘෂ්ඨීන් හැට දෙකක් තුළ ඇලී ගැලී කාමයන් තුළ ජීවත් වන මනුෂ්‍යයන් කෙලෙසක මේ ගාම්භීර ධර්මය අවබෝධ කරගනී ද කියන උකටලීභාවය තුළ බුදුරජාණන් වහන්සේ පසුවෙද්දී, මහා බ්‍රහ්මයාගේ ආරාධනයෙන් මේ උතුම් සද්ධර්මය දේශනා කිරීම ද උතුම් බුදුගුණයක්මය.

යම් කලෙක බෝසතුන් තුසිත දෙව්ලොවින් චුතව, සිහි නුවණින් යුතුව මව් කුස පිළිසිඳගත් මොහොතේ ද, යම් කලෙක් බෝසතුන් සිහි නුවණින් යුතුව මව් කුසින් බිහිවන

මොහොතේ ද, යම් කලෙක බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය අවබෝධ කොටගත් මොහොතේද, යම් කලෙක බුදුරජාණන් වහන්සේ ධම්මචක්කප්පවත්තන සූත්‍රය දේශනා කරන මොහොතේද, සියලුම දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය, සතර අපායන්හී දෙවියන්ගේ දිව්‍යානුභාවය ඉක්මවා ගිය ආලෝකයක් ඇතිවෙනවා. සඳ, හිරු දෙදෙනාගේ කාන්තිය නොලබන, ඝන අඳුරින් වැසීගත් යම් නිරාගත සත්ත්වයන් ඇති ද, අකුසලය නිසාම ආලෝකය නොපෙනෙන සත්ත්වයන් ඇති ද, මේ සෑම සත්ත්ව වාසයක් තුළම දෙවියන්ගේ ආලෝකය ඉක්මවා ගිය ආලෝකයක් පහළ වෙනවා. කල්පාන්තරයකට පසුව පහළ වෙන මේ ආලෝකය නිසාම, ඒවායේ ජීවත්වන සත්ත්වයන් තමන් වගේම අන්‍යසත්වයන් මෙහි සිටිනවාය කියලා දැනගන්නවා. මේ අඳුරු ලෝකයන් ආලෝකමත් වීමද උතුම් බුදුගුණයක්ම වෙනවා.

බුදුරජාණන් වහන්සේ නමක් පහළ වීමෙන්, පංචකාමයන්හී බැසගෙන ජීවත් වූ මනුෂ්‍යයන් මාන්නය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව තුළ ඇලී ගැලී ජීවත්වූ මනුෂ්‍යයෝ, අවිද්‍යාවෙහි ඇලී ගැලී ජීවත්වූ මනුෂ්‍යයෝ, බුදුරජාණන් වහන්සේ පහළ වී උතුම් සද්ධර්මය දේශනා කරන කල්හී සද්ධර්මය අසන්නට කැමති වේ නම්, දෙසවන් ධර්මයට යොමු කරනවා. මෙයත් උතුම් බුදුගුණයක්මය. 'අතීතයේ උතුම් සම්මා සම්බෝධියෙහි මා හා සම වූ බුදුරජාණන් වහන්සේලා වැඩ සිටියා. අනාගතයේදීත් මා හා සමවූ බුදුරජාණන් වහන්සේලා පහළ වෙනවා. නමුත් සාරිපුත්තය, සම්මා සම්බෝධිය විෂයෙහි බුදුරජාණන් වහන්සේට වඩා විශිෂ්ට ගුණ ඇති අන් මහණ කෙනෙක්, බමුණෙක් මේ ලෝක ධාතුව තුළ නැත්තේමය. එය ද උතුම් බුදුගුණයක්මය. බුදුරජාණන් වහන්සේලාට පමණක් උරුම, උතුම් ගුණයන්ගෙන්, උතුම් බලයන්ගෙන් එක දශමයක්වත් ඔබටත්, මටත් ඇතිකොට ගැනීමට නොහැකි බව අවිවාදයෙන් දකින්න. පින්වත් ඔබ නොදන්නාභාවය නිසාම බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, ඥානයන් බලයන් ඔබ තුළ ඇති කොට ගැනීමට උත්සාහ ගන්නේ නම් ඒ බුදුරජාණන් වහන්සේගේ

නොකැළැල් අයෝමය ශක්තිය, ගුණය පිළිබඳව නිවැරදි චිත්‍රයක්, ශ්‍රද්ධාවක් ඔබ තුළ ඇතිකොට ගැනීමට බාධාවක් වෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මහා සාගරය නම්, මේ සටහන් තබන භික්ෂුව එම මහා සාගරයේ ජල බින්දුවක් කියලයි භික්ෂුව සිතන්නේ. සමහරක් පින්වතුන්ලා උත්සහ ගන්නවා, බුදුරජාණන් වහන්සේලා සතු ඉතිපිසෝ භගවා අරහං...... සුගතෝ ලෝකවිදූ ගුණයන් තමන් තුළ ඇතිකර ගන්න. මේවා හුදු මායාවන් බවටයි පත්වෙන්නේ. බුදුරජාණන් වන්සේ කෙරෙහි ශ්‍රද්ධාවෙන් ඔබලාව තව තවත් ඈතට දමනවා.

දවසක් මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා, නපුරු මනුෂ්‍යයෙක් ආයුධයක් අමෝරාගෙන ඔබවහන්සේ ඉදිරියට ආවොත්, ඔබ වහන්සේ මොකද කරන්නේ? කියලා. භික්ෂුව ඒ මහත්මයාට ප්‍රකාශ කළේ, එම නපුරු මනුෂ්‍යයාව මග හැරලා යනවාය කියලා. ඒ වෙලාවේ එම මහත්මයා අහනවා 'බුදුරජාණන් වහන්සේ අංගුලිමාල ඉදිරියට වැඩියානේ. ඇයි ඔබ වහන්සේ නපුරු මනුෂ්‍යයා මගහැර යන්නේ?' කියලා. ඒ වෙලාවේ භික්ෂුවට තේරුණා මේ මහත්මයා තවම බුදුරජාණන් වහන්සේගේ ගුණයන්, ඥානයන්, බලයන් පිළිබඳව ශ්‍රද්ධාවට පැමිණ නැති මහත්මයෙක්ය කියලා. ශ්‍රද්ධාව නොපිහිටි නිසාම භික්ෂුවත්, ලොව්තුරා බුදුරජාණන් වහන්සේත් එකම මට්ටමකට දමලයි බලන්නේ. නමුත් පින්වත් ඔබට මේ උතුම් ධර්ම මාර්ගයේ ගමන් කරලා, උතුම් පැවිදි උපසම්පදාවන්ට පත්වෙලා, උතුම් සංඝරත්නයට අදාළ ගුණයන්, ඥානයන්, බලයන් අවශ්‍ය නම් ඇතිකොට ගන්න පුළුවන්. නමුත් සාරිපුත්ත මහරහතන් වහන්සේ, මුගලන් මහරහතන් වහන්සේ, මිහිඳු මහරහතන් වහන්සේ ආදී වූ උතුම් ආර්යයන් වහන්සේලාගේ ගුණයට, ඥානයට සමවෙන්න නම් සිතන්න එපා. එයත් හුදු මායාවක්මයි.

# මේ භයංකාරත්වය බුදුවරයකුම හැර වෙන කව්රුන් ඔබට පහදා දෙන්නද?

**(බුද්ධානුස්සතිය)**

වේරඤ්ජ බමුණා, බුදුරජාණන් වහන්සේව හමුවෙලා චෝදනාවක් කරනවා 'භවත් ගෞතමයන් වූ ඔබ, මහලු වූ බමුණන්ට වඳින්නේ නැහැ. පෙරගමන් කරන්නේ නැහැ. ආසන පනවන්නේ නැහැ. අසුනින් නැගිට ගරු කරන්නේ නැහැ' ය කියලා. ඒ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ වේරඤ්ජ බමුණාට දේශනා කරනවා 'බමුණ මම යම් පුද්ගලයකුට වඳිම්ද, නැගිට පෙරගමන් කරම්ද, අසුන් පවරම්ද එබඳු පුද්ගලයෙක් දෙවියන් සහිත මරුන්, බඹුන්, මනුෂ්‍යයන් සහිත ප්‍රජාවේද මම නොදකිමි' කියලා. යම් පුද්ගලයකුට බුදුරජාණන් වහන්සේ වඳී නම් හෝ අසුනින් නැගිට ගරු කරයි නම්, පෙර ගමන් කරයි නම්, අසුන් පනවයි නම් ඔහුගේ හිස ද ගෙලෙන් ගිලිහෙනවාය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. 'බමුණ මම කාය දුශ්චරිත, වාග් දුශ්චරිත, මනෝ දුශ්චරිත නසා දමා සිටිමි. එම අකුසලයන්ගේ නැසීම කියමි. බමුණ මා රාග, ද්වේෂ, මෝහ අකුසලයන්ගේ විනාශය පිණිස දහම් දෙසමි. තථාගතයන් නැවත මව්කුසට බැසගැනීම, නැවත භවයේ ඉපදීම ප්‍රහීනය. උදුරන ලද මුල් ඇත්තේ වෙයි' කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

පින්වත් ඔබ බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් පරිපූර්ණ වූ රූපකාය නුවණින් දකින්න උත්සාහ

ගන්න. සිත විසිරෙන, සිත කැළඹෙන සෑම මොහොතකම, බුදුරජාණන් වහන්සේගේ ජීවමාන රූපකාය සිහිපත්කොට ගන්න. පින්වත් ඔබේ විවේකී සිත, සරණක් නැති රූපයන් කරා යොමු කරන්නේ නැතිව, සරණක් ඇති බුදුරජාණන් වහන්සේ කෙරෙහි, උතුම් බුදුගුණයක් කෙරෙහි යොමුකොට ගන්න දක්ෂ වෙන්න. බුදුරජාණන් වහන්සේගේ අතීත පාරමී කුසල් ශක්තිය නිසාම ලබන, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුත් රූපකාය, පින්වත් ඔබ විසින් සිතින් මවා ගන්න.

වරක් අම්බට්ඨ මානවකයා, බුදුරජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ගැන සැක සිතිලා, එම ලක්ෂණයන් ගැන පරීක්ෂණ කරන්න පටන් ගත්තා. අම්බට්ඨ මානවකයාට බුදුරජාණන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණ දෙකක් හැර, ඉතිරි මහා පුරුෂ ලක්ෂණ තිහම නිවැරදිව හඳුනා ගන්න පුළුවන් වුණා. ඒ නිසා බාහිරට නොපෙනෙන කෙමියක් තුළ බහාලූ පරිද්දෙන් ඇති පුරුෂ නිමිත්තද, පුළුල් වූ දිවද යන මහා පුරුෂ ලක්ෂණ දෙක ගැන සැක කළා. මේ බව නුවණින් දැකගත් බුදුරජාණන් වහන්සේ අම්බට්ඨ මානවකයාට පමණක් පෙනෙන සේ ඍද්ධි ප්‍රාතිහාර්යයක් පාමින් බුදුරජාණන් වහන්සේගේ කෙමියක් තුළ බහාලූ පරිද්දෙන් ඇති පුරුෂ නිමිත්තද, බුදුරජාණන් වහන්සේගේ දිව එළියට යොමුකොට දෙකන් සිදුරු ස්පර්ෂකොට නළල් තලය දිවෙන් ස්පර්ෂකොට පෙන්වූවා. මේ සියල්ල අම්බට්ඨ මානවකයාට පමණක් පෙනෙන ආකාරයටයි ප්‍රාතිහාර්යය දැක්වූවේ. මේ ප්‍රාතිහාර්යයෙන් අම්බට්ඨ මානවකයාගේ සැකය දුරුවී, බුදුරජාණන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් පරිපූර්ණ බවත්, ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධත්වය අවබෝධ කොටගෙන ඇති බවත් ප්‍රත්‍යක්ෂකොට ගන්නවා.

බුදුරජාණන් වහන්සේ අතීත, වර්තමාන, අනාගත, කර්මයන්ගේ විපාකයන් ප්‍රත්‍යවශයෙන්, හේතුවශයෙන් දන්නවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණි ගෝවෘත

රකින, බලුවෘත රකින ආජීවකයන් දෙදෙනෙක් බුදුරජාණන් වහන්සේගෙන් විමසනවා, තමන් මරණින් පසුව මොනවගේ උපතක් ලබයිද කියලා. ඒ අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේ හේතුඵල දකිමින් දේශනා කරනවා, ගෝවෘත රකින ආජීවකයා හරකෙක් වෙලා උපදින බවත්, බලුවෘත රකින ආජීවකයා සුනඛයෙක් වෙලාත් උපදිනවාය කියලා. බුදුරජාණන් වහන්සේ උදායි තෙරුන්ට දේශනා කරනවා, ආනන්ද ස්වාමීන් වහන්සේ වීතරාගීව කලුරිය කළොත්, ඒ චිත්ත ප්‍රසාදයෙන් සත්වරක් සක්දෙව් පදවිය හොබවනවා. සත්වරක් දඹදිව මහ රාජ්‍ය හොබවනවා කියලා. නමුත් ආනන්ද මේ ජීවිතයේදීම සියලු කෙළෙසුන් නසා පිරිනිවීයෑම ඒකාන්තයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

වරක් අජාසත්ත රජතුමා, උතුම් සද්ධර්මය ශ්‍රවණයකොට බුදුරජාණන් වහන්සේගෙන් සමුගෙන යන මොහොතේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මහණෙනි ඔය අජාසත්ත රජතුමා තම පියා වන බිම්බිසාර රජතුමා ඝාතනය නොකළා නම්, මේ ආසනයේදීම ධර්මය දකිනවාය කියලා. කෝරක්ඛත්තිය නම් නිරුවත් තවුසෙක් බලුවෘත රකිමින් දෙදන සහ දෙවැලමිට යන සිව් අවයවය බිම තබා බල්ලෙක් ලෙසින් ඇවිදිමින්, බිම දැමූ ආහාර දිවෙන් අරගෙන කමින් ජීවත්වුණා. බුදුරජාණන් වහන්සේ සුනක්ඛත්ත හාමුදුරුවන්ට දේශනා කරනවා. ඔය කෝරක්ඛත්තිය නිරුවත් තවුසා තව සතියකින්, ආහාර අජීර්ණයකින් සෑදෙන අලසක රෝගයෙන් මියගොස්, තිහින වූ දුක්ඛිති වූ කාලකඤ්ජ නම් නිරයේ උපදිනවාය කියලා. බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ පරිදි කෝරක්ඛත්තිය තවුසා, සත්වැනි දින, අලසක රෝගයෙන් මියගොස් කාලකඤ්ජ නිරයට වැටෙනවා.

බුදුරජාණන් වහන්සේ සතර අපාය, නිරය ගැන පූර්ණ වශයෙන් දකිනවා. එය බුදුරජාණන් වහන්සේ සතු උතුම් බුදුගුණයක්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යමෙක්

නිරයට වැටුණහම යමපල්ලෝ ඔහුට පංචවිධ බන්ධන නම් වූ දුක පමුණනවා. රත් කළ යහුලක් දකුණතේ ගසනවා. රත් කළ යහුලක් වම් අතේ ගහනවා. රත් කළ යහුලක් වම් පාදයේ ගහනවා. රත් කළ යහුලක් දකුණු පාදයේ ගහනවා. රත් කළ යහුලක් පපුව මැදින් ගහනවා. එවිට එම නිරිසතා දුක්වූ, තීව්‍ර වූ, කටුක වූ දුක් විඳිනවා. ඒ පාපකර්මය නොගෙවන තාක්කල් ඔහු කලුරිය නොකරනවා. යමපල්ලෝ ඔහුව සිටුවා කෙටේරියෙන් රහිනවා. ඒ පාප කර්මය නොගෙවෙන තාක්කල් ඔහු කලුරිය නොකරයි. යමපල්ලෝ ඔහුව උඩුකුරු කර සිටුවා කෙටේරියෙන් රහිනවා. යමපල්ලෝ ගිනිගෙන දිලෙන ගිනිදැල් සහිත බිමක මොහුව ඔබ මොබ ඇවිදුවනවා. යමපල්ලෝ ගිනිගෙන දැවෙන මහා අඟුරු පව්වකට මොහුව නංවනවා, බස්සනවා. මහණෙනි, යමපල්ලෝ මොහුගේ පාද උඩුකුරු කර ඔහුව ලෝකුඹු නිරයේ ඔබනවා. මොහු එහි පෙන නංවමින් පැහෙනවා. ඒ පව්කම් ගෙවෙන තාත්කල් ඔහු කලුරිය නොකරනවා. යමපල්ලෝ පසුව ඔහු ගෙන මහ නිරයට දමනවා. මහා නිරයේ සිව් දොරටු සන යකඩ පවුරකින් වට වී තිබෙනවා. එහි බිම, දිලෙන ගිනිදැල්ලෙන් යුක්තයි. හාත්පස යොදුන් සියයක් පුරා ගිනිදැල් පැතිරී තිබෙනවා. බුදුරජාණන් වහන්සේ නිරයේ සැබෑම තතු මේ ආකාරයට දේශනා කරන්නේ, නිරයේ තතු සම්මා සම්බුද්ධ ඥානයෙන් දැකලාමයි. නිරයත්, සතර අපායත් පිළිබඳ නිවැරදි දැක්ම බුදුරජාණන් වහන්සේ සතු උතුම් බුදුගුණයක්ම වෙනවා.

# ඒ අසිරිමත් බුද්ධ ඥානයට මෙසේ වූ හැකියාවන්ද ඇත්තේය

(බුද්ධානුස්සතිය)

බුදුරජාණන් වහන්සේ සහශ්‍රී දසසහශ්‍රී ලෝක ධාතූන් තතු සේ දන්නවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, යම්තාක් තථාගතයන් වහන්සේ කැමැති වන සේක් ද සහශ්‍රී, දස සහශ්‍රී, මහා සහශ්‍රී ලෝක ධාතු තම ස්වරයෙන්, තම ඥානයෙන් දකින්න, හඬ පතුරුවන්න පුළුවන්ය කියලා. එපමණක් නොව, ඉන් පිටත යම්තාක් කැමැතිවන සේක්ද ඒ තාක් තම ස්වරය ඇසෙන්නට සලස්වන්න, ඒ ලෝක ධාතූන් තතුසේ දකින්න බුදුරජාණන් වහන්සේට පුළුවන්ය කියලා. මේ දැක්මත් උතුම් බුදුගුණයක්මය. බුදුරජාණන් වහන්සේ සත්ත්වයාගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන්, බල ධර්මයන්ගේ වැඩීම, නොවැඩීම තතු සේ දන්නවා. ඒ ඒ පුද්ගලයන්ගේ ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා ඉන්ද්‍රිය ධර්මයන් බලධර්මයන්ගේ වැඩීම, නොවැඩීම දකිමින් සුදුසු අනුශාසනා කිරීම බුදුරජාණන් වහන්සේට පමණක් උරුම බුදු ගුණයක් වෙනවා. යම් පින්වතෙක්, බුදුරජාණන් වහන්සේගේ අනුශාසනා පිළිපදී ද, ඔහු අපායේ නොවැටෙන, සෝවාන් පුද්ගලයෙක් වන්නේය, යමෙක් කාම, රාග, පටිඝ ධර්මයන් තුනී කොට, සකෘදාගාමී ඵලයට පත්වන්නේ ද, යමෙක් කාම, රාග, පටිඝ ධර්මයන් නිරෝධය කොට අනාගාමී ඵලයට පත්වී ශුද්ධාවාසයේ ඉපදී, එහිම පිරිනිවන් යන්නේ ද... ආදී වශයෙන් ඒ ඒ පුද්ගලයාගේ ඉන්ද්‍රිය, බල ධර්මයන්ගේ දියුණු නොදියුණුභාවය දැකීමේ හැකියාවද උතුම් බුදුගුණයක්මය.

ඒ වගේමයි, බුදුරජාණන් වහන්සේ සත්ත්වයාගේ ධ්‍යාන විමෝක්ඛ සමාධි සමාපත්තීන්ගේ කෙළෙසීම, පිරිසිදු බවද ඒවායින් නැවත නැඟී සිටීමද තතුසේ දන්නවා. බුදුරජාණන් වහන්සේ ඍද්ධි ධර්මයන් දෙකක් දේශනා කරනවා. එකක් තමයි ආර්ය යැයි නොකියනු ලබන ඍද්ධිය. එය සදොස් යැයි ද, දෝෂාරෝපණ සහිත යැයි ද බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ ආර්ය නොවන ඍද්ධිය වන්නේ, සමාධියෙන් සිත පරිපූර්ණ කල්හි ඔහු නොයෙක් ඍද්ධි කොටස් විද්‍යමාන කරනවා. එක්කෙනෙක්ව සිට බොහොදෙනෙක් බවට පත්වෙනවා. බොහෝදෙනෙක්ව සිට එක්කෙනෙක් බවට පත්වෙනවා. බිත්තියෙන් පිටතට, පර්වතයෙන් පිටතට, පවුරෙන් පිටතට අහසේ මෙන් නොගැටී ගමන් කරනවා. ජලයෙහිද, පොළොවෙහි මෙන් ගමන් කරනවා. මේ ඍද්ධි ප්‍රාතිහාර්යයන් ආර්ය නොවන ප්‍රාතිහාර්යයන් කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

තමන් කැමැති දේ කෙරෙහි ඇතිවන සැප වේදනාවත්, තමන් අකැමැති දේ කෙරෙහි ඇතිවෙන දුක් වේදනාවත් අනිත්‍ය වශයෙන් දකිමින් සැප, දුක්, වේදනාවන්ගේ මඳභාවය වන උපේක්ෂාවේද අනිත්‍යභාවය දකිමින් යමෙක් ජීවත් වෙනවා. වේදනාවේ සමාධියේ ආශ්වාදයේ අනිත්‍යභාවය දකිමින් ජීවත්වන්නේද, එය දොස් නැති, දෝෂාරෝපණ නොමැති ආර්ය ඍද්ධිය යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ ආර්ය ඍද්ධිය වේවා, අනාර්ය ඍද්ධිය වේවා යම් බමුණෙක්, මහණෙක් බුදුරජාණන් වහන්සේට වඩා දන්නවාය කියන කාරණය සිදු නොවන දෙයක් කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

බුදුරජාණන් වහන්සේ පුබ්බේනිවාසානුස්සති ඥානය තුළින් අතීත ජාති එකක්, සියයක්, දහසක්, දසදහසක් ජාති සියක් දහසක්, කල්ප ගණනාවක් ඈතට සිත මෙහෙයවා, යමෙක් අසුවල් තැන උපන්නේයි, අසවල් ගෝත්‍ර ඇත්තේයි පෙර විසූ කඳපිළිවෙල සිහිපත් කරනවා. 'මහණෙනි, විපස්සි බුදුරජාණන් වහන්සේට

බන්දුම නම් රජ පියා විය, බන්දුමතී නම් දේවිය මව වූවාය. 'බන්ධුමතී නුවර' බන්ධුම රජුට රාජධානිය විය. සිඛී බුදුරජාණන් වහන්සේගේ පියා 'අරුණ' නම් විය. ප්‍රභාවතී දේවිය මව වූවාය. අරුණාවතී නුවර, අරුණ රජුගේ රාජධානියයි. වෙස්සභූ බුදුරජාණන් වහන්සේගේ පියා සුපුනිත නම් විය. මව යශෝවතී වූවාය. අනෝමා නුවර සුපුනිත රජුගේ රාජධානිය වූවා යැයි බුදුරජාණන් වහන්සේ අතීතය ගැන සිංහනාද පවත්වන්නේ උතුම් පුබ්බේනිවාසානුස්සති ඥානය නිසාමය. රූපී වූ හෝ අරූපී වූ හෝ නේවසඤ්ඤා, නාසඤ්ඤා වූද සෑම සත්ත්වයකුගේම පුබ්බේ නිවාසය බුදුරජාණන් වහන්සේගේ උතුම් පුබ්බේනිවාසානුස්සති ඥානය ප්‍රකාශ කරන්නේය. එයත් උතුම් බුදුගුණයක්මය.

බුදුරජාණන් වහන්සේ චුතුපපාත ඥානයෙන් සත්ත්වයා මැරී උපදින සුගති භූමි, දුගති භූමි නිවැරදිවම දන්නවා. යම් සත්ත්වයෙක් ආශ්‍රවයන් සහිතව කලුරිය කරාද, යම් සත්ත්වයෙක් ආශ්‍රවයන් දියකොට පිරිනිවන් පෑවාද කියන කාරණය බුදුරජාණන් වහන්සේ දන්නවා. සත්ත්වයා සිතින්, කයින්, වචනයෙන් යහපත්ව හැසිරීමෙන්, සිල්වත්ව ජීවත්ව ජීවිතය ගෙවා මරණාසන්න මොහොතේ ඇතිවන යහපත් සිතිවිලි නිසා ඊළඟ උපත සුගතියේ උපදින්නේද, යමෙක් සිතෙන්, කයෙන්, වචනයෙන් අකුසල් සිදුකොට, මිසදිටුභාවයන්ට පත්ව මරණාසන්න වූ විට උපදින්නා වූ පහත් වූද, නොමනා වූද දුගතියේ උපතද, ශුද්ධවූ දිවැසින් එකෙණෙහිම එම සත්ත්වයාගේ නැවත උපත චුතුපපාත ඥානයෙන් බුදුරජාණන් වහන්සේ දකිනවා. එයත් උතුම් බුදුගුණයක්මයි.

# දැවෙන සිත් නිවුනු සිතින් දමනය කළ උන්වහන්සේගේ පුරිසධම්ම සාරථී ගුණය...

(බුද්ධානුස්සතිය)

බුදුරජාණන් වහන්සේ දෙවි මිනිසුන් ඉදිරියේ සිංහනාද ධම්මචක්‍රය පවත්වන්නේ තථාගත ධර්මයන්ගේ බලයෙන්ය කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ තථාගත බලධර්මයන්ගේ ආශ්චර්යමත්භාවය නුවණින් දකිමින් බුද්ධානුස්සතියෙන් ශක්තිමත් වෙන්න.

බුදුරජාණන් වහන්සේ අවිද්‍යාව දියකිරීමේ මාර්ගය තරණය කළ නිසා, තෘෂ්ණාවෙන් තොර හැසිරීම් ඇති නිසා, අවබෝධ කළ ඥානයෙන් යුතුව ඊට අදාළ ධර්මානුධර්ම හැසිරීමෙන් යුතුව වැඩසිටිය නිසා විජ්ජාචරණ සම්පන්න වෙනවා. උන්වහන්සේගේ සෑම ඉරියව්වක්ම සිහිනුවණින් පැවත්වූ ඉරියව්වක් වෙනවා. බුදුරජාණන් වහන්සේගේ ආර්යශීලය, ආර්ය සමාධිය, ආර්ය ප්‍රඥාව, ආර්ය විමුක්තිය සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ගේ ඵලය සෑම වචනයක්ම සෑම ඉරියව්වකම අර්ථය වුණා. බුදුරජාණන් වහන්සේ දැකීමෙන්, බුදුරජාණන් වහන්සේගේ ධර්මය ඇසීමෙන් දේශනා කර වදාළ මාර්ගය තුළ ගමන් කිරීමෙන් සත්ත්වයා සසර දුක නිවා ගත්තේ අවබෝධ කර වදාළ ධර්මයට අදාළව වැඩසිටිය නිසාමයි. අවබෝධ කළ මාර්ගයට අදාළව මාර්ගය බුදුරජාණන් වහන්සේ දේශනා කළ නිසාමයි. බුදුරජාණන් වහන්සේගේ රූපකාය, සන්සුන් ඉරියව් කෙරෙහි බැඳීයන භික්ෂූන් වහන්සේලා

අතරින් අග්‍රස්ථානයට පත්වූ වක්කලී මහරහතන් වහන්සේ ද බුදුරජාණන් වහන්සේගේ විජ්ජාචරණ සම්පන්න ගුණයේම ඵලයක්මය.

භවය නමැති සැඩ සයුර තරණය කරන යාත්‍රාව වන ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඍජුවම ගමන් කර විෂම භව සයුර තරණය කළ හෙයින් බුදුරජාණන් වහන්සේ සුගත නම් වෙනවා. දෘෂ්ඨීන් හැටදෙකක්, මාර්ග හැටදෙකක් කරා සත්ත්වයා යොමුකර තිබියදී කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ශාසනය අතුරුදන්වීමෙන්, වල්වැදී තිබූ ආර්ය අෂ්ටාංගික මාර්ගය ලෝකයට මතුකර දෙන්නේද බුදුරජාණන් වහන්සේය. ජීවිතයට සැප දෙන, ජීවිතයට දුක දෙන අන්තයන්ගෙන් බැහැරව මධ්‍යම ප්‍රතිපදාව මතුකර ගන්නේ ද ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළින්මය. 'මහණෙනි, මේ සැඩ සයුර ආර්ය අෂ්ටාංගික මාර්ගය නැමති යාත්‍රාව උපයෝගී කරගෙන තරණය කළාට පසුව ඔබ එම යාත්‍රාව කරේ තබාගෙන නොයා යුතුය. එය ද ඔබ අතහැරදැමිය යුතුය'යි පිරිනිවී යැමේ මාර්ගය ලොවට මතුකොට පෙන්වූයේ උතුම් සුගතෝ බුදුගුණයයි.

සත්ත්වයාගේ උපාදානය හේතුවෙන් සකස්වෙන භවය කාමභවය, රූපී, අරූපී භවාත්‍රය සහස්සී, දසසහස්සී ලෝක ධාතුන් තතුසේ දත් හෙයින් බුදුරජාණන් වහන්සේ ලෝකවිදූ ගුණයෙන් යුක්තවෙනවා. යමෙකුට මහා බ්‍රහ්මයා වීමටත්, ශක්‍රයා වීමටත් අවශ්‍ය ධර්මයන් මොනවාද යන්න බුදුරජාණන් වහන්සේ නිවැරැදිව දන්නවා. කල්ප විනාශයත්, නැවත ලෝකය හටගැනීමත්, මනුෂ්‍යයාගේ පහළවීමත් බුදුරජාණන් වහන්සේ තතුසේ දන්නවා. මුළු මහත් ලෝක ධාතුවම සම්මා සම්බුද්ධ ඥානයෙන් විනිවිද දැක අවබෝධ ඥානය ලබා මුළු මහත් ලෝක ධාතුවම ඔබගේ ජීවිතය නැමති නාමරූප ධර්මයට ගොනුකොට, සරල කොට දැක්වීමට ඇති අයෝමය හැකියාව බුදුරජාණන් වහන්සේ සතු උතුම් ලෝකවිදූ ගුණයක් වෙනවා. අවිද්‍යාව නිසා ලෝකයේ හටගැනීමත්, තෘෂ්ණාව හේතුවෙන් ලෝකයේ විකාශනයත්, තෘෂ්ණාව නිරෝධයෙන් ලෝකයෙන් මිදීමටත්, මාර්ගය මතුකර

දීම ලෝකවිදූ ඥානයේ ඵලයක්මයි. දැස් පියාගෙන සකස්වෙන සිතුවිලිවල අනිත්‍යභාවය දකින මොහොතේම පින්වත් ඔබ ලෝකය මොහොතකට තාවකාලිකව නිරුද්ධ කළා වෙනවා. මේ උතුම් දැක්ම ලෝකයට මතුකොට දෙන්නේ උතුම් ලෝකවිදූ ගුණයයි.

වක්කලී ස්වාමීන් වහන්සේ ගෙල කපාගෙන පිරිනිවීගිය මොහොතේ මාරයා බොහෝම කඩිමුඩියේ පැමිණ වක්කලී හිමියන්ගේ විඤ්ඤාණය හොයන්න පටන් ගත්තා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මාරය වක්කලීගේ විඤ්ඤාණය ලෝකයෙන් නිවී ගියාය කියල. ලෝකය අවුල වන, ලෝකය නිවන මාර්ගය ලෝකයට මතුකර දීමත් උතුම් ලෝකවිදූ ගුණයක් වෙනවා.

පුරුෂ ධම්ම සාරථී ගුණය තවත් උතුම් බුදුගුණයක්. ජයශ්‍රී මහ බෝ සමිඳුන් අභියස බෝධිසත්වයන් වහන්සේ මුලින්ම වසවර්ති මාරයාත්, තණ්හා, රතී, රඟා මාරදූතියන්වත් පරාජය කොටදමනවා. බෝධිසත්වයන් වහන්සේ පංච උපාදානස්කන්ධය නැමති මාරයාව පරාජය කර දමනය කොටයි උතුම් සම්මා සම්බෝධිය සාක්ෂාත් කොටගන්නේ. දමනය කළා වූ පංච උපාදානස්කන්ධයෙන් ගිනිගෙන ඇවිළෙන සත්ත්වයාගේ පංච උපාදානස්කන්ධයන් දමනය කිරීම උතුම් පුරුෂ ධම්ම සාරථී ගුණයක් වෙනවා. බුදුරජාණන් වහන්සේ සත්ත්වයාගේ ලෝභ සිත අලෝභයෙන් දමනය කරනවා. සත්ත්වයාගේ ද්වේශ සිත මෛත්‍රියෙන් දමනය කරනවා. සත්ත්වයාගේ මෝහ සිත අමෝහයෙන් දමනය කරනවා. සත්ත්වයාගේ මිථ්‍යා දෘෂ්ඨික සිතුවිලි උතුම් සම්මා දිට්ඨියෙන් දමනය කරනවා. මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්ම ප්‍රජාවගේ, විචිකිච්චාව බුදුරජාණන් වහන්සේ තෙරුවන් කෙරෙහි අචල සද්ධාවෙන් දමනය කරනවා. අන්‍යශීලව්‍රෘත කෙරෙහි ඇති විශ්වාසය, ආර්යශීලය තුළින් දමනය කරනවා. සක්කාය දිට්ටිය, පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය දැකීම තුළින් දමනය කරනවා. මෙය බුදුරජාණන් සතු

උතුම් පුරුෂධම්ම සාරථී ගුණයක් වෙනවා. සත්ව ප්‍රජාව මිථ්‍යා දෘෂ්ඨිකභාවයට, දුශ්ශීලභාවයට පත්කරන පංචනීවරණ ධර්මයන් සප්තබොජ්ඣංග ධර්මය තුළින් දමනය කිරීමට මාර්ගය කියාදීම බුදුරජාණන් වහන්සේ සතු උතුම් බුදුගුණයක් වෙනවා. අකීකරු මනුෂ්‍යයන්, දෙවියන්, බ්‍රහ්මයන්, අමනුෂ්‍යයන්, තිරිසන් සතුන්ගේ තෘෂ්ණාවෙන් ගිනිගෙන ඇවිළෙන පංච උපාදානස්කන්ධයන් බුදුරජාණන් වහන්සේ දමනය කරන්නේ තම නිවුණු පංච උපාදානස්කන්ධයේ සිහිල් මෙත් දහරාවෙන්මයි.

# අවසන් බුදු වදනේ පවා විහිදුනේ
# ඒ මහා කරුණා ගුණයයි...

(බුද්ධානුස්සතිය)

බුදුරජාණන් වහන්සේ සියලු සත්ත්වයන්ගේ යහපත උදෙසා, දුක තුනීකිරීම උදෙසා, දුකෙන් මිදීම උදෙසා ධර්මයෙන් අනුශාසනා කරනවා. පුබ්බේනිවාසානුස්සති ඥානයෙන්, චුතූපපාත ඥානයෙන් සත්ත්වයා සංසාරිකව විඳි දුකත්, විඳින දුකත්, අනාගතයට උරුම දුකත් බුදුරජාණන් වහන්සේ තතුසේ දකිනවා. බුදුරජාණන් වහන්සේ යමකුගේ ඇස දකිද්දී, බුදුරජාණන් වහන්සේට එම ඇස පෙනෙන්නේ මහා සාගරයක් වගේ. කන, නාසය, දිව, ශරීරය, මනස පෙනෙන්නේ මහා සාගරයක් සේ. ඇස කෙරෙහි සත්ත්වයා ඇතිකර ගන්නා තෘෂ්ණාව, ඇසෙන් දකින රූපයන් කෙරෙහි සත්ත්වයා ඇතිකර ගන්නා තෘෂ්ණාව සත්ත්වයා පරක් තෙරක් නොපෙනෙන සැඩ දුක් ගහන සංසාරයේ ඈත දුරක් කරා ඇදී යනවා. පින්වත් ඔබ මියයන මොහොතේ ඔබේ මනසට ද්වේශ සිතක් ඇතිවුවහොත් කල්ප ගණනාවක් ඈතට දුක් සාගරය ගලාගෙන යනවා. එක නරක සිතුවිල්ලක් කල්පයක් ඔබට දුක් දෙනවා. එක් අකුසල් සිතිවිල්ලක් දුක් කඳුළු සාගරයක ආරම්භයක් වෙනවා. බුදුරජාණන් වහන්සේ පමණයි, කෙනකුගේ ඇසක් දැකලා, මේ ගොරහැඩි දුකේ මේ යථාර්ථය මතුකොට දකින්නේ.

බුදුරජාණන් වහන්සේට ඔබේ ඇස දුක් සාගරයක්මයි. දෑස් පියාගත් සැනින්, මුළු ලෝකයම නිශේධ කොට දකින බුදුරජාණන්

වහන්සේගේ නිවුනු සිත, දුකෙන් නිදහස් වුණ සිත 'මම මිදුනා, මම නිදහස් වුණා, මේ නිදහස් වීමට මා මෙපමණ වීර්යය කළා. මා මෙපමණ පරිත්‍යාගයන් කළා. මෙපමණ මා කැපවීම් කළා. මෙපමණ මා මෙහෙවර කළා. මහා සාගරයේ ජලකඳ මම දකිද්දී, මේ උතුම් සම්මා සම්බෝධිය උදෙසා මා හෙලූ රුධිරයයි මට පෙනෙන්නේ. මහ පොළොව දකිද්දී, මා පිදූ ශරීර මාංශයි මම දකින්නේ' කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. 'මහණෙනි, මා උතුම් සම්මා සම්බෝධිය අවබෝධකොට ගැනීම සඳහා කළ කැපවීම් වලින්, විඳි දුකෙන්, කළ වීර්යයෙන් එක දශමයක්වත් ඔබට මේ ධර්මාවබෝධය උදෙසා වෙහෙසෙන්න අවශ්‍ය නැහැ. මම මාර්ගය සරල කොට, නිරවුල් කොට, පැහැදිලි කොට ඔබලාට දේශනා කොට තිබෙනවා' ලෝක සත්ත්වයාට තමන් අවබෝධ කළ මේ ගැඹුරු දහම සරලව දේශනා කිරීම, දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය ප්‍රජාවට බුදුරජාණන් වහන්සේ ධර්මයෙන් කළ උතුම්ම අනුශාසනාව වෙනවා.

වචනයෙන්, ප්‍රාතිහාර්යයෙන්, අන්‍ය සිත් දැකීමෙන් බුදුරජාණන් වහන්සේ කරන අනුශාසනාවන් 'මම මේ කටුක දුකෙන් නිදහස් වුණා. ඔබත් මේ කටුක දුකෙන් මිදෙන්න' කියනා මහා කරුණාවෙන්මයි සිදුකරන්නේ. දහවලක්, රාත්‍රියක්, වෙහෙසක්, නින්දක්, විවේකයක්, කුසගින්නක් නොදැනෙන බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය ලෝකයා දුකෙන් මිදෙන අර්ථයක්මයි, ධර්මයක්මයි කියලා දෙන්නේ. ඒ බුදුරජාණන් වහන්සේ සතු උතුම් ගුණයක් වෙනවා. මේ උතුම් ගුණය ක්‍රියාත්මක වෙන්නේ 'කාමයන්ගෙන් ජීවිතය පුරවාගත් සත්ත්වයා කෙලෙසක නම් මේ උතුම් ධර්මය අවබෝධකොට ගනීද? මගේ වීර්යයමයි, මගේ වෙහෙසමයි, මගේ මහා කරුණාවමයි ලෝකයාට ශක්තිය වෙන්නේ' කියන අරමුණෙන්මයි බුදුරජාණන් වහන්සේ ලෝකයාට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරන්නේ.

පින්වත් ඔබ බුදුරජාණන් වහන්සේට මලින්, පහනින්, සුවඳ දුමෙන්, ගිලන්පසින්, බුද්ධ පූජාවෙන්, ධජ පතාක ආදියෙන්, සැරසිලි වලින් ආමිසයෙන් පූජා කරනවා. අග්‍රම දෙය, ශ්‍රේෂ්ඨම දෙය, පිරිසිදුම දෙය, වටිනාම දෙය, සුවඳවත්ම දෙය, ලෝකයට අග්‍රම දෙය, ශ්‍රේෂ්ඨම දෙය බුදුරජාණන් වහන්සේටමයි සුදුසු වෙන්නේ. ඔබ කුසගින්නේ සිට බුදුරජාණන් වහන්සේට බුද්ධ පූජාව පූජා කළත් සැපයක්මයි. පිනක්මයි. භවයේ සැපය ආමිස පූජාව තුළ කැටිවෙලා තිබෙනවා. ශීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් බුදුරජාණන් වහන්සේට පූජා පැවැත්වීම, ප්‍රතිපත්ති පූජාව වෙනවා. පින්වත් ඔබ මේ මොහොත දක්වාම උතුම් සෝවාන් ඵලයට පත්වී නැතිනම්, ඔබ තවමත් ප්‍රතිපත්ති පූජාවෙන් බුදුරජාණන් වහන්සේට ගරු නොකළ කෙනෙක් බවටයි පත්වෙන්නේ. 'මහණෙනි, හිස ගිනිගත්තෙක් එම ගිනි නිවන්න වෙහෙස ගන්නා සේ, උතුම් රහත් ඵලයට පත්වීමට වෙහෙස ගන්න' බුදුරජාණන් වහන්සේගේ අවසාන වදන් පෙළ මහා කරුණා ගුණය කැටිවී භික්ෂුවගේ දෙසවන් තුළ මේ මොහොතේත් දෝංකාර දෙනවා.

හතළිස්පස් වසරක මහා කරුණා ගුණයේ ආශ්චර්යෙන් තුන් ලෝකයටම සරණක් වූ බුදුරජාණන් වහන්සේ. රන්කරුවකු වූ චුන්දකර්මාරගේ අවසාන පිණ්ඩපාත දානය වළඳා, ලෝහිත පක්ඛන්ධිකා රෝගය උත්සන්නව දැඩි ලෙස ගිලන් වෙද්දීත්, ආනන්ද ස්වාමීන් වහන්සේට ප්‍රකාශ කළේ 'ආනන්ද, චුන්දකර්මාරට කියන්න, ඔහුගේ දානය වළඳා බුදුරජාණන් වහන්සේගේ රෝගී තත්ත්වය උත්සන්න වුවත්, ඒ ගැන කනස්සල්ලට පත්වෙන්න එපා, චුන්දකර්මාර පූජා කළ අවසාන පිණ්ඩපාත දානය, ජය ශ්‍රීමහා බෝධි මූලයේදී සුජාතා සිටු දියණිය පූජා කළ මුල්ම දානය තරමටම ආනිශංසයි කියලා' එම ප්‍රකාශය තුළ ගැබ්වී ඇති බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය, කෘතවේදී ගුණය මොහොතක් මෙනෙහි කරන්න. 'මහණෙනි, හිස ගිනි ගත්තෙක්, එම ගිනි නිවන්න යම් වෙහෙසක් ගන්නේ

ද, එවැනි වෙහෙසක් ගෙන මේ භව ගින්දර නිවාගන්න’ කියන අවසාන අවවාදය බුදුරජාණන් වහන්සේ පින්වත් ඔබ කෙරෙහි දැක්වූ මහා කරුණා ගුණයේ සැබෑම රුවගුණ දකිමින් ඒ උතුම් ශාස්තෘන් වහන්සේගේ සරණ පින්වත් ඔබේ ජීවිතයේ සැබෑම සරණ කොට ගන්න.

# අයාලේ දුවන ඔබේ සිත බුදු ගුණයක් අභියස තැන්පත් කරන්න...

(බුද්ධානුස්සතිය)

විවේකීව සිටින සෑම මොහොතකම උතුම් බුදු ගුණයන් ගෙන්, එකදු ගුණයක් හෝ සිහිකරන්න. අයාලේ යන සිත, උතුම් බුදුගුණයක් අභියස තැන්පත්කොට ගන්න. මෙය සටහන් තබන භික්ෂුව, මේ මොහොතේ දෑස් පියාගෙන භවයේ ඈත අතීතයන් නුවණින් මෙනෙහි කරනවා. පටිච්ච සමුප්පන්නව සුගතිය, දුගතිය අතර දෝලනය වෙමින් පැමිණි භවගමනේ, සෑම උපතක්ම නුවණින් දකිමින් අනිත්‍යයි, අනිත්‍යයි වශයෙන් දකිමින්, වර්තමානයේ මේ ලැබූ භික්ෂු ජීවිතයත් අනිත්‍ය වශයෙන් දකිනවා. මීළඟට භික්ෂුව, අනිත්‍ය වශයෙන් දැක්වා වූ සිතත් අනිත්‍ය වශයෙන් දකිනවා. මේ උතුම් අනිත්‍යය දැකීමත් ලොව්තුරු බුදුරජාණන් වහන්සේගේ උතුම් බුදුගුණයක්මය.

පටිච්ච සමුප්පන්න ක්‍රියාවලියට අදාළව, පින්වත් ඔබට මේ උතුම් බෞද්ධ ජීවිතය ලැබුණේ ද හේතු ඵල ධර්මයක් නිසාමය. පෙර ජීවිතයේ මනුෂ්‍ය ආත්මභාවයක් ලබලා, තෙරුවන් සරණ පිහිටලා, සිල්පද ආරක්ෂා කොටගෙන, දන්පැන් පූජා කරලා, මෛත්‍රිය වඩලා, බුදුරජාණන් වහන්සේ නිසාම ලැබූ ජීවිතයකුයි ඔබ ඔය ගතකරන්නේ. මේ සා දරුණු සතර අපායක් අභිබවා, මිත්‍යාදෘෂ්ටික ලෝකයක් අභිබවා, බුද්ධෝත්පාද කාලයක සම්මා දිට්ඨියට පත් මනුෂ්‍යයෙක් බවට පත්වෙන්න ඔබට අවකාශ ලැබුණේ ද උතුම් බුදුගුණයක් නිසාමය. ඔබ මේ ජීවිතයේදී ලැබූ

ශ්‍රේෂ්ඨ උපත, අතීත කුසල් සංස්කාරයක ඵලයක්. අතීතයේ අකුසල් සංස්කාර බලවත් වූවානම්, පින්වත් ඔබ මවු කුසේදීම ගබ්සා වීමට ඉඩ තිබුණා. එසේ නම් පින්වත් ඔබේ ශ්‍රේෂ්ඨ උපතද බුදුගුණයක ඵලයක්මය. දෙමාපියන් අහිමි දරුවන් ජීවත් වන සමාජයක, පින්වත් ඔබට යහපත් දෙමාපියන් ලැබුණේ ද උතුම් බුදුගුණයක ඵලයක් නිසාමය.

පින්වත් ඔබට ඔය ඇස් දෙක ලැබුණේ පෙර කුසලයේ ශක්තිය නිසාය. ඔබගේ අකුසල් පක්ෂය බලවත් වූවා නම්, ඔබගේ ඇස් දෙක ජාති අන්ධයෙක් වීමට ඉඩ තිබුණි. ඔබට ඔය කන් දෙක ලැබුණේ ද පෙර කුසලයක ශක්තිය නිසාය. පෙර අකුසල් බලවත් වූවා නම්, ඔබ බිහිරි පුද්ගලයකු වීමට ඉඩ තිබුණි. එසේ නම් පින්වත් ඔබට ඔය සුන්දර ඇස් දෙක, කන් දෙක ලැබුණේ ද උතුම් බුදුගුණයක ඵලයක් හේතුවෙන්මය. අනෙකුත් නිරෝගී ආයතන ගැනත් ඉහත ආකාරයටම දකින්න. පින්වත් ඔබට ප්‍රසන්න සුරූපී කඩවසම් රූපයක් ලැබුණා නම් එම රූපය ඔබට ලැබුණේ පෙර කුසල් සංස්කාරයක් නිසාමය. ඔබට පෙර අකුසල් සංස්කාරයක් විපාකයට පැමිණියා නම්, විරූපී, අවලස්සන රූපයක් ඔබට හිමිවෙන්නට ඉඩ තිබිණි. එසේ නම්, පින්වත් ඔබට ඔය සුන්දර රූපය ලැබුණේ ද උතුම් බුදුගුණයක ඵලයක් හේතුවෙන්මය. පින්වත් ඔබට කුලයෙන්, ධනයෙන්, බලයෙන් ශක්තිමත් රූපයක් ලැබුණේ ඔබ අතීතයේ කළ කුසල් කර්මයන්ගේ බලවත්භාවය නිසාමය. ඔබට අතීතයේ අකුසල් වීපාකයක් ලැබුණා නම් කුලයෙන්, ධනයෙන්, බලයෙන් පිරිහී ගිය පින්වතෙක්ව ඉපදීමට ඉඩ තිබිණි. එසේ නම් පින්වත් ඔබ ලැබූ මේ මහේශාඛ්‍ය ජීවිතයද උතුම් බුදුගුණයක් ඵලයක්මය. පින්වත් ඔබට යහපත් විවාහයක් සිදුවූවානම්, යහපත් දරුවන් ලැබුණා නම්, යහපත් ඥාති සම්බන්ධතාවයන් ලැබුණානම් මේ සෑම යහපත් දෙයක්ම අතීත කුසල් සංස්කාරයන්ගේ ඵලයක්මය. අතීතයේ අකුසල් සංස්කාර බලවත් වූවා නම්, ඔබට ඉහත යහපත් සියල්ල අහිමිවීමට ඉඩ තිබිණි. පින්වත් ඔබ මේ මොහොතේ

අත්දකින උතුම් පැවිදිභාවය, උතුම් උපාසක, උපාසිකාභාවයන් පෙර කුසල් සංස්කාරයන්ගේ ඵලයකි. අතීතයේ අකුසල් සංස්කාර බලවත් වූවා නම්, ඔබ තවමත් දුස්ශීලභාවයේය. එසේනම් ඔබට මේ සිල්වත් ජීවිතය ලැබුණේ ද උතුම් බුදුගුණයක ඵලයක් නිසාමය.

පින්වත් ඔබ මේ ජීවිතයේදී ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කොට, සත්තිස් බෝධි පාක්ෂික ධර්මයන් පූර්ණ කොට, උතුම් අධිගමයන් සාක්ෂාත්කොට ගන්නේද උතුම් බුදුගුණයක අර්ථය නිසාමය. උතුම් ධර්ම රත්නය, සංඝ රත්නය, සහශ්‍රී දසදහස් ශ්‍රී ලෝකධාතු, භවාත්‍රය, සුගතිය, දුගතිය , සම්මා දිට්ඨිය, මිථ්‍යාදෘෂ්ටිය.... මේ සියල්ලම පිළිබඳව සැකයෙන් තොරව තතුසේ ඔබත්, මමත් දැනගන්නේ බුදුරජාණන් වහන්සේ සතු සම්මා සම්බුද්ධ ඥානය නිසාමය. ඒ නිසා, ඉහත සියල්ලම බුදුගුණයෙහිම ප්‍රතිඵලයන්ය.

පින්වත් ඔබ බටහිර, අප්‍රිකානු, මැදපෙරදිග රටක නොඉපදී, මේ උතුම් පින්බිමේ උපත ලැබුවේද උතුම් බුදුගුණයක් නිසාමය. ඉහතින් සඳහන් කළ සියලුම ධර්මතාවයන් බුදුගුණයන්ය කියලා භික්ෂුව සටහන් තැබුවේ, ඉහත සඳහන් සියලුම යහපත් සංස්කාර ඔබට ලැබුණේ කුසල් දහම් නිසාම බැවිනි. කුසල් ධර්මයන් ඔබතුළ වැඩුනේ සම්මා දිට්ඨියට අදාළ ධර්මතාවයන් පුහුණු කළ නිසාමය.

# ඔබේ නින්ද ද බුදුගුණයක් තුළම සතපවන්න

(බුද්ධානුස්සතිය)

සම්මා දිට්ඨියට අදාළ ආර්ය අෂ්ටාංගික මාර්ගය මේ ලොවට මතුකොට දුන්නේ බුදුරජාණන් වහන්සේමය. එම නිසා පින්වත් ඔබ මේ ජීවිතයේ ලැබූ යහපත් සියල්ලම උතුම් බුදුගුණයක්මය. භික්ෂුව මේ මොහොතේ දෑස් දෙක පියාගෙන අතීතය, වර්තමානය, අනාගතය ආවර්ජනය කර බලද්දී ඒ සෑම දෙයක්ම උතුම් බුදුගුණයක්මය. උපත, ජීවිතය, භික්ෂුත්වය, අවබෝධයන් ආදී මේ සියල්ල තුළින්ම භික්ෂුව දකින්නේ බුදුරජාණන් වහන්සේමය. උතුම් බුදුගුණයක්මය. ඒ බුදුරජාණන් වහන්සේ දකින සිතත්, බුදුගුණයක් යැයි දකින සිතත් අනිත්‍ය වශයෙන් දකින මොහොතේම බුද්ධානුස්සතිය විදර්ශනා නුවණින් දැක්කාද වෙනවා. ඒ දැක්මත් උතුම් බුදුගුණයක්මය. පින්වත් ඔබ මේ ජීවිතයේදී යහපත් දෙයක් ලැබුවා නම්, එම යහපත් දෙයින් යහපත් ප්‍රතිඵලයක් ලැබුවා නම්, ඒ යහපත් ප්‍රතිඵලයෙන් සැප වේදනාවක් ලැබුවා නම් ඒ සෑම සැප වේදනාවකට පසු සකස්වෙන සිතෙන් බුදුරජාණන් වහන්සේව සිහියට නගාගන්න. එම සතුටු සිතට හේතුව බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ කුසල් ධර්මයන්ගේ ශක්තියක් බව දකින්න. පින්වත් ඔබ ලබන සතුට, සැප වේදනාවක් නම් උතුම් බුදුගුණයක ඵලයක්ම බව නුවණින් දකින්න.

පින්වත් ඔබ ඉහත ආකාරයට, මේ උතුම් ජීවිතය බුදුගුණයක ඵලයක්ම බව දකින්න දක්ෂ නම්, විසිහතර පැය පුරාවට ඔබ

උතුම් බුදුගුණයක් වැඩුවා වෙනවා. රාත්‍රියට සුවසේ නින්දට යන විට පින්වත් ඔබ සිතන්න, 'බියෙන්, චකිතයෙන්, කුසගින්නෙන් පීඩාවන්ගෙන් බන්ධනාගාරගතව, සිරගතව හිසට සෙවනක් නැතිව දුකට පත්ව මේ රාත්‍රිය ගතකරන මනුෂ්‍යයින්, සත්ත්වයින් අතර මම මේ සුවදායී නින්දක් ලබන්නේ ද උතුම් බුදුගුණයක ඵලයක් නිසාමය' කියල. බුදුගුණයක ඵලයක්ම වූ ඔබේ සුවදායී නින්ද උදෙසා ඔබ දෑස් පියාගන්නා මොහොතේ බුදුරජාණන් වහන්සේව සිහිපත් කර ගෙන නින්දට යන්න. එවිට ඔබේ සුවදායී නින්ද ද උතුම් බුදුගුණයක ඵලයක්ම වෙනවා. පින්වත් ඔබ කවදාහරි දවසක මේ ජීවිතයෙන් සමුගන්නා අවසාන නිමේශයේදී අවසාන චුති සිතට 'මා ලැබූ ජීවිතයත් උතුම් බුදුගුණයක්ය. මා නැවත ලබන සුගතියේ උපතද උතුම් බුදුගුණයක ප්‍රතිඵලයක්' යැයි දකින්න ඔබ දක්ෂ නම්, එය බුද්ධානුස්සතියේ උතුම්ම ලෞකික සැපය වෙනවා.

පින්වත් ඔබට දැන් තේරෙනවා ඇති, ඔබේ මුළු ජීවිතයම උතුම් බුදුගුණයක ඵලයක්ය කියල. ඔබේ මුළු පවුලම බුදුගුණයක ඵලයක්මය කියලා. පින්වත් ඔබට උතුම් අම්මා, තාත්තා සොයල දුන්නෙත් උතුම් බුදුගුණයක් විසින් නම්, ඔබේ සැබෑම අම්මා, තාත්තා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක්මයි. පින්වත් ඔබව දුකට වැටීමට අකමැතිව ඒ සැබෑම මාතෘත්වය, පීතෘත්වය පින්වත් ඔබේ එකම සරණ කර ගන්න. එය උතුම් බුද්ධානුස්සතියේ සැබෑම අර්ථයයි.

පින්වත් ඔබට එරමිණියා ගොතාගෙන ද, පුටුවක වාඩිවී සිටිමින් ද, නිදි යහනේදී ද විවේකීව සිටින සෑම මොහොතකම ද බුද්ධානුස්සති භාවනාවේ අර්ථය ජීවිතයට එකතුකර ගත හැකිය. බුද්ධානුස්සති භාවනාව පුහුණුවීම දිනකට පැය භාගයක් පැයකට සීමාකර ඉහත ආකාරයට සෑම සිතුවිල්ලකට පසුව බුදුරජාණන් වහන්සේ මනසින් දැකීමට ඔබ දක්ෂ නම්, බුදුගුණයක් සිතීමට ඔබ දක්ෂ නම් දවස පුරාවට ඔබ බුද්ධානුස්සති භාවනාව පුහුණු කරා වෙනවා.

මහා පරිනිර්වාන සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'මහණෙනි, මේ ධර්මයෝ මා විසින් වෙසෙසින් නුවණින් දැන දෙසන ලදහ. ඔබලා විසින් මේ සසුන් බඹසර බොහෝ කල් පවත්නා පිණිස චිරස්ථායි වනු පිණිස මනාවට ඉගෙන සේවනය කළ යුතුයි. එය බොහෝ දෙනාට හිත සුව පිණිස, දෙවි මිනිසුන්ට අර්ථය පිණිස, සැප පිණිස හේතුවෙනවා. මගේ වයස මුහකුරා ගොස්ය. මගේ ජීවිත කාලය තව ස්වල්ප මොහොතකි. ඔබලා හැරයන්නේමි. මා විසින් මා පිහිට කර ගන්නා ලද්දේය. මහණෙනි, නොපමා වව්. මොනවට පිහිටවූ සම්‍යක් කල්පනා ඇත්තේ, තමන් සිත රැකගන්න' කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

බුදුරජාණන් වහන්සේට අවසාන වස්ත්‍ර පූජාව සිදුකරන්නේ කකුත්ථා නදිය සමීපයේදී පුක්කුස නම් මල්ල පුත්‍රයාය. තම මංගල කටයුතු සඳහා අඳින වටිනා රන්වන්වූ, මටසිළුටු වූ වස්ත්‍ර යුගල බුදුරජාණන් වහන්සේට පූජා කරනවා. පුක්කුස මල්ල පුත්‍රයා නික්ම ගිය පසු ආනන්ද ස්වාමීන් වහන්සේ එම මටසිළුටු රන්වන් වස්ත්‍ර යුගල බුදුසමිඳුන්ගේ ශ්‍රී සිරුරට එලනවා. එවිට සම්බුදු සිරුර ඡවි වර්ණ, පිරිසිදු, ප්‍රභාෂ්වරව ආශ්චර්යමත්, පහවූ සිළු ඇති ගිනි අඟුරු රැසක් සේ දිලිසෙන්නට පටන් ගන්නවා. එවිට බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, තථාගත සිරුර අවස්ථා දෙකකදී ඡවි වර්ණව, ප්‍රභාෂ්වරව, දිදුලනවා කියල. එම අවස්ථා දෙක වන්නේ තථාගතයෝ උතුම් සම්මා සම්බෝධිය අවබෝධ කරන්නේ ද යම් මොහොතක තථාගතයෝ අනුපදිශේෂ නිර්වාන ධාතුවෙන් පිරිනිවෙන්නේද, ඒ අවස්ථා දෙකේදීම තථාගත සිරුර ගිනි අඟුරු රැසක්සේ දිදුලනවා කියල.

ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුරජාණන් වහන්සේගෙන් විමසනවා 'භාග්‍යවතුන් වහන්ස, තථාගත සිරුරට කෙසේ බුහුමන් දැක්විය යුතුද' කියල. 'ආනන්දයෙනි, සක්විති රජකෙනකුගේ සිරුරට යම්සේ පිළිපදිම් ද තථාගතයන්ගේ සිරුරටද එසේම පිළිපැදිය යුතුයි. එය කෙසේද යත්, මුලින්ම සිරුර අලුත්

පිළියෙන් වෙලා දෙවනුව පිරිසිදු කපු පුළුන්වලින් වෙලවනවා. මේ ආකාරයට යුගල පන්සියයක් සක්විති රජුගේ සිරුර වෙලා, රන්මුව දෙනක බහා, සෑම වර්ගයකම සුවඳ දැවයෙන් චිතකයක් කර, ඒ සිරුර දවනවා. යම් පින්වතෙක් එම චිතකයට මල් හෝ සුවඳ පුදන්නේද, ආදරයෙන් ගෞරවයෙන් වන්දනා කරන්නේ ද, සිත පහදා ගන්නේ ද ඔවුන්ට මෙලොව පරලොව සුව පිණිසම හේතුවෙනවාය කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. පිරිනිවී යැමට පෙරාතුව අවසාන නිමේශයේදීත් බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න කරනවා 'මහණෙනි, එක් මහණකුට නමුත් තෙරුවන් කෙරෙහි හෝ මාර්ගය කෙරෙහි හෝ පිළිවෙත කෙරෙහි හෝ සැකයක් විචාරයක් ඇති නම් විචාරන්න' කියල. ස්වාමීන් වහන්සේලා නිහඬව සිටිය තැනදී බුදුරජාණන් වහන්සේ 'මහණෙනි, ශාස්තෲන්වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ද ඔබලා නොවිචාරනු විය හැකිය. එසේ නම් යහළු මහණ කෙනෙක් ලවා හෝ සැල කෙරේවා' යැයි පැවසූ සේක. සියල්ලක්ම නිහඬව සිටිය තැන භාග්‍යවතුන් වහන්සේ ස්වාමීන් වහන්සේලාට ඇමතුව සේක. 'මහණෙනි, දැන් ඔබලා අමතමි. සංස්කාරයෝ නැසෙන සුළුය. එබැවින් පමා නොවී එළඹියාවූ සිහියෙන්, රහත් බව පිණිස කළ යුතු දෑ සපුරවු' යැයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තම ශ්‍රී මුඛයෙන් අවසන් වදන් පෙළින් අවවාද කළ සේක. මෙවන් බුදුගුණයක් ඇසින් දකින්න මේ මොහොතේ ඔබ පින් කොට නැති මුත් මෙවන් උතුම් බුදුගුණයක් කනින් අසන්න, සිතෙන් මෙනෙහි කරන්න පින්කර ඇත. එයත් පින්වත් ඔබ ලැබූ උතුම් බුදුගුණයක ඵලයක්මය.

ගෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මැණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

මහ රහතුන් වැඩි මග ඔස්සේ



මිල රු. 160/-

ISBN 978-955-7887-34-0

අනගාරිකම 12

මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්